# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2018** ජනවාරි **09** වන අඟහරුවාදා
2018 தை 09 செவ்வாய்க் கிழமை
Tuesday 21st January 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 37 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.37 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.37 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு.தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. ඒ වාගේම ලැබුවා වූ 2018 නව වසර ඔබ සියලු දෙනාටම සාමය, සෞභාග්‍ය, සතුට, යස ඉසුරින් පිරි සුභ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒත් එක්කම ඉතාම සතුටින් කථා කරන්නේ. මම දැන් සභා ගර්භයට එන කොට මට යන්තම් ඇහුණා, ලස්සන වෙලා කියලා. බොහොම ස්තුතියි. මම විතරක් නොවෙයි. අද අපේ සෙංකෝලයත් ලස්සන කළා. අපේ සෙංකෝලයට පසුගිය දවස්වල කරදර සිද්ධ වුණා. අපි නව වර්ෂය පටන් ගන්න කොට අපේ සෙංකෝලය, අපි හැමෝගේම වස්තුව. ඒක අපි ප්‍රතිසංස්කරණය කළා. ඒ සඳහා රුපියල් ලක්ෂයක මුදලක් වැය වුණා. අද අපේ අලුත් සෙංකෝලයක් තිබෙනවා. ලස්සන සභාපතිවරයෙක් ඉන්නවා. ලස්සන මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා. මම ප්‍රාර්ථනා කරනවා, මෙම වසර කිසිම ප්‍රශ්නයක් නැතිව අපට පළාත් සභා කාලය ඉවර වන තාක් කල් 2019 අප්‍රේල් 21 දක්වා අපට ප්‍රශ්නයක් නැතිව මේ ගමන යන්න වාසනාව උදාවේවායි කියලා මම එක සිතින් ප්‍රාර්ථනා කරනවා.

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"මෙම පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙකුව සිටි යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා 2017.12.19 වන දින සිට එම පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වී තිබෙනවා. ඒ හේතුකොටගෙන කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම පළාත් සභාවේ ඇති වූ මන්ත්‍රීධූර පුරප්පාඩුව පුරවනු පිණිස ගරු ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් මැතිතුමා තේරී පත් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018.01.05 දිනැති අංක 2052/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.*

*ඒ අනුව ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා 2018.01.08 දින මා ඉදිරිපිටදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව/දිවුරුම දුන් බව කාරුණිකව දැනුම් දෙනවා.*

*ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාට මෙම සභාවට පැමිණ අසුන් ගන්නා මෙන් කාරුණිකව ආරාධනා කරනවා.*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් මහතා ] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***
*Subsequently, the newly appointed Member [Mr. Krishantha Yogadas Pancharathnam Ram] took his seat in the Council Chamber.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා මෙම පළාත් සභාවේ හිටපු ගරු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම බොහොම නිහතමානී, උගත්, වැදගත් මන්ත්‍රීවරයෙක්. ඒ නිසා එතුමාගේ සම්ප්‍රාප්තිය අපේ පළාත් සභාවට ලොකු අභිමානයක් සහ ගෞරවයක්. ඒ වාගේම එතුමාට සුදුසු අසුනක් ඉදිරි කාලයේදී සභා රීති ප්‍රකාරව වෙන් කර දීමට කටයුතු කරනවා. එතෙක් අද දිනට පමණක් තාවකාලිකව එතුමාට අසුනක් වෙන් කර තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා.

අභිනවයෙන් පත්වූ, ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේත්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ගරු සභානායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත්, සභා ලේකම්තුමා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ සියලු දෙනාගේත් සුභ පැතුම් මේ අවස්ථාවේදී ඔබතුමාට පිළිගන්වනවා.

*ii*

*ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන,*

1. *ගරු එම්.ඒ. මංජුල ප්‍රසන්න සම්පත් මැතතුමා දැරූ මන්ත්‍රීධූරය 2017.12.13 දින සිටද,*
2. *ගරු ජේ.ඒ. රොයිස් ප්‍රනාන්දු මැතිතුමා දැරූ මන්ත්‍රීධූරය 2017.12.18 දින සිට ද,*
3. *ගරු එස්. කුහවර්දන් මැතිතුමා දැරූ මන්ත්‍රීධූරය 2017.12.15 දින සිට ද,*
4. *ගරු. යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මැතිතුමා දැරූ මන්ත්‍රීධූරය 2017.12.19 දින සිටද*

*යනාදී වශයෙන් මෙම පළාත් සභාවේ මන්ත්‍රීධූර පුරප්පාඩු වූ බව කාරුණිකව දැනුම් දෙනවා. ඒ අතරින් අද දින පංචරත්නම් රාම් මන්ත්‍රීතුමා සභාවේ අසුන් ගත්තා. ඒ වාගේම අපේ හිටපු ගරු මන්ත්‍රීවරුන් සිවුදෙනා වෙතම අපගේ සුභාශිංසන පිරිනමනවා.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු යසපාල කෝරළගේ - ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
[ශ්‍රීනාත් ම. පෙරේරා කාරක සභා ගරු සභාපති වෙනුවෙන්]
Hon . Yasapala Koralage - Mr. Deputy Chairman
[On Behalf of Hon.Chairman of the Committee, Srinath M. Perera]

ගරු සභාපතිතුමනි, 2017.12.07 දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලාට පිළිගන්වනවා.

i. 2017.12.20 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව සහ,

ii. 2017.11.22 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගිය අවුරුද්දේ අපි පෙත්සම් සියල්ලක්ම විභාග කරලා අවසන් කළා. ඒ නිසා 2017 වසරේ එකම පෙත්සමක්වත් විභාග කිරීමට ඉතිරි වෙලා නැහැ. 2018 වසරේ ඉදිරිපත් වන පෙත්සම් තමයි විභාග කරන්න තිබෙන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

1. කැලණිය, නුංගමුගොඩ, උමගිලිය පෙදෙස, අංක 378/6 හි පදිංචි සිරි ජයලත් ආරච්චි යන අයගේ පෙත්සම,
2. මාකොළ, මාකොළ දකුණ, අංක 46/3 හි පදිංචි ඒ.පී. කරුණාසේන යන අයගේ පෙත්සම සහ,
3. සියඹලාපේ දකුණ, අංක 203/3 හි පදිංචි ජී.එම්. සරත් විජේතුංග ඇතුළු පිරිස විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, ඌරාපොල, රුක්මලේ, අංක 13 හි පදිංචි එම්. ප්‍රසන්න අජිත් කුමාර යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, පෙත්සම් කාරක සභාවේ තීරණ අරගෙන ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් අවුරුද්දක් පමණ වෙනවා. ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය. අපිත් උත්සාහ කරනවා. අපි පිළිගන්නවා ඔබතුමාගේ අදහස. අපි බොහොම මහන්සි වෙලා, මන්ත්‍රීවරු රැස් වෙලා අපි ස්ථාන පරීක්ෂණවලට ගිහිල්ලා තීන්දු සහ යම් යම් නිර්දේශ අපි ලබා දෙනවා. නමුත් අවාසනාවට මේවා - විශේෂයෙන්ම මේ පළාත් පාලන ආයතනවල තමයි ගොඩක් දුරට මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයත් මම යොමු කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා පෙත්සම් කිහිපයක්ම ඉදිරිපත් කළා. ගොඩක් පෙත්සම් තිබෙන්නේ, පළාත් පාලන ආයතන හා සම්බන්ධ ඒවා. අපි පෙත්සම් කාරක සභාවේ තීන්දු දෙනවා. නිර්දේශ දෙනවා. නමුත් ඒවා ගණන් ගන්නේ නැහැ. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකක් හරි ඉදිරියට සාධාරණයක් කරමු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මම ගරු මහ ඇමතිතුමාටත් ඉදිරිපත් කළා. මොකද, මගේ විතරක් නොවෙයි. තවත් ගරු මන්ත්‍රීවරුන්ගේ ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. ගරු මහ ඇමතිතුමා, කරුණාකර ඒ ගැන අවධානය යොමු කරලා, බලලා දෙන්න.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***01.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/112)***

*ප්‍රශ්නය :*

*අ. මීගමුව මහ නගර සභාව මගින් පාලනය වන සාප්පු සංකීර්ණය අවට මීට අවුරුදු 3 කට පෙර ක්‍රියාත්මක වූ රථවාහන සැලැස්ම විධිමත් ලෙස පැවති බව ඔබතුමා පිළිගන්නේද?*

*පිළිතුර :*

*අ. දැනට ක්‍රියාත්මක රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක වීමට පූර්වයෙන්, ඊට වෙනස් ආකාරයට රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක වී ඇති බව පිළිගනිමි.*

*ප්‍රශ්නය :*

*ආ. එකී සැලැස්ම අනුව විශේෂ අවස්ථාවල පමණක් එක් තීරුවක රථ වාහන ගමන් කිරීමට ඉඩ සැලැස්වූ බව ඔබතුමා දන්නෙහිද?*

*පිළිතුර :*

*ආ. පූර්වයෙන් පැවති රථ වාහන සැලැස්ම යටතේ එවැනි වූ ආකාරයට කටයුතු කර ඇති බව වාර්තා වී ඇත.*

*ප්‍රශ්නය :*

*ඇ. මේ වන විට කිසිදු අයෙකුට නොදන්වා එකී සාප්පු සංකීර්ණයේ එක් පසෙකට පමණක් රථ වාහන ගමන් කිරීමට ඉඩ සලස්වා ඇති බව ඔබතුමා දන්නෙහිද?*

*පිළිතුර :*

*ඇ. නව රථ වාහන සැලැස්ම යටතේ සාප්පු සංකීර්ණයේ එක් පසකට රථ වාහන ගමන් කිරීමට ඉඩ සලසා ඇති බව දනිමි.*

*ප්‍රශ්නය :*

*ඈ. අදාළ ව්‍යාපාරිකයන්ට හා නිලධාරීන්ට නොදන්වා එකී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?*

*පිළිතුර :*

*ඈ. මීගමුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙහි සාකච්ඡා කර, මීගමුව මහ නගර සභාව දැනුවත් කර, මීගමුව පොලීසියෙහි රථ වාහන අංශය විසින් අදාළ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කර ඇත.*

*ප්‍රශ්නය :*

*ඉ. ව්‍යාපාරිකයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පෙර පරිදි ක්‍රියාත්මක වූ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?*

*පිළිතුර :*

*ඉ. අදාළ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසියම් මහජන විරෝධතාවයක් තිබේ නම්, ඒ පිළිබඳව මීගමුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලෙස මීගමුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත උපදෙස් දෙමි.*

*ප්‍රශ්නය :*

*ඊ. නොඑසේ නම් ඒ මන්ද?*

*පිළිතුර :*

*ඊ. පැන නොනගී.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය යොමු කරනවා.

**02.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/117)**

අ. සීමාසහිත 532/සී වත්තෙගෙදර සණස සමිතියේ මුදල් අක්‍රමිකතාවයට අදාළ විනය පරීක්ෂණ අවසන් වීද?

ආ. අවසන් වී නැතිනම් හේතු කවරේද?

ඇ. මෙතෙක් කළ පරීක්ෂණවලට අනුව සම්පූර්ණ විස්තර ඇතුළත් වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඈ. එම වාර්තාව පදනම් කර ගනිමින්, අක්‍රමිකතා සිදු වී ඇති ආකාරය ගැන හෙළි වී ඇති කරුණු මොනවාද?

ඉ. අදාළ සමිතියේ කටයුතු අත්හිටුවීමෙන් පසුව එකතු කර ගෙන ඇති මුදල්වල වටිනාකම කීයද?

ඊ. තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින තැන්පත්කරුවන් සඳහා එම මුදල් සාධාරණ ක්‍රමයකට බෙදා දීමට කටයුතු කරන්නේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. සීමාසහිත 532/සී වත්තෙගෙදර සණස සමිතිය ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර රාජ්‍ය ආයතනයක් නොවන බැවින් සී/ස වත්තෙගෙදර සණස සමිතියේ මුදල් අක්‍රමිකතාවයට අදාළව විනය පරීක්ෂණ පැවැත්වීමේ හැකියාවක් නොමැත. බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 47 වගන්තිය යටතේ මෙවැනි අක්‍රමිකතාවයකදී විමර්ශනයක් පැවැත්වීමට හැකි අතර, ඒ අනුව එම විමර්ශනය පවත්වා ඇත.

ආ. උක්ත ප්‍රඥප්තියේ 47 වගන්තියට අනුව විමර්ශනය අවසන් කර නැවත අඩුපාඩු සකස් කරන ලද අවසන් වාර්තාව 2017.10.11 දින ලැබී ඇති අතර, එමගින් අනාවරණය වී ඇති කරුණු අනුව අදාළ පුද්ගලයන්ට එරෙහිව චෝදනාපත්‍ර සකස් කරමින් පවතී. එම කටයුතු 2018 ජනවාරි මස අවසානයේදී අවසන් කිරීමේ හැකියාව ඇත.

ඇ. උක්ත විමර්ශනය පවත්වා ඇත්තේ 2010 වර්ෂයේ සිට සමිති සාමාජික හා කාරක සභිකයින් විසින් සමිතියේ සම්පත් වංචනික ලෙස අවභාවිතා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ චෝදනා කීපයක් සම්බන්ධව වේ. මෙම විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව අදාළ පුද්ගලයන් වෙත චෝදනා පත්‍ර ලබා දීමෙන් අනතුරුව සභාව වෙත වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ඈ. මෙම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු පිළිබඳව අදාළ වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව චෝදනා පත්‍ර ගොනු කරමින් පවතී. ඉදිරියේදී සම්පූර්ණ වාර්තාවක් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

ඉ. සී/ස 532 සී වත්තෙගෙදර සණස සමිතියේ කටයුතු අත්හිටුවා නැති අතර, 2017.10.31 දිනට අය වී ඇති මුළු ණය වටිනාකම රු. 23,548,543.30 කි.

ඊ. සිය තැන්පතු මුදල් ලබා නොගත් සියළුම තැන්පත්කරුවන් සඳහා දැනට අය වෙමින් පවත්නා ණය මුදල් සාධාරණව බෙදා දීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍ය නෛතික උපදෙස් ලබා ගෙන සකස් කරමින් පවතී. ඉදිරියේදී සියළුම තැන්පත්කරුවන්ට (සිය තැන්පත් මුදල් ලබා නොගත්) ගෙවීමට නියමිත මුදල (සමානුපාතිකව) අවශ්‍ය මුදල් ප්‍රමාණය එක් රැස්වීමෙන් පසු සහ අදාළ මුදල් ලබා නොගත් තැන්පත්කරුවන් හඳුනා ගැනීමෙන් පසු එම මුදල් අනුමත ක්‍රමවේදයකට අනුව ගෙවීම් කරනු ලැබේ.

උ. අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ඇමතිතුමනි, මේකේ බරපතළ තත්ත්වය තිබෙන්නේ, කෝටි 75 ක මුදල් අවභාවිතාවකට දැනට එහි තැන්පත්කරුවන්ට ගෙවීම සඳහා කෝටි දෙකක වාගේ මුදලක් තමයි එකතු වෙලා තිබෙන්නේ. එතකොට දැන් අර විමර්ශන වාර්තාව සම්පූර්ණයෙන්ම ඔබතුමන්ලා මේකේ එළිදක්වලා නැහැ නේ? ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධව මේ ජනවාරි මාසය අවසන් වෙන්න ඉස්සෙල්ලා මේකට අවශ්‍ය පියවරක්, ඉතිරි මුදල් ටිකත් එකතු කර ගැනීම සඳහා අවශ්‍ය පියවරකට යෑම සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නේද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු මන්ත්‍රීතුමා, දැන් පසුබිම් වාර්තාවකුත් මම සකස් කරලා මේක සභාගත කරනවා. ඔබතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වාර්තාවේ පිටපතක් මටත් ලබා දෙන්න.

** [පසුබිම් වාර්තාව ]*
*[Background Report]*

*01. සී/ස 532/සී වත්තෙගෙදර ස.ණ.ස. සමිතයේ මහා පරිමාණ මූල්‍ය වංචාවන් හා මුදල් අවභාවිතයක් සිදු වී ඇති බව වාර්තාව වී ඇති අතර, එකී මූල්‍ය වංචාව හා මුදල් අවභාවිතය පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීම සඳහා 2011 අංක 04 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 බස්නාහිර පළාතේ සමූපකාර ප්‍රඥප්තියේ ප්‍රතිපාදනයන්ට යටත්ව මේ වන විටත් සියළු ක්‍රියා මාර්ග ගෙන ඇත.*

*02. මෙම සමිතියේ සිදු වී ඇති මූල්‍ය අවභාවිතය හා මූල්‍ය වංචාවලට අදාළව 2011 අංක 04 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන බස්නාහිර පළාත් සමූපකාර ප්‍රඥප්තිය යටතේ හා 1982 අංක 12 දරන පොදු දේපළ පනත යටතේ ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා සමිති විගණන වාර්තා ලබා දීමට අවශ්‍ය බැවින් 2001.07.01 දින සිට 2010.06.30 දින දක්වා වර්ෂ 05 ක සමිතියේ ගිණුම් පොත්පත් ලියවා විගණනය මේ වනවිට අවසන් කර ඇති අතර, වර්ෂ 04 ක විගණන වාර්තා සමිතිය වෙත මුදා හැර ඇත. 2010.07.01 දින සිට ඉදිරි වර්ෂවල විගණන කටයුතු සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තු පූර්ණ අධීක්ෂණය යටතේ නිවැරැදිව ගිණුම් පොත්පත් ලිවීමේ කටයුතු ද සිදු කරමින් පවතී. මේ වනවිට 2016.01.15 දින දක්වා සියළු ගනුදෙනු පරිගණකගත කර ඇත. මූල්‍ය වංචාවන් හා මුදල් අවභාවිතයට අදාළ කරුණු අනාවරණය කර ගැනීම සඳහා 2011 අංක 04 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන බස්නාහිර පළාතේ සමූපකාර ප්‍රඥප්තියේ 47 (2) වගන්තිය ප්‍රකාරව විමර්ශණයක් සිදු කර අදාළ පාර්ශවන් වෙත ලබා දීමට චෝදනා පත්‍ර සකස් කරමින් පවතී.*

*03. මේ වනවිට කල්පසු වී ඇති ණය අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි හා අවසන් නිවේදන යැවීමෙන් පසු බස්නාහිර පළාත් සමූපකාර ප්‍රඥප්තියේ 58 වෙනි වගන්තිය යටතේ තීරකකරණයට යොමු කර, එකී තීරකකරණයෙන් අය කර ගත නොහැකි ණය සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත නඩු ගොනු කර ඇති අතර, මේ වනවිට නඩු විභාග වෙමින් පවතී. එසේ අධිකරණ තීන්දු මත ක්‍රමිකව ණය අය වෙමින් පවතින අතර, එසේ අයවෙන ණය මුදල් සී/ස කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමයේ හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති අතර, අධිකරණය මගින් අයවෙන දඩ මුදල් මහජන බැංකු ගිණුමක තැන්පත් කර ඇත.*

*04. ඉදිරියේදී සිය තැන්පතු මුදල් ලබා නොගත් සියළුම තැන්පත්කරුවන් සඳහා දැනට අය වෙමින් පවත්නා ණය මුදල් සාධාරණව බෙදා දීමේ ක්‍රමවේදයක් සඳහා අවශ්‍ය නෛතික උපදෙස් ලබාගෙන සකස් කරමින් පවතින අතර, නීත්‍යානුකූලව තැන්පත් හිමි සියළුම තැන්පත්කරුවන්ට ගෙවීමට නියමිත මුදල් (සමානුපාතිකව) අවශ්‍ය මුදල් ප්‍රමාණය එක් රැස්වීමෙන් පසු අනුමත ක්‍රමවේදයකට අනුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ ඇති ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය යොමු කරනවා.

**03.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/120)**

අ. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 204 බී, ග්‍රාම නිලධාරී වසම තුළ මාර්ග අංක 244, සීදූව කොටුගොඩ මහා මාර්ගයත්, ජා-ඇළ මීනුවන්ගොඩ මහා මාර්ගයත් සම්බන්ධ වන පරිදි මාර්ගයක් සඳහා මාර්ග රක්ෂිතයක් තිබෙන බව ඔබතුමා දන්නෙහිද?

ආ. එකී මාර්ග කර්ෂිතයේ යම් ප්‍රමාණයක් මාර්ගයක් සඳහා භාවිතා කළ ද, තවත් කොටසක් අනවසරයෙන් ඉදි කිරීම් සිදු කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඇ. කටාන ප්‍රාදේශීය ලේකම් විසින් කටා/217/09 ගොනු අංකය යටතේ 2017.07.05 වන දින එකී මාර්ග රක්ෂිතය, මැනුම් නියෝගයක් ලබා ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බවත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් කටා/217/345 ගොනු අංකය යටතේ මාර්ග රක්ෂිතයේ මායිම් ලකුණු කර ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බවත්, ඔබතුමා දන්නෙහිද?

ඈ. එකී මාර්ග රක්ෂිතය මායිම් ලකුණු කිරීමෙන් පසු කිසියම් පිරිසක් විසින් බිම් කොටස 99 අවුරුදු බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට කටයුතු කරන බව ඔබතුමා දන්නෙහිද?

ඉ. එකී මාර්ග රක්ෂිතය භාවිතා කරමින් විකල්ප මාර්ගයක් ලෙස ඉදි කරන්නේ නම් මිලේනියම් සිටි, නිවාසි පුර, ඒකල, මිඩ්ලන්ඩ් වත්ත වැනි නගරවලට යා හැකි බව ඔබතුමා දන්නෙහිද?

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු. මෙම ප්‍රශ්නය යටතේ සඳහන් වන මාර්ගය බස්නාහිර පළාත් සභාවේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක් නොවන බවත්, එය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක් වන බැවින් ඒ ආශ්‍රිතව ඇති රක්ෂිතය ද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, සතුටු වෙනවා. නව වසරේ ආරම්භයත් සමඟ ගරු ඔබතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම මැති ඇමතිවරුන්ටත්, ගරු මන්ත්‍රීවරුන්ටත් සුභ පතන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව. ඇත්තටම මෙම නව වසරේ නව මැතිවරණයක්, නව මැතිවරණ ක්‍රමයක් යටතේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ. අපි සතුටු වෙන්න ඕනෑ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මෙම යහපාලන රජය තුළ මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්. ඇත්තටම මෙම මැතිවරණය කල් යන්න හේතු වුණේ, පසුගිය රජය කාලයේ කොට්ඨාශ නිර්ණය කිරීම සම්බන්ධව යම් යම් ප්‍රශ්න ඇති වුණු නිසයි. පක්ෂග්‍රාහී විධියට කොට්ඨාශ නිර්ණය කිරීම නිසා යම් යම් ප්‍රශ්න ඇති වීම නිසා එය කල් යාමට සිදු වුණා. කෙසේ වෙතත් නව කොට්ඨාශ ක්‍රමය තුළ අද අපි සතුටු වෙනවා, මැතිවරණයකට මුහුණ දීලා තිබෙන වෙලාවක අපි සතුටු වෙනවා. අද මැතිවරණ කාලයකදී ගමේ පුද්ගලයෙක්, ගමේ මන්ත්‍රීවරයෙකු වීම නිසා ගොඩාක් ප්‍රශ්න, දූෂණ, අක්‍රමිකතා ගොඩක් අඩු වෙලා, පෝස්ටර් තරඟයක් නැති වෙලා නව ප්‍රවේශයකට ලංකාව ගමන් කිරීමට හැකි වීම සම්බන්ධව අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම කාන්තා පාර්ශවයට 25% ක් අනුමත කිරීම නිසා කාන්තාවන්ට නිසි තැන මෙම නව රජය විසින්, නව යහපාලනය විසින් ලබා දීම නිසා අද කාන්තාවන්ට ශක්තියක් ලැබිලා තිබෙනවා. කාන්තාවන් 25% ක් අනිවාර්යයෙන්ම මෙම පළාත් පාලන ක්ෂේත්‍රයේදී පෙබරවාරි 10 වැනිදායින් පස්සේ ප්‍රාදේශීය සභා, නගර සභාවල ඒ කටයුතු කරනවා.

එම නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය කථාවේදීත් කිව්වා. බස්නාහිර පළාතෙන් තේරෙන කණ්ඩායමට විශේෂ පුහුණුවක් දෙනවාය කියලා. අපි සතුටු වෙනවා. එතුමා කල් ඇතිව මේකට සැලැස්මක් හදලා, නිලධාරීන් වෙන් කර ගෙන මේ කටයුතු කිරීම අපි අගය කරනවා. විපක්ෂය වශයෙන් අපි සතුටු වෙනවා. දැනට මේ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. දහ වැනිදායින් පස්සේ ඒ ක්‍රියාමාර්ගයත් සිදු

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

වෙවී. ඒ වාගේම අපි නව අවුරුද්දේ අලුත් ගොඩනැගිල්ලකට යන කොට, මෙම කණ්ඩායම පුළුවන් නම් ඒ ගොඩනැගිල්ලට ගෙනැල්ලා, ඒ කර්තව්‍ය කරනවා නම් ඒක අපට අභිමානයක්.

ඒ වාගේම කාන්තා නියෝජනය වාගේම ජාති, ආගම් භේදවලින් තොරව අද මේ මැතිවරණය කිරීම සම්බන්ධව සතුටු වෙනවා. ඉතා සාධාරණ මැතිවරණයක් බලාපොරොත්තු වෙනවා. මෙතුමා කිව්වා වාගේ කැලණිය හුණුපිටිය ජයන්තිමාලා හන්දියේදී කඩ පේළියක් ගිනි ගත්තා. ඒ කඩ පේළිය උඩින් තිබුණේ, අපේ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ ප්‍රචාරක පුවරුවක්. ඒක ගිනි තියන්න ඇවිල්ලා කඩ පේළිය ගිනි ගත්තා. අන්තිමට මේකෙන් වුණේ, ඒ දුප්පත් ජනතාවට, යමක් කරන්න පුළුවන් ජනතාවට තමන්ගේ කඩ ටික නැති වීම පමණයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

කවුද කළේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කළේ රණවීර මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම. පොහොට්ටුවේ. වෙන කවුරුවත් නොවෙයි. මේ වාගේ දේවල් කරන්න එපා කියන එකයි මම ඉල්ලීමක් කරන්නේ. මේ මැතිවරණය ඉතාම සාධාරණව, ඉතාම යුක්ති සහගතව මේ මැතිවරණ කොමිසමේ ගරු සභාපතිතුමා ඇතුළු කණ්ඩායම කරන වෙලාවක, එක එක පටු අදහස්වලින් කටයුතු කරන්න එපාය කියන එක මම අවංකව ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. තොරතුරු දැන ගැනීමේ පනත අනුව අපට ඕනෑම දෙයක් දැන ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා එවැනි කාලයක් තුළ අද මේ මැතිවරණය තුළ ඉතාම සාධාරණ බවක් පේන නිසා මම ඉල්ලීමක් කරනවා. ඉදිරියේදී මේ කාලය තුළ ඉතාම ශක්තිමත් විධියට මේ පළාත් සභාවට අලුත් ප්‍රාදේශීය සභා, නගර සභා සභාපතිවරු, උප සභාපතිවරු, නගරාධිපතිවරු බිහි වන වෙලාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ශක්තියක් වෙනවා. එහෙම නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට පෙබරවාරි 10 වැනිදායින් පස්සේ මේ ප්‍රාදේශීය සභා පාලනය කරන්න ලෙහෙසි වෙනවා. ඒකට අපි සතුටු වෙන්න ඕනෑ. ඒකට අපි සුභ පතන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. එක එක චෝදනා නොකර අපි ගමනක් යමු. අද මහරගම නාම යෝජනා පත්‍රය reject වුණාය කියලා අපි දුක් වෙන්නේ නැහැ. ඒ නාම යෝජනා පත්‍රය reject වීම නිසා එක එක සාටක දැම්මා කියලා අපි දුක් වෙන්නේ නැහැ. ඒ එතුමා දුක් වෙනවා. ලංකාවම අද මේ පොහොට්ටුව පරාජය පිළිඅරගෙන ඉවරයි. නාම යෝජනා පත්‍රයක්වත් දෙන්න බැරි මේ පොහොට්ටුවට -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බලාගෙන ඉන්න. අනිද්දාට උසාවියේ බලාගෙන ඉන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැන් අපට තරහය තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ක. පොහොට්ටුව එක්ක තරහයක් නැහැ. අපට තරහයක් නැහැ. (බාධා කිරීම්) ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සාධාරණ මැතිවරණයක් කිරීමට සියලු දෙනා එක් රොක් වෙමු කියලා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒකෙන්ම තේරෙනවා, භය වෙලා තිබෙන තරම.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

භය වෙලා තිබෙන තරම ඒකෙන්ම පේනවා. පොහොට්ටුවට භය වෙලා තිබෙන තරම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවසරය ඉල්ලනවා, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න. ගරු සභාපතිතුමනි, පසුගිය

දෙසැම්බර් 24 වැනිදා හරියටම රෑ 9.41 ට - මගේ දුරකථනයේ ඒ වෙලාව සටහන් වෙනවා. 0703000704 යන අංකය සහිත දුරකථනයෙන් මා වෙත දුරකථන ඇමතුමක් ලැබුණා. ඒ දුරකථන ඇමතුම මේ සභාවේ කටයුත්තක් සම්බන්ධව. එහිදී ඒ දුරකථනයෙන් කථා කළේ, හිටපු විභාග කොමසාරිස් අනුර එදිරිසිංහ කියලා මහත්මයෙක්. කථා කරලා මගෙන් ඇහුවා, "ඔබතුමා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ද" කියලා. මම කිව්වා, "ඔව්" කියලා. ඔබතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, පළාත් සභාවේ. මගේ නම සඳහන් කරමින්. එවැනි ප්‍රකාශයක් කරන්න හේතුව මොකක්ද කියලා. මම කිව්වා, ඔව්. ඔබතුමාගේ නම සඳහන් වුණු ප්‍රකාශයක්. ඒ සම්බන්ධව මගේ ළඟ කරුණු කාරණා තිබුණා. මම මහජන නියෝජිතයෙකු හැටියට ඒවා සියල්ල සභාගත කළා. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරන්නය කියලා ඉල්ලා සිටියාය කියලා මම කිව්වා. ඊට පස්සේ ඔහු තර්ජනාත්මකව මට ඒ දුරකථන - මොකද, මොකක් හරි දෙයක් - දැන් මොකද කියලා අහුවාමයි, මොකද කියලා ඇහුවාමයි වෙනසක් තිබෙනවා නේ? අන්න ඒ ජාතියේ ඒ දුරකථන ඇමතුම දුන්නේ සම්පූර්ණයෙන්ම තර්ජනයක් සහිතව. ඊට පස්සේ මගෙන් ඇහුවා, මම අවුරුදු අටක් විභාග කොමසාරිස් හැටියට හිටියා. ඇයි මාව අඳුරන්නේ නැද්ද කියලා. මම කිව්වා, මට අදාළ නැහැ නේ? විභාග කොමසාරිස්ලා එනවා. යනවා. ඔය නම් මොනවාද කියලා අපි එපමණ සොයන්නේ නැහැ. ඒක මට අදාළ කරුණක් නොවෙයි. මට තිබුණු තොරතුරු වගයක් තමයි මම ඉදිරිපත් කළේ කියලා කිව්වා. ඊට පස්සේ දිගටම මට ඒ විධියට තර්ජනාත්මක අයුරින් කථා කළා, තොරතුරු සොයලා බලලා කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. මම කිව්වා, මම මහජන නියෝජිතයෙක්. එතකොට මගේ ඩියුටියක් තිබෙනවා. මට ලැබුණු තොරතුරු තමයි මම සභාවට ඉදිරිපත් කළේ. අනික් එක මට මේ වාගේ දුරකථන ඇමතුමක් දෙන්න ඔබතුමා කවුද? මට මේ වාගේ බලපෑමක් කරන්න ඔබතුමාට ඇති අයිතිය කුමක්ද? කියලා මම අහනවා. එතුමාම කියනවා, අවුරුදු අටක් තිස්සේ විභාග කොමසාරිස් හැටියට හිටියා කියලා. ඉතින් මට හිතා ගන්න බැහැ. මම කිව්වා, ඒකට පරීක්ෂණයක් තියනවා.

ඊට පස්සේ ඔහු මට තර්ජනාත්මකව කියනවා, ඒ පරීක්ෂණයට මට අවශ්‍ය සහයෝගය දෙන්නය කියලා. ඉතින් මම කිව්වා, මට ඩියුටියක් නැහැ. මම කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට පරීක්ෂණයක් තියනවා. අදාළ ඇමතිවරු ඉන්නවා. ඉතින් ඒගොල්ලෝ රාජකාරී කරයි. මගේ වැඩේ මම ඉවර කරලා තිබෙන්නේ. මට ප්‍රශ්නයක් නැහැ. මට අදාළ කාරණයක් නොවෙයි කියලා මම ප්‍රකාශ කළා. ඔහු මට ඒ විධියට දිගින් දිගටම ඒ වෙලාවේ කථා කළා. මම දන්නේ නැහැ, ඔහු ඒ වෙලාවේ - මට තේරෙන්නේ නැහැ. මොකද, මට කවදාවක් කථා කරලා නැති නිසා ඔහු එවලේ බීමත්ව හිටියාද කියලා මට තේරෙන්නේ නැහැ. මම කිව්වා, කරුණාකරලා ඔබතුමා දුරකථනය තියන්න. මට ඔය විධියට බලපෑම් කරන්න එන්න එපාය කියලා. මම ඔබතුමාටත් ලියුමක් එව්වා. මම මතු කරන ප්‍රධාන කරුණු පහක් තිබෙනවා.

එකක් තමයි මේ දුරකථනයෙන් මාව අමතන ලද්දේ හිටපු විභාග කොමසාරිස්වරයාමද? එතකොට ඒක සනාථ කර ගන්න පුළුවන් මගේ මේ දුරකථන අංකයෙන්.

ඒ වාගේම මට එවැනි බලපෑමක් කිරීමට ඔහුට ඇති අයිතිය මොකක්ද?

අවුරුදු අටක් විභාග කොමසාරිස් වශයෙන් හිටපු කෙනෙක් මන්ත්‍රීවරයෙකුගේ කරුණු කාරණා, ඔහුගේ කටයුතු සම්බන්ධව අවබෝධයක් ඔහුට නැතිද?

ඊළඟ කාරණය තමයි, කිසියම් කරුණු ඉදිරිපත් කළාට පස්සේ, ඒ පිළිබඳව පරීක්ෂණ සිදු කිරීමේ ව්‍යුහය සැකසිලා තිබෙන්නේ කොහේද කියලා හිටපු විභාග කොමසාරිස් කෙනෙකු දන්නේ නැද්ද?

අනික් එක තමයි, වෙනත් මන්ත්‍රීවරයෙකුට නම් එහෙම කථා කරන්නේ නැහැ නේ? මට එහෙම කථා කරන්න ඔහුට කාගෙන් හරි අනුබලයක් ලැබෙන්න ඇති. මට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒකයි. මට ඒ විධියට ඔහු කථා කරන්න, ඔහුට අනිවාර්යයෙන්ම කාගෙන් හරි මොකක් හරි සපෝට් එකක්, මොකක් හරි ගැම්මක්, මොකක් හරි තල්ලුවක් ඇවිල්ලා තිබෙනවා. අන්න ඒ තල්ලුව දුන්නේ කවුද? කියන එක සම්බන්ධව ඔබතුමා පරීක්ෂණයක් කරලා, මේ දුරකථන අංකය ලබා ගෙන පරීක්ෂණයක් කරලා, ඔහු නම් මට ඒ තර්ජනය කළේ, කිසියම් හෝ කාරක සභාවකට ගෙන්වලා මට මේකේ සාධාරණත්වය ඉෂ්ට කරලා දෙන්න. මොකද, මගේ මන්ත්‍රී ධූරයේ කටයුතුවලට ඒක විශාල බාධාවක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාරණාව සම්බන්ධයෙන් ඔබතුමා මට ලිඛිතව ඉදිරිපත් කළා. ඔබතුමාගේ ප්‍රකාශයත් මට වැදගත් වෙනවා. ඒ අනුව අපි ඉදිරි කාලය තුළ අපි ඒ ගැන කඩිනම්ව සොයලා බලලා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම උදේ 8.30 ට මේ සභාවට ආවා. ඇවිල්ලා මම අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාව සොය සොයා හිටියා. මට තවමත් අල්ලා ගන්න බැරි වුණා. දැන් එතකොට මට පෞද්ගලික ප්‍රකාශයක් කරන්න තිබෙනවා. මේක කාට කියලාද අත්සන් කර ගන්නේ? හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමාට කිව්වාම මට බැහැයි කිව්වා. එතකොට මට මේ ප්‍රකාශය කරන්න අවස්ථාව ඔබතුමා ලබා දෙනවාද? ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා නැත්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි. ඔබතුමා 8.30 ට ආවා නම් මම මගේ නිල කාමරයේ හිටියා. ඉතින් එන්න තිබුණා නේ? අනික් කට්ටිය ඔක්කොම මට ඉදිරිපත් කළා. තවත් මන්ත්‍රීවරු තුන් දෙනෙක් මට දුන්නා. ඔබතුමා කොහේද හිටියේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් බැහැයි කියනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 8.30 ට ආවා නම් මම 9.15 ඉඳන් මගේ නිල කාමරයේ හිටියා. මට ඒ අවස්ථාවේ මන්ත්‍රීවරු -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අත්සන් නොකර ඔබතුමාට දෙන්න බැහැ නේ? මම ඉතින් ඔබතුමා - මම හිතුවේ, එතුමා එයි කියලා. එතුමා එයි කියලා තමයි මම විශ්වාස කර ගෙන හිටියේ. එතකොට මේකේ තිබෙන්නේ එහෙම නේ? එතකොට ඔබතුමාට කියලා ප්‍රශ්නය විසඳගන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට අපි අවස්ථාව දෙන්නම්. ඒක ගැටළුවක් නැහැ. ඔබතුමා මට ඒක ඉදිරිපත් කරන්න. අනික් මන්ත්‍රීවරු මට ඉදිරිපත් කළා. මම ඒකට අවසරය දුන්නා නේ? ගැටළුවක් නැහැ. ඔබතුමා 8.30 ට ආවා කියලා නම් මම පිළිගන්නේ නැහැ. වෙනත් කථාවක් ඒක. ඒක කථා කරන්න අවශ්‍ය නැහැ. ඒක මට ඉදිරිපත් කරන්න. මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම දිගින් දිගටම පසුගිය සභා වාරවලදීත් මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳව අදහස් පළ කළා. ඇත්ත වශයෙන්ම මේ වන කොට ඇතැම් ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කෙනෙකු නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම දුරකථනයෙන් අපේ ගරු මහ ඇමතිතුමාටත් මේ ගැන කිව්වා. හරි කනගාටුදායක තත්ත්වයක්. මම මේ කියන්න යන කාරණය ටිකක් බරපතළයි. මොකක්ද? ලින්ඩ්සේ බාලිකා විද්‍යාලයේ ගොඩනැගිලි ප්‍රශ්නයක් තිබුණා. තිබුණු ගොඩනැගිල්ල දිරාපත් වෙලා, ඉවත් කළා. එතකොට පාසලේ පන්ති කාමර හයක් දාන්න තැනක් නැති වුණා. ඒ වෙලාවේදී ඒ පාසලේ ඉඩ නැහැ. මොකද, මුහුද අයිනේ තිබෙන්නේ, මේ පාසල. ඒ වෙලාවේ යෝජනාවක් ආවා. විද්‍යාතිලක කියලා විද්‍යාලයක් තිබෙනවා. කොළඹ 05. තිඹිරිගස්යායේ. මේ ගොඩනැගිල්ල හදනකල් ඒ විද්‍යාලයට තාවකාලිකව මේ ළමයි ටික ඇතුළත් කරමුයි කියලා. මේකේ පන්ති කාමර 15 ක් විතර තිබෙනවා. මේ විද්‍යාතිලක මහා විද්‍යාලයේ ළමයින්ගේ සාමාන්‍ය පැමිණීම දිනකට ළමයින් 30 යි. දවසකට ළමයි 30 සාමාන්‍යයෙන් මේ පාසලට එන්නේ. පන්ති 15 ක් තිබෙනවා. එතකොට මේකෙන් පන්ති 06 ක් ලින්ඩ්සේ විද්‍යාලයේ 1 සහ 2 ශ්‍රේණිවලට දෙන්නය කියලා තීරණයක් ගත්තා.

2016 ජූලි මාසයේ සිට මේකේ ළමයින් ඇතුළත් කළා. එතකොට ලින්ඩ්සේ බාලිකා විද්‍යාලයේ ගොඩනැගිල්ලට මුල් ගල් තියලා, දැන් ඒක බොහොම ඉබි ගමනින් කෙරීගෙන යනවා. අපි බලාපොරොත්තු වන වේගයෙන්

ඒක හැදෙන්නේ නැහැ. සමහර වෙලාවට කියනවා, මේකට ප්‍රතිපාදන නැහැයි කියලා. ලක්ෂ 800 ක් වෙන් කළාය කියනවා. තට්ටු හතරක ගොඩනැගිල්ලක් හදන්න. හැබැයි, බොහොම හිමින් මේ වැඩේ යන්නේ. කෙසේ වෙතත් මේ දරුවන්ට ඉන්න තැනක් තිබෙන්න ඕනෑ. මේ විද්‍යාතිලක විද්‍යාලයේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ප්‍රශ්නය ගොඩ නැගෙන්නේ, විද්‍යාලතිලක විද්‍යාලයට එනවා, අලුත් විදුහල්පතිවරයෙක්. මේ විදුහල්පතිවරයාගේ නම දයාවංශ. මේ විදුහල්පතිවරයා ආවාට පස්සේ විදුහල්පතිවරයා මේ ළමයින් ටික මෙතැනින් එලවන්න සැලසුමක් හදනවා. ගිය අවුරුද්දේ අවසාන කාර්තුවේම. මේ දෙමව්පියන්ටයි ගුරුවරුන්ටයි. මේ විද්‍යාතිලකයේ විදුහල්පතිතුමා පුදුම විධියට වදයක් දුන්නා, මේ ළමයි ටික ඉවත් කර ගෙන යන්නය කියලා. දෙයියනේ මේ පුංචි ළමයින් ටික කොහේ දාන්නද? මේ පාසල් ගොඩනැගිල්ල හදන කල් මෙතැන ඉන්න එකේ වරද මොකක්ද? ඕනෑ තරම් ඉඩ තිබෙනවා. විද්‍යාලතිලකේ විදුහල්පතිවරයා වෙන බිස්නස් එකකුත් මෙතැන කරනවා. විශ්ව විද්‍යාලයට යන ළමයින්ට එහෙම ගුරු නිවාසයේ කාමර එහෙම කුලියට දීලා තිබෙනවා. මේක වෙන කතන්දරයක්. හැබැයි, එහෙම කර ගත්තාට අපට කමක් නැහැ. හැබැයි, අර දරුවෝ ටික එළවන්නේ නැතිව. දැන් ගිය දෙසැම්බර් 30 වැනිදා දෙමව්පියෝ එනවා පාසල් සුද්ද කරන්න. ලින්ඩ්සේ බාලිකා විදුහලේ එක දෙක වසරවල දරුවන්ගේ දෙමව්පියෝ. ආවාම විදුහල්පතිවරයා මේ පන්ති කාමර ලොක් කරනවා. සීල් කරනවා. සීල් කරලා ඉවර වෙලා, ඉතාම පරුෂ වචනයෙන් බැනලා, ගුරවරුයි දෙමව්පියොයි එළවනවා. එතකොට මේ විදුහල්පතිවරයා කියනවා, ගරු සභාපතිතුමනි, මේ පන්ති ටික අස් කර ගෙන ගියේ නැත්නම් මම මේක ලේ විලක් කරනවාය කියලා. දෙයියනේ විදුහල්පතිවරයෙක් කොහොමද එහෙම ප්‍රකාශයක් කරන්නේ ගරු සභාපතිතුමනි. පුංචි හය හතර නොතේරෙන අවුරුදු පහේ, හයේ දරුවන් ඉන්න තැන කියනවා, මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් ඔබතුමාට සාක්ෂි තිබෙනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සාක්ෂි විමසන්න ගුරුවරුන්ගෙන්. ගුරුවරු මට කථා කරලා කියපුවා ගරු සභාපතිතුමනි. වගකීමෙන් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ටේප් එකක් මොකුත් නැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු මන්ත්‍රීතුමා, එතුමා උතුරු කොළඹත් ඉඳලා, උතුරු කොළඹින් තමයි එයාව එළෙව්වේ. ඔය ප්‍රශ්නයම කළා බ්ලූමැන්ඩන් විද්‍යාලයටත්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමා ඔය විධියේම විනාශයක් කළා. මෙතුමාගෙන් මම ඇහුවා නේ කෝල් කරලා. එතුමාගේ ක්‍රියා කලාපය, චර්යාව ගැන මම අපේ ෆායිස් ගරු මන්ත්‍රීතුමාගෙන් දුරකථනයෙන් විමසුවා. එතකොට එතුමා කිව්වා, මෙහෙත් ප්‍රශ්න මතු කරලා ගියේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ගරු ඇමතිතුමා සභා ගර්භයේ නැහැ. ඒකත් ප්‍රශ්නයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා ඉන්නවා. අපි එතුමාට යොමු කරමු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්නේ. මේ අපේ ඇමතිතුමාට දවස් හතරක් තිස්සේ මම දුරකථනයෙන් උත්සාහ කරනවා. අද උදේ ගරු මහ ඇමතිතුමාට දුරකථනයෙන් කථා කරලා කිව්වා, ගරු මහ ඇමතිතුමා අධ්‍යාපන ඇමතිතුමාව සම්බන්ධ කර ගන්න බැහැ අධ්‍යාපනයේ ප්‍රශ්නයකට. ඔබතුමාටවත් බැරිද මේකට මැදිහත් වෙන්නය කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මළ ගෙයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මළ ගෙයක් වුණත් දූරකථනය නාද වන එක විසන්ධි කරන්න ඕනෑ නැහැ නේ? එයා ෆෝන් එක කට් කරනවා. ඒක වෙන කතන්දරයක්. අනාගතයේදී ඒවාට නිසි පිළිතුරු ලැබෙයි. ගරු සභාපතිතුමනි, හැකි ඉක්මණින් මේ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙන්නය කියලා මම මේ අදාළ පාර්ශවවලින් ඉල්ලනවා. දැන් ලේකම්වරයා ඉන්නවා නම්, ලේකම්වරයා මේකට මැදිහත් වෙන්න. ඒ නිසා වෙන විකල්ප දෙන්න හදන්න එපා. දැන්ම ලේකම්තුමාට කියනවා. වෙනත් පාසල් තෝරන්න, වෛශාඛා විද්‍යාලයට යන්න. එහෙම නොවෙයි. දැන් මේ යාළුවෝ ඉන්නවා ඇතුළේ. මේ අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්නවා දයාවංශගේ යාළුවෝ. යාළුවෝ හරහා පොඩ්ඩක් මේක ෂේප් කර ගන්න හදනවා. ෂේප් කර ගන්න නම් දෙන්නේ නැහැ. මෙතැනට ළඟම තැන. විද්‍යාතිලක විද්‍යාලයේ ඉඩ තියෙනවා. ඒ ගොඩනැගිල්ල හදන කල් ඒ දරුවෝ ටික මේකේ තියන්න අවස්ථාව ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. අපේ ගරු මහ ඇමතිතුමාටත් මම කියනවා. ගරු මහ ඇමතිතුමනි, මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳලා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. බොහොම ස්තූතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා හෝ වෙනත් පළාත් සභා මන්ත්‍රීවරයෙකු මේ සභාවේ ප්‍රශ්නයක් මතු කිරීම ගැන මගේ ගැටළුවක් නැහැ. හැබැයි, මෙතැන වැරැද්දක් තිබෙනවා. දැන් මේ සභාව දන්නේ නැහැ. කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, අපේ බස්නාහිර පළාතේම ඔය වාගේ ප්‍රශ්න ආවාම මම මැදිහත් වෙලා විසඳලා තිබෙනවා. මේ කියන විදුහල්පතිනියට, මට කියන්න ආපු අයට මම පණිවුඩයක් දුන්නා. මාව ඇවිල්ලා හම්බ වෙන්න කියලා. පළාතේ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා නම්, අධ්‍යාපන ඇමතිතුමා ප්‍රශ්නයක් නැහැ. මම ඉන්නේ, කොළඹ දිස්ත්‍රික්කයේ. ඒක මට ඇවිල්ලා කිව්වා නම්, මට එක දවසින් විසඳන්න පුළුවන්. දැන් ඊයේත් මම ප්‍රශ්නයක් විසඳුවා කලාප අධ්‍යක්ෂවරු ගෙන්වලා. ඒ නිසා මට ආවා නම් මට විසඳන්න තිබුණා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අමනාප වෙන්න එපා. මේ විදුහල්පතිවරු වැරදියි. මේ දෙමව්පියෝ වැරදියි. කරන්න පුළුවන් මිනිහෙකුට කියන්න එපැයි. මම ඒ අදාළ විදුහල්පතිනියට කිව්වා, මාව ඇවිල්ලා හම්බ වෙන්න කියලා. අද වන තෙක් ආවේ නැහැ. ඒ නිසා මේ සභාවේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මහ ඇමතිතුමනි, මම ඔබතුමාට අද යොමු කළා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඔබතුමා ඕක කියන්න ඉස්සෙල්ලා සති තුනකට කලින් මට ඒකේ පණිවුඩය ආවේ. මම කිව්වා, විදුහල්පතිට මාව ඇවිල්ලා හම්බ වෙන්න කියලා. මට ඕකට ටෙලිෆෝන් කෝල් දෙකයි යන්නේ. ඉතින් මම ඕක ගෙනැල්ලා විසඳනවා. මම ප්‍රශ්න විසඳලා තිබෙනවා. ඇත්තටම ඔබතුමා නිසා මම මොකුත් කියන්නේ නැහැ. නැත්නම් ඒක වැරදියි. වගකිවයුත්තෙකුට කියන්න එපැයි. එක්කෝ අධ්‍යාපන ඇමතිවරයාට කියන්න ඕනෑ. නැත්නම් මට කියන්න ඕනෑ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වරප්‍රසාද ප්‍රශ්නය ඇති වෙන්නේ මගේ මහරගම ආසනය තුළ ක්‍රියාත්මක වන කොට්ටාව විජයඝෝෂ විද්‍යාලයේ පස් වන ශ්‍රේණියෙන් පසුව හය වන ශ්‍රේණිය දක්වා යන්න තිබෙන්නේ, කොට්ටාව ධර්මපාල විද්‍යාලයට. දැන් ඒ කොට්ටාව ධර්මපාල විද්‍යාලයට ගත යුතුයි කියලා 2003 දී පාර්ලිමේන්තුවේ සම්මත ගිවිසුමකුත් තිබෙනවා. එහෙම තිබෙද්දී ගරු මහ ඇමතිතුමා, ඒ පාසලට දරුවන්ව භාර ගන්නේ නැතිව, දැන් හය වන ශ්‍රේණියට පාසලක් නැතිව ඒ දරුවෝ ඉන්නවා. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. ඒකත් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒකත් ඒ වාගේමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් එහෙම ප්‍රශ්නයක් තමයි. වරප්‍රසාද ප්‍රශ්නයකුත් නොවෙයි ඒක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ලේකම් ඉන්නවා නම් මම ගරු ඔබතුමා මගින් කියන්නේ. මේ විදුහල්පතිවරු දෙන්නාම ගෙන්වලා විනය පරීක්ෂණයක් කරන්න ඕනෑ. මෙතුමා කියන විජයසෝෂ විදුහලේ විදුහල්පතියි - මේ ප්‍රශ්න අපි විසඳලා තිබෙනවා. පළාත් අධ්‍යක්ෂකට කියලා. ඒ පාසලේ සීමාවක් තියන්න බැහැ. දැන් කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ පන්ති 10 ක් එනවා. එතකොට 45 සීමාවේ තියන්න බැහැ. ඔය විජය සෝෂ විදුහල්පතිට - මම ගරු ඔබතුමා මගින් අධ්‍යාපන ලේකම්ට කියනවා. මේ විදුහල්පතිවරු දෙන්නාටම - ඔය ලින්ඩ්සේ බාලිකාවේ එක්කෙනාටයි, විජයසෝෂ විද්‍යාලයේ එක්කෙනාටයි, අනිවාර්යයෙන් පරීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, ඒගොල්ලෝ ප්‍රශ්නයක් විසඳගන්න ඕනෑ අපිත් එක්ක කථා කරලා. මම ප්‍රශ්නය විසඳලා තිබෙනවා, පළාත් අධ්‍යක්ෂ සමඟ කටයුතු කරන්න. ඒක කරන්නේ නැතිව ඒක තුවාලයක් වාගේ තියාගෙන ඉන්නවා. ඒක වැරදියි. දැන් තමුන්නාන්සේ අධ්‍යාපනඥයෙක්. අපේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා යම් මැදිහත් වීමක් වුණා. ඒක වෙනම කේස් එකක්. නමුත් මේ මිනිස්සුන්ට මම ඉන්නවා නේ? මහරගම මට ඇවිල්ලා කියන්න එපැයි. අපි නේ ප්‍රතිව්‍යුහකරණය කළේ. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඒ කාලේ හිටියේ නැහැ නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මේක මට අද උදේ - ඒක ඔබතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි නේ මඩ කැවේ. කරුණාකරලා මම ගරු ඔබතුමා මගින් අධ්‍යාපන ලේකම්ට යෝජනා කරනවා. ඒ අපි පාසල් ප්‍රතිව්‍යුහකරණය කරන කොට සීමාව ඉක්මවා අපි දීලා තිබෙනවා, විජයසෝෂ විද්‍යාලයේ ළමයි 80 යි ද 120 යි ද? පන්ති තුනයි. 120 යි. ඒ පාසලෙන් පන්ති හතරයි. ඒ ළමයින් ඇතුළත් කරන්න බලයක් තිබෙනවා. ඒක අපි කියලා තිබෙන්නේ. දැන් වහාම මේ සම්බන්ධයෙන් සොයලා බලලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා අපේ නිලධාරීන්ගේ කාමරයේ ඉන්නවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පොඩි කාරණයක්. මම කියන්නේ, හැම කාරණයම මහ ඇමතිතුමාට දැනුම් දෙන්න මිනිස්සු පෙළඹෙන්නේ නැහැ. දෙමව්පියෝ තමන්ට ළඟා වෙන්න පුළුවන් මන්ත්‍රීවරයාට හෝ ඇමතිවරයාට හෝ කථා කරනවා. මම නම් ඒකේ ලොකු වැරැද්දක් දකින්නේ නැහැ. දුරකථන අංකය තිබෙනවා. ඒ කෙනාට කථා කරනවා. අපේ යුතුකම තමයි අපට ඉන්න ප්‍රධානියා හැටියට මහ ඇමතිතුමාට ඒ ප්‍රශ්නය යොමු කරන ඒක. අපව අමතලා කියන එකට - ඒකටත් වැරැද්දක් හිතන්නත් නරකයි කියන එකයි මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු මන්ත්‍රීතුමා. සාමාන්‍යයෙන් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ මන්ත්‍රීවරු දෙන්නාටත් ඒ පණිවුඩය ආපු වෙලාවේ මටත් කථා කළා නම්, මම ඒ වෙලාවේ විසඳලා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ඔබතුමාට කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමන්ලා දෙපළටම කියන්නේ. සාමාන්‍යයෙන් හැමදාම ඇහුම්කන් දෙන මහ ඇමතිවරයෙක් අපට දැන් පත් වෙලා ඉන්නේ. එතුමා පත් වුණු මොහොතේ ඉඳන් හැමදාම මේ ප්‍රශ්න විසඳනවා. ඒ නිසා එතුමා කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. මේ ප්‍රශ්න දෙකම කොළඹ දිස්ත්‍රික්කයේ. අධ්‍යාපන ඇමතිතුමා නැති වුණත් එතුමාට බලයක් තිබෙනවා, කැබිනට් එකේ නායකයා වශයෙන්. එතුමාට බලය තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ලේකම්තුමාට කියනවා. වහාම ඒ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කළ ප්‍රකාශයත්, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයත් බරපතළ ප්‍රකාශයක්. මොකද, විදුහල්පතිවරයෙක් කියනවා නම්, මේක ලේ විලක් කරනවා කියලා. මම දන්නේ නැහැ මට හිතාගන්න බැහැ. ඒ නිසා ඔබතුමා වහාම පරීක්ෂණයක් කරලා එතුමාට අවශ්‍ය දඬුවම් දෙන්න. නැත්නම් මේක යන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විදුහල්පතිතුමා කොහේද ඉගෙන ගත්තේ කියලා බලන්න ඕනෑ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මේ දක්වා මේ දරුවෝ ඉන්නේ ගෙවල්වල. ඒ නිසා ඔබතුමා හරහා යම් සාධාරණයක් කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. නැත්නම් ඒ ළමයින්ට හරි අසාධාරණයක්. ඒගොල්ලන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. විදුහල්පතිවරයා දැනුම් දුන්නේ නැහැ. මට උදේ ඇවිල්ලා දෙමව්පියන් වගයක් තමයි දැනුම් දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ව්‍යුහ කමිටුවෙත් ඒක කථා කරලා, අපි උපදේශක කාරක සභාවට -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් එක්කවත්, රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාත් එක්ක ප්‍රශ්නයක් නොවෙයි. මම මහරගම ආසනයේ ඉන්න කෙනා. මම මහ ඇමති. විදුහල්පති දැන ගන්න ඕනෑ මට කියන්න. ඔය විදුහල්පති පාසල් ප්‍රතිව්‍යුහකරණය කරන කොට මේ විද්‍යාලයේ හිටියා. අපියි මේකේ මඩ කෑවේ. තේරුණාද? ඒ නිසා අපට කියන්න ඕනෑ. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා, කැලණියේ ප්‍රශ්නයක් නම් තමුන්නාන්සේට කියන්න ඕනෑ. තමුන්නාන්සේ තමයි කැලණියේ එකම පළාත් සභා මන්ත්‍රී. ඒක ඔබතුමාට කිව්වාම, ඔබතුමා අපට කියන්න ඕනෑ. එහෙම නැතිව මේ සභාවට මේ ප්‍රශ්න ගේන එක වැරදියි. මේක ඊයේ ගෙදරදීම විසඳගන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ, මින් ඉස්සරහාට එහෙම කරන එකක් නැහැ. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මට තිබෙන කාරණාව තමයි. මැතිවරණ කොමිසමට තිබෙන අයිතිය මොකක්ද? මේ රටේ මහජනයා පත් කරපු මහජන නියෝජිතයන්ගේ අත පය බැඳ දාන්න. මැතිවරණ කොමිසමට තිබෙන ඒ අයිතිය මොකක්ද කියන කාරණය දැන ගන්නයි. ගරු සභාපතිතුමනි, ලබන අඟහරුවාදා, එනම් 16 වැනිදා පහත්ගම රෝමානු කතෝලික විද්‍යාලයේ - අද ඒ පාසලේ දරුවන්ට ඉන්න පන්ති කාමර නැතිව බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. පාසලේ ගොඩනැගිල්ලක් හදන්න මිලියන 14 ක් වෙන් කරලා තිබුණා. ඒකට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහභාගී වෙලා

මුල්ගල් තියන්න අවසර ඉල්ලා සිටියා ලබන අඟහරුවාදා මැතිවරණ කොමිසමෙන්. නමුත් මැතිවරණ කොමිසම ඒ සියලු ඒවා නතර කරලා දාලා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට ලියුමක් ගහලා තිබෙනවා, මේ උත්සවය තිබුණොත්, මහ ඇමතිවරයා ගෙන්නුවොත් අවශ්‍ය විනය කටයුතු කරනවාය කියලා. ගරු සභාපතිතුමනි, මට තේරෙන්නේ නැහැ මොන නීතියෙන්ද මේ කටයුත්ත කරන්නේ කියලා. දැන් ඊයේ අතිගරු ජනාධිපතිතුමා රාජගිරිය ගුවන් පාලම විවෘත කරනු ලැබුවා. රාජගිරියේ ගුවන් පාලම නොමැති වීම නිසා ජනතාව විශාල පීඩාවක් වින්දා. අපි ස්තුතිවන්ත වෙනවා, ජනාධිපතිතුමාට. ඇත්තටම විශාල අවහිරතාවයක් තිබුණා. රාජගිරිය පහු කරන්න පැය දෙකක් විතර යනවා. ඉතින් ජනාධිපතිතුමා ඊයේ ඇවිල්ලා විවෘත කළේ නැත්නම් - මම දැක්කා, මීට කලින් මැතිවරණ කොමිසම කියලා තිබුණා, ජනාධිපතිතුමා එන එක වැරදියි. එන්න බැහැයි කියලා. හැබැයි, ජනාධිපතිතුමා ඊයේ විවෘත කළා. ඒ නිසා ජනතාවට මහා දැවැන්ත සහනයක් ලැබුණා. එතකොට ජනාධිපතිතුමාට තිබෙන්නේ, Peoples mandate එකක්. අපි හැමදාම ඒක කියනවා. දැන් ප්‍රධාන අමාත්‍යතුමාට තිබෙන්නේ, මහජනයා දීපු බලයක්. ඉතින් ප්‍රධාන අමාත්‍යතුමාට ජනතාව වෙනුවෙන් ඇවිල්ලා, පාසල් දරුවන්ට ගොඩනැගිල්ලක් හදලා දෙන්න මුල්ගල් තියන්න තිබෙන අයිතිය වළක්වන්න මැතිවරණ කොමිසමට තිබෙන අයිතිය මොකක්ද?

ඒ නිසා මැතිවරණ කොමිසම ඉතාම අත්තනෝමතිකව වැඩ කරනවා. එතැනට ඇවිල්ලා, මැතිවරණ කොමිසමට පුළුවන්කම තිබෙනවා. දැන් මහ ඇමතිතුමා එන තැන පොලීසිය දාලා, හමුදාව දාලා වෙන යම් මැතිවරණ කොමිසමේ කට්ටිය දාලා, අපේක්ෂකයෝ ඒ උත්සවයට එනවාද කියලා බලන්න පුළුවන්. අපේක්ෂකයෝ ප්‍රවර්ධනය කරනවාද කියලා බලන්න පුළුවන්. එහෙම වෙනවා නම් දඬුවමක් දෙන්න පුළුවන්. හැබැයි, මේක මහජනතාව වෙනුවෙන් කරන කාර්යභාරයක්. ඒ නිසා සංවර්ධනය අඩාල කරන්න මැතිවරණ කොමිසමට තිබෙන අයිතිය මොකක්ද කියන කාරණය තමයි මම ප්‍රශ්න කරන්නේ. ඒ නිසා මැතිවරණ කොමිසමට දැනුම් දෙන්න ඕනෑ. කියන්න ඕනෑ. මහජනයා වෙනුවෙන් කරන සංවර්ධනයට බාධා කරන්න එපාය කියලා. දැන් තවමත් මේ ඉන්න මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයගේ මන්ත්‍රීකම් නැති වෙලා නැහැ. මාස දෙකහාමාරකට මැතිවරණ තියනකොට ඒ අයව කොහොමද අකර්මන්‍ය කරන්නේ? ඒ මහජන නියෝජිතයෝ අකර්මන්‍ය කිරීමේ අයිතිය කොහෙන්ද හම්බ වුණේ? මොන නීතියේද තිබෙන්නේ? අපි, මේ මහ ඇමතිතුමා යන්න හැදුවේ මැතිවරණය සඳහා වූ අපේක්ෂයෝ ප්‍රවර්ධනය සඳහා නොවෙයි. ජනතාවගේ ප්‍රශ්නයක් විසඳන්න. ඒ නිසා ජනතා ප්‍රශ්න විසඳන එක මාස දෙකහාමාරක් පස්සට දාන්න කියලාද මැතිවරණ කොමිසම කියන්නේ. ඒ නිසා මැතිවරණ කොමිසම ඉතාම අත්තනෝමතික විධියට වැඩ කරනවා. මේ නිසා රටේ සංවර්ධනය අඩාල වෙනවා. ඕනෑම ආයතනයක් තිබෙන්න ඕනෑ, රටක සංවර්ධනය සඳහා මිසක රටක සංවර්ධනය අඩාල කරන්න නොවෙයි කියන කාරණය මතක් කරමින්, ඒ සඳහා මැදිහත් වෙන්නය කියන ඉල්ලීම සභාවක් විධියට ඔබතුමාට කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, ඔය ප්‍රශ්නය හැම තැනම තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හංවැල්ලේ රෝමාණු කතෝලික ඉස්කෝලේ කියන්නේ - ගරු සභාපතිතුමනි, පන්තියක් නැති වුණොත් ඒක විශාල ප්‍රශ්නයක්. මොකද, මමවත් මෙතැන ඉන්න කවුරුවත් අපි ඡන්දය ඉල්ලන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේක්ෂකයෝ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා ඒක ලැහැස්ති කරන්න. මම එනවා මුල් ගල තියන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හරියට හරි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අනික් එක මහරගමත් නොවෙයි නේ? මම මොකටද භය වෙන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම අද පළාත් සභාවට එන විට - ඔබතුමා දන්නවා. මම සාමාන්‍යයෙන් ගොඩක් වෙලාවට, වෙලාවට එන කෙනෙක්. ගොඩක් දවස්වලට. අද මට පැය භාගයක් විතර ප්‍රමාද වුණා. ප්‍රමාද වෙන්න හේතුව තමයි, අද මේ ප්‍රවාහන අධිකාරියේ - මම ගරු සභාපතිතුමා හරහා මගේ වරප්‍රසාද ප්‍රශ්නය ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට කියනවා, පොඩ්ඩක් සවන් දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මම අද උදේ එන කොට මම මාලමුල්ල කොප්පල දක්වා, පානදුර - කොප්පල දක්වා දුවන බස් රථය, දැන් අවුරුදු හතරක් පහක් දුවපු බස් රථයක්. පාසල් ළමයින්ටත් යන්න විධියක් නැතිව මේ දවස් ටිකේම එතැන ඉන්නවා. රැඳී ඉන්න කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මාව එතැන නැවැත්තුවා. මම එන කොට මාව නැවැත්තුවා. ඒකයි මට ප්‍රමාද වෙන්න හේතුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස් එකේද ආවේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් සුමාන ගණනක් තිස්සේ බස් රථ ටික ඔක්කොම නවත්වලා. මම මේක ගරු ඇමතිතුමාටත් කිව්වා. මේ සිදුවීම වෙන්නේ නැහැ, මේක ක්‍රියාත්මක වුණා නම්. ඊට පස්සේ මම සභාපතිතුමාටත් කථා කරලා කිව්වා. මේක ගණනකට ගන්නේ නැතිව හිටපු නිසා අද ළමයින්ට ඉස්කෝලේ යන්න විධියක් නැහැ. රාජකාරියට යන අයට යන්න විධියක් නැහැ. මහා ගැටළු ගොඩක් වෙලා. අද ප්‍රවාහන අධිකාරිය පාලනය කරන්නේ මේ බස් හිමියන් විසින්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය විසඳන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නයක් නම් මම බලන්නම්. ඔබතුමාට සභාවට එන්න බාධාවක් වුණා නම්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මට ප්‍රමාද වෙන්න හේතුව ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මේ පිළිබඳව පොඩ්ඩක් සොයලා බලන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ ප්‍රශ්නය විසඳන්න කියන්න. මේවා විසඳන්නේ නැති හින්දා තමයි අපට ප්‍රශ්න එන්නේ. මේ ප්‍රවාහන අධිකාරිය බස් හිමියන්ට පාලනය කරන්න දෙන්න එපා. ප්‍රවාහන අධිකාරිය විසින් බස් හිමියන්ව පාලනය කරන්න. මේකට කඩිනමින් විසඳුමක් දෙන්න කියන්න. නැත්නම් අපට දිගින් දිගටම මේ ප්‍රශ්නය මතු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. සාමාන්‍යයෙන් මට ඔබතුමා ඔය ප්‍රශ්නය යොමු කළා නම්, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මට කාලය දෙන්න තිබුණා. නමුත් ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා අතුරු ප්‍රශ්නයකට ගියා. ගරු ඇමතිතුමා, පොඩ්ඩක් බලන්න එතුමා කියන කාරණාව. එතුමාට එන්න ප්‍රමාද වුණේ ඒ කියන පාරේ බස්වල තිබෙන ප්‍රශ්නයක් නිසාලු. මීළඟට එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා මම ගරු ඔබතුමාටත්, ගරු මහ ඇමතිතුමා ඇතුළු ගරු ඇමති මණ්ඩලයත්, මගේ හිතවත් ගරු මන්ත්‍රීවරුන්ටත් සුභ පතන්න. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය මෙතැනදී ගත්තේ මොකද කියලා කිව්වොත්, ඊයේ මගේ මිත්‍ර පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා දිවුරුම් දෙන්න සභා ලේකම් කාර්යාලයට ආවා. එතැනට ආවාම ඔබතුමාගේ කාමරයට ආවාම, මම පුදුමයට පත් වුණා. අපේ රටේ ජනාධිපතිවරු දෙන්නෙක් ඉන්නවා. ඔබතුමා මේ සභාවේ මුල් පුටුව. ඔබතුමා මේ සභාවේ සභාපති. ඔබතුමාගේ පුටුවට උඩින් ගහලා තිබෙනවා, ජනාධිපති මහින්ද රාජපක්ෂ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක ලොකු ප්‍රශ්නයක්. මේ රටේ මහජනතාව ලක්ෂ 62 ක් ඡන්දය දීලා තිබෙන්නේ එක ජනාධිපතිවරයෙකුට විතරයි. මේ බස්නාහිර පළාත් සභාවට ජනාධිපතිවරු දෙන්නෙක් නොවෙයි. දේශපාලන පක්ෂ කාර්යාලයේ ගිහිල්ලා පින්තූර දෙකක් නොවෙයි, පින්තූර දහයක් හරි ගැහුවාට ප්‍රශ්නයක් නොවෙයි. ඒක ගැටළුවක් නොවෙයි. මේක ඇවිල්ලා නිල කාර්යාලය. ඔබතුමාගේ නිල කාර්යාලය. දැන් අවුරුදු තුනක් වෙලා. 2015 ජනවාරි 08 වැනිදා ජනාධිපති පුටුවෙන් එතුමාව අයින් කරලා ඉවරයි. මම ඒක කියන්න ඕනෑ කියන්නේ, ඒක වැරද්දක් නිසා. කවුරුවත් මාව වැරදියට තේරුම් ගන්න එපා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපේ නායකයා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔබතුමන්ලාගේ නායකයා වෙන්න පුළුවන්. ඒ අපේ නායකයා රණසිංහ ප්‍රේමදාස, ජේ.ආර්. ජයවර්ධන - ඒක වෙන්න පුළුවන්. මේ රටේ ජනාධිපතිවරු දෙන්නෙක් නැහැ. එහෙම නැත්නම් මෛත්‍රීපාල සිරිසේන කියන පින්තූරය අයින් කරලා දාලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පින්තූරය තියා ගන්න. ගරු සභාපතිතුමනි, ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ ප්‍රශ්නය එපමණද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක ඔබතුමා හදන්න ඕනෑ. ඔබතුමා ඒක හැදුවොත් තමයි, මේ බස්නාහිර පළාත් සභාවේ තිබෙන අනික් කාර්යාලවලත් මේවා හදන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක සභා ලේකම් කාර්යාලය නොවෙයි. සභාපති කාර්යාලය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒ කියන්නේ ජනාධිපතිවරු දෙන්නෙකුගේ පින්තූර දාන්න එපා. ඒක වැරදියි. හිටපු ජනාධිපතිතුමා කියලා කොහේ හරි අයිනක දාන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එහෙම නම් සෙත්සිරිපායේ ප්‍රේමදාස මහත්තයාගේ පින්තූරේ තිබෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔබතුමාට තේරුණේ නැත්නම් ඔබතුමා ඒ ගැන කථා කරන්න එපා. ගිහිල්ලා බලන්න. තේරෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි. මට පැහැදිලියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඇවිල්ලා ඒක බලන්න. ඊයේ මම ගිහිල්ලා බලලා මම උඩ ගියා මේ මොකක්ද වෙන්නේ කියලා. මම ඒකයි කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උඩ යන්න දෙයක් නැහැ. ඔබතුමා හොඳට කේක් කාලා, තේ බීලා එතැනින් එළියට ආවේ. එහෙම උඩ ගියේ නැහැ. හරි. අපි ඉදිරියේදී නිවැරදි කරමු.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපේ අලුත් බිල්ඩිම තව මාස දෙක තුනකින් ඒක විවෘත කරනවා. එතැනින්වත් මේක හදා ගන්න කියන්නයි මම කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්. අපි ඒක කරනවා. ඔබතුමා මගේ කතන්දරයත් පොඩ්ඩක් අහන්න. මම මේ පළාත් සභාවට ආවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. එක්සත් ජාතික පක්ෂයෙන් නොවෙයි මම මේ පළාත් සභාවේ ඉන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මම ආවේ. 1993 දී. චන්ද්‍රිකා මැතිනියත් එක්ක ආවේ. අපේ චන්ද්‍රිකා මැතිනිය ජනාධිපතිතුමිය වෙලා හිටියා. එතුමිය දැන් නැහැ නේ ඉතින්. (බාධා කිරීම්) - මහින්ද රාජපක්ෂ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙම නම් ඔක්කෝගේම තිබෙන්න ඕනැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කියන දේ තේරුම් ගන්න කෝ? මට පොඩි අවස්ථාවක් දෙන්න කෝ. මම බොහොම සාධාරණව කථා කරන්නේ. එතකොට මම - මහින්ද රාජපපක්ෂ මැතිතුමා - හිටපු ජනාධිපතිතුමා. මාව 2004 දී නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් පත් කළා. ඒ පත් කිරීම කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඊට පස්සේ 2009 දීත් මාව සභාපති කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒක යෝජනා කළේ මෛත්‍රීපාල සිරිසේන අපේ පක්ෂයේ මහ ලේකම්තුමා. 2014 දීත් මාව නැවත සභාපතිවරයා වශයෙන් යෝජනා කළෙත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි මාව මෙතැනට නම් කළේ. ඒත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී. මම සදාචාරාත්මක මන්ත්‍රීවරයෙක්. මම නායකයින්ට සලකනවා. ඒ කාර්යාලයේ එතුමාගේ ෆොටෝ එක ගහලා තිබුණා. ඊට පස්සේ වෙනස් වුණාට පස්සේ ජනවාරි 08 වැනිදා. ඒක එහෙම්මම තිබෙනවා. ඒකේ ප්‍රශ්නයක් මොකුත් හිතන්න එපා. නමුත් අපේ අලුත් තැනට ගියාට පස්සේ අපි ඒක නිවැරදි කරනවා. එතුමා කිව්වා වාගේ අපි ඒවා නිවැරදි කරනවා. ඒක අද ඊයේ නොවෙයි. හැමදාම ඒක තිබුණා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන කාරණාව මට හොඳට තේරෙනවා. ඒක ඔබතුමාගේ පෞද්ගලික කාර්යාලයක දාන එක හරි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේත් පින්තූර දාන එක හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ තිබුණු ෆොටෝ - ඔබතුමා මෙහෙමයි -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක බස්නාහිර පළාත් සභාව. මුල් පුටුව ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේක අනවශ්‍ය ප්‍රශ්නයක් කර ගන්න එපා. මම පැහැදිලි කළේ, මෙතුමා ඊයේ උදේ ඇවිල්ලා, අපිත් එක්ක කේක් කාලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක දිගේ යන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතුවෙත් නැහැ ඔබතුමා මේ වාගේ මට්ටමට ඇද වැටෙයි කියලා. මම කනගාටු වෙනවා. හොඳ සුහදව කථා කරලා මට බුරියානිත් එවන්නම් කියලා ගිය මන්ත්‍රීතුමා දැන් මෙතැන ඇවිල්ලා -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කාමරයට වද්දා ගන්න හොඳ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, මම සභා කටයුතු ඇමතිවරයා වශයෙන් මම මේ ප්‍රකාශය කරන්නේ. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමාගේ අවධානය මම යොමු කරනවා. මේ රටේ හිටපු ජනාධිපතිවරු වන ජේ.ආර්. ජයවර්ධන මහත්තයා, ප්‍රේමදාස මහත්තයා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මහින්ද රාජපක්ෂ මහත්මයා. මේ ෆොටෝ තිබුණාට කමක් නැහැ. මේගොල්ලෝ රටේ හිටපු නායකයෝ. ඒ නිසා ඒ ගැන විවාදයක් කර ගන්න අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා මේක මම සමහර කාර්යාලවල - එහෙම නම් ඒ ගහලා තිබෙන ඒවා ගලවන්නත් ඕනැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු අමාත්‍යතුමා, මේක වාද විවාද කරන්න ගියා නම් මේක සම්පූර්ණ වැරදියි. දෙකක් තිබෙන එක ඕනෑ තැනකට ගහන්න පුළුවන්. සභාපතිතුමාගේ ඔලුව උඩ ජනාධිපතිවරු දෙදෙනෙකුගේ පින්තූර ගහන එක වැරදියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඇයි? අර බුදු පිළිමයකුත් තිබෙන්නේ. ඒකටත් එපැයි කියන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේ එක්සත් ජාතික පක්ෂය බිහි කරපු ඩී.එස්. සේනානායක මහත්තයාගේ පිළිරුව අද නිදහස් චතුරස්‍රයේ තිබෙනවා. ඒ එතුමාට ගරු කරන්න. ඉතින් එහෙම තිබුණාට කමක් නැහැ. ඒ ගැන විවාදයක් කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒක දාන්න හිටපු ජනාධිපති කියලා කියන්න. සභාපතිතුමාට තේරුණේ නැත්නම් ඕගොල්ලෝ ඇවිල්ලා කියලා දෙන්න. ජනාධිපති කියලා ගහන්න එපා. ඒකයි අපි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා, මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. මම කනගාටු වෙනවා ඔබතුමා ගැන. බොහොම හිතවත් මන්ත්‍රීවරයෙක්. මීළඟට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ වන කොට පළාත් සභා මැතිවරණය, ප්‍රාදේශීය සභා මැතිවරණය ප්‍රකාශයට පත් කරලා මැතිවරණයේ කටයුතු සිදු වෙමින් පවතින අවස්ථාවක් වන කොට අපි දකිනවා, එක පක්ෂයක එහෙම නැත්නම් දෙකක අපේක්ෂකයන්ගේ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය සම්පත් යොදා ගැනීම බහුලව සිදු වෙනවා. (බාධා කිරීම්) ඉතිහාසයේ පළමු වතාවට නොවෙයි. දැන් ඕගොල්ලෝ යහපාලන ආණ්ඩුවක් හැදුවා නේ? ඒ නිසා ඒ තුළ. ඒ කියන්නේ, ඉතාමත් පහත් විධියට ඒ වැඩේ කරන්නේ. මොකද, මේ වන කොට තිබෙන්නේ, ප්‍රාදේශීය සභා මැතිවරණය. ප්‍රාදේශීය සභාවේ සම්පත් ටිකම යොදා ගෙන අපේක්ෂකයන්ගේ ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කරනවා පැහැදිලිවම පේනවා. මම මේ පිළිබඳව මගේ හෝමාගම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාටත් කථා කරලා කිව්වා. මැතිවරණ කොමිසමට කිව්වා. පැපරල් සංවිධානයට කිව්වා. දැන් ඡායාරූප ගත කරලා තිබෙනවා. ඊයේ මම පාරේ යන කොට දැක්කා අපේ ගෙවල් පැත්තේ අපෙක්ෂකයෙක් ප්‍රිමික්ස් ට්‍රැක්ටරය ගෙනැල්ලා, ප්‍රිමෙක්ස් ටික දානවා. එතුමාගේ අතේ සවල විතරයි නැත්තේ. මම ඡායාරූප ගත කරලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටරය ගෙනැල්ලා ප්‍රිමික්ස් - ඒ ප්‍රිමික්ස් ටික දාන්නෙත් ප්‍රාදේශීය සභාවේ

[ගරු ජනක වැලිවත්ත]

කැඩුණු පාරට නොවෙයි. අර Water board එකෙන් කපලා තිබෙනවා, වතුර ලයින් එක දාන්න. ඒකටයි ප්‍රිමෙක්ස් ට්‍රැක්ටරය දාන්නේ. කිසිම ඇස්තමේන්තුවක්, කිසි දෙයක් නැහැ TO කෙනෙකුටවත් අනුමත කරන්න පුළුවන්කමක් නැහැ, ඒ විධියට Water board එකේ කපපු එකට ප්‍රිමෙක්ස් යොදන්න. ඒ එක්කම ඊයේ පෙරෙයිදා මම තවත් අපෙක්ෂකයෙකුව දැක්කා. කුණු ට්‍රැක්ටරය පස්සෙන් යනවා, ගෙවල්වල තිබෙන කුණු ටික එකතු කර ගෙන. මේ වාගේ ඉතාමත්ම පහත් විධියට ප්‍රාදේශීය සභාවල සම්පත් යොදා ගනිමින් තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ මේ වසරේ මුදල්වලට කලින් ගිවිසුම් අත්සන් කරලා මේ වන කොට පාරවල්වලට තාර දාන්න කටයුතු කරමින් යනවා. මේවා මැතිවරණයකදී අපේ නම් මම හිතන්නේ, එක්සත් ජාතික පක්ෂයටත් ඒ අවස්ථාව නැහැ. මේ එක පක්ෂයක ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් විතරයි මේ මුදල් යොදන්නේ. ඉතාමත්ම පහත් විධියට මේ කටයුත්ත කර ගෙන යන්නේ. මොකද, මේක අයිති බස්නාහිර පළාත් සභාවට. ලේකම්වරු මම දන්නේ නැහැ. කොමසාරිස්තුමිය ඉන්නවා. මේ ගැන දැනුමක්, අවබෝධයක් ඇතිව කරනවාද කියලා. මොකද, අවසානයේදී අමාරුවේ වැටෙන්නේ මේ නිලධාරීන් ටික. කාගේ හරි වුවමනාවට ලයිට් දාන්න හරි, අපේක්ෂකයෝ යනවා. අපේක්ෂකයෝ පාර කපන යන්ත්‍රය. මෝටර් ග්‍රේඩරය පස්සෙන් යනවා. මෝටර් ග්‍රේඩරය පස්සෙන් අපේක්ෂකයා යනවා.

දැන් මේවා ඡායාරූපගත කරලා මිනිස්සු අපට ගෙනැල්ලා දෙනවා. දැන් මැතිවරණ කොමසාරිස් සාධාරණ මැතිවරණයක් ගැන කථා කරනවා. මේවා ඉදිරිපත් කළොත් සාක්ෂි ඕනෑ නැහැ කියලා තිබෙනවා. තවම අපේ අතේ තිබෙනවා. මොකද, ඉදිරිපත් කළොත් එහෙම අමාරුවේ වැටෙන්නේ නිලධාරීන් ටික. ඔය අපේක්ෂකයෝ පරදිනවා. නමුත් නිලධාරීන් ටික අමාරුවේ වැටෙනවා. ඒ නිසයි මම කියන්නේ. බුද්ධිමත්ව කටයුතු කරන්න. නිලධාරීන්ව නැවත වතාවක් අමාරුවේ දාන්න එපා මේ කටයුතු වෙනුවෙන්. ඒ නිසා වගකීම ගන්න. මොකද, පෙබරවාරි මාසේ 10 වැනිදායින් පස්සේ, මේ පළාත් පාලන ආයතන පාලනය කිරීමේ අයිතිය මහ ඇමතිතුමාගෙන් ගිලිහිලා ආයිත් මහජන නියෝජිතයන් අතරට යනවා. එතකොට ඒ මහජන නියෝජිතයන්ට වගකියන්න සිද්ධ වෙන්නේ නිලධාරීන්ට. ඒ නිසා මේ රාජ්‍ය සම්පත්, ප්‍රාදේශීය සභාව සතු සම්පත් යොදවා ගැනීම සම්පූර්ණයෙන්ම නවත්වන්න. මැතිවරණ කොමසාරිස්තුමාටත් මම පැමිණිලි කළා. දිගින් දිගටම පැමිණිලි කළා. නමුත් ඒ පිළිබඳව හරියාකාරව කටයුතු කරන අවස්ථාවක් නැහැ. අවශ්‍ය වුණොත් ඡායාරූප, වීඩියෝ ඉදිරිපත් කිරීමේ හැකියාව අප සතුව තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියනවා. ඒ නිලධාරීන් දැනුවත් කරන්න. කොමසාරිස්තුමිය දැනුවත් කරන්න. සම්පත් යොදා ගැනීම නවත්වන්න කියන එක ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, මැතිවරණයක් තියනවා නම්, ඒ වාගේම මැතිවරණ කොමසාරිස් ස්වාධීන නම් හැමෝටම සාධාරණය විය යුතුයි. ඇත්තටම අද දිනයේ බලන කොට එක කණ්ඩායමකට විතරක්, එක පක්ෂයකට විතරක් නීතියක් බවට පත් කරලා, අනික් ඒවාට තමන්ට ඕනෑ ආකාරයෙන් - දැන් උදාහරණ විධියට ගත්තාම ස්ථිර ගොඩනැගිලි නැහැයි කියලා පොදු ජන පෙරමුණට විතරක් කාර්යාල ගහන්න දෙන්න බැහැ. හැබැයි, අනික් සියලුම පක්ෂවලට ඕනෑ ආකාරයෙන් ටකරං මඩුවක් ගහලා වුණත් දාන්න පුළුවන්. ඒක සාධාරණ නැහැ. ඇත්තටම මට අවශ්‍ය වුණේ ඒක කියන්න නොවෙයි. දෙසැම්බර් 31 වැනිදා - (බාධා කිරීමක්) දෙන්නේ නැහැ. නොදුන්නාට අනික් පක්ෂවල ඕනෑ තරම් දීපුවා තිබෙනවා. ඡායාරූප ගහලා යවලා තිබෙනවා. පැමිණිලි කරලා තිබෙනවා. කිසිම දෙයක සාධාරණීකරණයක් නැහැ. ඒකයි කියන්නේ. එක කොටසකට විතරක්.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ දෙසැම්බර් 31 වැනිදා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි සියලු දෙනාටම සමව දුන්න මුදල් ප්‍රතිපාදනවල ව්‍යාපෘති ආවා. හැම තැනම ව්‍යාපෘති තිබෙනවා. මගේ එක ව්‍යාපෘතියක්, ලක්ෂ 05 ක ව්‍යාපෘතියක් තිබෙනවා, මීටර් අසූ ගණනක් දාන්න. ඒ දවසේ රෑ හත, අට වෙන කොට ඒක සම්පූර්ණයෙන්ම

දාලා ඉවර වෙන්නයි තිබුණේ. නමුත් මේ මැතිවරණය තුළ, මැතිවරණ කොමසාරිස් කිව්වා කියලා පොලීසියෙන් ඇවිල්ලා මේක සවස තුනට විතර නවත්වලා - සම්පූර්ණයෙන්ම නවත්වන්න කිව්වා. නවත්වන්න කිව්වාම, මේ ගෙනාපු ගල් ටිකෙන් මීටර් 27 යි දාන්න පුළුවන් වුණේ. ගෙනාපු ගල් ටිකට, සම්පත් ටිකට කවුද වග කියන්නේ? මීටර් 27 ට ඒ ඇස්තමේන්තුව හැදුවා. යැව්වා. නමුත් ඇත්තටම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මහජනතාවගේ මුදල්. මහජනතාව වෙනුවෙන් කරන්නේ. මෙතැන කිසිම අපේක්ෂකයෙකු හිටියේ නැහැ. නමුත් මේ වාගේ දේවල් කළාම - අද පාර මැද්දේ යන්න බැහැ. ගල් ටිකට කවුද වග කියන්නේ? මම අහන්නේ, ඇයි ඒ වාගේ දේවල් කරන්නේ කියන එකයි. සාධාරණීකරණය කරනවා නම්.

හැබැයි, ඒ පාර විතරක් නොවෙයි. ඒ මොහොත වන විට තවත් පාරවල් විස්සක් තිහක් හැදුනා. නමුත් මේ වැඩ පිළිවෙළ තුළ එක්කෙනෙක් ඉලක්ක කරලා, එක කණ්ඩායමක් ඉලක්ක කරලා කරන වැඩ පිළිවෙළ සාධාරණීකරණය වෙන්නේ නැහැ. සාධාරණයි කියලා, යහපාලනයි කියලා ආවා නම් ඒක ක්‍රියාවෙනුත් ඔප්පු වෙන්න ඕනෑ. එහෙම නොවෙනතාක් කල් මම හිතන්නේ, මේ අපේ ජනතාවට තමයි ඒ හානිය වෙන්නේ. අද ඒ මුදල් ගෙනාපු කෙනාට, ඒ ගිවිසුම්ගත වුණු සමිතියට ඒ මුදල් ගන්න පුළුන්කමක් නැහැ. ඒ නිසා ඒ පාරේ යන අයගේ මානව අයිතිවාසිකමක් තමයි කඩ කළේ. ඇත්තටම අද පාර මැද්දේ ගල් ටික A, B, C ටික දාලා තිබෙනවා. වහින කොට හේදිලා යනවා. පල්ලෙහාට ගිහිල්ලා ගොඩ වෙනවා. ඇත්තටම මම අහන්නේ අර මුලින් කිව්වා වාගේම, මේ එක කොටසකට විතරක් ඇයි මේ කාරණාව. මේක සමව යන්න ඕනෑ. යහපාලනයක් තිබෙනවා නම් ඇත්තටම සමව ගිහිල්ලා හැමෝටම ඒ වරප්‍රසාදය ලැබෙන්න ඕනෑ. එහෙම නැත්නම් කාටවක්වත් නොවෙන්න ඕනෑ. නොවෙන්න නොවෙයි අපි කියන්නේ. අපි කියන්නේ ඒ අවශ්‍යතාවය, ජනතාවගේ මුදල් ජනතාවගේ සේවය සඳහා යොදවන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. කවුරුවක්වත් පෞද්ගලික වැඩ පිළිවෙළක් තුළ නොවෙයි මේවා ක්‍රියාත්මක කළේ. ඒ නිසා කියනවාට වඩා සාධාරණීකරණයක්, පෙන්වනවාට වඩා සාධාරණීකරණයක් තිබෙන්න ඕනෑය කියන එකයි මම ඉල්ලා සිටින්නේ. මැතිවරණ කොමසාරිස් ස්වාධීනයි කිව්වාට අද කියන එක නොවෙයි හෙට කියන්නේ. හෙට කියන එක නොවෙයි අනිත් දවසේ කියන්නේ. එක කණ්ඩායමක්, එක පුද්ගලයෙක් ඉලක්ක කරලා විතරයි එතුමා සියලුම නීති රීති හදන්නේ. ඒ නිසා මැතිවරණ කොමසාරිස් ස්වාධීන නැහැ. විනිවිදභාවයක් නැහැයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. රටේ වර්තමාන දේශපාලන තත්ත්වය සම්බන්ධව උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා ඇතුළු, අපේ ඇමැති මණ්ඩලය ඇතුළු මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. අද 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ පව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.මමත් ආවේ ටිකක් පරක්කු වෙලා, 10.00 ට විතර. මටත් විශේෂ ප්‍රකාශයක් කරන්න අවස්ථාව තිබුණා. ඉතින් ජෝර්ජ් පෙරේරා අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, දැන් වෙලාව නැහැ. මේ වෙලාවට දෙන්න බැහැයි කියලා. දැන් මාත් එක්කමයි උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ආවේ. (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න. මම අහන්නේ, නීතියක් තිබෙනවා නම්, 08.30 න් ඉස්සෙල්ලා ඒක භාර දෙන්නය කියලා. දැන් මේ සභාව ඇතුළේ ක්‍රියාත්මක වන නීතිය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, එතුමාත් එක්ක Lift එකේ ආවාට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පොඩ්ඩක් ඉන්න. ඔබතුමාගෙන් නොවෙයි ඇහුවේ. සභාපතිතුමාගෙන් ඇහුවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එයා කොහොමද දන්නේ මම ආපු වෙලාව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවේ ඔක්කොටම ජේන්න තමයි ඒක භාර දුන්නේ. 10.10 ට. වෙලාව බැලුවාම 10.10 ට. මේ ඔක්කොටම ජේන්න - සංවිධායකතුමාගේ මම දන්නේ නැහැ, අසනීපද නැද්ද කියලා. 10.10 ට භාර දුන්නේ. එතකොට ඒ තිබෙන අයිතිවාසිකම මටත් තිබෙන්න ඕනෑ. මගේ අයිතිවාසිකම විපක්ෂයේ සංවිධායකතුමා නැති කෙරුවා. ඒකේ තිබෙන සාධාරණය මොකක්ද? එහෙම කරන්න බැහැ. එහෙම කරන්න පුළුවන්ද? එහෙම සභාව එක එක්කෙනාට ඕනෑ විධියට ගෙනියන් බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම නීතියක් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවේ රීතියක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, අපි මේ කාලය බෙදලා තිබෙන්නේ, ආණ්ඩු පක්ෂයට 04 යි. විපක්ෂයට 03 යි. දැන් මට දෙන්න තිබුණා නම් එකක් ඔබතුමාට දෙන්න තිබුණා. දැන් තුන්දෙනා කථා කළා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා වෙලාවක් කියලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙමනම් වෙලාව පහු වෙලා අපිත් අනික් දවසේ ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් දැන් තුනක් දීලා තිබෙනවා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

තුන නොවෙයි නේ මෙතැන වෙලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක නොවෙයි මම අහන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කාලය පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැරදි පූර්වාදර්ශයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නම කිව්වත් දෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නීතියක් තිබෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ. ඔබතුමාත් එක්ක -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම තමුන්නාන්සේ ගැන ඇත්ත වශයෙන්ම

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, අලුතින් නීති හදන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා, ඇයි ඒක වුණේ කියලා. එතුමා 8.30 වනතුරු රස්තියාදු වෙලා සංවිධායකතුමා සිටියේ නැහැ. ඒ නිසා ඔබතුමා අවසර දුන්නා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි නීතියක් දාලා තිබෙන්නේ 8.30.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම කියලා බැහැ. එහෙම නීතියක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම කියලයි දුන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කනගාටු වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා කථා කළාම ඔබතුමා අවසර දුන්නා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම කරන්න පුළුවන්ද? ඕනෑ, ඕනෑ වෙලාවට. එහෙමනම් අලුතින් මේ රීති පොතක් ගහලා ලොකුවට දෙන්න ඕනෑ නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේක පක්ෂය ඇතුළේ ප්‍රශ්නයක්. මෙතුමා කාරණාව කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සම්පූර්ණ වැරැද්දක් කරන්නේ, ගරු සභාපතිතුමා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, කාලය පිළිබඳව - කාලයක් සඳහන් වෙනවා නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක වෙනයි. කාලය වෙනයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

8.30 නම්, 8.30 ට ඉස්සෙල්ලා දෙන්න ඕනෑ. බැරි නම් කරන්න දෙයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මැදින් ඇවිල්ලා දානවා. මොනතරම් අසාධාරණද ඒවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සිරිකමල් මන්ත්‍රීතුමාට අසාධාරණය කරලා තිබෙන්නේ ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උදේ ආවා කියන්නේ බොරු. මාත් එක්ක එකට සභාවට ගොඩ වුණේ. දෙන්නා එකට ආවේ කාරකෙන් බැහැලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමා 08.30 වෙන කොට සිටියා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ලිෆ්ට් එකේ ආවාම මම -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයාගේ නියෝජිතයෙක් නැත්නම්-

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උදේ 08.30 ට ඉස්සෙල්ලා භාර දෙන්නය කියලා මේකේ රීතියක් තිබෙනවා. එහෙමනම් ලේකම්තුමන්ලා අර ලොකු පොත් අච්චු ගහලා අපට එවන එකේ තේරුමක් නැහැ, මේ සභාවේ නීතියක්, රීතියක් නැතිව වැඩ කරනවා නම්. ඒක නිසා කරුණාකරලා මේ වැරැදි වැඩේ කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක අභ්‍යන්තර ප්‍රශ්නයක්. එතුමා 08.30 ට ආවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක වැරැදි පූර්වාදර්ශයක්. මේක වැරැදියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සංවිධායකතුමා නැති නිසා දෙන්න බැරි වුණේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක හැමෝම ඉස්සරහාට පාවිච්චි කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, ඒ මන්ත්‍රීවරයා බොරුවක් ප්‍රකාශ කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක තමයි. මම දන්නේ නැහැ නේ, ඉතින්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

8.30 ට කියපු නිසා තමයි තමුන්නාන්සේ ඒ පිළිබඳව අවධානය යොමු කළේ. හැබැයි අර ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් ඔප්පු වෙනවා, මෙයා ඇවිල්ලා තිබෙන්නේ 10.10 ට කියලා. ඒ නිසා ඔබතුමා තීන්දුවක් ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමා 08.30 ට සභාවේ සිටියා.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අමූලික බොරු. මමත් වේලාසන ආවා. අපි මෙතුමාව දැක්කේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කෝ. ගරු ඇමැතිතුමා, ආණ්ඩු පක්ෂයට හතර දෙනයි. විපක්ෂයට තුන් දෙනයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහොම හරි ගරු සභාපතිතුමා කොළේ දුන්නේ,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ තුන් දෙනෙක්ගේ නාම ලේඛනය මට හම්බ වුණා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

0000

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පක්ෂයේ අඩුපාඩු මෙහේ තියාගන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

08.30 ට ඇතුළේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අපේ කොඩි අපට ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට කථා කරන්න බැහැ ගරු සභාපතිතුමනි. තවත් මන්ත්‍රීවරයෙක් ඉන්න කොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතුමා වාඩි වෙන්න ඕනෑ, මම කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. දෙන්නම වාඩි වෙන්න කෝ.

0000

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, කොමියුනිට්ස් අය නොමිනිස් කථා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා කථා කරනවා. පොඩ්ඩක් ඉන්න කෝ. හරි. හරි. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමා 1993 ඉඳලා මේ ගරු සභාව නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු ඇමැතිතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක තමයි මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න කෝ ඉතින්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක නිසාවෙන් ඔබතුමා නියෝජ්‍ය සභාපති, සභාපති විධියට ඉතාම ගෞරවාන්විතව කටයුතු ඉෂ්ට කරන කෙනෙක්. ඒ ගැන මගේ ස්තුතිය. හැබැයි, මේ රීති සංග්‍රහය හරියට අපි අනුගමනය නොකරන නිසාවෙන් මේ ගරු මන්ත්‍රීතුමන්ලා තම තමන්ට ඕනෑ රීති කඩ කිරීම් සහ වෙනත් අලුත් අලුත් දේවල් මේ සභාවට ගෙනැල්ලා දානවා. මේ සැරේ අලුත් රීති සංග්‍රහයක් හැදුවා. මේක පන්තියක් පවත්වලා හරි මේක පවත්වාගෙන යන්න. නැත්නම් මේ සභාව එක එක විධියට, එක එක්කෙනාට ඕනෑ විධියට පාලනය වෙනවා. ඒ නිසාවෙන් මේක ප්‍රශ්නයක්. මම ඔබතුමාගේ යටතේ නියෝජ්‍ය සභාපති

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

හැටියට ඔතැන සිටියා. ඒ නිසාවෙන් ඉදිරියේදී මගේ ඉල්ලීම කාර්යපටිපාටි රීති සංග්‍රහය යටතේ මේ සභාව හසුරුවන්න කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක එක්කෙනාට ඕනෑ විධියට අයිතිවාසිකම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. දැන් මේක ඇති. ඔබතුමියත් කාරක සභාවේ ඉන්නවා නේ? (බාධා කිරීමක්) දෙනවා නේ මම. නොදී ඉන්නේ නැහැ නේ. ඔබතුමන්ලා ඉල්ලුවොත් මම දීලා තිබෙනවා. එතුමාට අවස්ථාව දෙන්න තිබුණා. මම දන්නේ නැහැ. එතුමා මට බොරුවක් කිව්වා. දැන් හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පක්ෂයේ වැරැදි මෙතැන හදන්න බැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට සහ ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන් මම තේ බොනවා ඇස් දෙකෙන් දැක්කා. ඒ වෙලාවේ උදේ. එතකොට මෙතුමා එක්ක ලිෆ්ට් එකේ ආවා කියලා තමයි මෙතුමා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් ඒ ප්‍රශ්නය ඉවරයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ විධියේ වැඩ කරන එක වැරැදියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද මම කථා කරන්න යන්නේ 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ ආණ්ඩු පක්ෂයේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ගණපූරණය නැහැ. මේ සභාවේ ගණපූරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung, Later, a Quorum being present.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා දැන් කථා කරන්න. ගණපූරණය සම්පූර්ණයි. ඉක්මණට කථා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා එතුමාට කථා කරන්න අවස්ථාව දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක එහෙමනම් මේකේ පූර්වාදර්ශයක් විධියට තියාගන්න කියන ඉල්ලීම මම ගෞරවයෙන් කරනවා. මේ අද කරන සිදුවීම පූර්වාදර්ශයක් විධියට තියාගන්න. මේක වැරැදි වැඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැරැදි වැඩේ තමුන්නාන්සේ හරි කරනවා. ඒ හරි එක පූර්වාදර්ශයක් විධියට තියාගන්න කියන කාරුණික ඉල්ලීම කරනවා, තමුන්නාන්සේගෙන්. අන්තිම වැරැදි වැඩක් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බොරුවට නේ කථා කරන්නේ. ඔබතුමා ඉල්ලීම් කළේ නැහැ නේ? ඔබතුමාගේ විපක්ෂයේ සංවිධායකතුමා මට මොකුත් එව්වේ නැහැ නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කථා කරලා උදේ ජෝර්ජ් සංවිධායකතුමාගෙන් ඇහුවා. අහපුවාම කිව්වා, මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කොළේ මට දෙන්න කෝ. ඔබතුමා ඉල්ලීම කළ කොළේ මට දැන් දෙන්න කෝ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලියන්න ඉස්සෙල්ලා ඇහුවේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා ඉල්ලීමක් කළා. එතකොට මෙතුමා ඇවිල්ලා තිබුණේ නැහැ. එතුමා ඉල්ලීම කරලා තිබුණා. මෙතැන නීතියේ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු සභාපතිතුමා. පිළිගන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මෙතැන රීතියේ ප්‍රශ්නයක්. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා බොහොම හොඳයි. මට දවසක් විනාඩි දෙකක් පරක්කු වෙලා, ඔබතුමා මට කථාව දුන්නේ නැහැ. අභ්‍යන්තර ගැටලුවක් නේ මේකට ගේන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට ආව ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරලා ඉවර කරන්න. අනවශ්‍ය ප්‍රශ්න සභාවේ ඇති කරන්න එපා. ඔබතුමා කථා කරන්න. ඔබතුමා මේ සභාවට මහ කරදරයක් වෙලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේක මෙහෙම කරන්න දෙන්න බැහැ. ගරු සභාපතිතුමා, මේ වැරැදි පූර්වාදර්ශයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

2015 ජනවාරි 08 වැනිදාට පෙර තිබුණු ආණ්ඩුව, මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව. මේ අපි ඔක්කොම පත් වුණු ආණ්ඩුව. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බලය හදපු මේ පළාත් සභාව මේ ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ ලේකම් හැටියට ඉඳලා අපේ පක්ෂයේ ලේකම් කමෙන් අස් වෙලා එක්සත් ජාතික පක්ෂයට ගිහිල්ලා එක්සත් ජාතික සන්ධානයෙන් තරග කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා අනවශ්‍ය ඒවා කියන්නේ. ඔබතුමා මට මේ මොනවද ලියලා එවලා තිබෙන්නේ. වර්තමාන දේශපාලන තත්ත්වය.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දේශපාලන තත්ත්වය තමයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා, විකාර කථා කරන්න එපා. කොළේ තිබෙන එක කථා කරන්න. මාතෘකාවට.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ආණ්ඩු අරගෙන අවුරුදු තුනක් යන කොට මේ රටේ මහා භාණ්ඩාගාරය ගත්තාම මේ තිබෙන බැඳුම්කර වංචාව. කෝටි 11,145 යි. මේ පත්තරේ. මේ පත්තරේ කෝටි 11,400 යි. එතකොට දැන් මේ රටේ නැති කෙනෙක්, මේ රටේ පුරවැසිභාවයක් නැති කෙනෙක් මේ රටේ මහ බැංකු අධිපතිවරයා ලෙස පත් කරලා, මේ රටේ මුදල් ඇමැතිවරයා ලෙස රවී කරුණානායකව පත් කරලා එයා යටතේ හිටපු අර්ජුන මහේන්ද්‍රන්ව ඒ අපේ මහ බැංකු අධිපතිවරයා ලෙස පත් කරලා, මේ රටේ කෝටි ගණනක් කාලා මේ වන විට අපේ තේ ටිකට, පොල් ටිකට, රබර් ටිකට, කුරුඳු ටිකට ඒ වාගේම මේ රටේ තිබෙන රැකි රක්ෂාවලට, මේ රටේ තිබෙන ආර්ථිකයට මේ සියල්ලක්ම ගොවියාට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැවත වතාවක් මේ සභාවේ ගණපූරණය නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ සියලුදෙනාටම අද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ ගණපූරණය නැති නිසා කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රවී කරුණානායක අත්සන් කරපු, හොර මුදල් ඇමැති හැටියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගණපූරණය නැහැ. වාඩි වෙන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum being present.*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නෝට්ටු ටික තහනම් කරලා මේ රටට අලුත් නෝට්ටු ටිකක් ගහලා මේ යහපාලනය පරාජය කරන අවුරුද්දට ඔබ සැම සහාය දෙන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා සභා ගර්භයේ පොඩ්ඩක් අසුන් ගන්න. එහේ මෙහේ යන්න එපා. කරුණාකරලා අසුන් ගන්න. මේක ඉක්මණට ඉවර කරන්න. හරි. අපි ආපසු න්‍යාය පත්‍රයට යමු.

පොදු කටයුතු. සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාට අවස්ථාව, බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය ඉදිරිපත් කරන්න.

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්යපටිපාටි රීති
NEW RULES OF PROCEDURE OF WESTERN PROVICE PROVINCIAL COUNCIL

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *“2017.11.07 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට පිළිගන්වන ලද බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්යපටිපටි රීති සංග්‍රහය - කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර අනුමත කළ යුතුය.”*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ සෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕවා මොකුත් හැන්සාඩ් දාන්නේ නැහැ. ඔක්කොම අයින් කරනවා. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. සභා කටයුතු ගරු ඇමැතිතුමා ඉදිරිපත් කළා, 2017 – (බාධා කිරීම්) මේක ඉවර කරගන්න විනාඩි 05 ක් දෙන්න. 2017.11.07 වන දින මෙම බස්නාහිර පළාත් සභාවට පිළිගන්වන ලද බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්යපටිපාටි රීති සංග්‍රහය කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර අනුමත කළ යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී සභාවේ විවාදයට පත් කළා. කරුණාකර ඔබතුමන්ලා වාඩි වෙන්න කෝ. ගරු ඇමැතිතුමා, එන්න කෝ. ඉවරයක් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අර බලන්න කෝ හැසිරෙන හැටි. චින්පන්චියා වාගේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දෙවැනි සැරේටත් ගිරවා හොරා කන්න ගිහිල්ලා. දැන් වෙන බෙල්ට් එකක් බඳින්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මම ඒ අවස්ථාවේදී -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒවා අපි-

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර එළියට යන්න. මට මේ වැඩේ කරගන්න දීලා. බාධා කිරීම් කරන්න එපා. ආපු වෙලාවේ ඉඳන් බාධා කිරීම්. අපු වෙලාවේ ඉඳන් ඔබතුමා මාව අමාරුවේ දානවා. 08.30 ට ආවලු.

[සභාවේ සෝෂා]

එම කාර්ය පටිපටි රීති සංග්‍රහය පිළිබඳ සාකච්ඡාවේදී 13 වැනි රීතිය සම්බන්ධව ජනතා විමුක්ති පෙරමුණේ අපේ ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රීතුමා විරෝධයක් ඉදිරිපත් කළා. එතුමා විරෝධයක් ඉල්ලුවා. සභාවේ දැනගැනීම පිණිස මම ඒ ටික පොඩ්ඩක් කියවන්නම්.

13 රීතිය. එහි 13(1), (2), (3) හා (4) රීතීන් පිළිබඳව සභාවේ එකඟතාවය ලබා ගැනීමට සිදුව ඇත. 2017.11.14 දින පැවති පළාත් සභා රැස්වීමේදී රීති සංශෝධන සලකා බැලීමේදී 13 වන රීතිය පිළිබඳව ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා සිය විරෝධය පළ කරමින් අදහස් දැක්වූ අතර, පසුව එම රීතිය පිළිබඳ එකඟතාවය විමසන අවස්ථාවේදීත්, රීති කෙටුම්පත පිළිබඳව එකඟතාවය එකවර

[ගරු සභාපතිතුමා]

විමසන අවස්ථාවේදීත් එකී 13 රීතියට එනම්, සභානායක ධූරය, විපක්ෂ නායක ධූරය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධූරය හා විපක්ෂයේ ප්‍රධාන සංවිධාක ධූරය සම්බන්ධ රීතිවලට පමණක් එකඟ නොවන බැවින්, ඒ සම්බන්ධයෙන් පමණක් බෙදීමක් ඉල්ලා සිටින ලදී. කෙසේ නමුත් ඒ සම්බන්ධයෙන් සභාවේ එකඟතාව විමසීමක් සිදු නොවූ අතර, ඒ අවස්ථාවේ අපි එකඟතාවය ඇහුවේ නැහැ. සමස්ත රීති ඇතුළත් කෙටුම්පත පිළිබඳව සභාවේ එකඟතාව විමසීමේදීත් නැවත වරක් එකී රීතීන් පිළිබඳ සිය විරෝධය සටහන් කර තබන ලෙස පැවසුවද 13 වන රීතීන් සම්බන්ධව කටයුතු අසම්පූර්ණව පවතින බැවින්, රීති සම්මත කිරීමේදී ඒක අපට ප්‍රශ්නයක්. ඒ පිළිබඳ සභාවේ යළි එකඟතාවය විමසීම අවශ්‍ය බව පෙනී ගියා. ඒ පිළිබඳව සභා කටයුතු කාරක සභාවේදී එතුමා ආයෙත් ප්‍රශ්න කළා. 2017.12.20 සභා කටයුතු කාරක සභාවේදී. ඒ නිසා අපි තීරණය කළා, නැවත වරක් මේ පිළිබඳව සලකා බැලීම සඳහා කාර්ය පටිපාටි රීති පුස්තක මාලාව සභාවට ඉදිරිපත් කරලා මේ සභාවේ මතය විමසන්න. 2017.11.14 දින විවාදයේදී ගරු මන්ත්‍රීවරුන් 13 රීතියට හැර අනෙකුත් සියලුම රීතීන්ට එකඟතාවය පළ කර තිබුණා. ඒ සම්බන්ධයෙන් එනම්, 13 රීතිය හැර අනෙකුත් රීතීන් සඳහා ගරු මන්ත්‍රීවරුන් එකඟයිනේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගෙන් යළිත් වරක් මම විමසා සිටිනවා, 13 රීතිය සම්බන්ධයෙන් ඔබතුමාගේ විරෝධයක් තිබෙනවාද? මේ විධියට අපි සම්මත කරමුද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම මේ සම්බන්ධව ඒ සාකච්ඡාවේදීත් මතු කළා. ඒ නිසා ඒ ධූරධාරීන් කියන ඒ කොටසට අපේ එකඟතාවයක් නැහැ. ඒ නිසා ඒ කොටසට අපේ බෙදීමක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එහෙමනම් අපි ඡන්දයකට යමු. ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපිත් කිව්වා අර සභාපතිට, උප සභාපතිට විශ්වාසභංගය දාන්න තිබෙන එක කෙරෙන්නත් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක දාලා තිබෙන්නේ. කරුණාකර සීනුව නාද කරන්න. බෙදීමක් ඉල්ලුවා. එතුමන්ගේ මතය නේ ඒක. එතුමන්ලාගේ අදහස ඒකයි.

***ඊට අනුකූලව යෝජිත කාර්ය පටිපාටි රීති මාලා පුස්තකයේ 13 රීතිය පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පළාත් සභාව පක්ෂව 35 යි, විරුද්ධව 04 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put on Rule No. 13 of proposed Rules of prodecure, the Provincial Council had a division of 35 in favour of 04 opposed and 00 declined.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව 13 වන රීතිය සම්බන්ධයෙන් මෙම සභාවේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා බෙදීමක් ඉල්ලූ බැවින් ඒ සඳහා සභාවේ එකඟතාවය විමසීමේදී, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධූරය, සභා නායක ධූරය, විපක්ෂ නායක ධූරය, ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධූරය යන ධූරධාරීන් සම්බන්ධව එම රීතිවලට ඇතුළත් කිරීම පිළිබඳව කැමැත්ත ප්‍රකාශ කිරීමේදී එම ධූරයන් හතර එම රීතිවලට ඇතුළත් කළ යුතුයි කියන ඒ යෝජනාවට ඡන්ද 35 ක් ප්‍රකාශ කර තිබෙනවා. ඇතුළත් කළ යුතු නැත කියලා විපක්ෂව ඡන්ද 04 ක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව එම රීතිය ඇතුළත් කරන අතර, 13 වන රීතිය හැර කාර්ය පටිපාටි රීති පුස්තකයේ අනෙකුත් සියලුම රීතීන් බෙදීමකින් තොරව සභා සම්මත වූ බවත් මීට පෙර ඡන්ද විමසීමේදී 13 වන රීතියද වැඩි වැඩි ඡන්ද 31 කින් සභා සම්මත වූ බැවින් අද දින ඉදිරිපත් වූ කාර්ය පටිපාටි රීති පුස්තක මාලාව[1] සභා

[1] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

සම්මත වූ බව මේ අවස්ථාවේ මම ප්‍රකාශ කර සිටින අතර, ඉදිරියේදී සියලු සංශෝධන ඇතුළත් නව කාර්ය පටිපාටි රීති පුස්තකය ගරු මන්ත්‍රීවරුන් හට ලබා දීමට කටයුතු කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. මේ ඡන්ද වකවානුවක් තිබෙන්නේ. මේ මාසේ පළාත් සභා රැස්වීම නොතියා 10 වැනිදායින් පස්සේ තියමු. අපි කවුරුත් කාර්ය බහුල පුද්ගලයෝ. එම නිසා එම අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක මගේ අදහස. සභා දෙකක් කල් දාන එක එච්චර සාධාරණත්වයක් නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සභාව තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා ජනවාරි මාසයේ සභාව අපි තියමු.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එකඟතාවය මම සභාවෙන් ඉල්ලන්නේ. අද සභාව තියලා කල් තියමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා, අපි ජනවාරි එකත් තියමු. පෙබරවාරි එක අපි කල් දාමු. මුල එක. ඒක සාධාරණයි. අපි කවුරුත් ඡන්දය ඉල්ලන්නේ නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනවාරි අග තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අග තියමු. ඒක අපි තියමු. පෙබරවාරි මුල එක අපි කල් දාමු. ඒසම්බන්ධයෙන් සභාව එකඟයි නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ ප්‍රශ්නයට අපි මොකද කරන්නේ? න්‍යාය පත්‍රයේ යෝජනා දෙකක් තිබෙනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අපි ගමු. ඒක අරන් ඉවර කරලා දාමු. මොකද, කැමත් ලැහැස්තියි නේ. නැත්නම් අපරාදේ. ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. සමාවෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, යෝජනාව ඉදිරිපත් කරන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ඉඩකඩ ලබා දීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

"*බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක 2 ට අයත් ප්‍රදේශයක පිහිටා ඇති බොල්ගොඩ ගඟ ලෙසත්, වැව ලෙසත් හඳුනන තෙත් බිම් පද්ධතිය පළාතේ සංවර්ධනයට යොදා ගත හැකි වටිනා සම්පතකි. ආර්ථික හා පාරිසරික වටිනාකමක් ඇති මෙම තෙත් බිම් පද්ධතිය වර්තමානය වන විට නොයෙක් විනාශයන්ට ගොදුරු වූ මානව සංවර්ධනයට සම්බන්ධ නොවන කිසිදු පරිපාලන ආයතනයක සෘජු සංවර්ධනයකට දායක නොවුණු අත්හැර දමන ලද සම්පතක් බවට පත් වී ඇත. මිරිදිය ධීවර කර්මාන්තය, පළාත් සංචාරක ව්‍යාපාරය, භාණ්ඩ ප්‍රවාහනය, තෙත් බිම් ආශ්‍රිත ඖෂධීය හා කෘෂි ආර්ථික තත්ත්වයන් පෝෂණය කර ගැනීම යනාදී වටිනා සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි මෙම පරිසර පද්ධතිය පිළිබඳව පුළුල් විද්‍යාත්මක සමීක්ෂණයකින් පසුව පරිපාලන ආයතන ඒකාබද්ධ කරගත් බොල්ගොඩ තේ බිම් පද්ධතිය උදෙසා සංවර්ධන වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි*" මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.04 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සාකච්ඡාව මම විශ්වාස කරන්නේ, මෙම බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ප්‍රාදේශීය සභා, නගර සභාවලත්, ඒ වාගේම මේ පළාත් සභාවේත් මට දැනගන්න ලැබුණු හැටියට මීට කාලයකට පෙර ගරු මන්ත්‍රීවරයෙක් මේ සම්බන්ධව මේ පළාත් සභාවේ සාකච්ඡා කරලා තිබෙනවා. නමුත් මේ මොහොත වන විට මේ තෙත් බිම් පද්ධතිය ඇත්තටම ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේක ඇත්තටම රටේ සංවර්ධනය සම්බන්ධව කවුරු හරි හිතනවා නම්, සංවර්ධන වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා තිබෙනවා නම් අන්න ඒ සංවර්ධන වැඩ පිළිවෙළට ඇතුළත් වෙලා මේ කියන ආකාරයට මේ සියලුම ආයතන, ඒ කියන්නේ මධ්‍යම ආණ්ඩුව මේකට සම්බන්ධ වෙන්න ඕනෑ. මධ්‍යම ආණ්ඩුවේ ආයතන ටික මේකට සම්බන්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම පළාත් සභාවේ වගකීමක් තිබෙනවා. පළාත් සභාවේ ආයතන මේකට සම්බන්ධව තිබෙනවා. ඒ වාගේම නගර සභා, ප්‍රාදේශීය සභා විශාල ගණනාවක් මේකට අයිතියි. බොරලැස්ගමුව නගර සභාව. කැස්බෑව නගර සභාව. ඒ වාගේම මොරටුව මහ නගර සභාව. දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව. පානදුර නගර සභාව ආදී විශාල භූමි ප්‍රදේශයක, වපසරියක මේ තෙත් බිම් පද්ධතිය පිහිටලා තිබෙනවා.

ඒ වාගේම එකක් තමයි, ඉතිහාසයේ ඉඳන්ම විශේෂයෙන්ම කැලණිය ප්‍රදේශයේ සිට මේ කළුතර දක්වාත්, කළුතර සිට කැලණිය ප්‍රදේශය දක්වාත් භාණ්ඩ ප්‍රවාහනයේදී යොදාගත් පද්ධතියක් තමයි මේ බොල්ගොඩ ගඟ කියලා කියන්නේ. එහෙම නැත්නම් බොල්ගොඩ වැව ආශ්‍රිතව වෙරළ ගඟත් කියලා අපි ඒ කොටසට හඳුන්වලා මෙන්න මේ ආශ්‍රිත කොටස. නමුත් අද මෙපමණ මේ රටේ එක පැත්තකින් ප්‍රවාහන ප්‍රශ්නය උග්‍ර අර්බුදයකට පත් වෙලා තිබෙද්දී, ප්‍රවාහන පද්ධතිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය තත්ත්වයක් රට තුළ නිර්මාණය වෙලා තිබෙද්දී, තවමත් අපේ කිසිම ආයතනයක්, පරිපාලන ව්‍යූහයක් අවශ්‍ය මට්ටමින් මේ සඳහා මැදිහත් වෙලා නැහැ. ඒ නිසා එක පැත්තකින් බැලුවොත් එහෙම, මේක මහා විනාශයක්. මේකට මේ එකතු කරගත යුතු කොටසක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙරළ ගඟ ආශ්‍රිතව තිබෙන අත්තිඩිය කුරුළු අභය භූමියත් එක්ක තිබෙන අන්න ඒ තෙත් බිම් පද්ධතියත් මේකට අදාළ ප්‍රදේශයක් හැටියට තිබෙනවා. 1990 ජූලි 25 වැනිදා මේක අභය භූමියක් හැටියට, මේ පද්ධතියට අදාළ එකක් හැටියට මේ වෙරළ ගඟ, එහෙම නැත්නම් බොල්ගොඩ අයිති කොටසක් හැටියට ප්‍රකාශයට පත් කරලා, ඒක රජයට පවරා ගැනීම සඳහා කටයුතු කරලා තිබෙනවා. නමුත් ඒකට අවශ්‍ය ඒ ගැසට්

එක නිකුත් කළාට අවශ්‍ය දේ හරියටම ඉෂ්ට වෙලා නැහැ. ඒ වාගේම තමයි ඔය කියන කොටසේ විශාල කොටසක් වෙල් යාය හැටියට තිබුණු ප්‍රදේශයක්. ඒ වෙල් යාය තමයි පසුව තෙත් බිමක් බවට පත් වෙලා තිබෙන්නේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු මන්ත්‍රීතුමා, අත්තිඩිය බෙල්ලන්විල අභය භූමිය කියලා නම් කරලා තිබුණාට මේ වන කොට විනාශ වෙලා තිබෙනවා. මම මේ මොරිස් විජේරත්න මන්ත්‍රීතුමා කථා කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැඟිටලා කථා කරන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට ඇහෙන්නේ නැහැ. ඒකයි, මම මේ බලනවා හතර වටේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අලුත් සම්ප්‍රදායන් පුරුදු කරන්න එපා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අලුත් සම්ප්‍රදායක් නොවෙයි. එතුමාට මම මතක් කරන්න මම කථා කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. වාදයක් එපා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ඔබතුමාගේ පාඩුවේ ඔබතුමා ඉන්න. ඔබතුමා නොවෙයි නේ සභාව මෙහෙය වන්නේ. ගරු මන්ත්‍රීතුමාගේ කථාවට යමක් එකතු කරන්න කථා කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙයක් පෙන්වා දුන්නාට කමක් නැහැ. වාදයක් යන්න බැහැ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මිනිස් ක්‍රියාකාරකම් බෙල්ලන්විල වැඩි වෙලා තිබෙනවා. ඒකත් සඳහන් කරන්න කියනවා. වාඩි වෙලා කථා කළේ ඒකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මෙතුමා කවුද සභාව පාලනය කරන්න. මෙතුමාද සභාව පාලනය කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

සභාව පාලනය කරනවා නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක නිසා ඔය ගොවිජන සේවා පනතට අනුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වගා නොකර කොටසක් අත්හැර දාලා තිබෙනවා නම්, ඒක අනිවාර්යයෙන්ම වගුරු බිමක් බවට මේකේ පත් වෙනවා. ඇත්තටම ගොවිජන සේවා පනතට අනුවම ඒක සඳහන් වෙනවා. සමහර ව්‍යාපාර කොටස්, ඒගොල්ලෝ ඒ විරෝධතා ඉදිරිපත් කිරීම නිසා මේකේ භුක්තිය භාර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා කියන එක තමයි මේකේ දැනගන්නට ලැබිලා තිබෙන්නේ. මෙතුමා කියන එක හරි.

0000

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

විශාල ප්‍රමාණයක් ගොඩකිරීම්වලට ලක් වුණා. නේද? ඔය තෙත් බිම් පද්ධතිය. ඒ වාගේම ජාත්‍යන්තර සම්මුතියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රැම්සා සම්මුතිය කියලා. මෙන්න මේ රැම්සා සම්මුතියට අයත් බිමක් එක්ක තමයි අත්තිඩිය ඔය කුරුළු අභය භූමියත් එක්ක තිබෙන මේ කොටස නම් කරලා තිබෙන්නේ. ඒ රැම්සා සම්මුතියෙන් තමයි ඇත්තටම මේ බිම හඳුනාගෙන තිබෙන්නේ. ජාත්‍යන්තරව මේ බිම හඳුනාගෙන තිබෙනවා. ජාත්‍යන්තර ඇහැ මේ බිම සම්බන්ධව තිබෙනවා. ඒකට හේතුව තමයි සංචාරක පක්ෂීන්ගේ වාසස්ථානයක් විධියට, ඒ කියන්නේ ජලාශ්‍රිත සංචාරක පක්ෂීන්ගේ වාසස්ථානයක් හැටියට තමයි හඳුනාගෙන තිබෙන්නේ. දේශීය ජලාශ්‍රිත පක්ෂීන් වාගේම සංචාරක ජලාශ්‍රිත පක්ෂීන්ගේ වාසස්ථානයක්. ඇත්තටම ලෝකයේ මේ වාගේ ස්ථාන දුර්ලභයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ වාගේ ස්ථාන අඩුයි. ඒ නිසා තමයි ඔය රැම්සා සම්මුතියෙන් මේකට විශේෂ අවධානයක් යොමු කරලා තිබෙන්නේ. ඒක නිසා අපි රටක් හැටියට මේක රැක ගත යුතු, මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු ඇත්තටම පරිසර පද්ධතියක්. නමුත් කනගාටුදායක තත්ත්වයකින් තමයි අද ඒ පරිසර පද්ධතිය, අර කියන විධියට මේ විනාශ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. දැන් මේ මොහොත වන විට මේ කොටසේ ආක්‍රමණික ශාක පිරිලා තිබෙනවා. ඒ ආක්‍රමණික ශාක හරහා මේ කොටස පිරිහීමට ලක් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මේ අභය භූමිය මැද්දෙන් තමයි වේරුස් ගඟ ගලාගෙන යන්නේ. මේක පෝෂණය කරන ඇළ මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ඇළ මාර්ග අතර තිබෙනවා, කටු ඇළ කියන ඇළ මාර්ගය. කටු ඇළ අර වේරුස් ගඟ ව්‍යාපෘතියට අදාළව දැනට ඔය සංවර්ධන කටයුතු සඳහා දාගෙන තිබෙනවා. මේ දියවන්නා ඔයේ සිටම. මේ ප්‍රදේශයේ සිටම ඔය කටු ඇළ අයිති දැනට යම් කොටසක් මේකේ කටු ඇළ සංවර්ධනයක් මේ මොහොතේ තිබෙනවා. ඒ වාගේම මම ජීවත්වන ප්‍රදේශය, බෝකුන්දර කියන ප්‍රදේශයේ ඒ හරහා මහ ඇළක් යනවා. මේ ප්‍රදේශවල සියලුම ජල මාර්ග හැදිලා තිබෙන්නේ ඒ මහ ඇළ හරහා. ඒ මහ ඇල මේ වේරුස් ගඟට යන්නේ. ඒ නිසා මහ ඇළ මේකට විශාල සම්බන්ධයක් තිබෙනවා. නමුත් අදාළ බලධාරීන් මෙම පරිසර පද්ධතිය සංරක්ෂණයට උනන්දුවක් දක්වන්නේ නැහැ.

0000

ඇත්තටම මෙහෙමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර තැන්වල දැන් ඔය වනජීවී කලාපයක් හැටියට නම් කළාට පස්සේ, ස්වාභාවිකව ඒ කියන්නේ, ඒක ගොඩබිමක් නම්. ඒ කියන්නේ ජලාශ්‍රිත ප්‍රදේශයක් නොවෙයි නම්, ඒ ගොඩබිම ඇතුළේ මිනිස්සුන්ට ජීවත් වීමේ අයිතියක් තිබෙනවා. ඒක තහවුරු කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය එහෙම නොවෙයි තිබෙන්නේ. අර විශාල ව්‍යාපාර - දැන් උදාහරණයක් හැටියට කිව්වොත් එහෙම බෙල්ලන්විල ඔය දැන් හදලා තිබෙන මංතීරු සඳහා. ඔය මැද්දේ විශාල කන්ටේනර් යාඩ් එකක් තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. ඒ කන්ටේනර් යාඩ් එක අයින් කරලා තමයි ඒ වැව කොටස නිර්මාණය කළේ. වැඩේ තිබෙන්නේ, ඒ කන්ටේනර් යාඩ් එක ගිහිල්ලා දැම්මේ අර කුරුළු අභය භූමියට. ඒ කන්ටේනර් යාඩ් එක දාගන්න ඉඩකඩ දුන්නා. ඇත්තටම අර අටුව කඩලා පුටුව හදනවා වාගේ වැඩ කරලා තිබෙන්නේ. ඒක මහා අපරාධයක්. අන්න ඒ වාගේ ආයතනවලට මේකට ඉඩකඩ දීලා තිබෙනවා. මේකට ඉඩකඩ දීලා තිබෙන්නේ කවුරුවක්වත් නොවෙයි, බලධාරීන්. ඒක නිසා මේකෙන් අපට පේනවා, මේවා සංරක්ෂණය කර ගැනීම සඳහා මේ බලධාරීන්ට ඇත්තටම උවමනාවක් මේ සම්බන්ධයෙන් තිබිලා නැහැ. මේකේ මුල්ම අවස්ථාවේ මේ කොටස ප්‍රකාශයට පත් කරන කොට හෙක්ටයාර් 372 ක් තිබිලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේකෙන් භාගයක්වත් අද ඒ කොටසට අයිති නැහැ. ඒ දේවල් අහිමි වෙලා තිබෙන්නේ. ඒ වාගේම අද ටිකක් හරි මේ ටික විධියට බේරිලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රත්මලාන ගුවන් සමාගම අධි ආරක්ෂිත කලාපයක් නිසා, ඒ කොටස මේකේ බේරිලා තිබෙනවා.

ඒ වාගේම ලොකු දුක්ගැනවිල්ලක් තිබෙනවා, කොළඹ ආශ්‍රිත ප්‍රදේශවල. විශේෂයෙන්ම අපි ජීවත්වන ආසනවල වඳුරු උවදුරක් තිබෙනවා. ගොවියෙකුට කෙසෙල් කැනක් තියා ගන්න විධියක් නැහැ. වගාවක් කර ගන්න විධියක් නැහැ. විශාල වශයෙන් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට හේතුව, මේක වඳුරන්ගේ වැරැද්දක් නොවෙයි. මේකට විශේෂ හේතුව තමයි, ඒ ප්‍රදේශයේ වඳුර උවදුර වැඩිවීමට හේතුව වෙලා තිබෙන්නේ, ඇත්තටම ඒ ප්‍රදේශවල සාමාන්‍යයෙන් විශාල ඉඩම් තිබුණා. දැන් ඒ ඉඩම් එකක්වත් නැහැ. ඒ නිසා වඳුරන්ට ජීවත් වෙන්න තැනක් නැහැ. මේක අර අලි ප්‍රශ්නය වාගේ තමයි.

අලියාගේ වාසස්ථාන ගිහින් මිනිස්සු අයිති කර ගත්තාට පස්සේ, - ඒ අලියාගේ වාසස්ථානය. ඒ වාගේම තමයි මේ වඳුරන්ට තිබුණු කොටස්. රජයනේ තිබුණෙ', ඇත්තටම රජයක් වුණාට පස්සේ, ආණ්ඩුවක් වුණාට පස්සේ තව අවුරුදු 20 කට, 25 කට සැලසුම් හදන්න ඕනෑ. ඒ නිසා ඒ ආශ්‍රිතව ජීවත් වුණු වන සතුන්ට ජීවත්වීම සඳහා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කොළඹ දිස්ත්‍රික්කයේ තමයි. නමුත් කොළඹ දිස්ත්‍රික්කයේත් මේ ස්වභාවය තිබෙනවා. ඒ නිසා යම් ඉඩ කොටසක් අපට නීත්‍යානුකූලව වෙන් කරන්න තිබුණා. මේ ඉඩම්වලින් කොටසක් ඒ වන සතුන්ටත් ජීවත් වෙන්න වෙන් කරන්න තිබුණා. වඳුරන්ට ජීවත් වෙන්න. එහෙම වුණා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වඳුරු උවදුරක් කියලා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ නිසා වඳුරත් ජීවත් වෙනවා. අපිත් ජීවත් වෙනවා. වඳුරත් ජීවත් වෙන්න ඕනෑ. අපි ජීවත් වෙන්න ඕනෑ. පරිසරය හැදිලා තිබෙන්නේ එහෙමයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

එකවගේ නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. එක වාගේ කියලා කියන්නත් පුළුවන්. ඉතිහාසයක් තිබෙනවා. එතැනට යන්න පරිණාම වාදය ගැන කථා කරන්න ඕනෑ. ඒක නිසා ඒවා ගැන සැලසුමක් අපට නැතිවීම නිසා තමයි මේ ප්‍රශ්න මතු වෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තෙත් බිම් ආශ්‍රිතව මේ බොල්ගොඩ ගඟ අද අපි රැක ගන්න කටයුතු නොකළොත් ඉදිරි අනාගතයේ තව අවුරුදු 10 ක්, 15 ක් යන කොට ඉදිරි පරම්පරාවට මේවා තමයි අපේ රටේ දැවැන්ත ප්‍රශ්න බවට පත් වෙන්නේ. ඒක නිසා මෙක ඇත්තටම බරපතළ ප්‍රශ්නයක්. ඒකයි මේ කියන්නේ. මේ යෝජනාව ඇත්තටම ගෙනැල්ලා තිබෙන්නේ මේක සාකච්ඡා කරලා මගේ හිත සතුටු කරගෙන මෙතැනින්, මේක මම සාකච්ඡා කළා කියන්න නොවෙයි. මේකට අවශ්‍ය පියවර ගන්න ඕනෑ. විශේෂයෙන්ම පළාත් සභාවේ මේක සාකච්ඡා කරනවා කියලා කියන්නේ මේක සම්බන්ධයෙන් ඇත්තටම අපේ අදාළ ආයතන, මේ නිලධාරීන්, මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ඉස්සරහාට අරගෙන යන්න ඕනෑ. මම හිතන්නේ ගරු ඇමැතිවරුන්ට ඒ අවශ්‍ය මගපෙන්වීම කරන්න ඕනෑ. ඒක මේ පළාත් සභාවෙන් කළ යුතු කාර්යයක්. ඒක නිසා ඒ උවමනාවෙන් තමයි මේ කරන්නේ.

ඒ වාගේම වඳුරෝ විතරක් නොවෙයි. නයි , පොළොන්ගු, කිඹුලන් අපේ මන්ත්‍රීතුමා දන්නවා. දැන් කිඹුල්ලු ගෙවල්වලට එනවා. නයි, පොළොන්ගු එනවා. ඇයි මොකද? උන්ගේ වාසස්ථානය අත්පත් කරගෙන තිබෙන්නේ. අර බෙල්ලන්විල. උන්ගේ වාසස්ථාන අත්පත් කර ගත්තාට පස්සේ ඇත්තටම උන්ට ඉන්න තැනක් නැහැ. ඒ නිසා ඒ සත්තු දැන් ගෙවල් ළඟට ඇවිල්ලා තිබෙන්නේ. කවුද වගකියන්න ඕනෑ? නයි, පොළොන්ගු, කිඹුලන්ද වග කියන්න ඕනෑ. නේද? වගකියන්න ඕනෑ අපි. මානවයා වග කියන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම ගංගා රක්ෂිතය කියලා කියන්නේ කිඹුලන්ගේ සංචරන මාර්ගයක්. අන්න ඒ මාර්ගය උන්ට අහිමි කිරීම නිසා තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ තිබෙන ටික හරි අපි විශ්වාස කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආරක්ෂා කරගත යුතු තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ගංගා රක්ෂිතය බේරාගත යුතුයි. මේ පරිසරය සකස් කොට ඒකේ ජීවීන්ගේ වාසස්ථානය සඳහා කළමනාකරණය කරගන්න දෙන්න පුළුවන් කොටසක් තිබෙනවා. ඉතින් ඒක නිසා විශේෂයෙන්ම මධ්‍යම පරිසර අධිකාරියට මේකේ විශාල වැඩ කොටසක් තිබෙනවා. දැන් අපි දන්නවා. සොබාකෙත කියලා පාසල් ළමුන් වෙනුවෙන් සංචාරකයන් දැනුවත් කිරීමට, දැනුවත් මධ්‍යස්ථානයක් ඔතැන තිබුණා. Visitor Center කියලා. අද මේකට වෙලා තිබෙන දේ. ඒකේ විස්තර මම ළඟ තිබෙනවා. ඇත්තටම මට කාලය මදී. මේ මධ්‍යම පරිසර අධිකාරියෙන් ඒ වාගේ තැන් - ගොඩනැගිලි හදලා නිකන් අයාලේ ගිය තැනක් බවට පත් වෙලා තිබෙනවා. අඩුම ගණනේ වනජීවී දෙපාර්තමේන්තුවට මේක ලබා දෙන්න පුළුවන්. මේවායේ තොරතුරු නැතිව නොවෙයි. මේවා සිතියම්ගත කරලා තිබෙනවා. ඒ විස්තර තිබෙනවා. ඒ වාගේම මේක සම්බන්ධව අදාළ, ඒ ගහපු ගැසට් එක මගේ ළඟ තිබෙනවා. ඒ ගැසට් එක ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ තොරතුරු සියල්ල මගේ ළඟ තිබෙනවා. ඒක නිසා මට ඇත්තටම මේ සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී විශාල සහයෝගයක් අපට ලබා දෙන්න පුළුවන්. ඒ නිසා මේ වේරැස් ගඟ ආශ්‍රිතව ඉදි කිරීම් තවදුරටත් වෙනවා නම් මේ සම්බන්ධව වහාම නතර කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඒ වාගේම දැන් සමහර විසඳුම් ගරු නියෝජ්‍ය සභාපිතතුමනි දීලා තිබෙන්නේ, උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම වේරහැර පාලමක් හැදුවේ මම හිතන්නේ කැලණියේ කොහේ හරි ගලෝපු පාලමක්. ඒ පාලම ගෙනැල්ලා වේරහැර හයි කළා. පාලමෙන් යන්න පුළුවන්. ඒක ඇත්ත. නමුත් ඇත්තටම ගඟ අනුව නොවෙයි පාලම හැදුවේ. පාලමට අනුව ගඟ පටු කළා. මේවා හරි විහිළු වැඩ. ඒකෙන් මොකද වුණේ? පාලමට ගොඩ කරපු නිසා ඒ ආශ්‍රිත ප්‍රදේශය අර අනවසර ඉදි කිරීම් සඳහා ඒ ගොල්ලන්ට උදව්වක් බවට පත් වුණා. ඒ කියන්නේ ඒකට හේතුව තමයි ඒ කටයුතු සිදු කිරීමේදී මේ පරිසර පද්ධතිය සම්බන්ධව හැඟීමකින් නොවෙයි, සමහර දේවල් කරලා තිබෙන්නේ. පාලමක් ඕනෑ. ඒක ඇත්ත. ඒ නිසා එතැනට පරණ පාලමක් ගෙනැල්ලා හයි කළා. ඒකට අනුව ගඟ පටු කළා. ඉතින් මෙන්න මේ තත්ත්වයන් ඇතුළේ විශාල අපරාධයක් තිබෙන්නේ. ඒක නිසා මේක සංචාරක කර්මාන්තය පැත්තෙන්, මිරිදිය ධීවර කර්මාන්තය පැත්තෙන්, ඒ වාගේම ඖෂධීය පැළෑටි ආරක්ෂා කර ගැනීම පැත්තෙන් මින් විශාල පිටුබලයක් ගන්න පුළුවන්. අපි ප්‍රමාද නැහැ. දැනටමත් මේකට අවශ්‍ය, ඒ ගංගා රක්ෂිතයට අවශ්‍ය දේවල් ටික අත්පත් කරගෙන අපි මේ වෙනුවෙන් කටයුතු කළොත් එහෙම මේ ප්‍රදේශ හොඳ සංචාරක පුරවරයක් බවට පත් කරන්න පුළුවන්.

අපි දන්නවා. නුවර එළිය ගියාට පස්සේ අර ග්‍රෙගරි වැව තිබෙන්නේ කොහොමද? එතකොට තමයි තේරෙන්නේ, ඇයි අපට මේ තත්ත්වයට - අපට විදේශ රටවල්වල ගිහිල්ලා මේවා තොරතුරු අරන් එන්න දෙයක් නැහැ. අපේ රටෙන්ම තොරතුරු ගන්න පුළුවන්. අපේ රටේ සමහර තැන් සංවර්ධනය කරගෙන තිබෙන හැටි. අපේ රටේ සමහර තැන් සංචාරක කර්මාන්තයට යොදාගෙන තිබෙන හැටි. ඒ නිසා ඒ අවබෝධය ගත්තත් මේක සංචාරක ව්‍යාපාරය පැත්තෙන්, ඒ වාගේම දේශීය සංචාරකයින්ට හොඳ නිවාඩුවක් ගත කරගන්න ඒ පැත්තෙන් විශාල රටට ආදායමක් උපදවන පැත්තෙන් මේ පරිසර පද්ධතිය යොදා ගන්න පුළුවන්. ඒ නිසා මේ මොන අතින් බැලුවත් මේක රටට ආදායම් උපයන මධ්‍යස්ථානයක් බවට මේ බොල්ගොඩ ගඟ පත් කරගන්න පුළුවන්. අපට කනගාටුව තිබෙන්නේ, මේ සම්බන්ධයෙන් කිසියම් හෝ අපට පෙනෙන වැඩ පිළිවෙළක් මේවා ඇතුළේ නැති එකයි. ඒ නිසා තමයි මේ යෝජනාව කළේ, කාගෙත් අවධානය යොමු කළ යුතු යෝජනාවක් හැටියට. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් මම සම්බන්ධව අහනවා. මේ භූමිය රජය සතුද? මධ්‍යම රජයට. නමුත් අයිතිකාරයෝ ඉන්නවා කියන එක පේනවා. ඊට පස්සේ ආක්‍රමණික ශාක කියන එක ඔබතුමා කියන්නේ එතැනින් ඉවත් කළ යුතුද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ආක්‍රමණික ශාක වැඩි වෙලා තිබෙනවා, මේ නඩත්තු නොකිරීම නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. මීළඟට නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.21 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පළමුකොටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි යෝජනාවක් ගෙන එමින් මේ සභාවේ අවධානය යොමු කිරීම පිළිබඳව. ඒ වාගේම කැස්බෑව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සම සභාපතිවරයා විධියටත්, මමත් සමඟ බොහොම ළඟින් මේ සංවර්ධන කමිටුවේ ක්‍රියාත්මක වන මන්ත්‍රීවරයෙක් විධියට ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් ක්‍රියා කරනවා. පළමුකොට මම මේ සභාවේ දැනුවත් කරන්න කැමැතියි. අවුරුදු තිස් පහක ඉතිහාසයේ කැස්බෑව ප්‍රාදේශීය සංවර්ධන කමිටුව විධියට අපට පුළුවන් වුණා, රාජ්‍ය ආයතන 17 ක් එක තැනකට කැඳවලා මුලින්ම, මේ ගඟේ සීමා ලකුණු කරන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ අනුව පසුගිය කාලයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන දෙපාර්තමේන්තුව, නගර සභා 07 ක්, ප්‍රාදේශීය සභා සහ නගර සභා 06 ක්, මහ නගර සභා 01 ක්, පහත් බිම්, පරිසර අධිකාරිය, මින්න්දෝරු දෙපාර්තමේන්තුව ආදී

මේ සියලු ආයතන එක තැනකට ගෙනැල්ලා බොල්ගොඩ ගඟේ සීමාව ලකුණු කිරීම බණ්ඩාරගම සිට අපට ලකුණු කරන්න පුළුවන් වුණා. අවසානයේදී ඒ ලකුණු කළ මායිම දාගන්න සල්ලි ටිකක් නැති වුණාම, මේ නගර සභාවලින් සල්ලි ඉල්ලලා තමයි සීමා සලකුණු අපට ලකුණු කරන්න සිද්ධ වුණේ. පසුගිය කාලයේ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් පළමුවැනි ප්‍රශ්නය වී තිබෙන්නේ, අද බොල්ගොඩ ගඟ ඩෙංගු බිහි කරන මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තය කෙසේ වෙතත්, විශේෂයෙන්ම කැස්බෑව හා බොරලැස්ගමුව නගර සීමා බල ප්‍රදේශයේත්, මොරටුවේත් මම හිතන්නේ ඩෙංගු ඇති වෙන්න ප්‍රධානම සාධයක් බවට පත් වෙලා තිබෙනවා. මේ බොල්ගොඩ ගඟ ආශ්‍රිතව තිබෙන ටිං, බෙලෙක්ක ආදී ගිහිල්ලා වතුර රැඳිලා ඩෙංගු බෝ වන මධ්‍යස්ථානයක් බවට අද බොල්ගොඩ ගඟ පත් වෙලා තිබෙනවා. ඒ වාගේම සැල්ලීනියා පාසි නිරන්තරයෙන් බැඳීම තුළ, මම දැක්කා මෙවර අයවැයේදී වෙන් කරලා තිබෙනවා. මිලියන 200 ක මුදලක්. මේ බොල්ගොඩ ගඟ ආශ්‍රිත වූ සැල්ලීනියා ඉවත් කිරීම සඳහා නව ව්‍යාපෘතියක් ගෙන එන්න කියලා.

ඒ වාගේම ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල්වලින් සංක්‍රමණික කුරුල්ලන් එන, විශේෂයෙන්ම අත්තිඩිය තෙත් භූමි ඉතාමත් ආකර්ශණීය සංචාරක ව්‍යාපාරයක් සඳහා කරගෙන යන්න පුළුවන්. ඒ වාගේම බොරලැස්ගමුව පී.ටී. ලංකා සෙරමික් ආයතනයේ මැටි සුද්ධාගාරය දැන් එතැන නැහැ. ඒ භූමි භාගයත් තිබෙනවා. එහෙම ගත්තාම ඉතාම විශාල වශයෙන් දේශීය සංචාරක ව්‍යාපාරය විතරක් නොවෙයි. කුරුළු අභය භූමියක් බවට මේ ස්ථානය පත් කිරීමේ හැකියාව තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට අමතරව දේශීය සංචාර ව්‍යාපාරයේ, මම මෙවර අයවැයේදීත් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් යෝජනා කළා. අපේ කැස්බෑව නගර සභාවටත් යෝජනා කරලා තිබෙනවා. හැකි ඉක්මණින්, විශේෂයෙන්ම කොළඹ නගරයේ මාර්ග තදබදයත් එක්ක මේ බොල්ගොඩ ගඟ හරහා මගී ප්‍රවාහන සේවයක් ආරම්භ කිරීමේ හැකියාව තිබෙනවා. ඊට අමතරව බොල්ගොඩ ගඟ හරහා විශේෂයෙන්ම බස්නාහිර පළාත මැදිහත් වෙලා බෝට්ටු ව්‍යාපාරයක් ආරම්භ කරන්න පුළුවන්. ඒ වාගේම දකුණු ආසියානු ක්‍රීඩා තරගාවලි තුනකදී රුවල් ඔරු තරග සඳහා මේ බොල්ගොඩ ගඟ පාවිච්චි කළේ. දේශීය සහ විදේශීය සංචාරක කර්මාන්තයට නව ආකර්ශණීය මුහුණුවරක් මේ බොල්ගොඩ ගඟ හරහා ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙරළ ගඟ ව්‍යාපෘතිය හා බොල්ගොඩ ගඟ බද්ධ වෙලා තිබෙනවා. පසුගිය කාලයේ වෙරළ ගඟ ක්‍රියාත්මක කිරීමේදී මේ වන කොට බොරලැස්ගමුවේ සහ කැස්බෑව නගර සභා බලප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් 860 ක් තිබෙනවා, බොල්ගොඩ ගඟට මායිම් වූ භූමිවල බලහත්කාරයෙන් ඉඩම් ගොඩ කරලා. පසුගිය අවුරුදු 12 පුරා මම මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාව තුළත්, පිටත් විශාල හඬක් නැඟුවා. නාගරික සංවර්ධන අධිකාරියත්, පහත්බිම් එකත්, ගොවිජන එකත් නිහඬ ප්‍රතිපත්තියක් දැරුවා. එක්තරා වණ්ඩි ව්‍යාපාරිකයෙක් බොල්ගොඩ ගඟ බලෙන් ගොඩ කරමින් ඉඩම් කට්ටි වික්කා. ඒක නවත්වන්නට මේ කිසිම ආයතනයක් අද වනතුරු අධිකරණයේ ගිහිල්ලා නඩුවක් ගොනු කරලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා ඔහු විශාල මුදලක් බොල්ගොඩ ගඟේ කෑලි විකුණමින් හම්බ කළා. ඒ නිසා එවැනි තත්ත්වයක් පසුගිය කාලය පුරාම මේ ස්ථානයේ තිබුණා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. එතුමා කිව්වා වාගේ 1377 ක භූමියකින් දැන් තිබෙන්නේ 200 කට ආසන්න ප්‍රමාණයක්. ඒ භූමි භාගය තුළ. ඒ නිසා කොළඹ ප්‍රදේශයේ ව්‍යාපාර ප්‍රජාව සහ මේ රටේ ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂවරු, සභාපතිවරු බොල්ගොඩ ගඟ අයිනේ ඉඩම් ගනිමින් මිලියන ගණන් යොදමින් සංචාරක නිකේතන හදනවා. ඒ වාගේම බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ව්‍යාපාර ආයතන රාශියක් පිහිටලා තිබෙනවා. කැස්බෑව නගර සභාවට, ඒ වාගේම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට, මොරටුව නගර සභාවට හොඳ ආදායම් ලැබෙන ස්ථානයක් මේ බොල්ගොඩ ගඟ. ඒ නිසා මේ පිළිබඳව විධිමත් ප්‍රතිපත්තියක්, ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය මේ මොහොත වන විට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඍජුවම බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයේ මැදිහත් වීමත්, ඒ වාගේම මධ්‍යම රජයෙත්, පරිසර අධිකාරියේත් - පරිසර අධිකාරියට විශාල කාර්යභාරයක් තිබෙනවා. ඒ නිසා පරිසර අධිකාරිය

[ගරු නිරෝෂන් පාදුක්ක]

මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව මධ්‍යම රජයත්, පළාත් සභාවත් එකතු වෙලා, අදාළ නගර සභා සියල්ල එකතු වෙලා වඩා විධිමත් කෙටි කාලීන සහ දිගු කාලීන සැලසුම් ඇතිව මේ බොල්ගොඩ ගඟ සංවර්ධනය කිරීමේ වේරැස් ගඟ ව්‍යාපෘතියට අනුබද්ධ කරලා, ඒ වාගේම දැන් අලුතෙන් ඉදි කරන ලද බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයත් සෘජුව මේ සඳහා දායක කරගෙන නව ව්‍යාපෘතියක් අනාගතයේදී ආරම්භ කරලා - මේක ජාතික සම්පතක්. ඒ නිසා මේ සම්පත විනාශ වීමේ උවදුරෙන් ආරක්ෂා කරගෙන අනාගත පරපුරට පැවරීම සඳහා සියලුම දේශපාලන අධිකාරීන්, මධ්‍යම රජය, පළාත් සභා සහ ප්‍රාදේශීය සභා එකතු වෙලා ජාතික වැඩ සටහනක් හදන්න ඕනෑ. ඒ වැඩ සටහන සඳහා අර මම කියපු සියලුම රාජ්‍ය ආයතනවල සෘජු මැදිහත්වීම අවශ්‍ය බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.27 ]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, බොහොම අපේ ප්‍රදේශයට දැනෙන සංවේදී ප්‍රශ්නයක් සභාව හමුවේ තැබීම සම්බන්ධව. 2011 අප්‍රේල් මාසයේ වේරැස් ගඟ සහ බොල්ගොඩ ගඟ ව්‍යාපෘතිය අත්සන් කරන වෙලාවේ මමත් එතැන සාමාජිකයෙක් හැටියට සිටියා. දිනේෂ් ගුණවර්ධන ගරු ඇමැතිතුමා තමයි විෂයය භාරව සිටියේ. ඒ හරහා වැඩ පටන් ගත්තා. බෙල්ලන්විල සිට ඔය යන වැඩ සටහන. ඊට පස්සේ අපේ මොරටුවේත්, කටුබැද්ද වෙල් යායත් සංවර්ධනය කරන්න පටන් ගත්තා. ඒ සංවර්ධනය කරන්න පටන් ගත්තාට පස්සේ මේ රජය ඉවත්වීමත් සමගම ඒ බඩු මුට්ටු නැවත ගියා. ආයෙත් නැවත ආවා. ආයෙත් වැඩ ටිකක් කරගෙන ගියා. දැන් ආයෙත් නතර කරලා තිබෙන්නේ. මේ එක පැත්තක්. අපේ මොරටුවේ කැස්බෑව, බණ්ඩාරගම යන ප්‍රදේශවලට අයත් තමයි බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ඇති වෙලා තිබෙන ප්‍රශ්න ටික බොහොම සංවේදී කාරණා බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි කොළඹට බොහොම කිට්ටුව වනජීවී දෙපාර්තමේන්තුවට, forest දෙපාර්තමේන්තුවට, බොහොම කිට්ටුවම තිබෙන අභය භූමිය තමයි බෙල්ලන්විල අභය භූමිය. මම ඉන්නේ බොල්ගොඩ ගඟ ආශ්‍රිතව. මට ඒ ප්‍රදේශයෙන් අහුවෙන - මම දාලා තිබෙනවා. නයි, ඒ වාගේම පිඹුරන්, ඉබ්බෝ මට හම්බ වුණාම මම අත්තිඩිය අභය භූමියට තමයි ගෙනැල්ලා දාන්නේ. ඒ ගෙනැල්ලා දාන්නේ අභය භූමියක් හැටියට එතැන නම් කරලා තිබෙන නිසා. ඒ වුණත් අභයක් භූමියක් හැටියට නම් කරලා තිබුණාට වන ජීවී එකට බොහොම කිට්ටුවෙන් තිබුණත් වැඩිම මිනිස් ක්‍රියාකාරකම් සිදුවන අභය භූමිය තමයි මේ බෙල්ලන්විල අභය භූමිය. මේ සම්බන්ධව කටයුතු කරනවාද කියන එක මම දන්නේ නැහැ. මොන හස්තයකින් මේක යටපත් කරලා තිබෙනවාද කියන්න මම දන්නේ නැහැ. ඒක නිසා අපේ ප්‍රදේශය දිහා අරගෙන බැලුවාම මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් 16 යි. කැස්බෑව මොරටුව යා කරන කොස්පැලෑන පාලම ළඟට ගියාම පාලම ළඟ සිට බැලුවාම පේනවා, ගොඩබිම කොච්චර මැදි ප්‍රමාණයට ඇවිල්ලා තිබෙනවාද කියලා. ගඟේ නිවාස ගහලා තිබෙන්නේ. මේ වනතුරු කවුරුත් මේ සම්බන්ධව දේශපාලන වාසි ගන්න මේ දේවල් ඉෂ්ට සිද්ධ කරන්න යන්නේ නැහැ. ඉතින් පරිසරය ආරක්ෂා කළොත්, ස්වාභාවිකත්වය ආරක්ෂා කළොත් තමයි මනස රැකෙන්නේ. ජීවිත් රැකෙන්නේ. අද වනකොට එවැනි තත්ත්වයක් අපට දකින්න නැහැ. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපේ එකඟතාවය සහ ඒක ඉතාමත්ම ක්‍රියාකාරී - මොකද සීඝ්‍ර දියුණුවත් සමග පරිසරය වෙනස්වීම තුළ, පරිසරය විනාශ කිරීම තුළ ඒකේ ප්‍රතිඵල ලබා ගන්න වෙන්නෙත් අපටම තමයි.

ඒ වාගේම තමයි සංවර්ධන ව්‍යාපෘති. අපට මතකයි, දැන් බොල්ගොඩ අපේ ගඟ සීමාවේ, ගඟ අයිනෙන් පාරක් ගියා. ඒ වාගේම තමයි ලුණාව කලපුව සංවර්ධනය කරන කොට ඇළ දෙපැත්තේ පාරවල් ගියා. ඒ පාරවල් ගියායින් කළපු ගොඩ කිරීම නැවතුණා. එවැනි වැඩ සටහනක්වත් අපට දකින්න නැහැ, මේ ක්‍රියාත්මක කරන තැන්වලින්. සමහර ලොකු තැන්වල ගඟ අයිනේ නතර කරලා තිබෙනවා. පොඩි ඉඩම්වල දිගටම කරගෙන යනවා. අද වනවිට කිඹුල් ගහනය - කරදිය මිශ්‍ර වෙලා තිබුණත් කොරලවැල්ලේ සිට දිගටම කිඹුල්ලු විශාල ප්‍රමාණයක් ඉන්නවා. මම මෑතකදී දැක්කා, බණ්ඩාරගම එක පුද්ගලයෙකුගේ කුකුළ ගලෝගෙන කිඹුලෙක් ගිහිල්ලා. ඉතින් මෙවැනි තත්ත්වයක් තුළ සංවේදී පරිසර පද්ධතියක් තුළ මේක ආරක්ෂා කරගන්න අපේ ක්‍රියාකාරීත්වය මොන මට්ටමේද

තිබෙන්නේ එක - පළාත් සභාවෙන් හෝ වේවා. පළාත් පාලන ආයතනවලින් හෝ වේවා. රජය හෝ වේවා. මධ්‍යම පරිසර අධිකාරිය හෝ වේවා. කිසිම තැනකින් ක්‍රියාත්මක දායකත්වයක් නැහැ. මේක තමයි අපට වෙලා තිබෙන වින්නැහිය. ආයතන තිබෙනවා. ආයතන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ආයතන ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ කාගේ බලපෑමටද කියන එක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අද අපේ ගරු ජනාධිපතිතුමා තමයි පරිසර සම්බන්ධයෙන් ඇමැතිතුමා ලෙස ඉන්නේ. පරිසරය සම්බන්ධයෙන් එතුමා බොහොම සංවේදී පුද්ගලයෙක්. ඉතින් එවැනි නායකත්වයට මේ විධියට පරිසරයට ආදරය කරනවා නම් අනුගත වෙන්න ඕනෑ, එතුමාගේ අධිෂ්ඨානයත් එක්ක, එතුමාගේ ප්‍රතිපත්තියත් එක්ක ඉස්සරහාට යන්න ඕනෑය කියන එක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කියන්න තිබෙන්නේ. ඉතින් ඒ බොල්ගොඩ ගඟ රක්ෂිතය සංචාරක ප්‍රදේශයටත්, ස්වාභාවිකත්වයේ සිරි විඳින්නටත්, තිබෙන සිසිල් සුළඟ ලබන්නත්, අපේ ප්‍රදේශයේ ජනතාවට නැති වන දවස ක්‍රමානුකූලව ළං වෙනවා කියන ප්‍රකාශය කරමින්, විශේෂයෙන් මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධව ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.31 ]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු හොඳ යෝජනාවක් හැටියට මම දකිනවා, මේ බොල්ගොඩ සංවර්ධන ව්‍යාපෘතිය. බොල්ගොඩ ගඟ ආශ්‍රිතව තිබෙන ඉඩකඩ දිහා බැලුවාම කොළඹ දිස්ත්‍රික්කයත්, කළුතර දිස්ත්‍රික්කයත් අතර විශාල භූමි ප්‍රමාණයක් තිබෙනවා. මේ කළුතර දිස්ත්‍රික්කය දිහා බැලුවාම හොරණ සහ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශ දෙක හැර අනිකුත් සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන විධියට අක්කර 35,000 ක භූමියක් තිබෙනවා. ඒක මේ බොල්ගොඩ මිටියාවතට අයිති වෙනවා. මම මේක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටිද්දී 1992 දී ප්‍රාදේශීය ලේකම්වරු ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සාකච්ඡාවක් තියලා මේ ගැන වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ අවස්ථාවේ ආණ්ඩු පෙරළියත් එක්ක ඒක අපට ගෙනියන්න බැරි වුණා. ඒ වෙලාවේ අපි බලාපොරොත්තු වුණේ, මේ ජලය රැඳෙන ප්‍රමාණයට විශාල වැව් දෙකක් සකස් කරන්න. විශාල වැව් දෙකක් සකස් කරලා මත්ස්‍ය ගම්මානයකුත්, සංචාරක කලාපයකුත් ඇති කරන්න තමයි සැලසුම් කළේ. ඒ සැලසුම තායිලන්තයෙන් ඇවිල්ලා තමයි හැදුවේ. හොඳ සැලැස්මක් හදලා තිබුණා. පවුල් 1000 කට මත්ස්‍ය ගම්මානයකුත්, විශාල සංචාරක ව්‍යාපාරයක්. වාහන යන්නේ නැති බෝට්ටුවලින් විතරක් ගමන් කරන. ඒ වෙලාවේ එහෙම සැලැස්මක් හදලා තිබුණා. ඒක අපට ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඊට පස්සේ මේ සභාවේ මම දෙගමනක් මේ යෝජනාව ගෙනාවා. අද වන කොට මේ බොල්ගොඩ මිටියාවතේ අපි කවුරුත් දන්න විධියට සෑම කෙනෙක්ම කට්ටි අල්ල ගෙන නිවාස හදනවා. සංචාරක බංගලා හදනවා වාගේම සමහර තැන්වල කට්ටි කඩලා විකුණනවා. මේ ළඟදී මම හිතන්නේ අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා පානදුර ප්‍රදේශයේත් විශාල වශයෙන් ගොඩ කරලා යම් යම් බලවත් අය කළා. මේවා කට්ටි කඩලා විකුණලා, ජාවාරම්කරුවෝ හම්බ කරනවා. මේ ක්‍රමවේදය තුළින් මිටියාවතෙන් අද අපට අක්කර ගණනක් අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ලොකු සම්පතක්. මේ සම්පතෙන් ප්‍රයෝජන ගත්තොත් ලංකාවට ලොකු ආදායම් මාර්ගයක් එන වැඩ පිළිවෙළක් කරගන්න පුළුවන්. විශේෂයෙන් ප්‍රාදේශීය සභාවලට විශාල ආදායම් මාර්ගයක් කරගන්න පුළුවන්කමක් තිබෙනවා. අපි යෝජනා කරපු විධියට. මොකද මේ ජල ධාරිතාව රැඳිය යුතුයි. ස්වභාව ධර්මයේ නිර්මාණයක් මේක. ඒ ජල ප්‍රමාණය රැඳෙන විධියට වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ. එහෙම කරනවා නම් විශාල ලොකු වැව් දෙකක් හදලා, ඒ ගොඩවෙන පොළවෙන් අපට උපරිම ප්‍රයෝජන ගන්න පුළුවන්. වැව් හදන කොට. මොකද, අද සුරතල් මසුන් හදනවා නම් මේ ලෝකයේ ලොකු ඉල්ලුමක් තිබෙනවා. මම හිතන්නේ 18% ක් විතර අපි නිෂ්පාදනය කරන්නේ සුරතල් මසුන්. මේ වාගේ ගොඩබිමක් හදලා පවුල් පිටින් පදිංචි කරලා මේ ව්‍යාපාරය දියත් කළොත් පවුල් 1000 කට අපට ලෝකයේ ඉල්ලුමට විශාල සුරතල් මත්ස්‍ය නිෂ්පාදනයක් කරන්න පුළුවන් ප්‍රදේශයක් වෙනවා, මේ ප්‍රදේශය. මොකද, ජලය කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ භූමිය ඒකට බොහොම සුදුසු පරිසරයක් තිබෙන්නේ. ඉතාම විශාල ආදායමක් ගන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්.

[ගරු පී.ඩී. අබේරත්න ]

ඊළඟට සංචාරක ව්‍යාපාරය. ඉතාම ආකර්ෂණීය සංචාරක ව්‍යාපාරයක් ඇති කරන්න පුළුවන්. සංචාරක ව්‍යාපාරය ඇති කරනවා වාගේම බොල්ගොඩ ඒ ප්‍රදේශයේ විශාල ජලාශ ප්‍රමාණයක් හැදුවාම ඒවායේ විශාල බෝට්ටු යන විධියට හදලා එතකොට විදේශීය සංචාරකයන් වාගේම ලංකාවේ සංචාරකයින්ටත් විශාල විවේකයක් ගන්න අවස්ථාවක් සලසා දෙන්න පුළුවන්කම තිබෙනවා. අද ලංකාවේ එවැනි කලාප අඩුයි. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ නුවරඑළියේ තිබෙනවා වාගේ, ඊට වැඩිය සිය ගුණයක් විශාල විධියට අපට මේක නිර්මාණය කරන්න පුළුවන්. එහෙම වුණොත් ලංකාවේ සංචාරකයින්ට විශාල අවස්ථාවක් ලැබෙනවා.

ඒ වාගේම බොල්ගොඩ ගඟත් ඒ වාගේ. තමුන්නාන්සේලා අපි රුසියාවේ සංචාරයක් කළා. ඒ රුසියා සංචාරයේදී අපි දැක්ක දෙයක් තමයි ගංගාවලින් විශාල ජනතාවක් විනෝද වෙන්න යනවා. ඒවායින් විශාල වශයෙන් හම්බ කරනවා. ව්‍යාපාර බවට පත් වෙලා තිබෙනවා. රැකී රක්ෂා උත්පාදනය වැඩි වෙලා තිබෙනවා. අද ලංකාවේ එකම ගඟකවත් ඒ තත්ත්වයක් නැහැ. සෑම ගඟක්ම ඒ විධියට උපයෝගී කර ගන්නවා නම් ඒ ගංගාවල බෝට්ටු යන්න පුළුවන් විධියට අපේ අයත් කැමැතියි ඒවායේ විනෝද වෙන්න. පවුල් පිටින් ඇවිල්ලා විශාල වශයෙන් විනෝද වෙනවා. හවස්වරුවේ විශාල වශයෙන් ඒවායේ ගත කරනවා. එවැනි තත්ත්වයක් තුළ අපට නිර්මාණය කරන්න පුළුවන් ප්‍රදේශයක් තමයි මේ. කොළඹ දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය බැලුවාම විශාල ප්‍රමාණයක්, අපේ 1992 සංගණනයට අනුව අක්කර 35,000 ක් තිබුණා. මේක අපට ලැබිලා තිබෙන විශාල සම්පතක්. ඒ සම්පතෙන් අද නියම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ බස්නාහිර පළාත් සභාව සම්පූර්ණයෙන්ම යොමු වෙලා මේ වැඩේ කළොත්, පළාත් සභාවේ මුදල් වියදම් කරලා කර ගත්තොත් පළාත් සභාවටත් ආදායම් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේක විදේශ ආධාර විශාල වශයෙන් ගන්න පුළුවන්කමක් තිබෙනවා. මැදිහත් වෙන්න ඕනෑ. හොඳ සැලැස්මක් හදලා, කථා කරන අයගේ අදහස් අරගෙන නියමිත සැලැස්මක් හදලා මේකට විදේශ සමාගම සම්බන්ධ කරගෙන හොඳ ආයෝජනයක් කළොත් අපේ රටට මුදල් ගලා එන විශාල ආදායම් මාර්ගයක් වෙනවා වාගේම රැකී රක්ෂා උත්පාදනයට ලොකු පිටුවහලක් වෙනවා. ඒ නිසා මේ වැදගත් යෝජනාව විධිමත් ආකාරයෙන් සංවිධානය කරලා - මොකෝ මේක භයානක දෙයක්. පරිසරය ආරක්ෂා වෙන්න ඕනෑ. අපේ Balance එක රටේ තියාගන්න ඕනෑ. ඒ නිසා ඒ විධියට විධිමත් ආකාරයෙන් හොඳ සැලැස්මක් ඇතිව කටයුතු කරලා ලොකු ආදායම් මාර්ගයක් කරගන්න, රටේ ජනතාවට සේවය කරන්න පුළුවන් අවස්ථාවක්. මේකට බස්නාහිර පළාත් සභාව මැදිහත් වෙලා, ගරු ප්‍රධාන ඇමැතිතුමාත් සම්බන්ධ වෙලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් රටට යහපතක්. අපට ආදායමක් ගන්න පුළුවන් වෙන තත්ත්වයක් ඇති වෙනවා. ඒ ගැන අවධානය යොමු කරනවා. ඒ ගැන වැඩ පිළිවෙළක් සකස් කරන්න අපට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින්, මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. ඊළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම ඊයේ අපේ මහරගම නගර සභාවට ගියා. එතැන කතෝලික මහත්වරු ටිකකුයි, මුස්ලිම් අපේ සහෝදරයෝ ටිකකුයි සිටියා. මේ ගොඩනැගිලි අයදුම් පත්‍රයක් තිබෙනවා. එතැනට මම යන කොට ඒ අය අතර argument එකක් තිබුණා. මේ අයදුම්පත් සිංහල භාෂාවෙන් තිබෙන්නේ. මේක පුරෝගන්න ඒගොල්ලන්ට තේරෙන්නේ නැහැ. තේරෙන්නේ නැතිව මේක අත්සන් කරන්න බැහැයි කියලා කියනවා. ඒ නිසා මම ඔබතුමා හරහා පළාත් පාලන කොමසාරිස්වරියට කියනවා. එතුමිය මෙතැන ඉන්නවා. මේ ගොඩනැගිලි අයදුම්පත්‍රය - මොකද

යහපාලන රජයක් තිබෙන වෙලාවේ අනිකුත් ජාතීන්වලට, අනිකුත් භාෂාවලට, විදේශිකයන්ට මේ දීලා තිබෙන මේ වරප්‍රසාදත් එක්ක මේ ගොඩනැගිලි අයදුම්පත්‍ර සම්බන්ධව ගත්තාම අනිකුත් භාෂාවලින් අඩුම ගණනේ 100 ක් වත් සභාවකට තිබෙන්න ඕනෑ. අනික් පළාත්වලටත් මේක බලපානවා ඇති.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. අපි ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මුස්ලිම් ජනතාව 5000 ක් විතර ඉන්නවා. එතකොට මේ ප්‍රශ්නය මේක පළාත් පාලන ආයතනවලට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි මන්ත්‍රීතුමා. ඔබතුමා කිව්ව කථාව පිළිගන්නවා. ඒක දැනුම් දීමක් කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ පිළිබඳව දැනුවත් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.38 ]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම හැමදාම වාගේ ඉතාමත් හරවත්, ඉතාමත් වැදගත් යෝජනා ගෙන එන, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මේ වැදගත් යෝජනාව ගෙන ඒම පිළිබඳව අපගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්තරා කාලයක් මගේ විෂයයක් තමයි භූගෝල විද්‍යා විෂය. කාලයක්ම උගන්වපු විෂයයක්. ශ්‍රී ලංකාව ගත්තොත් එහෙම ශ්‍රී ලංකාව වටේම පිහිටලා තිබෙනවා, ප්‍රධාන වාරිමාර්ග 32 ක්. ගංගාවල්. ඒ ගංගාවන් සහ මධ්‍යකරයෙන් එන්නා වූ ප්‍රධාන ගංගාවන් දෙක එකතු වුණාම විශාල වශයෙන් රට තුළ සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් මහා සම්පතක්. අපි ඇත්තටම මේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත්, පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කරපු ආකාරයකට නිසියාකාරව මෙය පරිහරණය නොවීමේ තිබෙන කටයුතු තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම යටත් විජිත සමයේදී ගත්තොත් එහෙම මේ යටත් විජිත සමයේදී ප්‍රධාන පාරවල් හැරුණාම, මහා මාර්ග හැරුණාම බහුල වශයෙන්ම රට තුළ ප්‍රවාහන කටයුතු සඳහා, විශේෂයෙන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගත්තා වූ ප්‍රධානම ප්‍රවාහන පද්ධතිය, එහෙම නැත්නම් ප්‍රවාහන මාධ්‍යය තමයි මේ ජල පරිවහනය. එතකොට ජල පරිවහනය, ගුවන් පරිවහනය සහ ගොඩබිම් පරිවහනයේදී ජල පරිවහනයෙන් විශාල කටයුත්තක් කරන්න පුළුවන්. ඒක අදත් සාක්ෂි දරනවා, මේ ඇලකන්ද හරහා දුවන ඕලන්ද ඇළ අදත් පරිහරණය කරනවා. වැල්ලවත්තේ සිට දියවන්නාව දක්වා ගඟක් තිබෙනවා. ඇළක් තිබෙනවා. ඒ වාගේම තමයි වේරුස් ගඟ හරහා ඒ දිවෙන ඇළ. දෙල්කඳ හරහා බොරලැස්ගමුව වැව දක්වා දිවෙන්නා වූ ඒ කොටස. ඒ වාගේම තමයි බේරවැව. බේරවැව ඉඳන් සම්බන්ධ වෙලා, දියවන්නාව දක්වාම. බොල්ගොඩ ගඟ තිබෙනවා. ඒ වාගේම කැලණි ගඟ. ඒ වාගේම කළු ගඟ. මේ අපේ පද්ධතියට, එහෙම නැත්නම් අපේ ප්‍රදේශයට අයිති කලාප තුළ පිහිටලා තිබෙන්නේ. නමුත් ඇත්තටම මෙතුමා මේ යෝජනාව මීට පෙරත් සාකච්ඡාවට ලක් කරලා තිබෙනවා. එක් එක් අවස්ථාවලදී. මේ කිසිම අවස්ථාවකදී මේවා නිසි ලෙස පරිහරණය කර ගන්න උත්සාහ කිරීමක් කරලා නැහැ. දැන් උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම ඊයේ ගරු ජනාධිපතිතුමාගේ සහ අග්‍රාමාත්‍යතුමාගේ අතින් ගුවන් පාලමක් විවෘත වුණා. විශේෂයෙන්ම පැය එකහමාරක්, දෙකක් විතර කාලයක් පාර්ලිමේන්තු වට රවුමේ සිට රාජගිරිය දක්වා යන ගමන. පැය දෙකක් විතර වාගේ යනවා. ඉතින් ඔය කලාපයේ සමහර පාර්ශව යන්නේ බස්වලින්. විශේෂයෙන් පොදු ප්‍රවාහන මාධ්‍යයක් හැටියට. එතැන සිට දියත උයන ළඟ සිට වැල්ලවත්තට සහ බේරවැව ඔස්සේ ගමන් මාර්ගයක්

[ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් ]

ආරම්භ කරන්න පුළුවන් හොඳ හැකියාවක් තිබෙනවා. ඒ වාගේම තමයි කඩුවෙල ගත්තොත් එහෙම, ඒ කඩුවෙල ප්‍රදේශයේත්, බියගම ප්‍රදේශය ඒ පැත්තෙන් එන්න පුළුවන්. එලෙස කැලණිය දක්වා හොඳ ජලපරිවහනය පාවිච්චි කරන්න පුළුවන් හොඳ ක්‍රම කිහිපයක්ම තිබෙනවා. ඔබතුමාට මතක ඇති. අපි රුසියාවේ එහෙම ගිය වෙලාවේ, අපි නම් ගියේ විනෝදය තකා. ඒ බෝට්ටුවල ගියේ තමන්ගේ ප්‍රවාහන මාධ්‍යයක් හැටියට. එක තැනකින් නැගලා තවත් තැනකින් බහින්න. ඒ වාගේම ඔබතුමාට මතක ඇති පින්ලන්තයේ යන කොට. අපි ගිය ඒ විශාල යාත්‍රාව මගී යාත්‍රාවක් හැටියට එහාට මෙහාට යන්න පාවිච්චි කළා. ඉතින් අද ලෝකය ගත්තොත් එහෙම - මේ දියත උයන ගත්තොත් එහෙම දියත උයනේ තිබෙනවා, ඒ වෝටර්ස් ඒජ් හෝටලය මගින් ක්‍රියාත්මක වෙනවා, පුංචි යාත්‍රාවක තිබෙන හෝටලයක්. මේ හෝටලය සංචාරකයින්ට ඉතාමත් ආකර්ශනීය ස්ථානයක්. ඉතින් මේවා මොනම ආකාරයෙන්වත් සම්බන්ධ කර ගන්න, එක්කෝ මේ පිළිබඳව අමාත්‍යාංශ විශාල ප්‍රමාණයක් තිබෙනවා. බස්නාහිර පළාතේ අපේ මහ ඇමතිතුමා ප්‍රමුඛව අපේ බස්නාහිර පළාතේ බොහෝ දුරට නෙත ගැටුනේ නැති එක්තරා කොටසක් තමයි. ඉතින් මේක මීට පෙර සාකච්ඡා කරපු ආකාරයට විශාල වශයෙන් සංචාරකයන් ආදේශ කර ගන්න පුළුවන්.

ඒ වාගේම ප්‍රවාහනය සඳහා යොදා ගන්න පුළුවන්. ඇත්තටම මෙතුමා කියපු ආකාරයට ඒවාට යොමු වීමක් වෙන්න ඕනැ. නැත්නම් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා, අපි යෝජනා ගේනවා. යෝජනා ගෙනාවාට පස්සේ ඒවා සාකච්ඡා කරනවා. කවුරුවත් ඒවා අහගෙන ඉන්නෙත් නැහැ. අපි අපි ඒවා සාකච්ඡා කරලා නැවත යෝජනාවක් බවට පමණක් පත් වෙනවා මේවා. ඒ නිසා අපි ඒ ගෙනෙන යෝජනාවන් නිසි ලෙස ක්‍රියාත්මක වෙන්න ඕනැ. ඒ නිසා මේවා එක් එක් අංශවල. අද නිලධාරීනුත් නැහැ මේකේ. අපි අපි කථා කරනවා. මේ හැන්සාඩ් ලියන දරුවෝ ටික ඉන්නවා. අපි ඔහේ සාකච්ඡා කරලා මෙතැනින් යනවා. එක ඇමතිවරයෙක් ඉන්නවා. අනික් කට්ටිය ඇත්තෙත් නැහැ. මේ වැදගත් යෝජනාවක් කථා කරන අවස්ථාවේදී. ඉතින් ඒ නිසා මේවාට ඉතාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අදාළ තැන්වලට අපි හැන්සාඩ් වාර්තා යොමු කරනවා. මේක විශේෂ අවධානයක් යොමු කරවනවා. මේ ගැටළුව සම්බන්ධව.

**ගරු රොඩ්නි රුඩෝල්ල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අනික් එක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් පායලී චම්පික රණවක ගරු ඇමතිතුමාගේ සංකල්පයක් අනුව මේ මෑතදී දැන් ගිය සතියේ ආරම්භ කළා බොරලැස්ගමුව වැව සංවර්ධනය කිරීමේ කටයුත්ත. ඊට මමයි එතුමා වෙනුවෙන් සහභාගී වුණේ. අපි ඒක සොයා බැලීමක් කරනවා. බොරලැස්ගමුව වැවෙන් තිබෙන්නේ -එදා තිබුණු වැව එක්ක මැනුම් කටයුතු කරලා බැලුවාට පස්සේ, එදා තිබුණු වැවයි, අද තිබෙන වැවයි බැලුවාට පස්සේ අද තිබෙන ඉඩම් ප්‍රමාණය, වැවේ ප්‍රමාණයෙන් 75% ක් ප්‍රදේශවාසීන් අල්ලාගෙන ඉන්නේ. එක්කෝ මේකට රාජ්‍ය අනුග්‍රහය. නැත්නම් ඒකේ ඉන්න චණ්ඩි ටිකක් අර අපේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට. ඒ නිසා ඒකේත් මීට පෙර මම මහරගම නගර සභාවේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරන දවස්වල මම තමයි ඒ ව්‍යාපෘතිය භාරව කටයුතු කළේ. මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමාත් කියපු විධියට මීට පෙර ඒ වටේටම අපි පාරක් දැම්මා. ඒකෙන් ඒ පාරෙන් මෙහාට ප්‍රවේශ වන එක නැති වෙලා ගියා. අනික් එක ගත්තොත් එහෙම මේ බොල්ගොඩ ගඟ පිළිබඳව මෙතුමා කථා කරනවා. ඒ බොල්ගොඩ ගඟ ආශ්‍රිතවම තමයි තිබෙන්නේ, අපි කුණු කසළ දමන ඩම්ප් එක.

මට මතකයි, මෑතකදී බොල්ගොඩ ගඟේ මාළු මැරෙන්න පටන් ගත්තා. මාළු මැරෙන්න එක හේතුවක් හැටියට සොයා බැලුවාම අර කුණු කඳුවලින් එන ජරාව, එහෙම නැත්නම් ඒ දියරයක් ඇවිල්ලා ඒ දියරය ගඟට තමයි මුදා හැරෙන්නේ. එතකොට ඒ ගඟේ අර උඩ මලකඩ වාගේ එකක් තැන්පත් වෙලා, ඒකෙන් මාළුවෝ මැරෙන්න පටන් ගත්තා. ඒ නිසා සොයා බැලීමක් කරලා තිබුණා. ඒ නිසා මේක මෙතුමාගේ හොඳ යෝජනාවක්. මේවා ඇත්තටම මෙතුමන්ලා - අර කැලණි නදිය පිළිබඳව සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව. මේ යෝජනා ගේනවා. අපි සාකච්ඡා කරනවා. නිලධාරීන් ගේනවා. එතැනින් නිමා

වෙනවා. ඒ නිසා මේක හොඳ ආදායම් මාර්ගයක්. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට සංචාරකයින් ආකර්ශනය කර ගන්න පුළුවන්. අපි වුණත් හරිම ආසයි වැවක් අද්දරට වෙලා, ගඟක් අද්දරට වෙලා ඉන්න. අර වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි කියන සංකල්පය යටතේ අපි හරි ආසාවක් දක්වනවා, දරුවොත් එක්ක ගිහිල්ලා වැවක් අද්දරට වෙලා ඉඳගෙන ඉන්න. ගෝල්ෆේස් එක ඉස්සරහා අපි ගිහිල්ලා ඉඳගෙන ඉන්නවා. බේරේ වැව ඉස්සරහා නම් අද ගිහිල්ලා ඉඳගෙන ඉන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මහා ගන්දස්සාරයි. අද මේ දියත කලාපය ගත්තාම පරිසරය ඉතාම අපවිත්‍ර වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව අපට හැකියාව තිබෙනවා. අපේ මහ ඇමතිතුමාට තිබෙනවා අවස්ථාව. ඒ නිසා මේ පිළිබඳව සැලකිල්ල යොමු කරලා මහ ඇමතිතුමාගේ අධීක්ෂණයට මේක විශේෂයෙන්ම ලක් කරලා, මේ කළුතර, කොළඹ ඒ වාගේම ගම්පහ කියන මේ ප්‍රදේශ - බොල්ගොඩ පමණක් නොවෙයි. අනික් ඒවාත් එකතු කරලා නිසියාකාර උගතුන්ගෙන් සහ බුද්ධිමතුන්ගෙන් හෙබි කණ්ඩායමක් එකතු කරලා, මේකේ ආදායම් ලබන්න පුළුවන් සහ මිනිස්සුන්ට සුදුසු ආකාරයේ ව්‍යාපෘතියක් කරන්නට අවශ්‍ය කරන කටයුතු සම්පාදනය කර ගනියි කියලා හිතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.47 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව අතිශය වැදගත් යෝජනාවක්. ඇයි? මම එහෙම කියන්නේ. බස්නාහිර පළාතේ කොළඹත්, කළුතරත් අපූරුවට සම්බන්ධ කරන, ජලාශ ගණනාවක ජලය එකට එකතු කරන තැනක් හැටියට මේ බොල්ගොඩ හඳුන්වන්න පුළුවන්. අපි දන්නවා, බොල්ගොඩ ගඟෙත්, වේරස් ගඟෙත්, කළු ගඟෙත් ද්‍රෝණිවලින් එකතු වන ජලය තමයි මේ තෙත් බිමට එකතු වෙන්නේ. එතකොට මේ විවිධ ප්‍රදේශවලින් එකතු වන ජලධාරාවල එකතුවක්. මේකේ විශේෂත්වය තමයි අපේ රටේ විවිධ භූ විෂමතාවන් නියෝජනය කරන, පරිසරයෙන් එකතු වන ජෛව සම්පත. එක පද්ධතියක් විධියට එකතු වන සුවිශේෂ තෙත් බිමක්. මේක බස්නාහිර පළාතේ තිබෙන ලොකුම තෙත්බිම. මේකේ තිබෙනවා, මෙතැනටම විශේෂිත වුණු ජලජ ශාක. සත්ව වර්ග. කුරුල්ලෝ. ඒ විතරක් නොවෙයි. මත්ස්‍ය වර්ග. ඒ නිසා මේක අතිශය වැදගත් ප්‍රදේශයක් හැටියට හඳුන්වන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේකේ පරිසර විද්‍යාත්මක වැදගත්කම කවුරුවත් මේ වන තෙක් තේරුම් අරගෙන නැහැ. විශේෂයෙන්ම බස්නාහිර පළාතට බලපාන මේ ජෛව සමතුලිතතාව රැකගෙන යන්න මහා විශාල පිටුබලයක් ලැබෙනවා මේ බොල්ගොඩ වැවේ ජෛව විවිධත්වය. එහෙම නම් මේ ජෛව විවිධත්වය ආරක්ෂා කර ගන්න ඕනෑ. මේක ආර්ථිකමය පැත්තට යොමු කර ගන්න වුවත්, එහෙම නැත්නම් වෙනත් සංචාරක කටයුතුවලට යොමු කර ගන්න වුවත්, වෙනත් ප්‍රවාහන කටයුතුවලට යොමු කර ගන්න වුවත් ඉස්සෙල්ලා අපි මේ ජෙජව විවිධත්වය ආරක්ෂා කර ගන්න ඕනෑ. මේ තෙත් බිම ආරක්ෂා කර ගන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හරිම අවාසනාවන්ත තත්ත්වයක්.

දැන් අපි දන්නවා. බොල්ගොඩ සම්බන්ධයෙන් යම් යම් නීතිත් තිබෙනවා. හැබැයි, බොල්ගොඩට වන හානිය නවත්වන්න ආයතනයක් නැහැ. නිශ්චිත අධිකාරියක් නැහැ. ඒක මහ නගර සංවර්ධන අමාත්‍යාංශයටද? එහෙම නැත්නම් පරිසර අමාත්‍යාංශයටද? සංචාරක අමාත්‍යාංශයටද? එහෙම නැත්නම් ඒ පළාත් නියෝජනය වන ප්‍රාදේශීය සභා, නගර සභාවලටද අපි දන්නේ නැහැ. හැබැයි, මේ බොල්ගොඩ වැව ආරක්ෂා කර ගන්න නම් සාමූහික වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මේ සියලු දෙනා එකතු කර ගත්ත වැඩ පිළිවෙළක් ඕනෑ. එහෙම නැති වුණොත් බොල්ගොඩට වන හානිය වළක්වාගන්න බැරි වෙනවා. මේ වන කොට මොකක්ද වෙලා තිබෙන්නේ. එක පැත්තක කුණු ගොඩ ගහනවා. අනෙක් පැත්තේ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉඩම් ටිකේ අයින් ටික ගොඩ කරලා, ගොඩ කරලා සමහරු නිකේතන, ගෙවල් ගහ ගන්නවා. කොළඹ ජීවත් වන සමහරු සනීපෙට ඉන්න ගෙයක් හදා ගන්නවා. බොල්ගොඩ ලේක්. කොහේද ඉන්නේ? බොල්ගොඩ ලේක් එක අයිනේ. ඒක කමක් නැහැ. හැබැයි, පරිසර පද්ධතියට හානි නොවන විධියට. මේකේ වඩාත් භයානකම පැත්ත. අපි දන්නවා, මේකට ආශ්‍රිත ප්‍රදේශයක් තමයි. මේ තෙත් බිමේ විශේෂයෙන්ම කියන්න ඕනෑ ප්‍රදේශයක් තිබෙනවා. මොකක්ද? කුරුළු පාරාදීසයක් තිබෙනවා. මේක අභය භූමියක් ලෙස නම් කරපු එකක් මීට කාලයකට කලින්. මේකේ හිටියා, පක්ෂි වර්ග 168 ක්. පක්ෂි වර්ග 168 ක් හිටපු ප්‍රදේශයක්. අද මේකෙන් පක්ෂීන් ටික

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

නැති වේ ගෙන යනවා. මේකේ කර්මාන්ත ආරම්භ කරලා, මේ පරිසරය සම්පූර්ණයෙන් විනාශ කරලා, ජලයට රසායන ද්‍රව්‍ය එකතු වෙනවා. මේ කර්මාන්ත ශාලාවලින් බැහැර කරන අපද්‍රව්‍ය ටික බොල්ගොඩට අන්තිමට එකතු වෙනවා. ඒ නිසා මේවා වළක්වන්න කිසිදු අධිකාරියක් නැහැ. මේ අභය භූමිය විනාශ කරලා තිබෙන්නේ. ගොඩ කරලා. ජනාවාස හදලා. කර්මාන්ත ශාලා දාලා. එහෙම නම් මේකට නිශ්චිත වැඩ පිළිවෙළක් ඕනෑ. අපි දැන් සංචාරක ගමනාන්ත ගැන කථා කළා. දැන් සංචාරක ගමනාන්ත යටතේ අනිවාර්යයෙන් මේක එක ස්ථානයක්. හැබැයි, ඉස්සෙල්ලාම මේක සංචාරක ගමනාන්තයක් බවට පරිවර්තනය කරන්න කලින් මේක ආරක්ෂා කරන වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. ඉස්සෙල්ලා මේ විනාශය වළක්වන්න ඕනෑ. දැන් අපි දන්නවා. ඕලන්ද යුගයේ සිංහරාජ වනාන්තරයේත්, රත්නපුර ප්‍රදේශයේ ඉඳලත් මොරටුවට දැව ප්‍රවාහනය කරලා තිබෙන්නේ මේ බොල්ගොඩ හරහා. ජේනවාද මේ බොල්ගොඩ වැව ප්‍රවාහනයට කොයි තරම් සේවයක් කරලා තිබෙනවාද කියලා. හැබැයි, අද ඒක කරන්න බැරි ඇයි? මේක විනාශ කරලා තිබෙන්නේ. නීති විරෝධී ගොඩ කිරීම්, නීති විරෝධී ඉදිකිරීම්වලින් මේ තෙත්බිම් පරිසරය විනාශ කරලා. ඉස්සෙල්ලා මම කියන්නේ, මේකේ ආර්ථිකය පැත්තට යොමු කරන්න කලින් මේ ජෛව විද්‍යාත්මක වැදගත්කම දැනගෙන පළමුවෙන්ම ඒක ආරක්ෂා කරන්න ඕනෑ. දෙවනුව, මේකේ භූමිය පිළිබඳව පරීක්ෂා කරලා, මේක මනා විද්‍යාත්මක අධ්‍යයනයක් කරලා, මේ පරිසරය සංරක්ෂණය කරන වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. එහෙම ගිහිල්ලා තමයි මේක ආර්ථිකමය සහ අනෙක් අංශවලට. මේක ලාභ ඉපයීමේ මාර්ගයක් බවට මේ ප්‍රදේශය, මේ තෙත් බිම් පරිසරය පාවිච්චි කරනවා නම්, කළ යුත්තේ කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ භූමිය ආරක්ෂා කිරීමේ විශාල වගකීමක් මේ පළාත් සභාවට තිබෙනවා. එහෙම නම් සාමූහික වැඩ පිළිවෙළකට යෑමෙන් හැර මේ වැඩේ කරන්න බැහැ. සියලු ආයතන එකතු වෙලා, සියලු ආයතන උනන්දු වෙලා, මේකට පුළුල් සැලසුමක් හදන්න ඕනෑ. සියලු දෙනා එකතු වෙලා සාමූහික වැඩ පිළිවෙළකින් මේ තෙත් බිම් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට මේ පළාත් සභාවත් එක්ක එකතු වෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.54 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ වැදගත් යෝජනාව ගැන අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන. අපි මේ සභාවේ යෝජනා රාශියක් ගැන විටින් විට කථා කරනවා. හැබැයි, පළාතේ සම්පත් සහ පළාතේ ජනයාට බලපාන කාරණා ගැන ඉතාම කලාතුරකින් තමයි අපි සාකච්ඡාවට ගැනෙන්නේ. ඉතින් මේ යෝජනාවත් බස්නාහිර පළාතට මැදිහත් වෙන්න පුළුවන්, බස්නාහිර පළාත මැදිහත් විය යුතු සහ බස්නාහිර පළාතේ තිබෙන සම්පතක් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනාවක් ලෙස අපි ඉතාම අගය කරනවා. අපි දැකලා තිබෙනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා අවස්ථා ගණනාවක මේ බොල්ගොඩ තෙත් බිම් කලාපය පිළිබඳව අදහස් ප්‍රකාශ කරනවා. එතුමා දැඩි උනන්දුවකින් කටයුතු කළා. මේ තෙත් බිම ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමේ උවමනාව ගැන අවධානය මේ සභාවේ යොමු කර ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වෙලාවේ කනගාටු වෙනවා. අපි හැමදාම කිව්වා, සාමාන්‍යයෙන් පළාත් සභාවේ යෝජනාවක් සාකච්ඡා කරන කොට මේ යෝජනාවට අදාළ වන නිලධාරීන් මේ සභාවේ ගෙනැල්ලා තියන්නය කියලා. දැන් අද අපි දන්නවා. අපට පාරිසරික අමාත්‍යාංශය සම්බන්ධ යම් කටයුත්තක් කරන්න පුළුවන්කම තිබෙනවා. පාරිසරික කටයුතු සම්බන්ධයෙන් යම් බලයක් අපට තිබෙනවා. පළාත් සභාව සතුව. ඉතින් පළාත් සභාවේ පරිසර විෂය භාරව යම් නිලධාරියෙකු මේ නිලධාරීන්ගේ කුටිය ඇතුළේ හිටියා නම්. මම දන්නේ නැහැ දැනුත් ඉන්නවාද කියලා. හිටියා නම් හරිම වටිනවා. මේ මන්ත්‍රීවරු කථා කරන අදහස් එක්ක එකතු වෙලා යම් ක්‍රියාත්මක සැලැස්මක් හදා ගන්න පුළුවන්කම තිබෙනවා.

ඇත්තටම අපට මතකයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පවිත්‍ර ගංගා වැඩ සටහන යටතේ කැලණි ගඟ සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබුවා. ඒක ආරම්භක

පියවරක් වෙන්න පුළුවන්. ඉතින් මේකේදීත් එවැනි තැනකට යන්න පුළුවන්කම තිබෙනවා. ගරු මන්ත්‍රීවරු කථා කරන මේ යෝජනා ටික, මේ අදහස් ටික එකතු කර ගෙන යම් සැලසුමක් හදා ගන්න පුළුවන්කම තිබුණා එහෙම නිලධාරීන් හිටියා නම්. ඇත්තටම බොල්ගොඩ කියලා කියන්නේ, පාරිසරික පද්ධතියක් තමයි. ජෛව විවිධත්වයක් තිබෙන ඉතාම සෞන්දර්යාත්මක වටිනාකමක් තිබෙන, පාරිසරික පද්ධතියක්. මට මතකයි. ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා නාගරික සංවර්ධන ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ මේ මැරෙන්න ගිය ගඟ බේරා ගැනීම සඳහා වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබුවා. නමුත්, ඒක එතැනින් නතර වුණාට පස්සේ එතැනින් ඉස්සරහාට ගියේ නැහැ. දැන් මේ ගඟ මළ ගංගාවක් බවට පත් වුණොත් මේකේ ඉන්න ජීවීන්, මේක අවට තිබෙන ශාක ඒ සියල්ල නැති වෙලා යනවා. ඉතාම නාගරික ප්‍රදේශයක තිබෙන නිසා මේක විනාශ වෙන්න තිබෙන අවස්ථාව, ඉඩකඩ ඉතාම වැඩියි. ඒ නිසා මේ සංවේදී කලාපයක් ආරක්ෂා කර ගන්න රටේ වගකිවයුතු ආයතන ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි කියන කාරණය මේ යෝජනාවේදී අපි දැඩිව අවධාරණය කරන්න ඕනෑ. ඒකට බස්නාහිර පළාත් සභාව විධියට අපට ආරම්භක පියවර තියන්න පුළුවන්. මේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පදනම් කර ගෙන අපට අපේ පරිසරය සම්බන්ධයෙන් තිබෙන බලය පාවිච්චි කරලා, මේ සම්බන්ධයෙන් ආරම්භක සාකච්ඡාවක් ඇති කළොත් විශේෂයෙන් මේ වෙනුවෙන් උනන්දු වන රටේ පරිසරවේදීන්, ඒ වාගේම රටේ සංචාරක කර්මාන්තයේ ඉන්න බොහෝ පිරිස් එකතු කර ගෙන යම් සාකච්ඡාවක් ආරම්භ කළොත් මේ බොල්ගොඩ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළට මූලික ආරම්භය තියන්න පුළුවන්කම අපට තිබෙනවා.

ඇත්තටම අපි දන්නවා. අපේ රටේ මහා අවාසනාවක් තිබෙනවා. පරිසරයට ආදරය කරන මිනිස්සු ඉන්නවා. පරිසරයට ආදරය නිසාම තමයි බොල්ගොඩ ගඟ අයිනේ ගිහිල්ලා ගෙයක් හදා ගන්න බොහෝ අය උනන්දු වෙන්නේ. ඒ පරිසරයේ තිබෙන වටිනාකම දන්න හින්දා. පාරිසරික සෞන්දර්යය විඳින්න ඕනෑ හින්දා. හැබැයි, හැම වෙලාවේම පරිසරයට හානි කරලා තමයි ඒ කටයුත්ත ඒ අය කරන්නේ. අපට රාජ්‍ය ආයතනයක් නැහැ. මේ සම්න්ධව උපදෙස් දීලා, පරිසරය රැක ගෙන සංවර්ධන කටයුතු කරන්නේ කොහොමද කියන දැනුවත් කිරීම කරන්න මැදිහත් වන රාජ්‍ය ආයතනයක් සහ රාජ්‍ය නිලධාරී පද්ධතියකුත් මේ රට ඇතුළේ නැහැ. ඒක තමයි බරපතළම අවාසනාව, මේක සම්බන්ධයෙන් තිබෙන. දැන් දෙපැත්තේ තිබෙන පළාත් පාලන ආයතන දෙක කොයි තරම් ප්‍රමාණයකට දැනුවත් වෙලා තිබෙනවාද කියන කාරණය ගැන අපට සැකයක් තිබෙනවා. මේ පාරිසරික පද්ධතියේ තිබෙන වටිනාකම ගැන. ඒ අය සැලසුමක් අනුමත කරන්න යද්දී, ඒ අය යම් කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන්න යද්දී මේ පාරිසරික පද්ධතියේ තිබෙන වටිනාකම් තහවුරු කරලා තමයි ඒ අනුමත කිරීම් කරන්න ඕනෑ. නමුත් අවාසනාවට ඒක සිද්ධ වෙන්නේ නැහැ. මේ බොල්ගොඩ ගඟේ එහා ඉවුරේ බොහෝ කර්මාන්ත තිබෙනවා. මොරටුව පැත්තෙන්. ඒ කර්මාන්ත ශාලාවල අපද්‍රව්‍ය සියල්ල මුදා හරින්නේ මේ ගඟට. ඒ එක්කම ගඟ අයිනේ තමයි කර්මාන්ත ශාලා පිහිටලා තිබෙන්නේ. ඉතින් මේ නිසා බරපතළ හානියක් මේ පාරිසරික පද්ධතියට වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මතකයි. අර ගල්ගමුව කැලේ හිටිය දළ පූට්ටුවාට කරපු අපරාධය. රාජ්‍ය නිලධාරීන් තමයි මැදිහත් වෙලා තිබුණේ මේ ඇතාට වෙඩි තියන්න. ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. දැන් අපි දන්නවා. විශාල කැලෑ කැපීමක් සිද්ධ වෙනවා. විල්පත්තුව ඇතුළේ. ඒවා රාජ්‍ය මැදිහත්වීම් මත සිද්ධ කර ගෙන යන්නේ. ඉතින් මේ පාරිසරික පද්ධතිය ආරක්ෂා වුණේ නැත්නම් කොහොමද රටක මිනිස්සු හුස්ම ගන්නේ. මිනිස්සු ජීවත් වෙන්නේ කියන ප්‍රශ්නය ගැන අවධානය යොමු කරන්නේ නැහැ. දැන් අද චීනය රාජ්‍ය මට්ටමෙන් මැදිහත් වෙලා ඒ අයගේ ස්වභාවික කැලෑ ප්‍රමාණය 10% කින් වැඩි කර ගෙන තිබෙනවා. ඒ අයට තේරෙනවා. අනාගතයේ ඇති වන මේ පාරිසරික ප්‍රශ්නය නිසා ලෝක ජනතාවට ජීවත් වෙන්න තිබෙන අභියෝගය ගැන ඒවා රාජ්‍යයන් විධියට තේරුම් අරගෙන කටයුතු කරනු ලබනවා. නමුත් අවාසනාවට අපේ රට තවමත් එහෙම කල්පනා කරන්නේ නැහැ. දැන් මේ රටේ පාරිසරික අමාත්‍යවරයා අතිගරු ජනාධිපතිතුමා. ඉතින් මම හිතන්නේ නැහැ පරිසරයට තරම් නීතිමය, දේශපාලනිකමය හයිය තිබෙන වෙන ආයතනයක් ලංකාවේ තිබෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ජනාධිපතිතුමා යටතේ පාලනය වන අමාත්‍යාංශයේ වගකීමක් ගැන මේ කථා කරන්නේ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව මෙතැන නතර කරලා

හරියන්නේ නැහැ. මේ යෝජනාව මෙතැනින් ඉස්සරහාට ගෙනියන්න සභාව මැදිහත් වෙලා ලියන්න, රැස් වෙන්න,

[ගරු මහේෂ් අල්මේදා]

කමිටු තියන්න සියල්ල කරලා මේ යෝජනාව යම් ප්‍රමාණයකට හරි, 100% ක් නොවුණත්, යම් මට්ටමකට සාර්ථක කරන්න ඉඩකඩ සලසා ගන්න අපි සභාවක් විධියට මැදිහත් වෙන්න ඕනෑය කියන කාරණය අපිත් මතක් කරනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සහයෝගයක් විධියට. ඒ නිසා මේ රටේ පාරිසරික සෞන්දර්යය සහ පාරිසරික තෙත් බිම් උද්‍යාන ආරක්ෂා කරන්න මැදිහත් වෙන්න අපි සියලු දෙනා කටයුතු කළ යුතුයි. අඩුම තරමින් මේ යෝජනාව පදනම් කර ගෙන මේ මාසය අවසන් වන්නට කලින් අපේ පරිසර අමාත්‍යාංශයට සම්බන්ධ කමිටුවක් ස්ථාපිත කරලා, මේ යෝජනාව යථාර්ථයක් කරන්න පළාත් සභාව යම් ප්‍රමාණයකට මැදිහත් විය යුතුයි කියන කාරණය මතක් කරමින්, නැවත වතාවක් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.01]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධව අදහස් දක්වපු, මේ යෝජනාව සංවර්ධනය කිරීම සඳහා තවත් කරුණු කාරණා ඉදිරිපත් කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. මේකේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අමාරු නැහැ. ඇත්තටම මේකේ විශාල වැඩ කොටසක් කරන්න ඉඩකඩ මෙන්න මේ මගේ ළඟ තිබෙන ගැසට් එක ඇතුළේ තිබෙනවා. මේ ගැසට් එක ගහලා තිබෙන්නේ 2009 දෙසැම්බර් මස 30 වැනි බදාදා. අති විශේෂ ගැසට් පත්‍රයක් හැටියට අංක 1634/23 කියන ගැසට් පත්‍රය. මේක පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය හැටියට පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා මේ ගැසට් එක ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ ගැසට් එක එතුමා එක්ක මම හිතන්නේ හොඳ අවබෝධයක් තිබෙන නිලධාරීන් එතුමාට සහයෝගය දක්වලා තිබෙනවා. මේක දැනට මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න පුළුවන් ආකාරයට සංක්ෂිප්තව මේ ගැසට් එක ඇතුළේ තිබෙනවා. නමුත් මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔන්න ඕකයි ප්‍රශ්නය. ගැසට් එක ගහනවා. නමුත් ඉන් පස්සේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ ගැසට් එක අනුව ක්‍රියාත්මක වෙන්න පුළුවන්. මේක 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ තමයි මේ ගැසට් එක ගහලා තිබෙන්නේ. එතකොට මේකේ තිබෙනවා, බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට ඇතුළත් වන භූමි ප්‍රදේශය කියලා පැහැදිලිව මේකේ තිබෙනවා. මම කියපු ටික. ඇත්තටම මම මේ යෝජනාව ඉදිරිපත් කළාට පස්සෙයි මට මේ ගැසට් එක හම්බ වුණේ. එතකොට මේකේ තිබෙනවා, මේකට අයිති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මොනවාද? අරවා මේවා ඔක්කොම ටික තිබෙනවා. මේකට කොයි තරම් මීටර් ප්‍රමාණයක් මේ ඉවුරුවල ඉඳන් මේකට සම්බන්ධ වෙනවාද? මේ ටික පවා තිබෙනවා.

ඊට පස්සේ මේකේ තිබෙනවා, අනුමත භාවිතයන් කියලා. ඒ අනුමත භාවිතයන් යටතේ 20 ක්, ඒ කියන්නේ කරුණු 20 ක් මෙහි සඳහන් වෙනවා. මේකෙන් කරන්න පුළුවන් දේවල්. මේකේ උද්‍යාන සහ ක්‍රීඩා පිට්ටනි. ස්වභාවික මංපෙත්. තෙත් බිම් වනාන්තර. පාරම්පරික ජල ජීවී වගා සහ ධීවර කර්මාන්තය. මේ වාගේ 20 ක් සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම සඳහා යටත් කරනු ලබන කොන්දේසි කියලා තිබෙනවා. ඉතා වැදගත් ශාක සහ සත්ව වාසස්ථානවලට හානි නොවන පරිදි සංවර්ධන කටයුතු කර ගෙන යා යුතුයි කියලා මේකේ බොහොම සඳහන් වෙනවා. ඒ වාගේ මේකේ ඒ කරුණු කාරණා - දැන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක ආරක්ෂා කර ගන්න ආයතනයක් නැහැයි කියලා. මේකේ තිබෙනවා. මේ ගැසට් එක අනුව සියලුම බලතල පවරලා තිබෙනවා, මධ්‍යම පරිසර අධිකාරියට. මේකේ තිබෙනවා. ඒගොල්ලන්ට මේ බලතල ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ ගැසට් එක හරියට ක්‍රියාත්මක වෙනවා නම්. ඒ නිසා මේකට එකතු කර ගන්න ඕනෑ ආයතන මේ සියල්ලක්ම මේ තිබෙනවා. දැනට පවතින හෝ යෝජිත සියලුම අනුමත භාවිතයන් සඳහා පාංශු සංරක්ෂණය, වැසි ජල ප්‍රවාහනය, අපද්‍රව්‍ය කළමනාකරණය, උද්‍යාන අලංකරණය යන අංශයන් ඒකාබද්ධ වූ කළමනාකරණ සැලැස්මක් තිබිය යුතුයි කියලා. මෙම සැලැස්මට අදාළ පරිදි මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන - ඔන්න ඔතැනින් තමයි අපට තිබෙන්නේ. පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය

ලේකම්, ධීවර දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතනවල උපදෙස් සහිතව පිළියෙළ කළ යුතුයි. එම සැලැස්ම - ඒ අනුව සංවර්ධිතයා විසින් අදාළ ව්‍යාපෘති මේ තුළ නිසි ලෙස ස්ථාපිත කර නඩත්තු කළ යුතුයි. මේ කරුණු කාරණා කරන්න, මේ යෝජනාව ක්‍රියාත්මක කර ගන්න අවශ්‍ය ඔක්කොම දේවල් ටික මේ සැලසුම් ඇතුළේ තිබෙනවා. ඒ නිසා දැන් තිබෙන්නේ, මේවා ක්‍රියාත්මක කිරීමයි. අර ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ ක්‍රියාත්මක කර ගන්න. ඇත්තටම කිව්වා වාගේ, මම හිතන්නේ අවාසනාවක් කියන්නේ මේකට විෂයට අදාළ නිලධාරීන් මෙතැන නැහැ. ඒ නිසා එතුමන්ලා අද මෙතැන නැහැ. මම මේක සභාගත[2] කරනවා. මේ ගැසට් එක. එතුමන්ලා මේකේ හිටියා නම්. ඊට පස්සේ තීරණය කරන්න පුළුවන් පළාත් සභාවේ අපට කොතැනින්ද මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්. පළාත් සභාවේ කොතැනින්ද මේක සම්බන්ධීකරණය කරන්න පුළුවන් කියලා. ඒ නිසා මේවා වැඩ කරන්න බැරි ඒවා නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩේ තිබෙන්නේ අවශ්‍ය දේ කරන්නේ නැති එක. වෙන වෙන දේවල් කරන එක. ඒ නිසා මම කියන්නේ. මේක හොඳින් පැහැදිලියි. මේක අත්‍යවශ්‍ය දෙයක්. ක්‍රියාත්මක කළ යුතු දෙයක්. ඉතාමත්ම වැදගත් දෙයක්. හැම පැත්තකින්ම. පාරිසරික පැත්තෙනුත්. ආදායම් පැත්තෙනුත්. අපට, පළාත් සභාවට ආදායම් උත්පාදනය කරන පැත්තෙනුත්. එතකොට පළාත් පාලන ආයතනවලට. විශේෂයෙන්ම ඉතාමත්ම වැදගත් දෙයක්. ඒ නිසා මේක ක්‍රියාත්මක කරන්න විතරයි තිබෙන්නේ. මේක ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග අදාළ නිලධාරීන් විශේෂයෙන්ම මේකට මැදිහත් වෙලා ගත යුතුයි කියන කාරණය ඉදිරිපත් කරමින් මේ සඳහා සම්බන්ධ වුණු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට නැවත වතාවක් ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි. ඉතාමත් කාලෝචිත, වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව අදාළ නිලධාරීන් නැති බව සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලින් දිගින් දිගටම පැහැදිලි වුණා. කෙසේ වෙතත් මෙම යෝජනාව සම්බන්ධව ඉදිරියේදී නැවත නැවත සාකච්ඡා කරන්න අවශ්‍ය කටයුතු අපි පෙන්වා දීමට උත්සාහ වෙනවා. එහෙම නම් මේ යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දෙවැනි යෝජනාව ගැනීමට කට්ටිය අඩු නිසා ඊළඟ සභාවේදී සාකච්ඡාවට ගනිමුයි කියලා යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ සංවිධායකතුමා ඉල්ලීමක් කරනවා, දෙවැනි යෝජනාව සඳහා පිරිස අඩු නිසාත්, ඒක ඊළඟ සභාවේදී ගන්න යෝජනා කරනවා. ඒ සඳහා සභාවේ එකඟතාවය තිබෙනවාද? නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව නිසා ඔබතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සඳහා ප්‍රමාණවත් තරම් මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් නොසිටින නිසා ඊළඟ සභා වාරය සඳහා මේක කල් දාන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එකඟයි.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

[2] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.08 ට, 2018 ජනවාරි මස 23 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 12.08 p.m till 9.30 a.m. on 23.01.2018*

# බස්නාහිර පළාතේ පළාත් සභා
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL



# කාර්යපටිපාටි රීති
# நடவடிக்கை முறை விதிகள்
# RULES OF PROCEDURE

**2018**

## ප්‍රතිඥාව හෝ දිවුරුම :

01. (1) සෑම මන්ත්‍රීවරයකු විසින් ම මන්ත්‍රීවරයකු වශයෙන් සභාවේ අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට පෙර පළාත් ආණ්ඩුකාරවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන වෙනත් අයෙකු ඉදිරියේ හෝ සභාපතිවරයා ඉදිරියේ හෝ පනතේ 4 වැනි වගන්තියෙන් නියමිත පරිදි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනයේ 7 වන උප ලේඛනය ප්‍රකාර ව ප්‍රතිඥාව හෝ දිවුරුම දී ඊට අත්සන් තැබීම කළ යුතු ය. *ප්‍රතිඥාව හෝ දිවුරුම.*

(2) එසේ ප්‍රතිඥා නැතහොත් දිවුරුම් දුන්නා වූ මන්ත්‍රීවරුන් පිළිබඳ සභාපතිවරයා ඊළඟ සභාව ආරම්භයේදී ම සභාව දැනුවත් කළ යුතු ය. *ප්‍රතිඥාව හෝ දිවුරුම සභාවේ දැනුවත් කිරීම.*

(3) ඉහත 01(1) අනුරීතියේ නියම කොට ඇති දිවුරුම් දී අත්සන් කිරීම හෝ ප්‍රතිඥා දී අත්සන් කිරීම යම් මන්ත්‍රීවරයකු පැහැර හැරියහොත්, එවන් තැනැත්තෙකු සභාවේ අසුන් ගැනීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම හෝ නොකළ යුතු අතර, සභාවේ අසුන් ගෙන සිටී නම්, සභාපතිවරයා විසින් ඔහුට වහා ම සභාවෙන් ඉවත් වීමට නියම කළ යුතු ය. *ප්‍රතිඥාව හෝ දිවුරුම දී අත්සන් නොකළ විට.*

(4) ඉහත 01(3) අනුරීතිය අනුව සභාපතිවරයා විසින් කරන ලද නියමය නොතකා එම තැනැත්තා තවදුරටත් අසුන්ගෙන සිටී නම් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමේ කටයුත්තේ නියැලී සිටී නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් පළාත් සභා පනතේ 6 වෙනි වගන්තිය යටතේ කටයුතු ආරම්භ කරන ලෙස සභාපතිවරයා විසින් නියෝග කළ යුතු ය. *එසේ සභාවේ රැඳී සිටී නම් පනතේ 6 වගන්තිය අනුව කටයුතු කිරීම.*

## පළාත් සභා මැතිවරණයකට පසුව පැවැත්වෙන ප්‍රථම රැස්වීම :

02. (1) පළාත් සභාවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන මැතිවරණයකින් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීමේදී සභාවේ ලේකම්වරයා විසින් ආණ්ඩුකාරවරයාගේ රැස්වීම කැඳවීමේ නිවේදනය කියවිය යුතු ය. ඉන් අනතුරුව සභාව පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතු ය. *මැතිවරණයකට පසුව ප්‍රථම රැස්වීම.*

(අ) සභාපතිවරයෙකු තෝරා ගැනීම.

(ආ) නියෝජ්‍ය සභාපතිවරයෙකු තෝරා ගැනීම

(2) එසේ සභාපතිවරයකු හා නියෝජ්‍ය සභාපතිවරයකු තෝරා පත් කර ගැනීම කාර්ය පටිපාටි රීති අංක 04 සහ 05 හි විධිවිධාන පරිදි සිදු විය යුතු ය.

(3) එකී කාර්යයන් නිම වීමෙන් පසුව, එදින සිට දින 21 ක් නොඉක්මවා සභාවේ දෙවන රැස්වීම පැවැත්වීමටත්, ඉන් පසුව පැවැත්වෙන රැස්වීම් කාර්යපටිපාටි රීති විධිවිධාන අනුව පැවැත්වීමටත් ක්‍රියා කළ යුතු ය. *පළමු රැස්වීමෙන් පසු දෙවැනි රැස්වීම.*

## මන්ත්‍රීවරුන් අසුන් ගැනීම :

03. (1) පළාත් සභාවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන මැතිවරණයකින් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීමේදී සහ ඉන් පසුව ඒ ඒ මන්ත්‍රීවරයාට ආසනයක් වෙන් කරන තුරු මන්ත්‍රීවරුන් සඳහා පනවා ඇති ඕනෑ ම අසුනක මන්ත්‍රීවරයෙකුට අසුන් ගත හැකි ය. *මන්ත්‍රීවරුන් සඳහා අසුන් පැනවීම.*

(2) සභාපතිවරයා විසින් හැකි ඉක්මණින් සෑම මන්ත්‍රීවරයෙකුට ම ආසනයක් වෙන් කළ යුතු අතර අවශ්‍ය පරිදි වරින් වර එම ආසන වෙන් කිරීම වෙනස් කළ හැකි ය. *අසුන් වෙනස් කිරීමේ හැකියාව.*

(3) පළාත් සභාවේ ඒ ඒ මන්ත්‍රීවරයාගේ ජ්‍යෙෂ්ටත්වයද, මන්ත්‍රීවරයා අයත් දේශපාලන පක්ෂයේ සංයුතියද, සභාවේ ඊට අදාළ නියෝජ්‍යත්වයද හැකිතාක් සැලකිල්ලට ගනිමින්, තම අභිමතය පරිදි සභාපතිවරයා විසින් අසුන් වෙන් කිරීම කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. *අසුන් පැනවීම පිළිබඳ අවසන් තීරණය සභාපතිවරයා සතු බව*

(4) පළාත් සභා පනතේ 8 වැනි වගන්තිය පරිදි සභාපතිවරයාව ධූරයෙන් ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතයක් සැලකිල්ලට භාජන ව පවත්නා විට, සභාපතිවරයාට එම පනතේ 8(2) වගන්තිය පරිදි සභා රැස්වීමේදී කථා කිරීමටත්, රැස්වීමේ කටයුතුවලට අන්‍යාකාරයෙන් සහභාගීවීමටත් හැකිවන පරිදි නියෝජ්‍ය සභාපතිවරයා අසුන් ගන්නා ආසනය වෙන් කළ යුතු ය. *සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීමට යෝජනාවක් පැමිණි විට පනතේ 8(2) වගන්තිය අනුව ක්‍රියා කිරීම.*

## සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම - ප්‍රථම සභා රැස්වීම :

04. (1) පළාත් සභාව සඳහා පැවැත්වෙන මැතිවරණයකින් පසුව, පළාත් සභාවේ පැවැත්වෙන ප්‍රථම සභා රැස්වීමේදී ම සභාපතිවරයෙකු තෝරා ගැනීමට සභාව ක්‍රියා කළ යුතු ය. *සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම*

(2) සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගැනීම සඳහා කිසියම් මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කරන මන්ත්‍රීවරයකු විසින්, පළමු කී මන්ත්‍රීවරයා සභාපති ධූරයට පත් කර ගනු ලැබුවහොත් එම ධූරය භාර ගැනීමට ඔහු කැමති බව, නාම යෝජනා කිරීමට පෙර නිශ්චිත ව තහවුරු කරගෙන සිටිය යුතු ය. *සභාපති ධූරයට මන්ත්‍රීවරයාගේ කැමැත්ත ලබා ගැනීම.*

(3) යෝජක මන්ත්‍රීවරයා සභාවේ ලේකම්වරයා අමතා එම අවස්ථාවේ සභා රැස්වීමට පැමිණ සිටින ඉහත අංක 04(2) හි අවශ්‍යතාවය සපුරාලන මන්ත්‍රීවරයකුගේ නම සඳහන් කරමින් “.......(මන්ත්‍රීවරයාගේ නම).......” මෙම සභාවේ සභාපතිවරයා ලෙස පත් කර ගත යුතු යැයි යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, එකී යෝජනාව වෙනත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතු ය. *සභාපති ධූරය සඳහා නාම යෝජනා කරන පිළිවෙළ.*

(4) එක් මන්ත්‍රීවරයකුගේ නම පමණක් යෝජනා වී ස්ථිර වූ විට, ඔහු සභාපති ධූරයට තෝරා පත් කර ගනු ලැබූ බව, ලේකම්වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය. *එක් මන්ත්‍රීවරයෙක් වූ විට ලේකම්ගේ ප්‍රකාශය.*

(5) එක් මන්ත්‍රීවරයකුට වැඩි දෙනෙකුගේ නම් ඉහත සඳහන් ප්‍රකාර යෝජනා කරනු ලැබ ඇත්නම්ද, ස්ථිර කරනු ලැබ ඇත්නම්ද විනාඩි දෙකක් කැඳවීම් සීනුව නාද කරවීමෙන් පසුව, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම පවත්වා, සභාපතිවරයා තෝරාපත් කර ගැනීමට සභාවේ ලේකම්වරයා ක්‍රියා කළ යුත්තේ ය. *මන්ත්‍රීවරු එකකට වැඩි වූ විට ඡන්දය විමසීම.*

(6) (1) සභාවේ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයා කැඳවා නිල මුද්‍රාව සහ අත්සන පමණක් සහිත ව නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාව බැගින් සැපයිය යුතු ය. අදාළ මන්ත්‍රීවරයා විසින් තමන් ඡන්දය පාවිච්චි කරන්නේ කුමන මන්ත්‍රීවරයාට ද යන වග තීරණය කර, පැහැදිලිව ම එකී අපේක්ෂක මන්ත්‍රීවරයාගේ නම පමණක් ලියා ඡන්ද පෙට්ටියට බහාලිය යුතු ය. *ලේකම්වරයා විසින් එකී ඡන්ද විමසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත.*

(2) ඡන්දය ප්‍රකාශ කිරීම අවසානයේදී ලේකම්වරයා විසින් තමන් විසින් කැඳවා ගනු ලබන තවත් නිලධාරියකු හෝ නිලධාරීන් සාක්ෂි වශයෙන් තබාගෙන ඡන්ද ගණන් කළ යුතු ය.

*අමතර නිලධාරීන් සාක්ෂි කොට ගෙන ඡන්දය ගණන් කිරීම.*

(3) එසේ ගණන් කිරීමේදී යම් ඡන්ද පත්‍රිකාවක සටහන් කර ඇති මනාපය කවුරුන් වෙනුවෙන් පළ කරන ලද්දක් දැයි නොපැහැදිලි නම්, එය නරක් වූ ඡන්ද පත්‍රිකාවක් සේ සලකා කටයුතු කළ යුතු ය. මේ සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

*නරක් වූ ඡන්ද පත්‍රිකා පිළිබඳව.*

(7) ඡන්ද ගණන් කර අවසාන වූ පසු සියලු ම මන්ත්‍රීවරුන්ට පෙනෙන පරිදි ධූරාපේක්ෂක ඒ ඒ මන්ත්‍රීවරයා ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අවරෝහණ පිළිවෙළට අනුව සටහන් කිරීමට ලේකම්වරයා පියවර ගත යුතු ය.

*සියලු දෙනාට පෙනෙන පරිදි ඡන්දය අවරෝහණ ක්‍රමයට සටහන් කිරීම.*

(8) සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේදී යම් මන්ත්‍රීවරයෙකු ඡන්දය දීමෙන් වැළකී සිටියහොත්, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනවාත් සමඟ ම, ඡන්දය දීමෙන් වැළකුණු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් ප්‍රකාශයට පත් කිරීමට ලේකම්වරයා පියවර ගත යුතු ය.

*ඡන්දය දීමෙන් වැළකුණු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඵල සටහන් කිරීම.*

(9) සභාපති නිලවරණය සඳහා අපේක්ෂකයන් ලෙස මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පමණක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක, ඔවුන් දෙදෙනා අතරින් සභාපතිවරයකු තෝරා ගැනීම සඳහා ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීමක් කළ යුතු අතර, අදාළ සභා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ගේ ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දයක් යම් අපේක්ෂක මන්ත්‍රීවරයෙකු විසින් ලබා ගෙන ඇත්නම්, එම අපේක්ෂක මන්ත්‍රීවරයා සභාපතිවරයා ලෙස පත් වූ බව ලේකම්වරයා විසින් ප්‍රකාශ කළ යුතු ය. මේ අවස්ථාවේදී ලේකම්වරයා විසින් 04(7) හා 04(8) අනුරීති අනුගමනය කළ යුතු ය.

*අපේක්ෂකයන් දෙදෙනෙකු අතර නිලවරණයකදී බහුතර ඡන්දය ලබා ගත් අයගේ නම ප්‍රකාශ කිරීම.*

(10) අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති අවස්ථාවක දී එක් අපේක්ෂකයකු අනෙක් අපේක්ෂකයින් සියලු දෙනා ම ලබා ගන්නා මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා නොගනී නම්, අඩු ම ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා අපේක්ෂකයාගේ නම ඡන්ද විමසීමෙන් බැහැර කොට, යළිත් ඉතිරි අපේක්ෂකයන් අතර ඡන්දය විමසිය යුතු ය. මෙසේ සෑම විමසීම් වාරයකදී ම අඩු ම ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා අපේක්ෂකයා ඡන්ද විමසීමෙන් බැහැර

*අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක නිල වරණයකදී කටයුතු කරන ආකාරය.*

කරමින්, එක් අපේක්ෂකයකු, ඉතිරි අපේක්ෂකයා ලබා ගන්නා ඡන්ද සංඛ්‍යාවට හෝ ඉතිරි අපේක්ෂකයින් සියලු දෙනා ලබා ගන්නා මුළු ඡන්ද සංඛ්‍යාවේ එකතුවට හෝ වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක් අවස්ථානුකූලව ඡන්ද විමසීම කරගෙන යා යුතු ය.

(11) (1) අපේක්ෂකයින් තිදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු අතර පැවැත්වෙන ඡන්ද විමසීමකදී, අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු එක සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අවස්ථාවකදී, මෙහි 04(10) අනු රීතිය යටතේ ඉන් එක් අපේක්ෂකයකු ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු වන විට, එක සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයින් අතුරින් බැහැර කළ යුතු අපේක්ෂකයා හඳුනා ගැනීමට, එම සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන් අතර නැවත ඡන්ද විමසීමක් සිදු කළ යුතු ය. එවිටත් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණ හොත්, ලේකම්වරයා තීරණය කරන අන්දමට කුසපත් ඇදීම මගින් බැහැර කළ යුතු අපේක්ෂකයා හඳුනා ගත යුතු ය.

*අපේක්ෂකයන් තිදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක නිල වරණයකදී සහ අපේක්ෂකයන් දෙදෙනා අතර ඡන්ද සමාන ව බෙදී ගිය අවස්ථාවක කුසපත් ඇදීම.*

(2) මේ ආකාරයට බැහැර කරමින් අපේක්ෂකයින් දෙදෙනෙකු අතර නිල වරණය පැවැත්වෙන අවස්ථාව දක්වා එළැඹුණු විට, අවස්ථාවෝචිත ව රීති අංක 04(9) හෝ 04(12) රීතීන් අනුගමනය කර ඡන්ද විමසීම පවත්වා සභාපතිවරයා තෝරා පත් කර ගත යුතු ය.

(12) අපේක්ෂකයින් දෙදෙනෙකු අතර පැවැත්වෙන ඡන්ද විමසීමකදී ඡන්ද සංඛ්‍යාව සමසේ බෙදී යන්නේ නම්, නැවත වරක් ඡන්දය විමසිය යුතු අතර, එම ඡන්දය විමසීමේදී ද ඡන්ද සමසේ බෙදී යන්නේ නම්, ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු අපේක්ෂකයා තෝරා ගැනීම, ලේකම්වරයා තීරණය කරන අන්දමට කුසපත් ඇදීම මගින් සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

*අපේක්ෂකයන් දෙදෙනෙකු අතර ඡන්ද විමසීමකදී ඡන්දය සමාන වූ අවස්ථාවකදී ක්‍රියා කරන අයුරු*

(13) ගණන් කරනු ලබන ඡන්ද පත්‍රිකා පෙට්ටියක තැන්පත් කළ යුතු අතර, යම් මන්ත්‍රීවරයකු සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරනු ලැබූ විට එම ඡන්ද පෙට්ටිය සභාව ඉදිරියේ මුද්‍රා යොදා තුන් මාසයක කාලයක් ලේකම්වරයා භාරයේ තැබීමෙන් අනතුරුව, සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය අනුව ලේකම්වරයා විසින් එකී ඡන්ද පත්‍රිකා සහ ඡන්දයට භාවිතා කළ අනිකුත් ලියවිලි පුළුස්සා දමා, එසේ කළ බව එළැඹෙන සභාවට දැනුම් දිය යුතු ය.

*ඡන්දයෙන් පසු ඡන්ද පත්‍රිකා සහ අනෙකුත් ලියවිලි සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය.*

(14) ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසුව හිස් ඡන්ද පත්‍රිකා සහ ඡන්දය සඳහා භාවිතා කළ අනෙකුත් ලියකියවිලි මුද්‍රා තබා,

*හිස් ඡන්ද පත්‍රිකා සම්බන්ධයෙන් ක්‍රියා*

මාස තුනක් ගත වන තුරු ලේකම් භාරයේ තබා ගැනීමෙන් අනතුරුව, සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය අනුව එකී හිස් ඡන්ද පත්‍රිකා පුළුස්සා දමා, එසේ කළ බව එළැඹෙන සභාවට දැනුම් දිය යුතු ය. *කළ යුතු අයුරු.*

(15) මෙම විධිවිධාන යටතේ සභාපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ඡන්ද විමසීමක් අඩාල ව කල් තැබිය නොහැකි ය. *සභාපතිවරයා තෝරන ඡන්දයක් අඩාලව කල් තැබිය නොහැකි බව.*

**නියෝජ්‍ය සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම :**

05. (1) නියෝජ්‍ය සභාපතිවරයා තෝරා පත් කර ගන්නා අවස්ථාවේදී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, නියෝජ්‍ය සභාපතිවරයා තෝරා ගැනීම සඳහා වන ඡන්ද විමසීම මෙහෙයවීමද සභාපතිවරයා විසින් කළ යුතු ය. *නියෝජ්‍ය සභාපති තෝරා පත් කර ගැනීම සභාපතිවරයා විසින් සිදු කිරීම.*

(2) නියෝජ්‍ය සභාපතිවරයා තෝරා පත් කර ගැනීමේදී, සභාපතිවරයා තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු රීති අංක 04 හි දක්වන්නා වූ අනුරීතිවල සඳහන් කර ඇති ක්‍රියා පිළිවෙත ම අනුගමනය කළ යුතු ය. *නියෝජ්‍ය සභාපති තෝරා ගැනීම සඳහාත් රීති අංක 04 අනුගමනය කිරීම.*

**සභාපති හෝ නියෝජ්‍ය සභාපති ප්‍රතිඥා හෝ දිවුරුම් දීම :**

06. දැනටමත් මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දී තිබෙන නමුත් සභාපති ධූරයට හෝ නියෝජ්‍ය සභාපති ධූරයට තේරී පත් වූ තැනැත්තන් ප්‍රතිඥාව හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් ඔහුගේ ධූරයේ කාර්යය ආරම්භ නොකළ යුත්තේ ය. පළාත් සභාවේ සභාපතිවරයා පළාත් සභාවේ ලේකම්වරයා ඉදිරියේදීද, නියෝජ්‍ය සභාපතිවරයා පළාත් සභාවේ සභාපතිවරයා ඉදිරියේදීද ප්‍රතිඥාව හෝ දිවුරුම දිය යුතු ය. *සභාපති හෝ නියෝජ්‍ය සභාපති ප්‍රතිඥා හෝ දිවුරුම් දීම සහ ධූරයන්හි කාර්යය ආරම්භ කරන අයුරු.*

**සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වූ අවස්ථාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තෝරා පත් කර ගැනීම :**

07. (1) සභාවේ මන්ත්‍රී ධූරය අහෝසි වීම නිසා හෝ විධිමත් ඉල්ලා අස්වීමේ ලිපියක් මගින් ඉල්ලා අස්වීම නිසා හෝ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2) (ඇ) වගන්තිය යටතේ *කවර අවස්ථාවක හෝ සභාපති ධූරය හිස් වූ අවස්ථාවක*

ධූරයෙන් ඉවත් කිරීම නිසා හෝ මරණයට පත්වීම නිසා හෝ, සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වන සෑම අවස්ථාවක ම සභාව විසින් අවස්ථාවෝචිත පරිදි සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය දැරීම සඳහා මන්ත්‍රීවරුන් අතුරින් සුදුස්සෙකු තෝරා ගත යුතු ය.

*සභාපති හෝ නියෝජ්‍ය සභාපති තෝරා පත් කර ගැනීම.*

(2) (අ) සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වූ අවස්ථාවක, ලේකම්වරයා විසින් එසේ ධූරය හිස් වී ඇති බව, ඒ අවස්ථාවට පසුව පවත්වනු ලබන පළමු සභා කටයුතු පිළිබඳ කාරක සභාවට වාර්තා කළ යුතු අතර, සභා කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ඊළඟ ආසන්නත ම සභා රැස්වීමේදී හිස් වූ සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය තෝරා ගැනීමට හැකිවන පරිදි න්‍යාය පත්‍රය සකස් කළ යුතු ය.

*ඉහත ධූරයන් හිස් වූ විට ලේකම් විසින් සභා කටයුතු කාරක සභාවට වාර්තා කිරීම.*

(ආ) එසේ වුවද, සභා කටයුතු කාරක සභා රැස්වීම, පළාත් සභා රැස්වීමක් අතර කාල සීමාව තුළ දී එකී ධූරයන් හිස් වූ විට හදිසි සභා කටයුතු කාරක සභාවක් කැඳවා එය පිළිබඳව දැනුවත් කළ යුතු ය.

*සභා කටයුතු කාරක සභාව කැඳවීම*

(ඇ) රීති අංක (2) අනුව සභාපති ධූරය හිස් වූ අවස්ථාවක සභා කටයුතු කාරක සභාවේ මුලසුන නියෝජ්‍ය සභාපතිවරයාද, ධූරයන් දෙකම හිස් වූ අවස්ථාවක සභා කටයුතු කාරක සභාවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ කැමැත්තෙන් පත් වන අයෙකු මුලසුන සඳහා පත් කර ගත යුතු අතර, එවලේ කාරක සභාවේ ගණපූරණය තිබිය යුතු ය.

(3) එසේ න්‍යාය පත්‍රය සකස් කිරීමේදී එකී තෝරා ගැනීම, එදිනට නියමිත න්‍යාය පත්‍රයේ ප්‍රථම කටයුත්ත ලෙස ඇතුළත් කළ යුතු ය.

(4) එසේ ධූරය හිස් වූ අවස්ථාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තේරීම සඳහා ඡන්ද විමසීමේ කටයුතු රීති අංක 04 හා 05 හි සඳහන් විධිවිධානවලට අනුව සිදු කළ යුතු ය.

*ධූරය හිස් වූ විට අනුගමනය කළ යුතු රීති*

**සභාපති නාමාවලිය :**

08. (1) එක් එක් සැසිවාරය ආරම්භයේදී සභාපතිවරයා විසින් හෝ නියෝජ්‍ය සභාපතිවරයා විසින් මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් යුත් සභාපති නාමාවලියක් නම් කළ යුතු

*සභාපති නාමාවලිය නම් කිරීම හා මූලාසනය ගැනීම.*

අතර එකී නාමාවලිය සකස් කිරීමේදී අදාළ මන්ත්‍රීවරයාගේ ජ්‍යෙෂ්ටත්වය ද සැලකිල්ලට ගත යුතු ය.

(2) සභාපති තනතුර හෝ නියෝජ්‍ය සභාපති තනතුර හෝ පුරප්පාඩු වීම හෝ ඒ දෙදෙනාගෙන් කවරෙකුවත් සභා රැස්වීමේ මූලාසනය නොදැරීම හෝ සිදුවන අවස්ථාවලදී ඉහත කී සභාපති නාමාවලියට නම් කර ඇති මන්ත්‍රීවරුන්ගෙන් එක් අයෙකු, නම් කර ඇති අනුපිළිවෙළ අනුව පනතේ 7(3) ඡේදය යටතේ සභාපතිවරයාගේ රාජකාරී ඉටු කිරීම හෝ පනතේ 7(4) ඡේදය යටතේ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම හෝ කළ යුතු ය.

*සභාපති නාමාවලියේ කෙනෙකු මූලසුන දරන විට පනතේ 7(3) හා 7(4) අනුව බලය හිමි වීම.*

(3) සැසිවාරය තුළදී සභාපති නාමාවලියේ හටගන්නා පුරප්පාඩුවක් වන්නේ නම්, නම් කිරීමක් මගින් එම පුරප්පාඩුව පිරවීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය. සභාපති නාමාවලියේ නම්වල අනුපිළිවෙළෙහි වෙනසක් කිරීමට ද සභාපතිවරයාට හැකි විය යුතු ය.

*සභාපති නාමාවලියේ පුරප්පාඩු පිරවීම හා අනුපිළිවෙළ වෙනස් කිරීම.*

(4) සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා ද, සභාපති නාමාවලියේ සාමාජිකයන් සියලුදෙනා ද නොමැති අවස්ථාවකදී, රැස්ව සිටින මන්ත්‍රීවරුන් අතරින් එක් අයකු සභාපතිවරයා වෙනුවෙන් එම අවස්ථාවේදී සභාවේ කටයුතු පවත්වාගෙන යාමට සභාව විසින් පත් කර ගත යුතු ය.

*සභාපතිවරයා, නියෝජ්‍ය සභාපතිවරයා සහ සභාපති නාමාවලියේ සාමාජිකයන් නොමැති විට.*

## සභාපතිවරයාගේ බලතල සහ වගකීම් :

09. (1) සභා භූමිය හා ගොඩනැගිලි, සභාවේ ආරක්ෂක විධිවිධාන හා සභා ගර්භය පිළිබඳ සාමාන්‍ය පරිපාලනය සභාපතිවරයාගේ මෙහෙය වීම හා පාලනය යටතේ ඉටු විය යුතු අතර, ඒ සඳහා සියලු බලතල ඔහු සතු විය යුතු ය.

*සභාපතිවරයා සතු බලතල.*

(2) ඉහත 09(1) හි සඳහන් බලතල වනුයේ ස්ථිර, තාවකාලික හා ආනුෂාංගික රීති බලාත්මක කිරීමේ අයිතිය වන අතර, ස්ථිර රීති හැර තාවකාලික හා ආනුෂාංගික රිති සභාපතිවරයාගේ අභිමතය පරිදි ලිහිල් කළ හැක්කේ ය.

*රීති බලාත්මක කිරීම හා තාවකාලිකව හා ආනුෂාංගික රීති ලිහිල් කිරීම.*

(3) සභාපතිවරයාගේ නියෝගවල බලාත්මක භාවය තහවුරු කිරීම සඳහා වන රීති උල්ලංඝණය වන අවස්ථාවන්ට අදාළ ව සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක වන ආකාරය පරිශිෂ්ටයේ සඳහන් වේ.

(4) මීට සමාන්තරව 68 සිට 78 දක්වා රීති යටතේ වන බලතල

ක්‍රියාවට නැඟීමේ අභිමතය සභාපතිවරයා සතු විය යුතු ය.

(5) කාරක සභාවලදී, කාරක සභාවල සභාපතිවරුන්ගේ බලතලද, සභාපතිවරයාගේ බලතල යටතේ පැන නඟින අතර, යම් හෙයකින් එකී කාරක සභාවලට සාක්ෂිකරුවන් හා ලේඛන කැඳවීමේදී, එකී පුද්ගලයන් එකී කැඳවුම් නියෝග කඩ කළ අවස්ථාවකදී, එය පළාත් සභාවේ වරප්‍රසාද කඩ කිරීමක් ලෙස සැලකිය යුතු ය. එවැනි අවස්ථාවක අදාළ නිලධාරීන් හෝ පුද්ගලයන්ට එකී වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරීම ආයතන සංග්‍රහයේ හා පවතින නීතියේ ප්‍රතිපාදන අනුව සිදු කළ යුත්තේ ය.

*කාරක සභාවන්වලට කැඳවන නිලධාරීන් කැඳ වූ නියෝග කඩ කිරීම් කළ විට ක්‍රියාත්මක වන ආකාරය.*

(6) සභාවේ කටයුතු සම්බන්ධයෙන් මෙම රීති මගින් විධිවිධාන සලස්වා නොමැති සියලුම කරුණු, අවස්ථානුකූලව මෙහෙයවීමේ බලය සභාපතිවරයා සතු වන්නේ ය.

*රීතිවලින් පනවා නැති කාරණා මෙහෙයවීමේ බලය සභාපතිවරයා සතුය.*

(7) සභාපති ධූරය හිස්ව පවතින විට හා සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණ ඇති විට මූලසුන හොබවන තැනැත්තා සභාපතිවරයා සතු බලතල හා වගකීම් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

*මූලසුන දරන්නාට සභාපති බලතල හිමි වීම.*

(8) සභාවේ කටයුතු සම්බන්ධයෙන් සභාපතිවරයා සතු අභිමතයට අභියෝග කළ නොහැක්කේ ය.

*සභාපති අභිමතයට අභියෝග කළ නොහැකි බව.*

(9) සභාපතිවරයා විසින් සභාවේ කටයුතු කාර්යක්ෂම හා සඵල ආකාරයට ඉටු කර ගැනීම සඳහා අදාළ කාරක සභා පත් කළ යුත්තේ ය. මෙකී කාරක සභාවල බලතල 82 සිට 100 දක්වා වගන්තිවල සඳහන් වන අතර, එකී කාරක සභාවල සභාපතිවරුන්ට, සභාපතිවරයාගේ බලතල යටතේ බලය ලැබෙන්නේ ය.

*වරප්‍රසාද ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීම.*

(10) මන්ත්‍රීවරයෙකු සභාව හමුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළ විට ඒ පිළිබඳ කටයුතු කිරීමේ පූර්ණ බලතල සභාපතිවරයා සතු වන්නේ ය.

(11) සභාවේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක්, යෝජනාවක්, වරප්‍රසාද ප්‍රශ්නයක් සභාවට හෝ කාරක සභාවට ගෙන එන්නේ නම් හෝ යොමු කරන්නේ නම් එම කාරණාව අදාළ අමාත්‍යවරයා වෙත යොමු කිරීම සහ එකී අමාත්‍යවරයාගෙන් පෙරළා පිළිතුරක් ලබා ගැනීම සභාපතිවරයාගේ වගකීම වන අතර ඒ සම්බන්ධව ගත් ක්‍රියා මාර්ගය පිළිබඳව අදාළ මන්ත්‍රීවරයා

*සභාවේ කථා වන ඕනෑම කරුණක් පිළිබඳ අදාළ විෂයය භාර අමාත්‍යවරයාගෙන් පිළිතුරක් ලබා අදාළ මන්ත්‍රීවරයා දැනුවත් කිරීම*

දැනුවත් කිරීමට සභාපතිවරයා කටයුතු කළ යුතු ය. *සභාපතිවරයාගේ වගකීම බව.*

**නියෝජ්‍ය සභාපතිවරයා සතු බලතල සහ වගකීම් :**

10. (1) සභාපති ධූරය හිස්ව පවතින අවස්ථාවකදී හෝ සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණ ඇති විට පළාත් සභා පනතේ 7(3) හා 7(4) වගන්ති ප්‍රකාරව සභාපතිවරයා සතු බලතල හා වගකීම් නියෝජ්‍ය සභාපතිවරයා විසින් ඉටු කරනු ලැබිය යුතු ය. *නියෝජ්‍ය සභාපතිවරයා සතු බලතල හා වගීම් ක්‍රියාත්මක කිරීම.*

(2) සභාවේ සභාපතිවරයා යම් කාරක සභාවක සභාපති ධූරය හොබවයිද ඔහු නොමැති අවස්ථාවකදී එකී කාරක සභාවන්හි මූලාසනය නියෝජ්‍ය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. *සභාපතිවරයා සිටින කාරක සභාවල කටයුතු කරන අයුරු.*

11. **සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම :**

සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) සහ 8 වගන්ති සහ 55 රීතිය අනුව කටයුතු කළ යුතු ය. *සභාපති සහ නියෝජ්‍ය සභාති ධූරයෙන් ඉවත් කිරීම.*

**ලේකම්වරයාගේ රජකාරී :**

12. (1) පනතේ 17(1) ප්‍රකාරව සභාවේ ලේකම් කාර්ය මණ්ඩලයක් විය යුතු අතර, ලේකම් කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා සභාවේ ලේකම්වරයා විය යුතු ය. *සභා ලේකම් කාර්ය මණ්ඩලය සහ එහි ප්‍රධානියා.*

(2) සභා රැස්වීමකදී හෝ සභාවේ පූර්ණ කාරක සභා රැස්වීමකදී ගනු ලැබූ තීරණයන් හා පැමිණිලි හා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් සටහන් කළ කාර්ය සටහන්වල පිටපතක්, එම සභා රැස්වීම් දිනට පසුව එළැඹෙන පළමු සභා රැස්වීමේදී ලේකම්වරයා විසින් මන්ත්‍රීවරුන් අතර බෙදා දිය යුතු ය. *කාර්ය සටහන් මන්ත්‍රීවරුන් අතර බෙදා දීම.*

(3) සභා රැස්වීමකදී හෝ සභාවේ පූර්ණ කාරක සභා රැස්වීමකදී සිදු වූ කටයුතුවල සියලු විස්තර ඇතුළත් නිල [හැන්සාඩ්] වාර්තාවක පිටපතක් ලේකම්වරයා විසින් මන්ත්‍රීවරුන්ට ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය. එම නිල [හැන්සාඩ්] වාර්තාව සකස් කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. *නිල (හැන්සාඩ්) වාර්තා මන්ත්‍රීවරුන් අතර බෙදා දීම.*

(4) සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කොට බෙදා හැරීමද, මෙම රීති අනුව හෝ ප්‍රඥප්ති අනුව හෝ අවශ්‍ය වන ලිපි ලේඛන හා පොත්පත් පවත්වාගෙන යෑමද, මෙම රීති හෝ ප්‍රඥප්ති අනුව නියම කෙරෙන සියලු ම කටයුතු ඉටු කිරීම ද ලේකම්වරයාගේ රාජකාරිය සහ වගකීම විය යුතු ය. *ලේකම්වරයා සතු සෙසු රාජකාරී.*

(5) පොත්පත්, වාර්තා, සටහන් සහ වෙනත් ලේඛනවල ආරක්ෂාව තහවුරු කිරීම ලේකම්වරයාගේ වගකීම වන්නේ ය. මන්ත්‍රීවරුන්ට එම පොත්පත්, වාර්තා සටහන් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ලේකම්වරයා විසින් ඒ සඳහා ඉඩ සලසා දිය යුතු ය.

(6) පටිගත කළ හෝ රූපගත කළ මන්ත්‍රීවරුන් විසින් සභාවේදී කරන ලද කථාවලට සවන් දීමට හෝ පිටපත් ගැනීමට කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කැමැත්තට යටත් ව අදාළ රැස්වීම් දිනයේ සිට තුන් මාසයක් ගත වන තුරු ඉඩ සැලසීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. *පටිගත කළ, රූපගත කළ මන්ත්‍රීවරුන්ගේ කථා නිකුත් කිරීම හා එහි කාලය.*

(7) ආරක්ෂා කර තබා ගත යුතු බවට සභාවේ හෝ සභාපතිවරයාගේ හෝ නියෝගයක් නොමැති නම්, යම් රැස්වීම් දිනයක සිට හය මාසයක් ඉක්ම ගිය පසු, එම රැස්වීමේදී පටිගත කරන ලද කථා මකා දමා පටිගත කිරීම සඳහා භාවිතා කළ අයිතමයන් යළි පරිහරණය කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයාට හැකි ය. *පටිගත කරන ලද කථා මකා දැමීම.*

(8) සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කිරීමටද, එම න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීමටද, එම න්‍යාය පත්‍රය පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමටද, ලේකම්වරයා විසින් අවස්ථානුකූලව, සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ අදහස පරිදි හෝ සභාපතිවරයාගේ නියමය පරිදි හෝ තම අභිමතය පරිදි හෝ හැකි සියලු පියවර ගත යුතු ය. *න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේදී උපදෙස් ගන්නා අයුරු.*

### ධූරධාරීහු :

### සභානායක ධූරය :

13. (1) (අ) සභාවෙහි සභානායක ධූරයක් තිබිය යුතු ය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් සභානායකවරයා පත් *සභානායක පත් කිරීම.*

කළ හැක්කේ ය.

(ආ) පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු විසින් සභාවෙහි ඉදිරිපත් කළ යුතු යෝජනාවක් හැරෙන්නට සභාවෙහි කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය වන සියලු අනිකුත් යෝජනා සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යුතු ය. සභානායකවරයා නොමැති අවස්ථාවක අමාත්‍යවරයෙකුට එකී යෝජනාව ඉදිරිපත් කළ හැක්කේ ය. *සභානායකවරයා සතු සභාවේ කටයුතු.*

(ඇ) පළාත් අමාත්‍යවරයෙකු සභාව නියෝජනය නොකරනු ලබන අවස්ථාවක, එකී පළාත් අමාත්‍යවරයා විසින් පවරනු ලබන කටයුතු ඔහු වෙනුවෙන් සභාව තුළදී ඉටු කළ යුත්තේ ය. *අමාත්‍යවරුන් වෙනුවෙන් (පවරන) සභාවේ කටයුතු කිරීම.*

**විපක්ෂනායක ධූරය :**

(2) (අ) සභාවෙහි විපක්ෂ නායක ධූරයක් තිබිය යුතු ය. සභාවේ විපක්ෂයේ දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් අතර වැඩි ම මන්ත්‍රී කණ්ඩායමක් සිටින පක්ෂයට හෝ කණ්ඩායමට විපක්ෂනායක ධූරය හිමි විය යුතු ය. *විපක්ෂ නායක ධූරය.*

(ආ) සභාවේ කටයුතුවලදී විපක්ෂයේ පක්ෂ හෝ කණ්ඩායම්වල මන්ත්‍රීවරුන් වෙනුවෙන් ක්‍රියා කිරීම, විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් නියෝජනය කිරීම, විපක්ෂයට අදාළ ව ගත යුතු තීරණ පිළිබඳව අවශ්‍ය අවස්ථාවලදී සභාපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම විපක්ෂනායකවරයාගේ කාර්යභාරය වේ. *විපක්ෂ නායකවරයාගේ කාර්ය භාරය.*

**ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධූරය :**

(3) (අ) සභාවෙහි ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධූරයක් තිබිය යුතු ය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා පත් කළ යුතු ය. *ආණ්ඩු පක්ෂයේ සංවිධායක පත් කිරීම.*

(ආ) සභාව හමුවේ ඇති යෝජනා සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය සංවිධානය කර, සභාවේ කාර්යය පහසු කරලීම සහ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම්වල ගණපූරණය පවත්වාගෙන යාම පිළිබඳව කටයුතු කිරීම, සභාවේ පැවැත්ම හා ක්‍රියාකාරීත්වය වෙනුවෙන් වැදගත් වන්නා වූ කාරණාවන්හි දී ඒ පිළිබඳ සාකච්ඡා කොට තීන්දු ගැනීමට සහ සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ සියලු ම දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා සභාපතිවරයාට සහාය වීමද ආණ්ඩු පක්ෂ *ආණ්ඩු පක්ෂයේ සංවිධායකගේ කාර්ය භාරය.*

සංවිධායකගේ කාර්යභාරය වන්නේ ය.

**විපක්ෂයේ සංවිධායක ධූරය :**

(4) (අ) සභාවෙහි විපක්ෂයේ විපක්ෂ සංවිධායක ධූරයක් තිබිය යුතු ය. විපක්ෂනායකවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් විපක්ෂයේ සංවිධායකවරයා පත් කළ යුතු ය.

*විපක්ෂයේ සංවිධායක පත් කිරීම.*

(ආ) සභාව හමුවේ ඇති යෝජනා සම්බන්ධයෙන් විපක්ෂය සංවිධානය කර සභාවේ කාර්ය පහසු කරලීම සහ එමගින් සභාවේ වැඩ කටයුතුවලට විපක්ෂයේ පක්ෂ හා කණ්ඩායම්වල සහාය ලබා දීම, ගණ පූරණය පවත්වාගෙන යාම පිළිබඳ කටයුතු කිරීම, සභාවේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් වැදගත් වන්නා වූ කාරණාවන්හිදී, ඒ පිළිබඳව සාකච්ඡා කොට තීන්දු ගැනීම සහ සභාවේ නියෝජනය වන සියලු ම විපක්ෂයේ දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ගේ අදහස් ලබා ගැනීම සඳහා සභාපතිවරයාට සහාය වීම විපක්ෂයේ සංවිධායකවරයාගේ කාර්යභාරය වන්නේ ය.

*විපක්ෂ සංවිධායකගේ කාර්ය භාරය.*

**සභා රැස්වීම් :**

14. (1) (අ) සෑම වර්ෂයක ම පවත්වනු ලබන ප්‍රථම සභා රැස්වීම ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්විය හැක්කේ ය.

*සෑම වසරකම පළමු සභා රැස්වීම ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් හෝ සභාපතිවරයාගේ මූලිකත්වයෙන්.*

(ආ) එසේ වුවද, ආණ්ඩුකාරතුමා සහභාගී නොවන අවස්ථාවකදී සභාපතිතුමාගේ මූලිකත්වයෙන් රැස් විය යුතු ය.

(2) (අ) සභාව වෙනත් තීරණයක් නොගනී නම්, සෑම මාසයක ම පළමු වන ඉරු දිනට සහ තුන්වන ඉරුදිනට පසුව එළැඹෙන අඟහරුවාදා දිනයෙහි සභා රැස්වීම පැවැත් විය යුතු ය.

*සභා රැස්වීම් දිනය පළමුවන සහ තුන්වන ඉරු දිනෙන් එළැඹෙන අඟහරුවාදා දිනයන්.*

(ආ) එසේ වුවද, එවැනි දිනයන් අදාළ මාසයට නොයෙදෙන්නේ නම්, ඒ සඳහා අදාළ මාසයේ අවසානයේ ඇති වැඩ කරන දිනය යොදාගත යුතු ය.

(3) හදිසි වැඩ කටයුතු ගැන ක්‍රියා කළ යුතුව ඇති අවස්ථාවලදී ඉහත 14(1) රීතියේ විධාන නොසලකා, සභා රැස්වීමකදී දිනය සඳහන් කරමින්, "............. දින මෙම සභාව රැස්විය යුතුය........." යන යෝජනාව සම්මත කර ගැනීමෙන් එදිනට

රැස් විය හැකි ය.

(4) ආණ්ඩුකාරවරයා විසින් කැඳවනු ලබන රැස්වීමකට ඉහත අංක 14(1) හා 14(2) රීති බලනොපානු ඇත. *ආණ්ඩුකාරවරයා සභාව කැඳවීම*

(5) සභා රැස්වීමක් පෙරවරු 09.30 ට ආරම්භ විය යුතු ය. එසේ වුවද, ආණ්ඩුකාරවරයා විසින් කැඳවනු ලබන රැස්වීමක්, ඒ වෙනුවෙන් ආණ්ඩුකාරවරයා විසින් නිකුත් කරනු ලබන දැන්වීමෙන් නියම කෙරෙන වේලාවට ආරම්භ විය යුතු ය. *සභා රැස්වීමක ආරම්භක වේලාව.*

(6) පස්වරු 02.00 ට අවධානයට යොමුව ඇති කටයුත්තක් වෙතොත් එය නිම විය යුතු අතර, සභාව කාරක සභා අවස්ථාවේ පසු වේ නම්, නැවත සභා අවස්ථාවට පැමිණ 31 වන රීතිය යටතේ කටයුතු කරගෙන යා හැකි ය. දිනට නියමිත න්‍යාය පත්‍රයෙහි ඇතුළත් සභාවේ වැඩ කටයුතු පස්වරු 02.00 ට අවසන් විය යුතුව ඇත්නම්, සභාව කල් තැබීමේ වේලාවේ සිට විනාඩි 30 කට නොවැඩි කාලයක් 31 වන රීතිය යටතේ කටයුතු සඳහා යොදා ගත හැකි ය. *රීති අංක 31 යටතේ කටයුතු කිරීමේ අවස්ථාව.*

(7) (අ) රීති අංක 110 යටතේ ඉදිරිපත් වූ යෝජනාවක් හෝ වෙනත් යෝජනාවක් විවාද වී 14(6) රීතිය ප්‍රකාරව කටයුතු කොට පස්වරු 02.00 ට කලින් අවසන් වූයේ නම්, 31 වන රීතිය යටතේ කටයුතු සඳහා යොදා ගත හැකි ය. *රීති අත්හිටුවීමේ යෝජනාවකින් අනතුරුව 31 යටතේ ක්‍රියා කිරීම.*

(ආ) පස්වරු 2.30 ට හෝ 31 වන රීතිය යටතේ කටයුතු අවසන් කිරීම හෝ යන දෙකින් වඩාත්, කලින් එළැඹෙන අවස්ථාවේදී සභාපතිවරයා විසින් සභාව කල් තැබිය යුතු ය. *සභාපතිවරයා සභාව කල් තබන අවස්ථාවන්.*

(ඇ) දිනට නියමිත න්‍යාය පත්‍රයේ කිසියම් විශේෂිත කාර්යයක් එදිනම නිමාවට පත් කර ගත යුතු යැයි සලකතොත්, 14 වන රීතියේ (6) වන හා (7) වන අනු රීතිවල බලපෑමෙන් නිදහස් ව එය කරගෙන යා හැක්කේ, ඒ පිළිබඳව සභානායකවරයා හෝ අමාත්‍යවරයකු විසින් ගෙන එනු ලබන යෝජනාවක් සම්මත කර ගැනීමෙනි. “න්‍යාය පත්‍රයේ අංක ...... දරන විෂයය පිළිබඳ වැඩ කටයුතු අංක 14(5) හා 14(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතු ය.” යනුවෙන් සඳහන් විය යුතු එම යෝජනාව විවාදයට භාජනය නොවිය යුතු ය. ඒ යෝජනාව සම්මත වුවහොත් ඒ අනුව කටයුතු කරගෙන යා හැකි ය. *14 (5) හා (6) යන අනු රීතිවලින් නිදහස්ව කටයුතු කිරීමට ඇති අවස්ථාව.* *පස්වරු 02.00 න් පසුව සභාව පැවැත්වීම.*

(ඈ) සභාපතිවරයාගේ අවසරය ලැබෙන ඕනෑ ම අවස්ථාවක

14(7)(ඇ) හී සඳහන් පරිදි යෝජනාව ඉදිරිපත් කළ හැකි ය.

(8) රීති අංක 14(7)(ආ) යටතේ වන විෂයයක් සම්බන්ධයෙන් කෙරෙන වැඩ කටයුතු පස්වරු 2.00 පසුවී නිමා වන්නේ නම් හා 31 වන රීතිය යටතේ දැනුම් දී ඇති ප්‍රශ්න ඉතා හදිසි ස්වරූපයේ ඒවා බව සභාපතිවරයා නිගමනය නොකරන්නේ නම්, කල් තැබීමේ යෝජනාවක් නොමැතිව සභාව වහාම කල් තැබීමට සභාපතිවරයාට හැකි විය යුතු ය. *කල් තැබීමේ යෝජනාවක් නොමැතිව සභාව කල් තැබීම.*

## කල් තැබීම හා අත්සිටුවීම :

15. (1) (අ) සභා නායකවරයාට හෝ ඇමතිවරයකුට හෝ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ හැකි ය. *සභාව කල් තැබීමේ යෝජනාව.*

(ආ) නියමිත දිනයක් සඳහන් නොකර, “දැන් සභාව කල් තැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන්නේ නම්, ඊට සභාවේ එකඟත්වය විමසා, සභාව ඊට අවසර දෙන්නේ නම් එහි අදහස විය යුත්තේ, රීති අංක 14(2) යටතේ ඊළඟට සභාව රැස් විය යුතු දින පෙරවරු 09.30 දක්වා සභාව කල් තැබීම ය. *ඊළඟ රැස්වීම් දින පෙ.ව. 9.30 දක්වා කල් තැබීම.*

(ඇ) යෝජනාවේ නියමිත දිනයක් හා වේලාවක් සඳහන් වන්නේ නම්, එම යෝජනාව සම්මත වූ විට එකී දින, එකී වේලාවට සභාව රැස් විය යුතු ය.

(ඈ) “දින නියමයක් නොමැතිව සභාව කල් තැබිය යුතු ය” යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකි ය.

(2) (අ) සභාවක හෝ පූර්ණ කාරක සභාවක නොසන්සුන්තාවයක් ඇති වුවහොත් සභාපතිවරයා නියම කරන කාලයකට එම සභාව හෝ පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවිය හැකි ය. *නොසන්සුන්තාවයක් ඇති විට සභාව හෝ පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවීම.*

(ආ) සභාපතිවරයාගේ අභිමතය පරිදි ඉහත කාරණාවලින් බැහැර ව වුවද, සභාව හෝ පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවිය හැකි ය. *සභාපති අභිමතය පරිදි සභාව හෝ පූර්ණ කාරක සභාව අත්සිටුවීම.*

(ඇ) සභාවේ දැඩි නොසන්සුන්තාවයක් ඇති වුවහොත් එය පාලනය කිරීමට සභාව කල් තැබිය යුතු යැයි සභාපතිවරයා අදහස් කරන විට, සභාව කල් තැබීමට සභාපතිවරයා පියවර ගත යුතු ය.

(ඇ) ඉහත 2(ඇ) වගන්ති අනුව සභාව කල් තැබුවහොත් එකී කල් තබන අවස්ථාවේදී විවාදගත ව පැවති යෝජනාව, ඊළඟ සභා වාරයේ න්‍යාය පත්‍රයට අනිවාර්යයෙන් ඇතුළත් කොට ප්‍රමුඛතා ව ලබා දිය යුතු ය. *ඊට අනුකූලව විවාදය ඊළඟ න්‍යාය පත්‍රයට යොමු කිරීම.*

(3) සභාව කල් තැබෙන අවස්ථාවේදී සාකච්ඡාවට නොගැණුනු න්‍යාය පත්‍රයේ අඩංගු සියලු කරුණු ඊළඟ සභා රැස්වීමේ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුය. *න්‍යාය පත්‍රයේ සියුල විෂයයන් ඊළඟ න්‍යා ය පත්‍රයට යොමු වීම.*

**ගණපූරණය :**

16. (1) පළාත් සභා පනතේ 10(4) වන වගන්තියෙන් නියමිත පරිදි සභාවේ ගණපූරණය මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය. සභාවේ ගණපූරණයක් නොමැති බව සභාපතිවරයාට පෙනී යන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවධානය යොමු කරවනු ලබන සෑම විටකදී ම, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කළ යුතු ය. විනාඩි 5 ක කාලය ඇවෑමෙන් ගණපූරණයක් ඇති නොවේ නම්, පළාත් සභා පනතේ 10(5) වගන්ති අනුව සභාව කල් තැබීමට හෝ ගණපූරණයක් ඇති වන තුරු රැස්වීම අත්සිටුවීමට හෝ සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය. ගණපූරණය ගණන් ගැනීමේදී සභාපතිවරයා ද ඊට ඇතුළත් විය යුතු ය. *සභාවේ ගණපූරණය. (මන්ත්‍රී සංඛ්‍යාව 35 කි)*

*ගණපූරණය නොමැති විට පනතේ 10(5) වගන්තිය අනුව කටයුතු කිරීම.*

(2) මුළු සභාව ම පූර්ණ කාරක සභාවක් වශයෙන් රැස්වන විට අවශ්‍ය ගණපූරණය ද සභාව සඳහා අවශ්‍ය ගණපූරණය ම විය යුතු ය. මුළු සභාව ම කාරක සභාවක් වශයෙන් රැස් වන අවස්ථාවේදී ගණපූරණයක් නොමැති බව සභාපතිවරයාට පෙනී යන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයකු විසින් ඔහුගේ අවධානය යොමු කරවනු ලබන සෑම විටකදී ම කැඳවීම් සීනුව නාද කරවීමට සභාපතිවරයා විසින් නියෝග කළ යුතු අතර, විනාඩි 5 ක කාලයක් අවසානයේදීත් ගණපූරණයක් ඇති නොවේ නම්, යළි සභා අවස්ථාවට එළැඹිය යුතු ය. යළිත් ගණපූරණයක් නොමැති නම්, සභාපතිවරයා සභාව කල් තැබීම හෝ ගණපූරණය ඇති වන තුරු අත්සිටුවීම හෝ කළ යුතු ය. ගණපූරණය ගණන් ගැනීමේදී සභාපතිවරයා ද ඊට ඇතුළත් විය යුතු ය. *පූර්ණ කාරක සභාවේ ගණපූරණය ඇති වූ විට.*

**සභාවේ වැඩ කටයුතු කළ යුතු භාෂා :**

17. (1) සභාවේ වැඩ කටයුතු රාජ්‍ය භාෂාවලින් කරගෙන යා යුතු ය. එසේ වුවද, සභාවේදී කථා කිරීමේදී හා තම රාජකාරී කටයුතු ඉටු කිරීමේදී සම්බන්ධීකරණ භාෂාව භාවිතා කිරීමට මන්ත්‍රීවරුන්ට හැකි විය යුතු ය. *රාජ්‍ය භාෂාවන් සම්බන්ධීකරන භාෂාව*

(2) සභාවේදී පවත්වන ලද සෑම කථාවක් ම එය පවත්වන ලද භාෂාවෙන්, පළාත් සභා විවාද නිල[හැන්සාඩ්] වාර්තාවෙහි පළ විය යුතු ය. *කථා හැන්සාඩ් වාර්තාවේ පළවන අයුරු*

(3) සභාවේදී සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් එකකින් පවත්වන කථාවක භාෂණ පරිවර්තනවලට සවන් දීමට මන්ත්‍රීවරුන්ට පහසුකම් සලසා දීමට හැකි හැම අවස්ථාවකදී ම සභාපතිවරයා විසින් විධිවිධාන සැලසිය යුතු ය. *භාෂණ පරිවර්තනය.*

**පිට අය:**

18. (1) සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව මිස කිසිම පිටස්තර පුද්ගලයෙක් සභා රැස්වීමක් හෝ පූර්ණ කාරක සභාවේ රැස්වීමක් පැවැත්වෙන වේලාව තුළදී සභා ගර්භය සහ සභාපතිතුමා විසින් තීරණය කරනු ලබන එයට ආසන්න ප්‍රදේශයට ඇතුළු වීම හෝ රැඳී සිටීම නොකළ යුතු ය. *සභා රැස්වීම් අවස්ථාවේ පිට අය සභා ගර්භයට ඇතුල් නොවීම.*

(2) අවසර ලබා නොගෙන සභා ගර්භයේ රැඳී සිටින පිටස්තර පුද්ගලයකු ඉන් ඉවත් විය යුතු යැයි නියෝග කිරීමටද, අවසර ලබාගෙන තිබෙන්නේ වුවද, අවස්ථාවෝචිත ව හැඟී යන කරුණු මත යම් පිටස්තර පුද්ගලයකු සභා ගර්භයෙන් ඉවත් කළ යුතු බව සභාපතිවරයාට හැඟෙන්නේ නම්, එවන් අවස්ථාවකදීද එකී පිටස්තර පුද්ගලයාට සභා ගර්භයෙන් ඉවත් විය යුතු යැයි සභාපතිවරයා විසින් නියෝග කළ හැක්කේ ය. *පිටස්තර අය සම්බන්ධව කටයුතු කරන ආකාරය.*

(3) රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සභාපතිවරයාගේ නියමය පරිදි කැඳවනු ලැබූ නිලධාරීහු පිට අය වශයෙන් නොසැලකෙති.

(4) (අ) පළාත් සභා රැස්වීම ආවරණය කිරීම සඳහා ජනමාධ්‍ය නියෝජිතයන් සභා පරිශ්‍රයට ඇතුළු වීම සඳහා සභාපතිවරයාගෙන් අවසර ලබා ගත යුතු ය. *ජනමාධ්‍ය නියෝජිත යින්*

(ආ) පළාත් සභාවේ හෝ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝණය වන වාර්තාවක් හෝ අසත්‍ය වාර්තාවක් එම ප්‍රවෘත්ති මාධ්‍යයෙහි පළ කළහොත් අවවාද කිරීම හෝ සභාපතිතුමාගේ අභිමතය පරිදි කටයුතු කිරීම හෝ කළ හැකිය. *ඔවුන්ගේ වාර්තාවන් සම්බන්ධව.*

## සභාවේ වැඩ කටයුතු : [න්‍යාය පත්‍රයේ අනුපිළිවෙළ]

19. (1) සභාවේ වැඩ කටයුතු කරගෙන යා යුතු අනුපිළිවෙළ පහත සඳහන් පරිදි විය යුතු ය. *සභාවේ වැඩ කටයුතු කළ යුතු අනුපිළිවෙළ.*

අ. අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම්

ආ. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ

ඇ. සභාපතිවරයාගේ නිවේදන

ඈ. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

ඉ. ලිපි ලේඛන පිළිගැන්වීම

ඊ. කාරක සභා වාර්තා පිළිගැන්වීම

උ. පෙත්සම්

ඌ. ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම

එ. පෞද්ගලික ප්‍රකාශ කිරීම්

ඒ. කලින් අවසරගත් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

ඓ. අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ හෝ අදාළ වරප්‍රසාද කඩවීම් සම්බන්ධව දිය යුතු පිළිතුරු

ඔ. ශෝක ප්‍රකාශ යෝජනා

ඕ. පොදු කටයුතු ආරම්භයේදී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා

ඖ. පොදු කටයුතු ආරම්භයේදී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා

ක. පළාත් සභාවේ පොදු කටයුතු

ග. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

(2) පොදු කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්දේශ පිළිබඳ කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව, ඒවා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ යෝග්‍යතාව සභාපතිවරයා විසින් සලකා බලා, ඒවා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළ යුතු ය. *න්‍යාය පත්‍රයට ඇතුළත් කරන අමාත්‍යවරුන්ගේ නිර්දේශ.*

(3) පෞද්ගලිකව මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන පොදු කටයුතු පිළිබඳ යෝජනා සහ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු සම්බන්ධයෙන් ලේකම්වරයා වෙත දැනුම් දෙන ලද අනුපිළිවෙළ අනුව ඒවා න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කළ යුතු ය. *පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පොදු කටයුතු පිළිබඳ යෝජනා.*

(4) (අ) කිසියම් පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් පිළිබඳ විවාදය, එම යෝජනාව සාකච්ඡාවට ගැනෙන දිනයේදී ම සාකච්ඡා කර අවසානයේදී ඡන්දය විමසිය යුතු ය. *පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සම්බන්ධ ඡන්දය විමසීම.*

(ආ) එතෙකුදු වුවද, සභාවේ නොසන්සුන්තාවය නිසා හෝ සභාව කල් තබන අවස්ථාව එළැඹ තිබෙන නිසා හෝ වෙනත් පාලනය කර ගත නොහැකි හේතුවක් නිසා හෝ සාකච්ඡා වෙමින් තිබුණු යම් පෞද්ගලික යෝජනාවක් වෙතොත් එම යෝජනාව ඊළඟ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය. එකී යෝජනාවට අදාළ සාකච්ඡාව නතර වූ තැන් පටන් ඊළඟ රැස්වීම් දිනයේදී, සාකච්ඡාව කරගෙන යා හැක්කේ ය. *පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් කිසියම් හේතුවක් උඩ එදින අවසන් නොවූ විට ඊළඟ දින න්‍යාය පත්‍රයට යොමු කිරීම.*

(ඇ) එය සභාවේ ගණපූරණය නොමැති නිසා නම් රීති අංක 54(7) අනුව ක්‍රියා කළ යුතු ය.

(ඈ) එවැනි යෝජනාවකට ඊළඟ දින න්‍යාය පත්‍රයේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය. *ඊට න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාව*

## ලිපිලේඛනාදිය පිළිගැන්වීම :

20. (1) ලිපිලේඛන පිළිගැන්විය හැක්කේ සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභාපති නාමාවලියේ මන්ත්‍රීවරයෙකු හා එදින යෝජනා සම්මතයෙන් මුලසුන හොබවන මන්ත්‍රීතුමාට හා අමාත්‍යවරයකුට සහ යම් අමාත්‍යවරයෙකු වෙනුවෙන් සභානායකවරයාට පමණි. *ලිපි ලේඛන පිළිගැන්වීම සිදු කළ හැකි ආකාරය.*

(2) කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටියෙන් විස්තරයක් කළ හැකි ය. එහෙත් ඒ සම්බන්ධයෙන් විවාදයක් නොපැවැත් විය යුතු ය. එකී ලිපි ලේඛනයක යම් දෝෂ සහගත තත්ත්වයක් ඇත්නම් එය පෙන්වා දීමට කිසියම් හෝ මන්ත්‍රීවරයෙකුට හැකියාව ඇත්තේ ය. *මන්ත්‍රීවරයෙකුට එකී ලිපි ලේඛනවල දෝෂ සහගත තත්ත්වය පෙන්වා දීමට ඇති හැකියාව.*

(3) පිළිගන්වන ලද ලිපි ලේඛන සියල්ලක්ම සභා මේසය මත තිබිය යුතු යැයි නියෝග කරන ලද්දක් මෙන් සැලකිය යුතු ය. තවද, එම ලිපි ලේඛනවල මුද්‍රණය කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් වෙතොත්, සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව සභාගත වූවා සේ සැලකිය යුතු ය.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :**

21. (1) යම් කාරක සභාවක සභාපතිවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජිකයකු විසින් හෝ කාරක සභා වාර්තාවක් පිළිගැන්විය හැකි ය. *කාරක සභා වාර්තා පිළිගැන්වීම.*

(2) එම වාර්තාව ගැන සභාවට කරුණු ඉදිරිපත් කළ හැකි වුවත්, එම අවස්ථාවේදී විවාදයක් නොපැවැත්විය යුතු ය. *ඊට විවාදයක් නොපැවැත්වීම.*

**පෙත්සම් :**

22. (1) පළාත් සභාවට ඉදිරිපත් කරන සෑම පෙත්සමක් ම පළාත් සභාවට ව්‍යවස්ථානුකූලව පැවරී ඇති විෂයයකටද, බස්නාහිර පළාතටද අදාළ එකක් විය යුතු අතර, එය මෙම අනුරීතියේ පහතින් සඳහන් විධිවිධාන අනුව ඉදිරිපත් කළ යුතු ය. *පෙත්සම් ඉදිරිත් කළ යුතු ආකාරය.*

(2) පෙත්සමක් සභාපතිවරයා වෙත ආමන්ත්‍රණය විය යුතු අතර, එය මන්ත්‍රීවරයකු විසින් පිළිගැන් විය යුතු වන අතර එම පෙත්සම න්‍යාය පත්‍රයේ පෙත්සම් ඉදිරිපත් කරන කාලවේලාව තුළ දී අදාළ මන්ත්‍රීවරයා විසින් ම ඉදිරිපත් කළ යුතු පෙත්සමක් විය යුතු ය. *පෙත්සමක ආමන්ත්‍රණය කළ යුත්තේ සභාපතිවරයාට බව.*

(3) සෑම පෙත්සමක් ම ගෞරවාන්විත භාෂාවෙන් ලිවිය යුතු අතර, කාරණයට අදාළ නොවන කරුණු එහි අඩංගු නොවිය යුතු ය.

(4) සෑම පෙත්සමක් ම එය ලියා අත්සන් කරන දිනය හා පෙත්සම්කරුගේ පෞද්ගලික ලිපිනය පැහැදිලි ව සඳහන් කර තිබිය යුතු අතර, සෑම පෙත්සමක් ම කියවිය හැකි පරිදි පැහැදිලි ව ලියා තිබිය යුතුවාක් මෙන් ම අපේක්ෂිත සහනය පැහැදිලි ව දැක්වෙන ආයාචනයක්ද අඩංගු විය යුතු ය.

(5) පෙත්සම්කරු ඉහත සඳහන් පරිදි සහනයක් ලබා ගැනීමට තමන් විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග ගැන පෙත්සමෙහි සඳහන් කර තිබිය යුතු ය. එකී සඳහනේ පෙත්සම්කරු අදාළ ගැටලුව විසඳා ගැනීම සඳහා සාධාරණ උත්සාහයක් දරා ඇති බව ගම්‍ය විය යුතු ය. *පෙත්සමේ ගැටළු විසඳා ගැනීමට සාධාරණ උත්සාහයක් දරා තිබිය යුතු බව.*

(6) පෙත්සම්කරු විසින් සිය පෙත්සම අත්සන් කර තිබිය යුතු ය.

(7) පෙත්සමේ ඇති කරුණු සනාථ කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ යම් ලේඛන ඇත්නම් ඒවායේ සහතික කළ ඡායා පිටපත් එකී පෙත්සමට ඇමිණිය යුතු ය.

(8) අධිකරණයක හෝ ඔම්බුඩ්ස්මන්වරයා හෝ සමථ මණ්ඩලයක හෝ වෙනත් කිසිදු යුක්තිය පසඳලීමේ ආයතනයක් ඉදිරියේ හෝ විභාග වෙමින් පවතින කාරණයක් සම්බන්ධයෙන් හෝ බේරුම්කරණය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇති කාරණයක් සම්බන්ධයෙන් හෝ නොවන බවට පෙත්සම්කරු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතු ය.

*අධිකරණය ආදී යම් කටයුත්තකට යොමු වූ කරුණක්, පෙත්සමක් ලෙස ඉදිරිපත් නොවිය යුතු බව.*

(09) පෙත්සමකට අත්සන් කර ඇති පුද්ගලයා සඳහන් කර ඇති කාරණා සත්‍ය බවට එය ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා සෑහීමකට පත් විය යුතු ය.

(10) මන්ත්‍රීවරයකුට තමන් වෙනුවෙන් ම පෙත්සමක් පිළිගැන් විය නොහැකි ය. එහෙත් වෙනත් මන්ත්‍රීවරයකුට එම පෙත්සම පිළිගැන්වීමට බාධාවක් නොමැත.

*මන්ත්‍රීවරයෙකුට වෙනත් මන්ත්‍රීවරයෙකු ලවා තමන් සම්බන්ධ පෙත්සම ඉදිරිපත් කළ හැකිය.*

(11) පළාත් සභාවට ඉදිරිපත් කිරීම පිණිස, පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් මහජන පෙත්සම් භාර ගැනීමට පෙර ඉහත අවශ්‍යතා සම්පූර්ණ වී ඇති බව තහවුරු කරගත යුතු ය.

(12) පෙත්සම් කාරක සභාවට එම පෙත්සම් ගැන ක්‍රියා කිරීමට නොහැකි බව පෙනී යන්නේ නම්, සුදුසු කටයුතු කිරීම සඳහා ඒවා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ හැකි ය.

*පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස්ට යොමු කිරීම.*

(13) පෙත්සමක් පිළිගන්වන මන්ත්‍රීවරයෙක්, “ගරු සභාපතිතුමනි, .............. පදිංචි................ විසින්/හා තව ................... දෙනෙක් විසින් ඉදිරිපත් කරන පෙත්සම පිළිගන්වමි.” යන්නට පමණක් සිය කථාව සීමා කළ යුතු වේ. මේ පිළිබඳ කිසිම විවාදයකට ඉඩ නොතැබිය යුතු ය.

*පෙත්සමක් සභාවට පිළිගැන්වීම.*

(14) (අ) සභාවට පිළිගන්වන පෙත්සම්, මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු ය.

(ආ) අදාළ පෙත්සම මෙම රීතිවලට අනුකූලව ඉදිරිපත් කර නොමැති විටකදී එය ප්‍රතික්ෂේප වන අතර, ඒ පිළිබඳව පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(15) එක ම කාරණයක් පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කළ හැක්කේ එක් වරක් පමණි.

(16) පෙත්සම් කාරක සභාව විසින් දෙන ලද නිර්දේශයන් ක්‍රියාත්මක නොවූ අවස්ථාවකදී, අදාළ පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට හෝ ඔහු වෙනුවෙන් වෙනත් මන්ත්‍රීවරයෙකුට ඒ පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළ හැකි ය.

(17) නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු සති 06 ක් ඇතුළත එය ක්‍රියාත්මක කර නොමැති විටකදී, පෙත්සම් ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා පෙත්සම විභාග කළ අනුකාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකුට එය ප්‍රමාද වීමට හේතු දක්වමින්, සභාවට ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවේ සභාපතිතුමාට ඉදිරිපත් කළ යුතු ය.

*නිර්දේශ ක්‍රියාත්මක නොවූ විට*

(18) පෙත්සම් විභාග වන අවස්ථාවේදී පෙත්සම් විභාගයට පැමිණි වගඋත්තරකරුවෙකු හෝ විත්තිකරුවෙකු හෝ පෙත්සම්කරුවකු විසින් පෙත්සම විභාග කරනු ලබන ගරු මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් විරෝධය මතු කළහොත්, අනුකාරක සභාව විසින් එම පෙත්සම විභාග කිරීම අත්හිටුවා, එකී විරෝධතාව සභාපතිතුමා වෙත යොමු කළ යුතු ය. ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් දෙන තුරු පෙත්සම විභාග නොකළ යුතු ය.

*සාමාජික ගරු මන්ත්‍රීවරයකුට යම් විරෝධතාවයක් මතු වූ විට පෙත්සම විභාග නොකොට විරෝධතාව සභාපතිතුමාට යොමු කිරීම.*

**වාචික පිළිතුරු හෝ ලිඛිත පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න :**

23. (1) යම් අමාත්‍යවරයෙකුගේ විෂයය පථය තුළ ඇති කාරණාවලට අදාළ ව ඕනෑ ම මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න විමසීමට හැකි ය. එම ප්‍රශ්නවලට අදාළව වාචික ව පිළිතුරු ලබා දිය හැකි ය.

*ඉදිරිපත් කරන ප්‍රශ්නවලට පිළිතුරු වාචික විය යුතුය.*

(2) ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ, එම ප්‍රශ්නය යොමු කෙරෙන අමාත්‍යවරයාගේ අධිකාරීත්වය යටතේ වන කරුණක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා හෝ අවශ්‍ය ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා හෝ ඔහු පොළඹවාලීම ය.

24\. (1) කල් ඇතිව ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයක් ලිඛිත ව සභා ලේකම්වරයා වෙත යොමු කළ යුතු ය. ලේකම්වරයා එය සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

*කල් ඇතිව ඉදිරිපත් කරන ප්‍රශ්න.*

(2) ප්‍රශ්නයක් ගැන දැනුම් දෙන මන්ත්‍රීවරයා එය ලිඛිත පිළිතුරක් අපේක්ෂිත ප්‍රශ්නයක් දැයි සඳහන් කර තිබිය යුතු ය.

(3) ලිඛිතව ප්‍රශ්නය ඉදිරිපත් කිරීමෙන් ඉක්බිති ව එළැඹෙන රැස්වීම් දින න්‍යාය පත්‍රයට එම ප්‍රශ්නය ඇතුළත් කළ යුතු ය. එසේ වුවද, එක් දිනකට ප්‍රශ්න 15 කට වඩා න්‍යාය පත්‍රයේ ඇතුළත් නොවිය යුතු ය. එක් දිනකට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ප්‍රශ්න 15 කට වැඩියෙන් ලැබී ඇති අවස්ථාවලදී, ඒ වැඩිපුර ප්‍රශ්න ඊළඟ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

*එක් සභා රැස්වීම් දිනකට උපරිම ප්‍රශ්න 15 කි.*

25\. (1) ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුත්තේ, ඒවා ලේකම් වෙත භාරදෙන අනුපිළිවෙළ අනුව ය. ලේකම් සෑම ප්‍රශ්නයකටම අංකයක් දිය යුතු ය. ප්‍රශ්නය න්‍යාය පත්‍රයේ ඇතුළත් විය යුත්තේ, එකී අංකය ද සමග ය.

*ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුල් කිරීම.*

(2) කල් ගන්නා ලද ප්‍රශ්නද ඇතුළු ව එක් මන්ත්‍රීවරයෙකුගේ නමින් එක් දිනකට ප්‍රශ්න තුනකට වඩා න්‍යාය පත්‍රයට ඇතුළත් නොවිය යුතු ය.

*එක් අයෙකු නමින් ප්‍රශ්න තුනක් න්‍යාය පත්‍රයේ පළ වීම.*

26\. යම් ප්‍රශ්නයක් රීතිවලට පටහැනි වන කල්හි හෝ ව්‍යාකූල වන බව පෙනෙන කල්හි හෝ එය සංශෝධනය කර එවන ලෙස අදාළ මන්ත්‍රීවරයාට දැනුම් දීමට හෝ එම ප්‍රශ්නය මුළුමණින් ම ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයාට හැකි විය යුතු ය. එවැනි අවස්ථාවලදී ඊට හේතු අදාළ මන්ත්‍රීවරයාට ලිඛිත ව දැනුම් දීම හෝ මන්ත්‍රීවරයාගේ වාරය පැමිණි විට වාචික ව දැනුම් දීම හෝ කළ යුතු ය.

*ප්‍රශ්න රීති විරෝධී වීම හෝ ව්‍යාකූල වූ විට කටයුතු කරන ආකාරය*

27\. (1) ඕනෑම වාචික ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් ඇසිය හැකි ය. ප්‍රශ්නය යොමු කර ඇති මන්ත්‍රීවරයා එකී අතුරු ප්‍රශ්න නොඅසන්නේ නම්, වෙනත් මන්ත්‍රීවරයෙකුට එම අතුරු ප්‍රශ්න ඇසීමට පිළිවන. මුල් ප්‍රශ්න විෂයය පථයට අදාළ නොවූ කරුණු අතුරු ප්‍රශ්නවලට ඇතුළත් නොවිය යුතු ය.

*අතුරු ප්‍රශ්න 03 ක් එකවර ඇසීමට ඇති අවස්ථාව.*

(2) අතුරු ප්‍රශ්නවලට දෙන පිළිතුරු ඇසුරින් අතුරු ප්‍රශ්න ඇසිය හැකි වුවද රීති අංක 27(1) හි විධිවිධානය යටතේ ඇසිය යුතු ය. *අතුරු ප්‍රශ්නවලට දෙන පිළිතුරුවලට නැවත අතුරු ප්‍රශ්න ඇසීම 27(1) අනුව සිදු කිරීම.*

(3) අතුරු ප්‍රශ්න කෙටි ප්‍රශ්න ස්වරූපයෙන් විමසිය යුතු ය.

28. (1) ප්‍රශ්නයකට ලිඛිත හෝ වාචික පිළිතුරක් ඉල්ලා ඇති කල්හි, සභා නිල (හැන්සාඩ්) වාර්තාවේ පළ කිරීම සඳහා එකී පිළිතුර සභා ලේකම් වෙත භාර දීමට ඒ පිළිතුරු දෙන අමාත්‍යවරයා ක්‍රියා කළ යුතු ය. *ලිඛිත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හැන්සාඩ් වාර්තාවේ පළ කිරීම.*

(2) ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලද දිනයේ නිල (හැන්සාඩ්) වාර්තාවෙහි එම ප්‍රශ්නය හා ඊට දෙන ලද පිළිතුරද එම ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න හා ඒවාට දෙන ලද පිළිතුරුද ඇතුළත් විය යුතු ය. *ප්‍රශ්නවලට සහ අතුරු ප්‍රශ්නවලට දෙන පිළිතුරු නිල වාර්තාවේ පළ කිරීම.*

(3) (අ) ගරු මන්ත්‍රීවරයෙක් විසින් සභාවේදී අසනු ලබන ප්‍රශ්නයකට අසත්‍ය පිළිතුරු ලබා දුන් බව සභාවේදී අනාවරණය වූ විට, ඊට අදාළ නිලධාරීන් සභා කටයුතු කාරක සභාවට කැඳවා විමසා බැලීමට හැකි ය.

(ආ) ප්‍රශ්නයට ඉදිරිපත් කරන ලද පිළිතුරු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරයා සෑහීමකට පත් නොවන්නේ නම්, එම මන්ත්‍රීවරයාට එය සභා කටයුතු කාරක සභාව මගින් සභාවට ලිඛිත ව යොමු කළ හැකි ය.

(ඇ) ඒ සම්බන්ධයෙන් සභා කටයුතු කාරක සභාවට සෑහීමකට පත් විය නොහැකි පිළිතුරක් බව හැඟී යන්නේ නම්, එකී මන්ත්‍රීවරයාට ඒ පිළිබඳව පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ප්‍රමුඛතාව ලබා දී ඒ පිළිබඳව ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය. *ප්‍රශ්නය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට ප්‍රකාශයක් කිරීමට ඇති අවස්ථාව.*

(ඇ) එවන් අවස්ථාවකදී සභා කටයුතු කාරක සභාව තීරණය කරන්නේ නම් පමණක්, අදාළ ගැටලුව ගරු ආණ්ඩුකාරවරයාට යොමු කළ හැකි ය.

## ප්‍රශ්න ඇසීමේ අයිතිය තුළ සීමා :

29. ප්‍රශ්න ඇසීමේ අයිතිය පහත සඳහන් සීමාවන්ට යටත් විය යුතු ය.

(1) එක් ප්‍රශ්නයක් වචන 150 කට නොවැඩි විය යුතු ය. *ප්‍රශ්නයක් වචන 150*

*කින් යුක්ත වීම.*

(2) ප්‍රශ්නයක්, විෂයයන් එකකට වැඩි ගණනකට යොමු නොවිය යුතු ය.

(3) ප්‍රශ්නයක් පැහැදිලි කරලීම පිණිස අනිවාර්යයෙන් අවශ්‍ය වන නමක් හැරෙන්නට, වෙනත් නමක් හෝ ප්‍රකාශයක් ප්‍රශ්නයේ පළ නොවිය යුතු ය.

(4) ප්‍රශ්නයක ප්‍රකාශයක් ඇතුළත් වේ නම්, එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රශ්නය අසන මන්ත්‍රීවරයා වගකීම භාරගත යුතු ය.

(5) තර්කයක්, අනුමානයෙන් බැසගත් තීරණයක්, ආරෝපිත චෝදනාවක්, අනවශ්‍ය විස්තර දක්වන පදයක් හෝ අවඥා සහගත පදයක් හෝ ප්‍රශ්නයකට ඇතුළත් නොවිය යුතු ය.

(6) කාරක සභා වාර්තාවක් මගින් සභාව වෙත ඉදිරිපත් කර නොමැති සභාවේ කාරක සභාවක වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්න විමසීමක් නොකළ යුතු ය. *කාරක සභාවල වැඩ කටයුතු සම්බන්ධව ප්‍රශ්න නොඇසීම.*

(7) අධිකරණයක විනිශ්චයකට භාජනය වෙමින් පවතින කරුණක් ගැන හෝ දීමට නියමිත අධිකරණ තීරණයකට විෂයය වන කරුණක් ගැන හෝ ප්‍රශ්නයක සඳහන් නොවිය යුතු ය. *අධිකරණ විනිශ්චයකට භාජන කරුණක් හෝ තීරණයන්ට විෂයය වන කරුණක් නොවීම.*

(8) නෛතික කරුණක් සම්බන්ධයෙන් හෝ වෙනත් මත ප්‍රකාශයක් සම්බන්ධයෙන් හෝ ඉල්ලුම් කරන ප්‍රශ්න විමසීමක් නොකළ යුතු ය. *නෛතික කරුණක් හෝ වෙනත් මත ප්‍රකාශයක් නොවීම.*

(9) යම් පුද්ගලයකුගේ නිල හෝ රාජකාරී තත්ත්වය සම්බන්ධයෙන් විනා ඔහුගේ පැවැත්ම සම්බන්ධව ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය. *පුද්ගලයකුගේ නිල රාජකාරී විනා ඔහුගේ පැවැත්ම ඇතුළත් නොවිය යුතුය.*

(10) ජනාධිපතිගේ හෝ ආණ්ඩුකාරවරයකුගේ හෝ විනිශ්චයකාරවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමක් නොකළ යුතු ය. *ජනාධිපති, ආණ්ඩුකාර, විනිශ්චයකාර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පැවැත්ම පිළිබඳව ප්‍රශ්න නොඇසීම.*

(11) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පළාත් සභා පනතින් හෝ නියම කර ඇති ප්‍රමාණයට ආණ්ඩුකාරවරයකු විසින් තම කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන කිසියම් කරුණක් *ආණ්ඩුකාරවරයෙකුගේ කාර්ය සපුරාලීම කෙරෙහි බලපාන කරුණු ඇතුළත්*

සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමක් නොකළ යුතු ය. *නොවීම.*

(12) (1) සම්පූර්ණ පිළිතුරු සපයා ඇති ප්‍රශ්නයක් එම ආකාරයෙන්ම හෝ වෙනත් ආකාරයකින් හෝ අවුරුද්දක් තුළ දී හෝ යළිත් නොවිමසිය යුතු ය. *සම්පූර්ණ පිළිතුරු සැපයූ ප්‍රශ්නයක් වසරක් තුළදී නැවත නොඇසීම.*

(2) එසේ වුවද, එකම ආකාරයේ ප්‍රශ්නයක් යම් මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කරන්නේ නම්, එම ප්‍රශ්නය කාලීන වශයෙන් වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් යැයි සභා කටයුතු කාරක සභාවට පෙනී යන්නේ නම්, සභාපතිවරයාගේ එකඟතාවය මත න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකි ය. *නමුත් කාලීන ප්‍රශ්නයක් නම් සලකා බැලීම.*

**ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම :**

30. (1) ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට නියමිත මන්ත්‍රීවරයාගේ නම සභාපතිවරයා විසින් කැඳවන ලද විට එම මන්ත්‍රීවරයා සිය අසුනින් නැඟී සිට එම ප්‍රශ්නයේ අංකය සඳහන් කර, "............ (මන්ත්‍රීවරයාගේ නම) ........... නමින් යුතු ප්‍රශ්නය .......... (ඇමතිවරයාගේ නම) ........... අමාත්‍යවරයා වෙත යොමු කරනවා" යැයි ප්‍රකාශ කළ යුතු ය.

(2) ප්‍රශ්නය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා නොපැමිණ සිටින්නේ නම්, එකී මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකටද, එකී මන්ත්‍රීවරයා විපක්ෂයේ මන්ත්‍රීවරයකු නම් විපක්ෂයේ සංවිධායකටද, එකී මන්ත්‍රීවරයාගේ කැමැත්ත ලබාගෙන එම ප්‍රශ්නය ඉදිරිපත් කළ හැකි ය. *මන්ත්‍රීවරයා නොපැමිණි විට සංවිධායකවරයාට සිය කණ්ඩායමේ මන්ත්‍රීවරයාගේ ප්‍රශ්නය ඉදිරිපත් කළ හැකිය.*

(3) යම් අමාත්‍යවරයකු විසින් පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට ඒ අමාත්‍යවරයා නොවැළැක්විය හැකි හේතුවක් නිසා නොපැමිණ ඇති කල්හි අදාළ මන්ත්‍රීවරයා එකඟ වේ නම්, වෙනත් අමාත්‍යවරයෙකුට හෝ සභානායකවරයාට ඒ සඳහා පිළිතුරු සැපයිය හැකි ය. එවන් අවස්ථාවකදී එකී මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න අසන්නේ නම්, එකී අතුරු ප්‍රශ්න එළැඹෙන සභා වාරයේදී යළිත් ඇසිය හැකි වන අතර අදාළ විෂයය භාර අමාත්‍යවරයා විසින් හෝ සභානායකවරයා විසින් ඒවාට පිළිතුරු සැපයිය යුතු ය. *වෙනත් අමාත්‍යවරයෙකුට පිළිතුරු සැපයීමට ඇති හැකියාව සහ අතුරු ප්‍රශ්නවලට පිළිතුරු එළැඹෙන සභා වාරයේදී ලබා දීම.*

(4) ප්‍රශ්නයකට පිළිතුරක් ඉදිරිපත් කරන අවස්ථාවේදී එකී ප්‍රශ්නය සම්බන්ධව පැහැදිලි කිරීමක් හෝ විවාදයක් නොතිබිය යුතු ය.

(5) න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රශ්නයකට පිළිතුරක් සූදානම් නැති කල්හි අදාළ අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයකු හෝ සභානායකවරයා හෝ නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඒ අමාත්‍යවරයා නොපැමිණ ඇති කල්හි ඒ සඳහා පිළිතුරු දීමට කල් ඉල්ලා සිටිය යුතු ය. කල් ඉල්ලීම් එක් වරකට දෙමාසයක කාලයක නොඉක්මවිය යුතු ය. එසේ වුවද, වරින් වර කල් ඉල්ලීමේදී, කල් ඉල්ලිය හැකි උපරිම කාලය මාස 03 කට සීමා විය යුතු ය.

*පිළිතුරු සැපයීම සඳහා කල් ඉල්ලීමට පුළුවන. උපරිමය මාස තුනක කාලයකට සීමා වේ.*

(6) (අ) න්‍යාය පත්‍රයේ ඇතුළත් ප්‍රශ්නයක් අදාළ මන්ත්‍රීවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නොඅසන ලද කල්හි, පිළිතුරු සූදානම්ව ඇත්නම්, පිළිතුර දෙන අමාත්‍යවරයාට එකී පිළිතුරු සභාපතිතුමාගේ අවසරය පරිදි සභාගත කිරීමට හැකියාව ඇත්තේ ය.

*මන්ත්‍රීවරයා නොමැති නම් පිළිතුරු සභාගත කිරීම.*

(ආ) එසේ සභාගත කරන ලද පිළිතුරක් සම්බන්ධව අතුරු ප්‍රශ්න ඇසීමට ප්‍රශ්නය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට අවශ්‍ය නම්, රීති අංක 30(3) හි විධිවිධානය යටතේ හෝ පිළිතුර සභාගත කළ දින සිට මසක් ඇතුළත හෝ අදාළ අමාත්‍යවරයාගෙන් එය ලිඛිත ව විමසිය හැකි ය.

*සභාගත කළ පිළිතුරුවලට අතුරු ප්‍රශ්න ලිඛිතව විමසීම.*

(ඇ) ඕනෑම වාචික ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිළි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් ඇසිය හැකි ය. ප්‍රශ්නය යොමු කර ඇති මන්ත්‍රීවරයා එකී අතුරු ප්‍රශ්න නොඅසන්නේ නම්, වෙනත් මන්ත්‍රීවරයෙකුට එම අතුරු ප්‍රශ්න ඇසීමට පිළිවන. මුල් ප්‍රශ්නයේ විෂයය පථයට අදාළ නොවූ කරුණු අතුරු ප්‍රශ්නවලට ඇතුළත් නොවිය යුතු අතර, අතුරු ප්‍රශ්න සඳහා නැවත අතුරු ප්‍රශ්න ඇසිය නොහැකි ය.

*අතුරු ප්‍රශ්න ඇසීම සහ අතුරු ප්‍රශ්නවලට අතුරු ප්‍රශ්න ඇසීම නොහැකි බව.*

(7) අදාළ මන්ත්‍රීවරයාට ලබා දීම සඳහා ප්‍රශ්නවලට ඉදිරිපත් කරන ලද පිළිතුරේ පිටපතක් සභා රැස්වීම් දිනට පෙර හෝ සභා රැස්වීම් දින පෙ.ව. 9.00 ට පෙර සභා ලේකම්වරයාට ලබා දිය යුතු ය.

*ප්‍රශ්න සඳහා වූ ලිඛිත පිළිතුර කලින් ලබා ගැනීම.*

**කල් තැබීමේ යෝජනා යටතේ අසනු ලබන ප්‍රශ්න සහ යෝජනා :**

31. (1) **කල් තැබීමේ යෝජනා යටතේ අසනු ලබන ප්‍රශ්න**

(අ) 14(6) රීතිය යටතේ සභාව කල් තබන අවස්ථාවේදී යම් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතේ ඇති කාරණයකට අදාළ ව පොදු වැදගත්කමකින් යුත් හදිසි කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමට ඕනෑ ම මන්ත්‍රීවරයෙකුට

*14(6) යටතේ පොදු වැදගත්කමින් යුත් හදිසි කරුණක් ගැන පමණක් ප්‍රශ්න විමසීමට ඇති*

පුළුවන. *හැකියාව.*

(ආ) එවැනි ප්‍රශ්න විමසීමේ අයිතිය පහත සඳහන් රීතීන්ට යටත් විය යුතු ය.

(i) පොදු වැදගත්කමකින් යුත් 29 වන රීතිය යටතේ ඉඩ ලැබෙන කරුණක් සම්බන්ධයෙන් වන ප්‍රශ්න පමණක් විමසීමට අවසර ලැබේ.

(ii) ප්‍රශ්න සංක්ෂිප්ත මෙන් ම නිවැරැදි විය යුතු ය.

(iii) ප්‍රශ්න විවාදයට ලක් නොවිය යුතු ය.

(iv) අදාළ දින පෙ.ව. 10.00 ට ප්‍රථම පිටපතක් සහිත ව සෑම ප්‍රශ්නයක් ම සභා ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය. පෙරවරු 10.00 න් පසු ඉදිරිපත් කරනු ලබන හෝ මෙම රීතිවලට පටහැනි ප්‍රශ්න තම අභිමතය පරිදි සභාපතිවරයාට ප්‍රතික්ෂේප කළ හැකි ය. *කල් තබන අවස්ථාවේ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න පෙරවරු 10.00 ට පෙර ලේකම්වරයාට භාර දිය යුතු බව.*

(v) තමන් වෙත යොමු කරන ප්‍රශ්නයකට අමාත්‍යවරයා පිළිතුරු දීමට උත්සාහ කළ යුතු ය. නොඑසේ නම්, අමාත්‍යවරයාට එදින හෝ සභාපතිවරයාගේ අවසරය පරිදි ඊළඟ රැස්වීම් දිනයේදී හෝ පිළිතුරු දිය හැකි ය. ඒ සඳහා එකී ප්‍රශ්නය ඊළඟ රැස්වීම් දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය. *එවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.*

(vi) කිසියම් පිළිතුරක් සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් විමසීමට සභාපතිවරයාගේ පූර්ණ අභිමතය පරිදි ඉඩ දිය හැකි ය. *අතිරේක ප්‍රශ්න තුනක් ඇසීමට ඇති අයිතිය.*

(ඇ) අදාළ අමාත්‍යවරයා හෝ අමාත්‍යවරුන් හෝ නොපැමිණ සිටින කල්හි, එම ප්‍රශ්න වෙනත් අමාත්‍යවරයකු වෙත හෝ සභානායකවරයා වෙත හෝ යොමු කිරීමට සභා ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. එවන් අවස්ථාවකදී එකී අමාත්‍යවරයා හෝ සභානායකවරයා විසින් එම ප්‍රශ්න ඊළඟ රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේදී යෝජනා කළ යුතු ය. *අදාළ අමාත්‍යවරයා නොමැති විට එකී ප්‍රශ්න වෙනත් අමාත්‍යවරයෙකුට හෝ සභානායකවරයාට යොමු කිරීම.*

(ඈ) (i) ප්‍රශ්නයක් අසනු ලබන දිනයේ දී ඊට පිළිතුරු දීමට අදාළ අමාත්‍යවරයා අපොහොසත් වෙන්නේ නම්, ඊළඟ රැස්වීම් දිනයේ දී පිළිතුරු දෙන බව කල් *පිළිතුරු නොමැති නම් කල් ගැනීමට ඇති හැකියාව සහ ඊළඟ දින න්‍යාය පත්‍රයට යොමු කිරීම.*

තැබීමේ අවස්ථාවේදී ප්‍රශ්නය යොමු කළ විට ප්‍රකාශ කළ යුතු ය. පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්නයක් ඊළඟට පැවැත්වෙන සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභා ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

(ii) රීතිවලට අනුකූල නොවන ප්‍රශ්නයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ රීතිවලට අනුකූල වන සේ සංශෝධනය කිරීමට හෝ සභාපතිවරයාට හැකි විය යුතු ය.

(iii) අසන ලද ප්‍රශ්නයත් ඊට දෙන පිළිතුරත් අදාළ දින නිල [හැන්සාඩ්] වාර්තාවෙහි ඇතුළත් විය යුතු ය.

(2) **කල් තැබීමේ යෝජනාව යටතේ කරනු ලබන යෝජනා :**

(අ) සභාව කල් තබන අවස්ථාවේදී හදිසි පොදු වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට කිනම් මන්ත්‍රීවරයෙකුට වුවද හැකි විය යුතු ය. සභාව කල් තබන අවස්ථාවේදී පිළිතුරු දීමට ප්‍රශ්න වෙතොත්, ඒවාට පසුව යෝජනාව ඉදිරිපත් කළ යුතු වේ. *14(6) රීතිය යටතේ හදිසි යෝජනාවක් ඉදිරිපත් කිරීම හැකිය.*

(ආ) අදාළ යෝජනාව විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ නම් අදාළ විපක්ෂ කණ්ඩායම් නායකයාගේත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ නම් සභානායකවරයාගේත් අත්සන සහිත ව එදින පෙරවරු 10.00 ට පෙර එය ඉහත සඳහන් ධූර දරන මන්ත්‍රීවරයා විසින් ලේකම්වරයාට භාර දිය යුතු ය. *කල් තබන අවස්ථාවේ අසනු ලබන ප්‍රශ්න පෙරවරු 10.00 ට පෙර භාර දීම.*

(ඇ) ඒ සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ලේකම්වරයා විසින් යෝජනාව අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතු ය. මේ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

(ඈ) සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ පසු අදාළ මන්ත්‍රීවරයා කරුණු පැහැදිලි කරමින් යෝජනාව ඉදිරිපත් කළ යුතු අතර, වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් එය ස්ථිර කළ යුතු වේ. *යෝජනාව ස්ථිර කළ යුතු බව.*

(ඉ) මේ සඳහා වෙන් කර ඇති කාලය ආණ්ඩු පක්ෂයට සහ විරුද්ධ පක්ෂයට සමව බෙදා දෙනු ලබන අතර, පිළිතුරු *කාලය වෙන් කරන අයුරු.*

සැපයීම සඳහා නියමිත අමාත්‍යවරයාට ආණ්ඩු පක්ෂයේ කාලයෙන් ප්‍රමාණවත් කාලයක් වෙන් කළ යුතු ය.

(ඊ) මෙවැනි යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදු නොවන්නේ ය. *ඡන්ද විමසීමක් සිදු නොකරයි.*

(උ) කිසියම් දිනයකදී සාකච්ඡාවට ගනු ලබන්නේ, එක් යෝජනාවක් පමණි.

(ඌ) නියමිත කාලයේදී අදාළ මන්ත්‍රීවරයා විසින් යෝජනාව ඉදිරිපත් නොකළ හොත්, එය අහෝසි වන්නේ ය.

32. (1) අදාළ දින න්‍යාය පත්‍රයේ පළ කර ඇති කිසිදු කරුණක් සම්බන්ධව 31 රීතිය යටතේ ප්‍රශ්න හෝ යෝජනා ඉදිරිපත් නොකළ යුතු ය. *31 රීතිය යටතේ ඉදිරිපත් කළ නොහැකි යෝජනා.*

(2) එසේ වුවද, අදාළ දින න්‍යාය පත්‍රයේ පළ කර තිබුණු කරුණක් සම්බන්ධව වුවද, එදින සාකච්ඡාවට නොගන්නේ නම්, 31 රීතිය යටතේ ප්‍රශ්න හෝ යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

(3) කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ හැකි වනුයේ, එක් යෝජනාවක් සහ ප්‍රශ්න දෙකක් පමණි.

**ශෝක ප්‍රකාශ :**

33. (1) ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කළ හැක්කේ පහත සඳහන් අයවලුන්ගේ අභාවයන් වෙනුවෙන් පමණි. *ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කළ හැකි අවස්ථා.*

(අ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා හෝ හිටපු රාජ්‍ය නායකයෙක්,

(ආ) අග්‍රාමාත්‍යවරයා හෝ හිටපු අග්‍රාමාත්‍යවරයෙක්,

(ඇ) බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හෝ බස්නාහිර පළාතේ හිටපු ආණ්ඩුකාරවරයෙක්,

(ඈ) බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හෝ එම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්,

(2) අභාවප්‍රාප්ත වූ පුද්ගලයා සම්බන්ධ ගුණකථනවලට පමණක් ශෝක ප්‍රකාශ යෝජනාවක් යටතේ කෙරෙන කථා සීමා විය යුතු ය.

(3) කථාවල අඩංගු විය හැකි විවේචන හා අනුචිත කොටස් ඉවත් කිරීමට සභාපතිවරයාට හැකි ය.

(4) ශෝක ප්‍රකාශ යෝජනාවක් යටතේ පවත්වන ලද මන්ත්‍රීවරුන්ගේ කථා ඇතුළත් නිල [හැන්සාඩ්] වාර්තාව අභාවප්‍රාප්ත වූ අයගේ කිට්ටු ම ඥාතිවරයාට යැවීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

(5) ශෝක ප්‍රකාශ යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් ව ඇති විට එය එදින ම අවසන් කළ යුතු ය.

(6) දැනට පළාත් සභාවේ සිටින මන්ත්‍රීවරයකු මිය ගිය විට, හැකි ඉක්මණින් ශෝක යෝජනාව සභාවට ගෙන ආ යුතු අතර, හිටපු ගරු මන්ත්‍රීවරයෙකු පිළිබඳ ශෝක යෝජනාව ද නොපමා ව සභාවට ඉදිරිපත් කළ යුතු ය. *ශෝක යෝජනා සභාවට ඉදිරිපත් කිරීමේ කාල සීමාව.*

**නොපැමිණ සිටීමේ අවසරය :**

34\. (1) කිසියම් මන්ත්‍රීවරයකුට සාධාරණ හේතූන් මත සභා රැස්වීම්වලට සහභාගී වීමට නොහැකි වන අවස්ථාවකදී, තමා විසින් ම හෝ වෙනත් මන්ත්‍රීවරයකු විසින් සභාපතිතුමාගෙන් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් හෝ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මගින් හෝ නොපැමිණ සිටීමේ අවසරය ලබාගත හැකි ය. *තමා විසින් හෝ නොපැමිණ සීමේ අවසරය වෙනත් මන්ත්‍රීවරයෙකු ලවා ඉදිරිපත් කළ හැකි බව.*

(2) එවන් යෝජනාවක් මන්ත්‍රීවරයා තමා ම ඉදිරිපත් නොකරන අවස්ථාවක, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු නම් විපක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයකු විසින් ද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් ආණ්ඩු පක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයකු විසින්ද කළ යුතු වන්නේ ය. *ඔහු විපක්ෂයේ මන්ත්‍රීවරයක් නම් විපක්ෂයෙන්ද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් ආණ්ඩු පක්ෂයෙන්ද ඉදිරිපත් කිරීම.*

(3) කිසියම් මන්ත්‍රීවරයකු සභාවේ අවසරය නොලබා දින 90 කට හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩ ව සභා රැස්වීම්වලට සහභාගි නොවූවහොත් ඔහුගේ මන්ත්‍රී ධූරය අහෝසි වන්නේ ය. *දින 90 ක් අඛණ්ඩව රැස්වීම්වලට නොපැමිණි විට ධූරය අහෝසි වීම. (පනතේ අංකය)*

**අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

35\. (1) අමාත්‍යවරයකුට ස්වකීය විෂයය පථයට අදාළ ව සභාව දැනුවත් කළ යුතු යැයි හැඟෙන කරුණු සම්බන්ධයෙන් නිවේදන ඉදිරිපත් කළ හැකි ය. *අමාත්‍යවරයෙකුට ස්වකීය විෂයය පථයට අදාළව ප්‍රකාශ හා නිවේදන*

*ඉදිරිපත් කිරීම.*

(2) අමාත්‍යවරයෙකු ස්වකීය අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් හෝ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී උද්ගත වූ කරුණක් සම්බන්ධයෙන් හෝ සභාවේ මතු වූ වෙනත් කරුණක් සම්බන්ධයෙන් හෝ කරුණු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයක් කළ හැකි ය. *ප්‍රකාශ හා නිවේදන ඉදිරිපත් කිරීමට සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීම.*

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ පළාත් සභා විෂය පථයට අයත් වූ එහෙත් අමාත්‍යවරයෙකුට පවරා නැති විෂයයකට අදාළ කරුණක් සම්බන්ධයෙන් ඉහත (1) සහ (2) උප ජේදයන්ට යටත්ව ප්‍රකාශයක් කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට අවකාශ තිබිය යුතු ය. *පළාත් සභා විෂයයට අමතරව පවරා නැති සියලු විෂයයන් සම්බන්ධ ප්‍රකාශ ප්‍රධාන අමාත්‍යවරයාට කළ හැකි බව.*

(4) ඉහත (1) හා (2) යටතේ ප්‍රකාශයක් පුද්ගලයකුගේ පෞද්ගලික හැසිරීම විවේචනය කිරීම සඳහා යොදා නොගත යුතු ය. *එය පෞද්ගලික හැසිරීම විවාදයක් කිරීමක් නොවීම.*

(5) මේ යටතේ කරනු ලබන ප්‍රකාශයක අඩංගු කරුණු පිළිබඳව වෙනත් මන්ත්‍රීවරයෙකුට කථා කිරීමට හෝ එවැනි ප්‍රකාශයක අඩංගු කරුණු එම අවස්ථාවේදී විවාදයට ලක් කිරීමට හෝ අවස්ථාව නොමැත්තේ ය. *විවාදයක් නොමැත.*

(6) ගරු අමාත්‍යවරයෙකුගේ ප්‍රකාශය හුදෙක් අමාත්‍යාංශ විෂය පථයට අදාළ එකක් විය යුතු අතර, එය මන්ත්‍රීවරයෙකු අගතියට පත්වන ප්‍රකාශයක් නොවිය යුතු ය. *මන්ත්‍රීවරු අගතියට පත් කරන ප්‍රකාශ නොවීම.*

## පෞද්ගලික ප්‍රකාශ කිරීම් :

36. (1) කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයෙකු විසින් සිය ප්‍රකාශය තම ලිපි ශීර්ෂයක සවිස්තරාත්මක ව ලියා සභා රැස්වීමට පෙර දින ප.ව. 04.15 ට පෙර සභාපතිතුමාට හෝ සභා ලේකම්වරයාට ලැබීමට සැලැස්විය යුතු ය. *පෞද්ගලික ප්‍රකාශ රැස්වීමට පෙර දින ප.ව. 04.15 ට පෙර ලේකම්වරයාට භාර දීම.*

(2) සභාපතිවරයා ඒ පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම්, ඒ සඳහා අවස්ථාවක් දිය යුතු අතර, සභාපතිවරයා විසින් ගරු මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ පෞද්ගලික ප්‍රකාශයේ රීති විරෝධී හා අන්‍යාකාරයෙන් වරප්‍රසාද කඩවන කරුණු ඉවත් කර ඇති විටක, එසේ ඉවත් කරන ලද කොටස් හැර, ඉතිරි ප්‍රකාශය ගරු මන්ත්‍රීවරයා විසින් සභාවට කියැවිය යුතු ය. *රීති විරෝධී සහ වරප්‍රසාද කඩවන කරුණු හැර සෙසු ප්‍රකාශ කියැවීම.*

(3) එසේ සභාපතිවරයාගේ අවසරය ලබා ගන්නා කරුණුවලට පමණක් අදාළ ව පෞද්ගලික ප්‍රකාශය කිය විය යුතු අතර එම ප්‍රකාශය අවසානයේ, ප්‍රකාශය ඇතුළත් එකී ලේඛනය සභාගත කළ යුතු ය. *ප්‍රකාශය ඇතුළත් ලේඛනය සභාගත කිරීම.*

(4) පෞද්ගලික ප්‍රකාශ ගැන විවාදයක් ඇති නොවිය යුතු ය.

(5) සභාවෙන් බාහිර ව මන්ත්‍රීවරයකු විසින් කරන ලද හෝ කියන ලද හෝ දෙයක් ගැන සභාවේදී පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ නොහැකි ය.

(6) එක් මන්ත්‍රීවරයෙකුට එක සභා වාරයකදී එක් කරුණක් පිළිබඳව පමණක් පෞද්ගලික ප්‍රකාශයක් කළ හැකි ය.

(7) යම් අමාත්‍යාංශයක විෂය පථයට අදාළ ව පෞද්ගලික ප්‍රකාශයක් කිරීමේදී ඉදිරිපත් වූ කරුණක් සම්බන්ධව එකී පෞද්ගලික ප්‍රකාශය අවසානයේදී හෝ එළැඹෙන පළාත් සභා රැස්වීමේදී අදාළ අමාත්‍යවරයා විසින් සභාපතිවරයාගේ අවසරය මත ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දිය හැකි ය. *පෞද්ගලික ප්‍රකාශය අවසානයේ ඒ පිළිබඳ පැහැදිලි කිරීමට විෂයය භාර අමාත්‍යවරයාට හැකි බව.*

(8) එවන් පැහැදිලි කිරීමක් සඳහා ලබා දිය හැක්කේ, උපරිම විනාඩි පහක කාලයකි. *ඊට කාලය විනාඩි 05 කි.*

(9) යම් පෞද්ගලික පැහැදිලි කිරීමකින් ප්‍රකාශ කරන්නා වූ කාරණා පළාත් සභාවට විශේෂයෙන් බලපාන කාරණා බව පළාත් සභාවේ සභාපතිවරයා තීරණය කරන්නේ නම්, එය උපදේශක කාරක සභාවකට හෝ අනිකුත් කාරක සභාවකට යොමු කළ හැකි ය.

## වරප්‍රසාද සම්බන්ධ ප්‍රකාශ :

37. (1) පළාත් සභා මන්ත්‍රීවරයකුගේ ගරුත්වයට හෝ තම කටයුතු කරගෙන යෑමට අවහිර වන ආකාරයේ ක්‍රියාවක් හෝ බලපෑමක් හෝ ඇති වුවහොත් එය වරප්‍රසාද කඩවීමක් ලෙස සැලකිය හැකි ය.

(2) (අ) සභා පරිශ්‍රය තුළ ඇතිවන මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් වන විටකදී හැරෙන්නට, යම් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් පිළිබඳව එකී මන්ත්‍රීවරයා විසින් ලිඛිත ව ගරු සභාපතිතුමා වෙත අදාළ ආකෘතිය පුරවා පෙ.ව.09.30 ට ප්‍රථම ව ලබා දිය යුතු වන *වරප්‍රසාද කඩවීම පෙරවරු 09.30 ට ප්‍රථම භාර දිය යුතුය.*

අතර, සභාපතිතුමා එය මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වී ඇති බව නිගමනය කළහොත් පමණක්, එකී කාරණාව පිළිබඳව එම මන්ත්‍රීවරයාට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය.

(ආ) එසේ වුවද, සුවිශේෂී අවස්ථාවක සභාපතිවරයාගේ අභිමතය පරිදි වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළ හැකි ය. *සුවිශේෂී අවස්ථාවක වරප්‍රසාද ප්‍රකාශ ලබා දීම.*

(3) එකී වරප්‍රසාද කඩවීම පිළිබඳව අදාළ මන්ත්‍රීවරයා විනාඩි දෙකක කාලයක් තුළ සිය වරප්‍රසාද කඩවීම පිළිබඳව පැහැදිලි කිරීම අවසන් කළ යුතු ය. *වරප්‍රසාද කාලය විනාඩි දෙකයි.*

(4) ඒ හැරත් සභාව පැවැත්වෙන කාලපරාසය තුළ යම් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සිදු වූයේ නම්, එකී වරප්‍රසාදය කිනම් හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කිරීමට හැකියාව ඇති අතර, ඒ සඳහා ප්‍රමුඛතා ව ලබා දීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය. *සභාව පැවැත්වෙන කාලය තුළ වරප්‍රසාද කඩවන විට ප්‍රමුඛතාව ලැබීම.*

(5) වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා ගනු ලබන තීරණය අවසන් තීරණය වන්නේ ය. ඒ පිළිබඳව විවාදයක් ඇති නොවිය යුතු ය. *සභාපතිවරයාගේ තීරණය අවසන් තීරණ යයි.*

(6) මන්ත්‍රීවරයකු පළාත් සභාවේදී කරන ලද කථාවක් හෝ ඉන් කොටසක් හෝ වැරැදි ආකාරයකට හෝ අර්ථය වෙනස් වන ආකාරයකට හෝ ජනමාධ්‍ය මගින් හෝ අන් ලෙසකින් හෝ පළ කිරීම මන්ත්‍රීවරයකුගේ වරප්‍රසාද කඩ කිරීමක් ද වන්නේ ය. *ජනමාධ්‍ය ආයතන මගින් සිදු වන වරප්‍රසාද කඩවීම්.*

(7) ඉහත රීති අංක 6 හි වරප්‍රසාද කඩවීම සම්බන්ධව වහා ම නිවැරැදි කිරීමක් සිදු කළ යුතු බව, එකී ජනමාධ්‍ය ආයතනයට හෝ ඊට අදාළ කවර ආයතනයකට හෝ ගරු සභාපතිවරයා විසින් එවලේ වාචිකව සහ පසුව ලිඛිත ව දැනුම් දිය යුතු ය. *එවැනි ජනමාධ්‍ය ආයතනවලට වාචිකව හා ලිඛිතව දැනුම් දීම.*

(8) වරප්‍රසාද කඩවීමක් සිදු වී ඇද්දැයි සොයා බැලීමට එම කාරණය සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කිරීමට සභාපතිවරයාගේ නියෝගය මත ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. *වරප්‍රසාද කඩවීම් සභා කටයුතු කාරක සභාවට යොමු කිරීම.*

(9) සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලැබීමෙන් පසු සභාපතිවරයාට සුදුසු යැයි හැඟෙන ආකාරයට ක්‍රියා

කළ හැකි ය.

**පොදු කටයුතු ආරම්භයේදී පූර්ව දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා :**

38. රීතින් මගින් අන් ලෙසකින් විධිවිධාන සැලසෙන්නේ නම් පමණක් පහත දැක්වෙන යෝජනා හැර, වෙනත් සෑම යෝජනාවක් ගැනීම දැනුම් දීමක් කළ යුතු ය. *පොදු කටයුතු ආරම්භයේදී පූර්ව දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා.*

(1) පූර්ණ කාරක සභාවකට ලක් කළ යුතු යෝජනාවක්,

(2) සාකච්ඡාවක් නිම කිරීම පිණිස වූ හෝ කල් තැබීම පිණිස වූ හෝ යෝජනාවක්,

(3) වරප්‍රසාදයකට අදාළ යෝජනාවක්,

(4) මන්ත්‍රීවරයකුගේ සභා සහභාගීත්වය අත් සිටුවීම පිණිස වූ යෝජනාවක්,

(5) දිනට නියමිත කිසියම් විෂයයක් තුළින් පැන නැඟෙන කාරණයක් පිළිබඳව එම විෂයය අවසන් වූ වහා ම හා අලුත් විෂයයකට එළැඹීමට පෙර ගෙනෙන යෝජනාවක්,

(6) සභා නිල [හැන්සාඩ්] වාර්තා සහ කාර්ය සටහන්වල වැරැදි නිවැරැදි කිරීම පිණිස වූ යෝජනාවක්.

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය වන යෝජනා සම්බන්ධ පොදු විධිවිධාන :**

39. (1) සභාව අන් ලෙසකින් තීරණය කළහොත් මිස, මෙම රීති යටතේ අවශ්‍ය දැනුම් දීම මන්ත්‍රීවරුන් වෙත කිරීමෙන් තොරව කිසියම් කරුණක් සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතු ය. *පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය වන යෝජනා සම්බන්ධ පොදු විධිවිධාන.*

(2) (අ) මෙම රීති මගින් අන් ලෙසකින් විධිවිධාන සැලසෙන්නේ නම් පමණක් විනා, දිනට නියමිත න්‍යාය පත්‍රයේ දැක්වෙන කාර්ය විෂයයන් සම්බන්ධයෙන් හැර වෙනත් කරුණක් සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතු ය.

(ආ) ප්‍රශ්නයකට යෝජනා කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නයට

අදාළ එකක් විය යුතු ය.

(3) සභා රැස්වීම් සහ සභාවේ වැඩ කටයුතු හා අදාළ යෝජනා රැස්වීමක න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු අතර, ඒවා එම රැස්වීමට දින 10 කට කලින් ලේකම්වරයා වෙත ලබා දිය යුතු ය.

(4) මන්ත්‍රීවරුන් ලබා දෙන යෝජනා අනුපිළිවෙළ අනුව න්‍යාය පත්‍රයෙහි ඇතුළත් ප්‍රඥප්ති සහ යෝජනාවල පිටපත් ඉදිරිපත් කිරීමේදී ඒ ගැන කටයුතු කිරීමට යොදා ගෙන ඇති දිනය මන්ත්‍රීවරුන් වෙත දැනුම් දිය යුතු ය.

**ප්‍රඥප්ති සම්පාදනය :**

**ප්‍රඥප්ති ඉදිරිපත් කිරීම :**

40. (1) ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන යම් අමාත්‍යවරයකු එකී ප්‍රඥප්තිය සඳහා වන කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු එකී කෙටුම්පත සිංහලෙන් හා දෙමළෙන් සකස් කර ඉංග්‍රීසි පරිවර්තනයක් සමග මතු දැක්වෙන ලියවිලිද සහිත ව සභාවේ ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

*ප්‍රඥප්ති කෙටුම්පත සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම ඉදිරිපත් කිරීම සහ ඒ සමග ඉදිරිපත් කළ යුතු ලියවිලි.*

(අ) ප්‍රඥප්ති කෙටුම්පතේ අඩංගු කරුණ හෝ කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ කවර ලැයිස්තුවක සඳහන් එකක් දැයි නිශ්චිත ලෙස දැක්වෙන ප්‍රකාශයක්.

*ආ.ව්‍ය. 9 වන උප ලේඛනයේ කවර ලැයිස්තුවේද යන්න.*

(ආ) ප්‍රඥප්ති කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව එහි පිටපතක්.

*ගැසට් පත්‍රයේ පිටපතක්.*

(2) ලේකම්වරයා විසින් යෝජිත ප්‍රඥප්ති කෙටුම්පත සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය ප්‍රඥප්ති ඉදිරිපත් කිරීමේ දී බලපාන නීතිරීති හා අනුකූල වන්නේ දැයි සභාපතිවරයා විසින් තීරණය කළ යුතු ය. සභාපතිවරයා විසින් එකී ප්‍රඥප්ති කෙටුම්පත අදාළ නීතිරීතිවලට අනුකූල යැයි තීරණය කරනු ලබන්නේ නම්, එය න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම පිණිස ලේකම්වරයාට භාර දිය යුතු ය.

*න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.*

(3) නියමිත විෂයය අංකය යටතේ අමාත්‍යවරයාගේ තනතුරු නාමය සඳහන් කරමින් "............ (නම) ........... විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කොට, ප්‍රඥප්තියේ නම සහ එහි පූර්විකාව න්‍යාය පත්‍රයේ සඳහන්

*ප්‍රඥප්ති කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුල් කිරීම.*

කළ යුතු ය.

(4) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ දැක්වෙන කරුණු පමණක් අඩංගු වී ඇති විට පළාත් සභාවට එම ප්‍රඥප්ති කෙටුම්පත සම්මත කළ හැකි ය. *ආ.ව්‍ය. 9 උ.ලේ. 1 වන ලැයිස්තුව.*

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උලේඛනයේ 2 වන ලැයිස්තුවේ දැක්වෙන යම් කරුණක් ප්‍රඥප්තියේ අඩංගු වී ඇති විට එම කරුණු සහිත ව ප්‍රඥප්ති සම්මත කළ නොහැක්කේ ය. *ආ.ව්‍ය. 9 උ.ලේ. 2 වන ලැයිස්තුව.*

(5) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 3 වන ලැයිස්තුවේ දැක්වෙන කිසියම් කරුණක් අඩංගු ප්‍රඥප්තියක් සම්මත කිරීම සඳහා ඉදිරිපත් කරන විට එම ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු ය. *ආ.ව්‍ය. 9 වන උප ලේඛනයේ 3 වන ලැයිස්තුවට අදාළ කරුණක් නම් ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කළ යුතු බව.*

(ආ) එම කාරක සභාව එම ප්‍රඥප්තිය සලකා බලා මාස 03 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ අදහස් දන්වා එවන ලෙස පාර්ලිමේන්තුවේ කථානායකවරයාට යෝජනා කළ යුතු ය. *පසුව පාර්ලිමේන්තුවෙන් අදහස් විමසිය යුතුය.*

(ඇ) පාර්ලිමේන්තුවේ අදහස් ලැබීමෙන් පසුව පමණක් එකී අදහස්වලට යටත්ව ප්‍රඥප්තිය සම්බන්ධයෙන් පළාත් සභාවට තවදුරටත් කටයුතු කරගෙන යා හැකි විය යුතු ය. *මාස 03 ක් කල් ගත වූ පසු පළාත් සභාවට කටයුතු කළ හැකිය.*

**ප්‍රඥප්තිය පළමුවර කියැවීම :**

41. (1) අදාළ අමාත්‍යවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයකු විසින් හෝ සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ එම විෂය අංකයට පැමිණි විට, ප්‍රඥප්තියේ නම සඳහන් කොට එකී ප්‍රඥප්තිය පළමුවර කියැවීම සඳහා සභාවට යෝජනා කරන බව ප්‍රකාශ කළ යුතු ය. *ප්‍රඥප්තිය පළමුවර කියැවීම.*

(2) ඉන් පසුව සභාපතිවරයාගේ නියමය පරිදි ලේකම්වරයා විසින් හෝ වැඩ බලන ලේකම්වරයා විසින් හෝ තමන් වාඩි වී සිටින අසුනින් නැඟී සිට, එම ප්‍රඥප්තියේ පූර්විකාව කියැවිය යුතු ය. මෙය ප්‍රඥප්තියක පළමුවර කියැවීම වන්නේ ය. *පූර්විකාව.*

(3) ලේකම්වරයා හෝ වැඩ බලන ලේකම්වරයා විසින් ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීමෙන් පසුව එය දෙවනවර කියැවීම සඳහා එදින සිට මාසයක් ඇතුළත එළඹෙන දිනයක් නියම කළ යුතු ය. එසේ වුවද, අවශ්‍ය වූ විටකදී *දෙවනවර කියැවීමට දිනයක් යෝජනා කිරීම.*

සභාපතිවරයාට එකී කාලය දීර්ඝ කළ හැකි ය.

(4) එමෙන්ම අදාළ ප්‍රඥප්තියේ නෛතිකභාවය පිළිබඳව තවදුරටත් විමසා බැලීම සඳහා යෝජනා කරන්නේ නම් අදාළ ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කළ යුතු අතර, එකී වාර්තාව මාසයක් ඇතුළත සභාවට ඉදිරිපත් කළ යුතු ය.

42. අමාත්‍යවරයකු විසින් ප්‍රඥප්තියක් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලබන දිනයේ දී මන්ත්‍රීවරුන්ට බෙදා දීමට හැකි වන පරිදි අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් එහි පිටපත් සභා ලේකම්වරයා වෙත සැපයිය යුතු ය. මන්ත්‍රීවරුන්ට තමන් කැමැති පරිදි සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාවකින් ප්‍රඥප්තියේ පිටපත් ඉල්ලා සිටිය හැකි ය. *ප්‍රඥප්තියක පිටපත් භාෂාත්‍රයෙන් සැපයීම.*

## ප්‍රඥප්තිය දෙවන වර කියැවීම :

43. (1) අදාළ අමාත්‍යවරයා විසින් ප්‍රඥප්තිය දෙවන වර කියැවිය යුතු යැයි යෝජනා කළ යුතු ය. *ප්‍රඥප්තිය දෙවනවර කියැවීම.*

(2) ප්‍රඥප්තියක් දෙවන වර කියැවීමේදී ඒ පිළිබඳව විවාදයක් ඇති විය හැකි ය.

(3) දෙවන වර කියැවීමේ යෝජනාව යටතේ විවාදයක් ඇති වේ නම්, එය ප්‍රඥප්තිය හා බැඳුණු ප්‍රතිපත්තිමය කරුණුවලට පමණක් සීමා විය යුතු අතර, එය පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීමට ප්‍රථම එනම්, රීති අංක 79 හි විධිවිධාන යටතේ සිදු කළ යුතු ය. *ප්‍රඥප්තිය පිළිබඳ ප්‍රතිපත්තිමය සාකච්ඡාව පූර්ණ කාරක සභාවට පෙර.*

(4) ප්‍රඥප්තිය දෙවන වර කියැවීම සඳහා සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීමට යෝජනා කිරීමට සභානායකවරයාට හෝ අමාත්‍යවරයකුට හෝ හැකි විය යුතු ය. *ප්‍රඥප්තිය දෙවනවර කියැවීම සඳහා පූර්ණ කාරක සභාව බවට පත් කරලීම.*

(5) ප්‍රඥප්තියක් සලකා බැලීම සඳහා සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි සභානායකවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ යෝජනා කළ පසු, “දැන් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වන්නේ යැයි” සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය.

(6) සභාවේ පූර්ණ කාරක සභාවේදී ප්‍රඥප්තියේ එක් එක් වගන්තිය සභාපතිවරයා විසින් කියවනු ලැබිය යුතු වන අතර,

ඒ එක් එක් වගන්තිය යටතේ සාකච්ඡා කළ හැකි ය. නමුත් විවාදයක් සිදු නොවිය යුතු ය.

(7) පූර්ණ කාරක සභා අවස්ථාවේ දී අදාළ ප්‍රඥප්තියේ ලුහුඬු නාමය හෝ පූර්විකාව හෝ වගන්තියක් හෝ වගන්ති කිහිපයක් හෝ සංශෝධනය කළ හැකි ය. නැතහොත් ඉවත් කළ හැකි ය. ප්‍රඥප්ති කෙටුම්පතට විෂය වන කරුණුවලට අදාළවද ඒ හා සමගම සභා රීතිවලට අනුකූලවද අලුත් වගන්තියක් එකතු කළ හැකි ය. *ප්‍රඥප්තියකට සංශෝධන ඉදිරිපත් කළ හැකි බව.*

(8) (අ) පූර්ණ කාරක සභා අවස්ථාවේදී ප්‍රඥප්තියට අදාළ ප්‍රතිපත්තිම ය කරුණු සාකච්ඡාවට භාජනය නොකළ යුතු ය. ප්‍රඥප්තියේ වගන්තිවලට අදාළ වන විස්තරාත්මක ව කරුණු පමණක් සාකච්ඡාවට භාජනය කළ හැකි ය. *කාරක සභා අවස්ථාවලදී විවාදයක් නොමැතිව විස්තරාත්මක කරුණු පමණක් වීම.*

(ආ) පූර්ණ කාරක සභා අවස්ථාවේදී එකඟත්වයට පැමිණි ප්‍රඥප්තියක පූර්ව කොටසක් පිළිබඳව ගන්නා ලද තීරණයකට අනුකූල නොවන සංශෝධනයක් එම කාරක සභාවේ පසු කොටසේ දී යෝජනා කළ නොහැකි ය. *කාරක සභාවේදී එකඟතාවයට පැමිණි කරුණක් පිළිබඳව අනුකූල නොවන සංශෝධන පසුව ඉදිරිපත් කළ නොහැකි බව.*

(9) පූර්ණ කාරක සභා අවස්ථාවකදී ඉදිරිපත් කරනු ලබන සංශෝධනයන් පිළිබඳ යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය. *පූර්ණ කාරක සභාවේදී සංශෝධනයන් ස්ථිර කිරීම අවශ්‍ය නොවේ.*

(10) පූර්ණ කාරක සභා අවස්ථාවකදී අදාළ ප්‍රඥප්තියේ වගන්ති එකින් එක සාකච්ඡාවට භාජනය වී අවසානයේදී ම සභාපතිවරයා විසින් ඒ ඒ අවස්ථාවේ දී එක් එක් වගන්තිය පිළිබඳව සභාවේ එකඟතාවය ලබා ගත යුතු ය. *කාරක සභාවේදී වගන්ති සඳහා එකඟතාවය ලබා ගැනීම.*

(11) ප්‍රඥප්තියක සියලු ම වගන්ති සලකා බැලීමෙන් පසුව පූර්ණ කාරක සභාව යළිත් සභාව බවට පරිවර්තනය වන බව සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය. *පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් කිරීම.*

(12) පූර්ණ කාරක සභා අවස්ථාවේ දී ප්‍රඥප්තිය බෙදීමක් ඇතිව හෝ නැතිව සභා සම්මත වීමෙන් අනතුරුව පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වූ පසු, පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ප්‍රකාශ කළ යුතු ය. *පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය.*

**ප්‍රඥප්තිය තුන්වන වර කියැවීම :**

44. (1) දෙවන වර කියැවීමෙන් අනතුරුව ප්‍රඥප්තිය තුන්වන වර කියැවිය යුතු බව අමාත්‍යවරයකු විසින් යෝජනා කළ යුතු ය. *තුන්වන වර කියැවීමේදී*

එම යෝජනාවට සංශෝධන ඉදිරිපත් කළ නොහැකි ය. *සංශෝධන ඉදිරිපත් කළ නොහැකිය.*

(2) තුන්වන වර කියැවීමේදී ප්‍රඥප්තිය පිළිබඳ විවාදයක් ඇති නොවිය යුතු ය.

(3) තුන්වන වර කියැවීම සම්බන්ධයෙන් බෙදීමක් ඇතිව හෝ නැතිව හෝ සම්මත වීමෙන් පසු එය නියමානුකූල ලෙස සම්මත වූ බවට සභාපතිවරයා විසින් සහතික කිරීමෙන් පසු ලේකම්වරයා විසින් ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ අනුමතයට යොමු කළ යුතු ය. *තුන්වනවර සම්මත වූ පසු ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාට යොමු කිරීම.*

(4) එම අනුමතය ලැබීමෙන් පසු අදාළ ඇමතිවරයා විසින් ප්‍රඥප්තිය ආණ්ඩුකාරතුමාගේ අනුමතය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන බව ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය. *ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කිරීම.*

## නියෝග, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා සම්මත කිරීම :

45\. (1) නියෝග, රෙගුලාසි හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වූ විට, ඊට අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා සභාපතිවරයා වෙත යොමු කළ යුතු ය. අනතුරුව අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් යෝජනාවක් මගින් එය සභාවට ඉදිරිපත් කළ යුතු ය. *නියෝග, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා.*

(2) (අ) එසේ ඉදිරිපත් වූ අනුරීතියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් විස්තරාත්මක ව සලකා බැලීම සඳහා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එය යොමු කළ හැකි ය. *ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීම.*

(ආ) එවන් නිර්දේශයක් එකී අනුරීති හෝ අතුරු ව්‍යවස්ථා එම කාරක සභාවට ඉදිරිපත් කළ දිනයේ සිට මසක කාලයක් ඇතුළත සලකා බලා, එකී නිර්දේශ සභාවට ඉදිරිපත් කළ යුතු ය. *මසක් ඇතුළත කාරක සභා වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.*

(ඇ) එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිවරයාට එකී කාලය දීර්ඝ කළ හැකි ය. *කාලය දීර්ඝ කිරීම.*

## පෞද්ගලික මන්ත්‍රී ප්‍රඥප්ති :

46. (1) ප්‍රඥප්ති කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයා විසින් ඒ සඳහා පළාත් සභාවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රඥප්ති කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත මූලික අරමුණු ඇතුළත් යෝජනාවක් සමඟ එකී ප්‍රඥප්ති කෙටුම්පත සභා ලේකම්වරයාට භාර දිය යුතු ය.

*මන්ත්‍රීවරයෙකුට ප්‍රඥප්ති කෙටුම්පතක් ඉදිරිපත් කළ හැක.*

(2) එවන් ප්‍රඥප්ති කෙටුම්පතක් සම්බන්ධයෙන් සභාවේ අවසරය ලබා ගැනීමෙන් පසුව මාසයක් ඇතුළත එකී ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රවෘත්ති පත්‍රයන්හි හෝ පළාත් ගැසට් පත්‍රයක් වේ නම්, එම ගැසට් පත්‍රයේ හෝ එවැනි ගැසට් පත්‍රයක් නොමැති නම්, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ හෝ භාෂාත්‍රයෙන් ම පළ කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලෙස සභා ලේකම්වරයාට නියෝග කළ යුතු ය.

*යෝජිත පෞද්ගලික ප්‍රඥප්තිය පළාත් සභා ගැසට් පත්‍රයේ හෝ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ හෝ පළාතේ අලෙවි වන පුවත්පතක පළ කිරීමේ අභිලාෂය දැනුම් දීම.*

(3) (අ) ඉන් අනතුරුව එය රීති අංක 40, 41, 42, 43 සහ 44 යන රීතීන්ට අනුකූලව සාමාන්‍ය ප්‍රඥප්තියක් ලෙස සලකා කටයුතු කළ යුතු ය.

*රීති අංක 40, 41, 42, 43 හා 44 අනුව කටයුතු කිරීම.*

(ආ) එසේ වුවද, ප්‍රඥප්ති කෙටුම්පත ඉදිරිපත් කිරීම, දෙවැනි වර කියැවීම සහ තෙවන වර කියැවීමේ යන යෝජනාවන් ප්‍රඥප්ති කෙටුම්පත ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට හිමි විය යුතු අතර, ඔහු නොමැති විට අදාළ අමාත්‍යවරයාට ඉදිරිපත් කළ හැකි ය.

(4) ඒ අනුව 40(3) අනු රීතියේ කෙසේ සඳහන් වුවද, නියමිත විෂය අංකය යටතේ ප්‍රඥප්තිය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාගේ නාමය සඳහන් කරමින් “( ......නම..... ) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කොට, ප්‍රඥප්තියේ නම සහ එහි පූර්විකාව න්‍යාය පත්‍රයේ සඳහන් කළ යුතු ය.

*අදාළ මන්ත්‍රීවරයා ප්‍රඥප්තියකින් ඉදිරිපත් කිරීම.*

## වාර්ෂික මුදල් ප්‍රකාශය :

47. (1) පළාත් සභා පනතේ 25 වන වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික මුදල් ප්‍රකාශය ගැන පළාත් සභාව අවස්ථා දෙකකින් ක්‍රියා කළ යුතු ය.

*වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධව අවස්ථා දෙකකදී ක්‍රියා කළ යුතුයි.*

(අ) පොදු සාකච්ඡාව.

(ආ) සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වී ඉල්ලීම්

සලකා බැලීම හා ඡන්දයෙන් අනුමත කිරීම.

(2) පොදු සාකච්ඡාව සමස්තයක් වශයෙන් වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධයෙන් සහ ඒ හා බැඳුණු ප්‍රතිපත්තිම ය කරුණුවලට පමණක් සීමා විය යුතු ය. වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධ පොදු සාකච්ඡාව අවසානයේ සභාවේ කැමැත්ත විමසීමක් නොවිය යුතු ය.

(3) පොදු සාකච්ඡාව අවසානයේ දී මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඔහුට පැමිණිය නොහැකි විට, ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයෙකු විසින් හෝ පිළිතුරු දිය යුතු ය.

(4) පොදු සාකච්ඡාව අවසානයේ දී සභානායකවරයා විසින් හෝ අමාත්‍යවරයෙකු විසින්, "ප්‍රදානයන් සඳහා වූ ඉල්ලීම සලකා බැලීම පිණිස මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි" යෝජනාව ඉදිරිපත් කළ යුතු ය.

*ප්‍රදානයන් සඳහා සලකා බැලීම. පූර්ණ කාරක සභාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.*

(5) ඉහත සඳහන් යෝජනාව සම්මත වීමෙන් පසුව සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වන බවට සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය.

(6) වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් සියලුම ප්‍රදාන පිළිබඳ ඉල්ලීම් සලකා බලා අවසන් වනතුරු 47 (4) රීතිය යටතේ සම්මත වූ යෝජනාව බල පවත්වන්නේ ය. ඒ නිසා ඒ ඒ දිනවල අවශ්‍ය අවස්ථාවල දී සභාපතිවරයා විසින්, "ප්‍රදාන පිළිබඳ ඉල්ලීම සලකා බැලීමට මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වන්නේ ය" යනුවෙන් ප්‍රකාශයක් කිරීම ප්‍රමාණවත් ය. එකී ප්‍රකාශයෙන් පසුව ප්‍රදානයන් පිළිබඳ සාකච්ඡාව ආරම්භ කළ හැකි ය.

*ප්‍රදානයන් සලකා බලන සෑම දිනකම සභාපතිවරයා පූර්ණ කාරක සභාව බවට පත් කිරීම ප්‍රකාශ කිරීම ප්‍රමාණවත්ය.*

(7) පූර්ණ කාරක සභාවේ දී ප්‍රදානයන් සම්මත වීම, සභාවේ දී සම්මත වීමක් ලෙස සැලකිය යුත්තේ ය. ඒ හෙයින් සභාවේ දී නැවත ඡන්ද විමසීමක් අවශ්‍ය නොවන අතර, පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය සභාපතිවරයා විසින් සභාවට දැනුම් දිය යුතු ය.

*පූර්ණ කාරක සභාවේදී එකඟත්වයට පත් වූ පසු යළි සභා අවස්ථාවේදී ඡන්දය නොවිමසීම.*

(8) ප්‍රශ්නයක් සලකා බැලීම සඳහා පූර්ණ කාරක සභාව පැවැත්වෙන සෑම දිනක ම එදිනට නියමිත සලකා බැලීම් නිම වූ වහා ම, එම පූර්ණ කාරක සභාව නැවත සභාව බවට පරිවර්තනය වන බව සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු

*පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය සභාවට වාර්තා කිරීම.*

අතර, එදින පූර්ණ කාරක සභාවේ ප්‍රගතියද සභාවට වාර්තා කළ යුතු ය.

**සංකේත කපා හැරීම :**

48. (1) (අ) කිසියම් ඉල්ලීමකට පාදක ව ඇති ප්‍රතිපත්තිම ය කරුණු සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කිරීම පිණිස හෝ සභාවේ වගකීමට අයත් වන තෘප්තියට පත් නොවන කරුණක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම පිණිස හෝ කිසියම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන සංකේත කපා හැරීමක් යෝජනා කිරීමට ඕනෑ ම මන්ත්‍රීවරයෙකුට හැකි විය යුතු ය. *ඕනෑම මන්ත්‍රීවරයෙකුට සංකේත කපා හැරීම සිදු කළ හැකිය.*

(ආ) කිසියම් ඉල්ලීමක ඉතිරි කිරීමක් ඇති කිරීම පිණිස අපේක්ෂිත ඉල්ලීම නිරූපණය කරන ප්‍රමාණයේ මුදලක් කපා හැරීමට හෝ ඉල්ලීමෙහි අඩු කළ කිසියම් කරුණක් ඉවත් කිරීමට හෝ යෝජනා කිරීමට ඕනෑ ම මන්ත්‍රීවරයෙකුට හැකි විය යුතු ය.

(ඇ) එවැනි එක් යෝජනාවක් එක ඉල්ලීමකට පමණක් සීමා විය යුතු ය.

(2) සංකේත කපා හැරීමක් පිළිබඳ යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(3) සංකේත කපා හැරීමක් නොමැති කල්හි එම ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම නොමැති ලෙස සලකා, එම ඉල්ලීමේ ශීර්ෂ අංක ඉදිරිපත් කරමින්, ඒවා සම්බන්ධයෙන් පූර්ණ කාරක සභාවේ කැමැත්ත විමසීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය.

(4) කිසියම් ප්‍රදානයක් සම්බන්ධයෙන් සංකේත කපා හැරීමක් යෝජනා කළ නොහැකි යැයි සීමා පැනවීමක් නොවිය යුතු ය. එසේ වුවද, පළාත් සභා පනතේ 25 (3) අනු වගන්තියේ පළාත් සභා අරමුදලට වැය බරක් හැටියට නිශ්චිත ව සඳහන් කර ඇති කරුණක් පිළිබඳව විමසීමක් නොකළ යුතු ය. *පනතේ 25 (3) හි සඳහන් කරුණු සම්බන්ධව විමසීමක් නොකළ යුතුය.*

49. (1) වාර්ෂික මුදල් ප්‍රකාශය හා ඊට අදාළ කටයුතු සඳහා, එම ප්‍රකාශය සභාගත කිරීමෙන් අනතුරුව දින දෙකකට පසුව ආරම්භ වන විශේෂිත දින 21 කට නොවැඩි දින ගණනක්, සභා කටයුතු පිළිබඳ කාරක සභාව විමසා බැලීමෙන් පසුව සභාපතිවරයා විසින් වෙන් කළ යුතු ය. *වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධ සාකච්ඡාවට දින වෙන් කිරීම.*

(2) පොදු සාකච්ඡාව සඳහා දින 7 කට වැඩියෙන් නොගත *පොදු සාකච්ඡාවට*

යුතු ය. පූර්ණ කාරක සභාව සඳහා දින 14 කට වැඩියෙන් නොගත යුතු ය. *දින*

(3) වාර්ෂික මුදල් ප්‍රකාශය වෙනුවෙන් වෙන් කරන ලද සෑම දිනක ම එය පොදු කාර්ය විෂය ලෙසින් සැලකිය යුතු ය. එවැනි දිනයක වෙනත් කිසිදු කාර්යයක් පස්වරු 5.00 වන තුරු සාකච්ඡාවට නොගත යුතු ය. *මුදල් ප්‍රකාශයට වෙන් කරන ලද දිනවල පස්වරු 05.00 තෙක් වෙනත් කරුණු සාකච්ඡා නොකිරීම.*

(4) වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳව කටයුතු කිරීමේ දී පාලක පක්ෂයට සහ විරුද්ධ පක්ෂයට විවාදය සඳහා වෙන් කෙරෙන කාලය සම්බන්ධයෙන් සභා කටයුතු පිළිබඳ කාරක සභාව විමසා සීමාවක් පැනවිය හැකි ය. *පාලක පක්ෂයට විරුද්ධ පක්ෂයට විවාද කාලය වෙන් කිරීම.*

(5) වාර්ෂික මුදල් ප්‍රකාශය සාකච්ඡා කෙරෙන, ඒ සඳහා වෙන් කරන ලද දිනවල සභා රැස්වීම් පැවැත්වෙන කාල වේලා පහත සඳහන් පරිදි විය යුතු ය.

පූ.භා 9.00 සිට අ.භා. 1.00 දක්වා
අ. භා. 2.00 සිට අ.භා. 5.00 දක්වා

(6) වාර්ෂික මුදල් ප්‍රකාශය වෙනුවෙන් කටයුතු කෙරෙන දිනයක එකී කටයුතු පවත්වාගෙන යන කාලය නිම වීමෙන් පසුව රීති අංක 31 යටතේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර එය යටතේ පැය භාගයකට නොවැඩි කාලයක් කටයුතු කර ගෙන යා හැකි ය. *මුදල් ප්‍රකාශ දිනවල 31 රීතිය සම්බන්ධව කටයුතු කිරීම.*

(7) වාර්ෂික මුදල් ප්‍රකාශය සාකච්ඡා කෙරෙන, ඒ සඳහා වෙන් කරන ලද දිනයක එකී කටයුතු පවත්වාගෙන යන කාලය නිම වීමෙන් පසුව, වෙනත් හදිසි කටයුත්තක් සඳහා සභාවේ එකඟත්වය ඇතිව කාලය වෙන් කර ගත හැකි ය. එවැනි වෙනත් කටයුත්තක් සාකච්ඡා කර අවසන් වූ වහා ම කල් තැබීමේ යෝජනාවක් නොමැතිව සභාව ඊළඟ දිනය තෙක් කල් තැබිය යුතු ය. *මුදල් ප්‍රකාශ දිනවල හදිසි කටයුතුවලට කාලය වෙන් කිරීම.*

(8) 81 (1) (අ) අනු රීතියෙහි ඇතුළත් විධිවිධානයන් පිළිබඳ තැකීමකින් තොරව කිසියම් ඉල්ලීමක් අඩු කිරීම පිණිස හෝ කිසියම් ඉල්ලීමක යම් විෂයාංකයක් කපා හැරීම පිණිස හෝ වූ සෑම යෝජනාවක් ම පිළිබඳ දැනුම් දීම, එම ඉල්ලීම සාකච්ඡාවට ගැනීමට දින තුනකට නොඅඩු කාලයකට ප්‍රථමයෙන් සහා ලේකම්වරයා වෙත ලිඛිත ව ඉදිරිපත් *දින 03 කට කලින් ලේකම්වරයාට ලිඛිතව දැනුම් දීම.*

කළ යුතු ය.

| | | | |
|---|---|---|---|
| (9) | | සාකච්ඡා කිරීමට යෝජිත ප්‍රතිපත්තිය පිළිබඳව හෝ ප්‍රකාශ කිරීමට අපේක්ෂිත තෘප්තියට පත් නොවන කරුණ පිළිබඳව හෝ ඇති කිරීමට බලාපොරොත්තු වන ඉතිරි කිරීම පිළිබඳව හෝ විස්තර එම දැනුම් දීමෙහි කෙටියෙන් සඳහන් විය යුතු ය. එම දැනුම් දීමෙහි දැක්වෙන කරුණුවලට පමණක් සාකච්ඡාව සීමා විය යුතු ය. | *කෙටි විස්තරයක් ඇතුළත් කර තිබීම.* |
| (10) | | එක් ඉල්ලීමක් සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත්ව ඇති විට, ඒවා සභාපතිවරයා තීරණය කරන පිළිවෙළ අනුව සාකච්ඡාවට ගත යුතු ය. | |
| (11) | (අ) | ප්‍රදානයන් සඳහා කාරක සභා තීරණ කලින් අවසන් නොවන්නේ නම්, එම ප්‍රදානයන් සලකා බැලීම සඳහා වෙන් කර ඇති අවසන් දිනයේ පස්වරු 4.30 ට ඒ වන විට සාකච්ඡා වෙමින් පැවතෙන වැය ශීර්ෂය හා ඉන් පසුව ඇති සියලු වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් කාරක සභාවේ තීරණය දිය යුතු ය. | *පස්වරු 04.30 ට සභාවේ තීරණය විමසීම.* |
| | (ආ) | එදින සභාවේ වැඩ කටයුතු කලින් අවසන් නොවන්නේ නම්, පස්වරු 5.00 ට සභාපතිවරයා විසින් සංශෝධනය කිරීමක් හෝ විවාදයට භාජනය කිරීමකින් හෝ තොරව මුදල් ප්‍රකාශය සම්බන්ධයෙන් සභාව විසින් නිගමනය කළ යුතු ව ඇති සියලු කරුණු පිළිබඳව සභාවේ තීරණය විමසිය යුතු ය. | *කලින් අවසන් නොවන විට පස්වරු 5.00 ට සභාවේ තීරණය විමසීම.* |

**විසර්ජන ප්‍රඥප්තිය :**

| | | | |
|---|---|---|---|
| 50. | (1) | 40 වන රීතියේ දැක්වෙන විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොර ව, වාර්ෂික මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කෙරෙන දින ම ඒ වාර්ෂික මුදල් ප්‍රකාශයට නීතිම ය බලපෑම හිමි වන විසර්ජන ප්‍රඥප්තියද ඉදිරිපත් කළ යුතු ය. | *40 රීතිය නොසලකා විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම.* |
| | (2) | වාර්ෂික මුදල් ප්‍රකාශය සම්මත වූ වහා ම විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳව කටයුතු කර ගෙන යා යුතු ය. | |
| | (3) | වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ සාකච්ඡාවේ දී සැලකිල්ලට භාජනය නොවුණු පොදු වැදගත්කමකින් යුත් පරිපාලන ප්‍රතිපත්ති හා ඊට අදාළ කරුණුවලට පමණක් විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් වන විවාදය සීමා විය යුතු ය. | |

**වාරාවසාන කිරීම :**

| | | |
|---|---|---|
| 51. | වාර්ෂික මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තියේ වැඩ කටයුතු අවසන් වූ පසු එළැඹෙන ඊළඟ රැස්වීම් දින ගරු | *ආණ්ඩුකාරවරයාගේ නියම ප්‍රකාරව* |

ආණ්ඩුකාරතුමාගේ නියමය ප්‍රකාර ව සැසිවාරය අවසන් කළ හැක්කේ ය. *සැසිවාරය අවසන් කළ හැක.*

**පරිපූරක ප්‍රදාන :**

52. (1) පළාත් සභා පනතේ 28 වන වගන්තිය යටතේ වූ ඇස්තමේන්තුගත වියදම් පිළිබඳ ප්‍රකාශයක් හෝ අතිරික්ත සඳහා ඉල්ලීමක් හෝ එම පනතේ 29 වන වගන්තිය යටතේ ගිණුම් පිළිබඳ වැයක් හෝ සම්බන්ධයෙන් 40 වන රීතියේ විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව කටයුතු කරගෙන යෑමට පළාත් සභාවට හැකි ය. *40 රීතියේ විධිවධාන නොසලකා පනතේ 28 හෝ 29 වගන්ති යටතේ අතිරික්ත සඳහා ඉල්ලීම් කිරීම.*

(2) එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක්කේ අමාත්‍යවරයකුට පමණි.

(3) එවැනි ඉල්ලීමක් කිරීමේ හේතු, එම ඉල්ලීම සමග විය යුතු ය.

(4) එවැනි ඉල්ලීමක් සමග ඒ ඉල්ලීමට අදාළ ව බලය ලැබෙන විසර්ජන ප්‍රඥප්තියක් ද ඉදිරිපත් කළ යුතු ය.

(5) එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ට යටත් පිරිසෙයින් දින 7 කට පෙර දැනුම් දිය යුතු ය.

(6) පරිපූරක ප්‍රදාන ගැන කටයුතු කිරීමෙන් පසුව එදින ම ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ගැන ද කටයුතු කර අවසන් විය යුතු ය.

(7) පරිපූරක ප්‍රදානයන් සම්බන්ධයෙන් කටයුතු කරන විට සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීම අවශ්‍ය නොවේ.

**පෞද්ගලික මන්ත්‍රී යෝජනා :**

53. (1) පොදු වැදගත්කමකින් යුත් ඕනෑ ම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීමට ඕනෑම මන්ත්‍රීවරයකුට වුවද හැකි විය යුතු ය. *පොදු වැදගත්කමකින් යුතු ඕනෑම කරුණක් ගැන කිනම්*

*මන්ත්‍රීවරයෙකුට වුවද යෝජනා කළ හැකි බව.*

(2) එම යෝජනා ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, ඔහු එය සභාපතිවරයාගේ අවධානයට යොමු කළ යුතු ය. එම යෝජනාව රීති විරෝධී නොවන බවට සහා කටයුතු කාරක සභාවේ අදහස්ද විමසා බලා සභාපතිවරයා තීරණය කරන්නේ නම්, එය න්‍යාය පුස්තකයට / න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

(3) න්‍යාය පුස්තකයේ ඇතුළත් වී තිබෙන යෝජනාවල අනුපිළිවෙළ නොඉක්මවා, ඒ ඒ සභා රැස්වීම්වල තිබෙන න්‍යාය පත්‍රයට සභා කටයුතු පිළිබඳ කාරක සභාවේද එකඟත්වය මත යෝජනා යම් සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතු ය.

(4) පහත සඳහන් කරනු ලබන කොන්දේසි සපුරාලන්නේ නම් පමණක්, එකී යෝජනාවට සංශෝධන ඉදිරිපත් කළ හැකි ය.

(අ) එකී සංශෝධනය/සංශෝධන එම යෝජනාව සභා සම්මත වීමට පෙර ඕනෑ ම අවස්ථාවකදී ඉදිරිපත් කළ හැකි ය.

(ආ) එවැනි සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා එම යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා එකඟත්වය පළ කළ යුතු ය. *සංශෝධනවලට මන්ත්‍රීවරයාගේ එකඟත්වය අවශ්‍ය බව.*

(ඇ) එම සංශෝධනයේ අන්තර්ගතය, මුලින් ඉදිරිපත් කළ යෝජනාවේ අන්තර්ගතයට පටහැනි නොවිය යුතු ය. *සංශෝධන මුල් යෝජනාවට පටහැනි නොවීම.*

54. (1) යෝජනාවක් ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරයෙකුට එම යෝජනා විවාදයට භාජනය වන දිනයේ දී සභා රැස්වීම සඳහා පැමිණිය නොහැකි වුවහොත්, සභා රැස්වීම ආරම්භ වීමට ප්‍රථම සභාපතිවරයා දැනුවත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඉදිරිපත් කිරීමේ බලය වෙනත් මන්ත්‍රීවරයකුට පැවරිය හැකි ය. *යෝජිත මන්ත්‍රීවරයා නොමැති විට වෙනත් මන්ත්‍රීවරයෙකු යෝජනාව ඉදිරිපත් කිරීම.*

(2) මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් තවත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කරනු *පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ස්ථිර විය යුතු බව.*

නොලබන්නේ නම්, එය සාකච්ඡා නොවිය යුතු ය.

(3) ඕනෑ ම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් සාකච්ඡා වෙමින් පවතින විට ඉහත 53(4) හි විධිවිධානයන්ට යටත් ව ඊට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට ඕනෑ ම මන්ත්‍රීවරයකුට හැකි විය යුතු ය. එවන් සංශෝධනයක් වේ නම්, එකී සංශෝධනය ලිඛිත ව මූලාසනයට ඉදිරිපත් කළ යුතු ය. *පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට සංශෝධන ලිඛිතව ඉදිරිපත් කිරීම.*

(4) කිසියම් පෞද්ගලික යෝජනාවක් හැකි තරම් දුරට සංක්ෂිප්ත විය යුතු අතර, වචන 150 ක් නොඉක්මවිය යුතු ය.

(5) යෝජනා කොට ස්ථිර කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉල්ලා අස් කර ගත හැක්කේ, සභාවේ එකඟතාව මත පමණි. *පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉල්ලා අස් කර ගැනීමට ඇති හැකියාව.*

(6) යම් මන්ත්‍රීවරයෙකු පෞද්ගලික මන්ත්‍රී යෝජනා කිහිපයක් අනුපිළිවෙළට ඉදිරිපත් කර ඇති විටක වුවද, එක් න්‍යාය පත්‍රයකට ඇතුළත් කළ හැකි වන්නේ, එයින් එක් යෝජනාවක් පමණි. *එක් මන්ත්‍රීවරයකුගේ එක් යෝජනාවක් පමණයි.*

(7) (අ) ගණපූරණය නොමැතිව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් කල් තබන්නේ නම්, එම යෝජනාව ඊළඟ සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙසට යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කළ යුතු ය. එසේ ඉල්ලීමක් නොකරන්නේ නම්, අදාළ යෝජනාව අහෝසි වන්නේ ය. *ගණපූරණය නොමැති අවස්ථාවකදී යෝජනාවක් කල් තැබීම*

(ආ) ගණපූරණය නොමැතිව ඊළඟ දින න්‍යාය පත්‍රයට කල් තබන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව විවාදයට ගනු ලබන නියමිත දිනයේදී එම යෝජනාව යළිත් සභාවට ඉදිරිපත් කිරීම සඳහා අදාළ ගරු මන්ත්‍රීවරයා සභා ගර්භයේ රැඳී සිටිය යුතු ය. *ගණපූරණය නොමැති අවස්ථාවකදී කල් තැබූ යෝජනාව යළිත් විවාදයට ගැනීම.*

**විශ්වාසභංග යෝජනා :**

55. (1) විශ්වාසභංග යෝජනාවක් පාලක පක්ෂයට හෝ අමාත්‍යවරයෙකුට හෝ ගරු සභාපතිතුමාට හෝ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට එරෙහිව ඉදිරිපත් කළ හැකි ය. එම විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් වීමට පදනම් වූයේ කුමක් ද යන්න පැහැදිලි ව සහ සවිස්තර ව එම යෝජනාවේ ඇතුළත් විය යුතු ය. *විශ්වාසභංග යෝජනාව සවිස්තරව ඉදිරිපත් කිරීම.*

(2) එවැනි යෝජනාවක් ලිඛිත ව පළාත් සභාවේ සමස්ත මන්ත්‍රීවරු (නොපැමිණි මන්ත්‍රීවරුද ඇතුළත්ව) සංඛ්‍යාවෙන් *විශ්වාසභංග යෝජනා සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන්*

1/5 ක් හෝ ඊට වැඩි පිරිසකගේ අත්සන් සහිත ව සභා ලේකම්වරයාට භාර දිය යුතු අතර, එවැන්නක් ගරු සභාපතිතුමාට හෝ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට එරෙහි ව ගෙන ඒමේදී පනතේ 7(2)(ඇ) සහ 8 වගන්ති ප්‍රකාර ව කටයුතු කළ යුතු ය. *1/5 ක් හෝ වැඩි පිරිසක් අත්සන් කළ යුතුය.*

(3) එකී විශ්වාසභංග යෝජනාව නිසියාකාරව සකස් කර ඉදිරිපත් කර ඇති බවට සභාපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්, එය සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු වන අතර, එකී යෝජනාව රීති විරෝධී නොවන බවට එම කාරක සභාව නිගමනය කරන්නේ නම්, ඊළඟට යෙදෙන සභා රැස්වීම් දින න්‍යාය පත්‍රයට එකී යෝජනාව ඇතුළත් කළ යුතු අතර, එයට එම න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානය දිය යුතු ය. *විශ්වාසභංග යෝජනාව සභා කටයුතු කාරක සභාවට යොමු කොට අනතුරුව ඊළඟ දින න්‍යාය පත්‍රයට යොමු කිරීම.*

(4) එසේ වුවද, සභාපතිවරයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වී ඇති විට සභාපතිවරයා එකී සභා කටයුතු කාරක සභාවේ මුලසුන නොදැරිය යුතු අතර, නියෝජ්‍ය සභාපතිතුමා එහි මුලසුන දැරිය යුතු ය. නියෝජ්‍ය සභාපතිවරයා නොමැති විටක කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකුව යෝජනා ස්ථිරත්වයෙන් මුලසුන සඳහා පත් කර ගත යුතු අතර, එවිට කාරක සභාවේ ගණපූරණය ද තිබිය යුතු ය.

(5) අමාත්‍යවරයෙකුට එරෙහිව ඉදිරිපත් කරන එවන් විශ්වාසභංග යෝජනාවක් සභා සම්මත කිරීමෙන් පසුව අදාළ අමාත්‍යවරයා ඉල්ලා අස් නොවන්නේ නම්, ඒ පිළිබඳව වැඩිදුර තීන්දු ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කළ යුතු ය. *ඉල්ලා අස් නොවූ විට ආණ්ඩුකාරවරයා වෙත යොමු කිරීම.*

**යෝජනා ඉල්ලා අස් කර ගැනීම :**

56. මෙම රීතිවල මෙයට පටහැනි වූ විධානයන් ඇති අවස්ථාවන්වලදී හැරෙන්නට, සභාව වෙත ඉදිරිපත් කරන ලද කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම් දී ඇති අමාත්‍යවරයෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට, සභාපතිවරයාට ලිඛිත ව දැනුම් දීමෙන් හෝ සභාවේ එම විෂයයට පැමිණි අවස්ථාවේදී ප්‍රකාශයක් කිරීමෙන් හෝ එම යෝජනාව ඉල්ලා අස් කර ගත හැකි ය. *යෝජනා ඉල්ලා අස්කර ගැනීම.*

**සංශෝධන :**

57. (1) මූලාසනයෙන් සභාභිමුඛ කරන ප්‍රශ්නයක්, කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් වන විටකදී, *ප්‍රශ්නයක් සංශෝධනය කළ හැකි ආකාර.*

(අ) වෙනත් වචන ඇතුළත් කිරීම සඳහා ඇතැම් වචන අත්හැරීමෙන් හෝ

(ආ) ඇතැම් වචන අත්හැරීමෙන් හෝ

(ඇ) වෙනත් වචන ඇතුළත් කිරීමෙන් හෝ එකතු කිරීමෙන් හෝ සංශෝධනය කළ හැකි ය.

(2) සෑම සංශෝධනයක් ම එම සංශෝධන යෝජනා කරන මන්ත්‍රීවරයා විසින් ලිඛිත ව ලේකම්වරයාට භාර දිය යුතු ය. රීති විරෝධී බවට සභාපතිවරයා තීරණය නොකරන්නේ නම් සහ ඒ සඳහා වේලාව ඇත්නම්, එහි පිටපතක් පිළියෙල කොට සෑම මන්ත්‍රීවරයකුට ම ලබා ගැනීමට සැලැස් විය යුතු ය. ප්‍රශ්නයකට යෝජනා කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නයට අදාළ එකක් විය යුතු ය.

(3) ප්‍රශ්නයක/යෝජනාවක කිසියම් කොටසකට කෙරෙන සංශෝධනයක් සම්බන්ධයෙන් තීරණයක් දීමෙන් එකී සංශෝධනයට සහසම්බන්ධ වන වෙනත් සංශෝධන ද කළ නොහැකි ය.

(4) ප්‍රශ්නයකට/යෝජනාවකට කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නය යෝජනාවට කලින් කර ඇති සංශෝධනයක් හා පටහැනි නොවිය යුතු ය.

(5) මූලාසනයෙන් සභාභිමුඛ කරන ලද ප්‍රශ්නයකට/යෝජනාවකට සංශෝධනයක් හෝ ඊට වැඩි සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත්ව ඇති විට, එනම් සංශෝධන සම්බන්ධයෙන් සුදුසු කටයුතු අවසන් වන තෙක් සභාභිමුඛ ප්‍රශ්නය, මුල් ප්‍රශ්නය ලෙස සලකා ක්‍රියා කළ යුතු ය.

*සභාභිමුඛ කළ ප්‍රශ්නය මුල් ප්‍රශ්නය ලෙස සැලකිය යුතුය.*

(6) මූලාසනයෙන් සභාභිමුඛ කර ඇති සංශෝධනයකට සංශෝධනයක් යෝජනා කිරීමට හැකි ය.

58. (1) යෝජිත ප්‍රඥප්තියක ඡේදයකට හෝ උප ලේඛනයකට කෙරෙන සංශෝධනයක් සම්බන්ධයෙන් එම ප්‍රඥප්තිය සැලකිල්ලට භාජනය කළ යුතු දිනට පුරා දිනකට කලින් දැනුම් දීමක් නොකරන්නේ නම්, එම සංශෝධනය ඉදිරිපත් කිරීම ගැන ඕනෑ ම මන්ත්‍රීවරයකුට විරුද්ධත්වය ප්‍රකාශ කළ

*සංශෝධන කලින් ඉදිරිපත් කළ යුතු බව සහ එසේ යොමු නොවූ විට මන්ත්‍රීවරුන්ට විරුද්ධ වීමට ඇති*

හැකි ය. *හැකියාව.*

(2) සභාපතිවරයා අදාළ සංශෝධනය ඉදිරිපත් කිරීමට ඉඩ නොදෙන්නේ නම්, විරුද්ධත්වය වලංගු වන්නේ ය. කෙසේ වුවද, දැනුම් දීමකින් තොරව කෙරෙන යෝජනාවක් අනුව සභාව එකඟත්වයකට පත් වන්නේ නම්, ප්‍රශ්නය සාකච්ඡාවට භාජනය කිරීම සඳහා අවශ්‍ය විමසා බැලීම් අවසන් වනතුරු කල් තැබිය යුතු ය. *සභාපති ඊට එකඟ නම් විරුද්ධත්වය වලංගුය. නමුත් සභාව ඊට එකඟවීම විමසා බැලීම.*

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයේ ii වන ලැයිස්තුවේ දක්වා ඇති කිසියම් කරුණක් ඉදිරිපත් කිරීමට තුඩු දෙන කිසිදු සංශෝධනයකට ඉඩ දෙනු නොලැබේ. *ආ.ව්‍ය. 9 වන උ. ලේඛනයේ ii වන ලැයිස්තුවේ කරුණකට සංශෝධන ඉදිරිපත් කළ නොහැක.*

(4) පළාත් සභා පනතේ 24 වන වගන්තියටපටහැනි වන කිසිදු සංශෝධනයකට ඉඩ දෙනු නොලැබේ. *පනතේ 24 වන වගන්තියට පටහැනි සංශෝධන කළ නොහැකි බව.*

(5) පාර්ලිමේන්තුවෙන් විමසා ඇති බවට සභාපතිවරයා සෑහීමකට පත් නොවෙන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ iii වන ලැයිස්තුවේ දක්වා ඇති කරුණකට අදාළ ප්‍රශ්නයකට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට හෝ එම ලැයිස්තුවේ දක්වා ඇති කරුණක් ඉදිරිපත් කිරීමට තුඩු දෙන කිසිදු සංශෝධනයක් ඉදිරිපත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ. *ආ.ව්‍ය. 9 වන උ. ලේඛනයේ iii වන ලැයිස්තුවේ කරුණකට සංශෝධන ඉදිරිපත් කළ නොහැකි බව.*

**සාකච්ඡාවක් නිම කිරීම :**

59. (1) සභාභිමුඛ කර ඇති ප්‍රශ්නයක්/යෝජනාවක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකුට ස්වකීය ආසනයෙන් නැඟී සිට “ප්‍රශ්නය/යෝජනාව දැන් විමසිය යුතු” යැයි ඉල්ලා සිටිය හැකි ය. එවිට, එම ඉල්ලීම සභා රීති අයුතු අන්දමට පාවිච්චි කිරීමකැයි හෝ සෙසු පාර්ශවයන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමකැයි මූලාසනයට පෙනෙතොත් මිස “එකී ප්‍රශ්නය/යෝජනා පිළිබඳව ඡන්දය දැන් විමසිය යුතුය” යන ප්‍රකාශය කොට ඡන්දය විමසිය යුතු ය.

(2) මෙම රීතිය යටතේ කිසියම් ප්‍රශ්නයක්/ යෝජනාවක්,

ගණපූරණයට යටත් ව එදින පැමිණ සිටින මන්ත්‍රීවරුන්ගේ බහුතර ඡන්දයෙන් වලංගුභාවයට පත් වන්නේ ය.

**බෙදීම :**

60. (1) සභාපතිවරයා විසින් ප්‍රශ්නය/යෝජනාව සභාවට ඉදිරිපත් කර ඊට "පක්ෂයි" සහ "විරුද්ධයි" යනුවෙන් කටහඬවල් අනුව ඡන්දය ගෙන එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය. *බෙදීමක් සම්බන්ධව ඡන්දය ගැනීම සහ එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.*

(2) ප්‍රශ්නයක්/යෝජනාවක් සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටින්නේ නම්, එවැනි අවස්ථාවකදී බෙදීම සිදු කළ යුත්තේ, විනාඩි දෙකක් සීනුව නාද කරවීමෙන් පසුව ය.

(3) විද්‍යුත් මාධ්‍යයෙන් ඡන්දය විමසන විට මන්ත්‍රීවරුන් සභාපතිතුමා විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ ඔවුන්ගේ තීරණය දැක්වීම සඳහා අදාළ බොත්තම එබිය යුත්තේ ය. *විද්‍යුත් මාධ්‍යයෙන් ඡන්දය විමසීම.*

(4) එසේ බෙදීමක් ඉල්ලා සිටින කල්හී පළමුව යෝජනාවට පක්ෂව සිටින මන්ත්‍රීවරුන්ට නැඟී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කර වීමටත්, දෙවනුව විරුද්ධව සිටින මන්ත්‍රීවරුන්ට නැඟී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කර වීමටත්, තෙවනුව යෝජනාවට වැළකී සිටින මන්ත්‍රීවරුන්ට නැගී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කිරීමටත් සලස්වා, ලේකම්වරයා විසින් තමන්ට දැනුම් දෙන ලද ගණන් කිරීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය. *ඡන්දය විමසන අයුරු.*

(5) නමින් ඡන්දය විමසිය යුතු යැයි 60 (2) අනුරීතිය යටතේ යම් මන්ත්‍රීවරයකු ඉල්ලා සිටිය හොත් සභාපතිවරයාට තම අභිමතය පරිදි නමින් ඡන්දය විමසීමට හෝ 60 (3) අනුරීතිය යටතේ ක්‍රියා කිරීමට හෝ හැකි ය.

(6) නමින් ඡන්දය විමසීමේ දී ඒ ඒ මන්ත්‍රීවරයාගේ නම ප්‍රකාශ කරන විට_ඒ මන්ත්‍රීවරයා තම අභිමතය පරිදි "පක්ෂයි" හෝ "විරුද්ධයි" හෝ යනුවෙන් ප්‍රකාශ කළ යුතු ය.

(7) නමින් ඡන්දය විමසීමේ දී ආණ්ඩු පක්ෂයේ නම් මුලින් ම ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ද, විපක්ෂයේ නම් විපක්ෂ නායකවරයාගෙන් ද ආරම්භ කර ආසන අනුපිළිවෙළට ඡන්දය විමසිය යුතු ය. *ආණ්ඩු පක්ෂයෙන් ප්‍රධාන අමාත්‍යවරාගේ සිට විපක්ෂයේ විපක්ෂ නායකවරයා සිට*

(8) තමන් ඡන්දය දීමෙන් වළකින බව ප්‍රකාශ කිරීමට හෝ *ඡන්දයෙන්*

ඡන්දය දීමෙන් වැළකී සිටීමට මන්ත්‍රීවරුන්ට හැකි ය. එවැනි අවස්ථාවකදී ඔවුන් ඡන්දය දීමෙන් වැළකී සිටි අය ලෙස ලේකම් විසින් සටහන් කළ යුතු ය. *වැළකෙන විට.*

(9) ලේකම්වරයා විසින් ඡන්ද සංඛ්‍යාව සභාපතිවරයාට දැනුම් දිය යුතු අතර, අසමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති විට සභාපතිවරයා විසින් එම ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය.

(10) සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති විට, ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර සභාපතිවරයා විසින් ඔහුගේ තීරක ඡන්දය පාවිච්චි කළ යුතු ය. *සභාවේ තීරක ඡන්දය*

(11) (අ) ප්‍රධාන අමාත්‍යතුමා හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හා විපක්ෂ නායකතුමා හෝ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයෙකුට යම් යෝජනාවක් සම්බන්ධයෙන් රහස් ඡන්දයක් ලබා දිය යුතු යැයි ඉල්ලා සිටිය හැකිය. එවන් අවස්ථාවකදී එකී යෝජනාවට අදාළව රහස් ඡන්දයක් පැවැත් වීමට කටයුතු සැලසිය යුතු ය. *රහස් ඡන්දයක් ඉල්ලීම.*

(ආ) එවැනි අවස්ථාවකදී විනාඩි දෙකක් කැඳවීම් සීනුව නාද කිරීමෙන් පසුව ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසිය යුතුය. එසේ වුවද, රහස් ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා කාලය අවශ්‍ය බව හැඟී යන්නේ නම්, සභාපතිවරයා තීරණය කරන පරිදි කෙටි කාල සීමාවකට සභාව තාවකාලිකව අත්සිටු විය හැකි ය. *රහස් ඡන්දයකදී සභාව කෙටි කාලයකට අත්සිටුවීම.*

(12) ඡන්ද විමසීමේ ප්‍රතිඵල අදාළ දින කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය.

**අපේක්ෂණය :**

61. සභාවේ න්‍යාය පත්‍රයට කලින් සිට ඇතුළත් යෝජනාවක හෝ යෝජිත ප්‍රඥප්තියක විෂයය කරුණු හා අදාළ ව යෝජනාවක් ඉදිරිපත් කිරීම හෝ සංශෝධනයක් යෝජනා

කිරීම හෝ රීති විරෝධී වන්නේ ය.

## පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවේ අදහස් විමසන අවස්ථාවේදී ක්‍රියා පටිපාටිය :

62. (1) ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 9 වන උපලේඛනයේ I වන ලැයිස්තුවෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සම්පාදනය කිරීමට යෝජිත යම් නීතියක් පිළිබඳව සභාවේ අදහස් විමසා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලැබුණු යම් අවස්ථාවක දී, එය ලැබුණු බව සභාපතිවරයා විසින් ඊළඟ පළාත් සභා රැස්වීමේ දී ප්‍රකාශ කළ යුතු ය. එබඳු ලිපියක් ලැබෙන අවස්ථාවක දී සභාවේ රැස්වීමක් පැවැත් වේ නම්, සභාවේ වැඩ කටයුතු එම ප්‍රකාශය කිරීම සඳහා තාවකාලිකව අත්හිටුවිය යුතු ය.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායේ 9 වන උප ලේඛනයේ I වන ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවේ අදහස් විමසීම.*

(2) ඉන් අනතුරුව එම දැන්වීම ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය. ප්‍රඥප්ති සහ නීති පිළිබඳ කාරක සභාව එම දැන්වීම ලැබී දින තුනක් ඇතුළත රැස්වීමෙන් අනතුරුව, පසු දින ම ස්වකීය වාර්තාව යෝජිත නීතියට අදාළ පළාත් විෂයය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

(3) එම වාර්තාව ඊළඟට පැවැත්වෙන පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමට අදාළ අමාත්‍යවරයා විසින් යොමු කළ යුතු අතර, එහිදී යෝජිත නීතිය පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ තීරණය සභා ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය.

(4) (අ) ලේකම්වරයා ඊළඟට පැවැත්වෙන පළාත් සභාවට එය ඉදිරිපත් කළ යුතු අතර, පළාත් සභාවේ තීරණය පළාත් සභාව රැස්වී දින තුනක් ඇතුළත ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලෙස සභාව ලේකම්වරයාට නියම කළ යුතු ය.

(ආ) එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිතුමාගේ එකඟත්වයට යටත්ව එකී කාලසීමාවන් දීර්ඝ කළ හැකිය.

63. (1) ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සම්පාදනය කිරීමට යෝජිත යම් නීතියක් පිළිබඳව සභාවේ අදහස් විමසා පාර්ලිමේන්තුවෙන් ලිපියක් ලැබුණු බව

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායේ 9 වන උප ලේඛනයේ III වන ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුව විසින්*

සභාපතිවරයා විසින් ඊළඟ පළාත් සභා රැස්වීමේ දී ප්‍රකාශ කළ යුතු ය. එබඳු ලිපියක් ලැබෙන අවස්ථාවේ දී සභාවෙහි රැස්වීමක් පැවැත් වේ නම්, සභාවෙහි වැඩ කටයුතු එම ප්‍රකාශය කිරීම සඳහා තාවකාලිකව අත්හිටුවිය යුතු ය. *පළාත් සභාවේ අදහස් විමසීම.*

(2) ඉන් අනතුරුව එම දැන්වීම ප්‍රඥප්ති සහ නීති කාරක සභාවට යොමු කළ යුතු ය. ප්‍රඥප්ති හා නීති කාරක සභාව, එම දැන්වීම ලැබී දින 03 ක් ඇතුළත රැස්වීමෙන් පසු දින තම වාර්තාව ඊළඟ පළාත් සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකි වන සේ ලේකම්වරයාට භාර දිය යුතු ය.

(3) (අ) පළාත් සභාවේ අදහස් සලකා බැලීමෙන් පසුව එම යෝජිත නීතිය පිළිබඳව සභාවේ තීරණය දින 03 ක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ලේකම්වරයාට නියම කළ යුතු ය.

(ආ) එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිතුමාගේ එකඟත්වයට යටත්ව එකී කාලසීමාවන් දීර්ඝ කළ හැකි ය.

## විවාද පිළිබඳ රීති :

64. (1) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) (4) ව්‍යවස්ථාවට යටත්ව ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුකාරවරයකුගේ හෝ විනිශ්චයකාරවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ හෝ පැවැත්ම සභාවේ සාකච්ඡා කිරීම තහනම් කරන පළාත් සභා පනතේ 18 වන වගන්තිය දැඩි ලෙස පිළිපැදිය යුතු ය. එසේ වුවද, ඉහත ධුරධාරීන්ගේ පැවැත්මට සහ චරිතයට අගතියක් නොවන පරිදි සභාපතිවරයාගේ අභිමතය පරිදි සාකච්ඡා කළ හැකි ය. *ජනාධිපතිවරයා, ආණ්ඩුකාරවරයා, විනිශ්චයකාරවරයෙකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පැවැත්ම පිළිබඳ සාකච්ඡා කළ නොහැකි බව.*

(ආ) යම් මන්ත්‍රීවරයෙකු 64(1)(අ) යටතේ කථා කිරීමට කටයුතු කරන්නේ නම් එය සභාපතිවරයාගේ අභිමතය පරිදි විය යුතු ය.

(2) පළාත් සභා මන්ත්‍රීවරයකුගේ පැවැත්ම පිළිබඳව එම විෂයය සඳහා වන විශේෂ යෝජනාවක දී හැරුණු විට, සාකච්ඡා නොකළ යුතු ය. *පළාත් මන්ත්‍රීවරයෙකුගේ පැවැත්ම පිළිබඳව සාකච්ඡා කිරීම.*

(3) ස්වකීය අභිමතය පරිදි කටයුතු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ පනතින් ඉඩ ලැබෙන තාක් දුරට, ආණ්ඩුකාරවරයකුට තම කාර්යයන් සපුරාලීම කෙරෙහි *ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන*

බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමක් සිදු නොවිය යුතු ය. *කරුණක් ගැන සාකච්ඡා නොකළ යුතු බව.*

(4) ඉහත අංක (1) සහ (2) අනු රීතිවල සඳහන් වන්නා වූ පුද්ගලයකුගේ පැවැත්ම පිළිබඳවත්, අංක (3) අනුරීතියෙහි දැක්වෙන කිසියම් කරුණක් පිළිබඳවත්, යම් සංශෝධනයක දී හෝ අමාත්‍යවරයකු වෙත ඉදිරිපත් කෙරෙන යම් ප්‍රශ්නයක දී හෝ විවාදයක දී හෝ සඳහන් කිරීම නොකළ යුතු ය.

(5) සභාව ඉදිරියේ ඇති කිසියම් යෝජනාවක් පිළිබඳව පහත සඳහන් තත්ත්වයන් හා කරුණු යටතේ විනා, කිසිදු මන්ත්‍රීවරයකු එක් වරකට වැඩියෙන් කථා නොකළ යුතු ය. *මන්ත්‍රීවරයෙකුට එක් වරකට වඩා කථා නොකිරීම.*

(අ) අලුතින් කරුණු ඉදිරිපත් කිරීමකින් තොර ව, ස්වකීය කථාවේ වරදවා තේරුම් ගෙන ඇති වැදගත් කොටසක් පැහැදිලි කරලීම පිණිස පමණක් සභාපතිවරයා වෙතින් ලත් පූර්ණ අවසරය මත ;

(ආ) රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන්,

(ඇ) වරප්‍රසාද ප්‍රශ්නයක් සම්බන්ධයෙන්,

(ඈ) පූර්ණ කාරක සභාවට යොමු කළ කරුණක් සම්බන්ධයෙන්

යම් මන්ත්‍රීවරයෙකුට කථා කිරීමට බාධාවක් නොමැත්තේ ය.

(6) කෙසේ වුවද යෝජනාවක් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට, එම යෝජනාව සම්බන්ධයෙන් සභාව ඇමතීමට සිටින අනිකුත් මන්ත්‍රීවරුන් සභාව ඇමතීමෙන් අනතුරුව, පිළිතුරු දීමට හැකි විය යුතු ය. *යෝජක මන්ත්‍රීවරයාට පිළිතුරු කථාවක් පැවැත්වීමට පුළුවන් බව.*

65. (1) යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට ඒ වෙනුවෙන් කථා කිරීමට පිළිවන්කම ලැබුණ ද, එම යෝජනාව හෝ සංශෝධනය හෝ නිසි පරිදි ස්ථිර කෙරෙන තුරු ඒ සම්බන්ධයෙන් විවාදයකට ඉඩ නොලැබෙන අතර, ඒ පිළිබඳ විමසීමක් ද නොකළ යුතු ය. එතෙකුදු වුවත්, අමාත්‍යවරයකු විසින් ගෙනෙනු ලබන පොදු කටයුතු සම්බන්ධයෙන් කරනු ලබන කිසියම් යෝජනාවක් හෝ සංශෝධනයක් හෝ ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය. *යෝජනා හා සංශෝධන ස්ථිර කිරීම හෝ නොකිරීම.*

(2) ඕනෑ ම මන්ත්‍රීවරයකුට තමන්ට වෙන් කර ඇති ආසනයෙන්

නැඟී සිට මූලාසනයට ආචාර කොට කිසියම් යෝජනාවක් ස්ථිර කිරීමට හෝ සංශෝධනයක් ස්ථිර කිරීමට හෝ පුළුවන. එය ඒ මන්ත්‍රීවරයාට පසුව කථා කිරීමට ඇති අයිතියට අවහිරතාවයක් නොවිය යුතු ය.

66. (1) සභාපතිවරයා විසින් ප්‍රශ්නයක් සමාප්තියට පත් කරනු ලැබීමෙන් පසු කිසිදු මන්ත්‍රීවරයකු ඒ සම්බන්ධයෙන් කථා නොකළ යුතු ය. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසු එම ප්‍රශ්නය සමාප්තියට පත් වන්නේ ය. *ප්‍රශ්නයක් සමාප්තියට පත් කිරීම.*

(2) (අ) යෝජනා කොට විවාදයට ලක් කිරීමෙන් පසු නිගමනය කර ඇති යම් කරුණක් එක ම වසරක් තුළ දී හෝ නැවත යෝජනා කොට විවාද කළ නොහැක්කේ ය. *විවාද කළ අවසන් කළ යම් කරුණක් වසරක් තුළදී යළි විවාද කළ නොහැකි බව.*

(ආ) එසේ වුවද, කාලීන වැදගත්කමින් යුත් කරුණක් ලෙස සභාපතිවරයාට හෝ සභා කටයුතු කාරක සභාවට හැඟී යන්නේ නම්, සභාව හෝ සභා කටයුතු කාරක සභාව තීරණය කරන පරිදි ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ හැක්කේ ය. *සභාවේ හා සභා කටයුතු කාරක සභාවේ තීරණය අනුව යළිත් විවාද කළ හැකි බව.*

## මන්ත්‍රීවරුන්ගේ කථා පැවැත්වීම හා සම්බන්ධ රීති :

67. (1) තමන්ට වෙන් කර දී ඇති ආසනයෙන් පිට සිට, මන්ත්‍රීවරයකු සභාව ඇමැතීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම හෝ නොකළ යුතු ය. *මන්ත්‍රීවරයෙකුගේ කථා පැවැත්වීම සම්බන්ධ රීති.*

(2) අන් අයුරකින් කථා කිරීමට සභාපතිවරයා අවසර දුන්නොත් මිස, සෑම මන්ත්‍රීවරයකු ම කථා කළ යුත්තේ නැඟී සිට ය. සෑම මන්ත්‍රීවරයකු මූලාසනයට යොමුව සභාපතිවරයා අමතමින් කථා කළ යුතු ය. *නැගිට, මූලාසනයට යොමුව සභාපතිවරයා අමතමින් කථා කිරීම.*

(3) එක්වර මන්ත්‍රීවරු දෙදෙනෙක් හෝ වැඩි දෙනෙක් හෝ නැඟී සිටිත් නම්, සභාපතිවරයා මුලින් ම තම නෙත ගැටුණු මන්ත්‍රීවරයාට ආමන්ත්‍රණය කොට, කථා කිරීමට ඔහුට දැන්විය යුතු ය. සභාපතිවරයාගේ තීරණය අභියෝගයට ලක් නොකළ යුතු ය. *පළමුව නෙත ගැටුණු කෙනාට අවස්ථාව දීම.*

(4) මන්ත්‍රීවරයකුට යම් නිරීක්ෂණයන් වේ නම්, ඒවා සභාපතිවරයා වෙත යොමු කළ යුතු ය.

(5) මන්ත්‍රීවරයකුට සභාව ඉදිරියේ ඇති යම් විෂයයක් සම්බන්ධයෙන් හෝ ඊට යෝජනා කොට ඇති සංශෝධනයක් සම්බන්ධයෙන් හෝ විවාදයේ දී උද්ගත වන රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ විනා වෙනත් කරුණක් සම්බන්ධයෙන් කථා කිරීමට නොපිළිවන.

(6) මන්ත්‍රීවරයකු ස්වකීය අදහස් දැක්වීම සාකච්ඡාවට භාජන ව ඇති විෂයයට සීමා කළ යුතු ය. *සාකච්ඡාව විෂයයට සීමා වීම.*

(7) (1) කිසියම් මන්ත්‍රීවරයකු අධිකරණයක විනිශ්චයකට භාජන ව ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණ ම ය තීන්දුවක් අපේක්ෂා කරන කරුණක් සම්බන්ධයෙන් හෝ සාකච්ඡා කිරීම හෝ හැඟවීම් කිරීම හෝ නොකළ යුතු ය. *අධිකරණයක විනිශ්චයට භාජනව හෝ තීන්දුවක් අපේක්ෂා කරන කරුණ.*

(2) 67(7)(1) රීතියේ ප්‍රතිපාදන යටතේ යම් මන්ත්‍රීවරයෙකු විරෝධය පළ කරන්නේ නම්, එකී මන්ත්‍රීවරයා විසින් එය සනාථ කිරීම සඳහා කටයුතු ඉටු කළ යුතු ය. *එක් කරුණ සනාථ කිරීම කළ යුතු බව.*

(8) කිසිදු මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකු වෙත අපහාසාත්මක ප්‍රකාශයන් හෝ පෞද්ගලික චෝදනා නැගීම හෝ නොකළ යුතු ය.

(9) කථා කරමින් සිටින මන්ත්‍රීවරයකු අදාළ විෂයයෙන් පිටස්තරව කථා කරන්නේ නම්, ඔහුව සභාපතිවරයා හරහා දැනුවත් කළ හැක්කේ ය.

(10) සභාවේ ඒ පිළිබඳ ප්‍රශ්නයක් සභාභිමුඛ කර නොතිබුණ ද, සභාපතිවරයාගේ අවසරයට යටත් ව මන්ත්‍රීවරයකුට තමා පිළිබඳ වූ පෞද්ගලික කරුණු පහදා දිය හැකි ය. එහෙත් එවැනි කරුණු විවාදයකට භාජනය කළ නොහැකි ය. එමෙන් ම එම කථාව තමාගේ පැවැත්ම දෝෂමුක්ත කිරීමට පමණක් සීමා විය යුතු ය. *මන්ත්‍රීවරයෙකුට තම පැවැත්ම දෝෂමුක්ත කිරීම සඳහා කථා කිරීමට ඇති හැකියාව.*

(11) රීතිවලින් බැහැර ව යන කිසියම් මන්ත්‍රීවරයකු සභාපතිවරයා විසින් වහා ම හෝ, රීති ප්‍රශ්නයක් මතු කිරීම මගින් වෙනත් මන්ත්‍රීවරයකු විසින් හෝ නිසි මාර්ගයට යොමු කළ යුතු ය.

## මන්ත්‍රීවරුන්ගේ හැසිරීම :

68. (1) මන්ත්‍රීවරුන් සභා ප්‍රදේශය ඇතුළත සියලු ම අවස්ථාවන්හි දී සභාවේ ගරුත්වය හා සභාපතිවරයාගේ අධිකාරිය රකිමින් විනීත අන්දමින් හැසිරිය යුතු ය. *සභාවේ ගරුත්වය හා සභාපතිවරයාගේ අධිකාරිය රකිමින් හැසිරිය යුතු බව.*

(2) මන්ත්‍රීවරුන් සභාවට පැමිණෙන විට සහ සභාවෙන් පිට වන *මූලාසනයට හිස නමා*

විට මූලාසනයට හිස නමා ආචාර කළ යුතු ය.

*ආචාර කිරීම.*

(3) සභාවේ හෝ කාරක සභාවක රැස්වීම්වලට සහභාගී වන විට සභාවේ සභාපතිවරයා විසින් නියම කර ඇති උපදෙස් පරිදි මන්ත්‍රීවරුන්ගේ සභා අත්පොතෙහි සඳහන් නිසි ඇඳුමින් සැරසී සිටිය යුතු ය.

(4) සභාවේ රැස්වීමක් හෝ මුළු සභාවෙහි ම කාරක සභා රැස්වීමක් හෝ පැවැත්වෙන කාලය තුළදී මන්ත්‍රීවරයකු ;

(අ) රැස්වීම් ශාලාවට ඇතුළු වීම හෝ ඉන් පිට වීම හෝ අවශ්‍ය වන විට නිශ්ශබ්දව හා අවහිරයක් සිදු නොකොට එසේ කළ යුතු ය.

*සභාවෙන් පිට විය යුතු අයුරු*

(ආ) සභා ගර්භය මැදින් හෝ මූලාසනයත්, කථා කරමින් සිටින මන්ත්‍රීවරයාත් අතරින් හෝ ගමන් නොකළ යුතු ය.

*සභා ගර්භයේ මැදින් සහ මූලාසනයත් කථික මන්ත්‍රීවරයාත් මැදින් ගමන් කළ නොහැකි බව.*

(ඇ) සභාවට ඉදිරිපත් කොට තිබෙන කාර්යයන්ට අදාළ පුවත්පත්, ලිපි ලේඛන හැර, අදාළ නොවන පුවත්පත්, පොත්, ලියුම් හෝ වෙනත් යමක් හෝ නොකියැවිය යුතු ය.

*පුවත්පත්, ලිපිලේඛන, පොත්පත්, ලියුම්*

(ඇ) යම් ලේඛනයක උපුටනයක් ගෙන හැර දක්වමින් යම් මන්ත්‍රීවරයෙකු කථා කරන්නේ නම්, එම උපුටනය අඩංගු ලේඛනයේ නම, ප්‍රකාශනයට පත් කර ඇති දිනය හා පිටු අංකයද, අදාළ ඡේදය ද තම කථාවේ දී සඳහන් කළ යුතු අතර, එම ලේඛනය සභාගත කිරීමටද මන්ත්‍රීවරුන් විසින් වගබලා ගත යුතු ය.

*සභාව ඇමතීමේදී භාවිතා කරන සියලුම උපුටනයන් සභාගත කළ යුතු බව.*

(ඉ) සභාවේ දී සඳහන් කළ ප්‍රකාශය සහ සභාගත ලියවිල්ලේ අදාළ කොටස අතර යම් පරස්පරතාවක් තිබෙයි නම්, එම පරස්පරතාවයෙන් යුතු කොටස නිල වාර්තාවෙන් ඉවත් කිරීමේ බලය සභාපතිවරයාට ඇත්තේ ය.

*ප්‍රකාශයේ සහ ලේඛනයේ පරස්පර කරුණු ඇත්නම් එම කොටස් ඉවත් කිරීමට බලය ඇති බව.*

(ඊ) රීති විරෝධී යැයි සැලකෙන යම් කරුණක් හෝ ප්‍රකාශයක් ඇත්නම්, එම කරුණ හෝ ප්‍රකාශය නිල වාර්තාව සභාගත කිරීමට පෙර ඉවත් කිරීමේ බලය සභාපතිවරයාට ඇත්තේ ය.

*රීති විරෝධී ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීම.*

(උ) සභා ගර්භය තුළ දුම්පානය කිරීම හෝ යම් ආහාර පාන ගැනීම ආදියක් හෝ නොකළ යුතු ය. එසේ වුවද, සභාව අමතන අවස්ථාවේ යම් මන්ත්‍රීවරයකුට වතුර පානය කිරීමට අවශ්‍ය වුවහොත් ඊට බාධාවක් නොතිබිය යුතු ය.

*දුම්පානය, ආහාරපාන ගැනීම.*

(ඍ) වෙනත් මන්ත්‍රීවරයකු කථා කරන විට නිශ්ශබ්දව සිටිය යුතු අතර, එසේ කථා කරන මන්ත්‍රීවරයා විසින් ඉඩ දෙනු ලැබුවොත් මිස, ඔහුගේ කථාවට බාධා නොකළ යුතු ය. *කථාවට බාධා නොකිරීම.*

(එ) සභාව ඉදිරියේ අදහස් ප්‍රකාශ කරන මන්ත්‍රීවරයෙකුට තමාගේ කථාවට අදාළ තොරතුරු තහවුරු කිරීම සඳහා හෝ පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයාගේ අවසරය මත පරිගණක භාවිතා කළ හැකි ය. එසේ වුවද, සභාවේ අවධානය කඩවන පරිදි ඒවා භාවිතා කරන බව පෙනී යන්නේ නම්, සභාවේ අවධානය එම මන්ත්‍රීවරයා වෙත යොමු කරවා, ඔහුගේ කථාව හෝ ක්‍රියාව නතර කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය. *පරිගණක භාවිතය සහ සීමාව*

(5) සෙංකෝලය පළාත් සභා ගර්භය ඇතුළත තැන්පත් කර ඇති විට යම් මන්ත්‍රීවරයෙකු එය සපර්ශ කිරීම හෝ එසවීම හෝ කිසියම් හෝ අලාභයක් සිදු කිරීම බරපතළ විනය විරෝධී ක්‍රියාවක් වන අතර, එම වරද කරනුයේ පළමුවරට කියන කාරණය නොසලකා, එම මන්ත්‍රීවරයාට පළාත් සභාව මාසයකට අත්හිටවනු ලැබිය යුත්තේ ය. *සෙංකෝලය*

69. සභාවෙහි සෑම රැස්වීමකදී ම හෝ මුළු සභාවේ ම කාරක සභා රැස්වීමකදී හෝ සභා පිළිවෙත පිළිබඳ නියමයන් පිළිපැදීම ගැන සභාපතිවරයා වගකිව යුතු අතර, එම පිළිවෙත පිළිබඳ යම් රීති ප්‍රශ්නයකට අදාළව ඔහුගේ තීරණය ගැන ප්‍රශ්න කිරීම කළ නොහැකි ය. එමෙන් ම දැනුම් දීමකින් පසුව කෙරෙන වෙනත් යෝජනාවක් මගින් මිස, සභාව විසින් එම තීරණය සමාලෝචනය නොකළ යුතු ය. *රීති ප්‍රශ්නයකට අනතුරුව සභාපතිවරයාගේ තීරණය ප්‍රශ්න කිරීමට ඉඩ නොමැති බව.*

70. විවාදයක් අතරතුරදී සභාපතිවරයා සභාව අමතන යම් අවස්ථාවකදී, කථා කරමින් සිටින හෝ කථා කිරීම සඳහා ඉදිරිපත් වන යම් මන්ත්‍රීවරයෙකු සිය ආසනයෙහි අසුන් ගත යුතු අතර, සභාපතිවරයාගේ කථාව අවහිරතාවයකින් තොරව ඇසෙන පරිදි සභාව හෝ කාරක සභාව හෝ නිශ්ශබ්ද විය යුතු ය. *විවාදයක් අතරතුර සභාපතිවරයා අමතන විට හැසිරිය යුතු ආකාරය.*

71. අනුගමනය කළ යුතු රීති පිළිබඳව ප්‍රශ්නයක් නැඟීමෙන් පසු එය නඟන මන්ත්‍රීවරයා තම අසුනෙහි වාඩි විය යුතු අතර, සභාපතිවරයා අවසර දුනහොත් හැර වෙනත් කිසිදු මන්ත්‍රීවරයකු එම ප්‍රශ්නය ගැන සභාපතිවරයා තීන්දුවක් දෙන තුරු නැඟී නොසිටිය යුතු ය. මූලාසනය එම තීන්දුව දුන් පසු ඒ අනුව ක්‍රියා කරමින් එම ප්‍රශ්නය නැඟූ අවස්ථාවේ දී සභාව හෝ කාරක සභාව අමතමින් සිටි මන්ත්‍රීවරයාට කථාව තවදුරටත් කර ගෙන යෑමට අයිතිය ඇත. *රීති ප්‍රශ්නයක් නැඟූ පසු ඊට සභාපතිවරයා පිළිතුරු දෙන තුරු මන්ත්‍රීවරු අසුන් ගෙන සිටිය යුතුය.*

72. (1) අනුගමනය කළ යුතු රීති ක්‍රියාත්මක කිරීම පිළිබඳව හෝ එහි අර්ථ නිරූපනය පිළිබඳව හෝ සභාවේ වැඩ කටයුතු විධිමත් කිරීමට අදාළ වන රීතියක් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අනු දැනුම ඇතිව රීති ප්‍රශ්නයක් නැගිය හැකි විය යුතු ය. මෙම රීති සම්බන්ධයෙන් හෝ සභාවේ කටයුතු විධිමත් කිරීමට අදාළ වන කුමන රීතියක් සම්බන්ධයෙන් හෝ අර්ථ නිරූපනය පිළිබඳව යම් වරදක් සිදු වූ ඉක්බිතිව ම රීති ප්‍රශ්නය මතු කළ යුතු ය.

*රීති ක්‍රියාත්මක කිරීම හෝ රීති අර්ථ නිරූපණය පිළිබඳව යම් වරදක් සිදු කළ ඉක්බිතිවම රීති ප්‍රශ්නය මතු කළ යුතුය.*

(2) එම රීති ප්‍රශ්නය මතු කරන අවස්ථාවේදී කථා කරමින් සිටින මන්ත්‍රීවරයා එම රීති ප්‍රශ්නය සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය දී අවසන් වනතුරු සිය අසුනෙහි වාඩි විය යුතු ය.

(3) රීති ප්‍රශ්නයක් මත රීති ප්‍රශ්නයක් නැඟිය නොහැකි ය. රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය දෙන තුරු තවත් රීති ප්‍රශ්නයක් මතු කළ නොහැකි ය.

*රීති ප්‍රශ්නයකට තවත් රීති ප්‍රශ්න නැඟිය නොහැකි බව.*

(4) රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සභාපතිවරයා යම් තීරණයක් දුන් පසු ඒ පිළිබඳව තවදුරටත් ප්‍රශ්න කළ නොහැකි ය.

*සභාතිවරයාගේ තීරණය ප්‍රශ්න කළ නොහැකි බව.*

73. අදාළ නොවන කරුණු දැක්වීම හෝ තමාගේ ම තර්ක හෝ විවාදයට සම්බන්ධ සෙසු මන්ත්‍රීවරුන් පාවිච්චි කරන තර්ක පීඩාකාරී ලෙසින් නැවතත් ඉදිරිපත් කිරීමෙහි නිරත යම් මන්ත්‍රීවරයකු සිටින බව පෙනී යන්නේ නම් හෝ යම් මන්ත්‍රීවරයෙකු සභාවේ ගෞරවයට හානි වන ලෙස අවිනීත ලෙස හැසිරේ නම් හෝ සභාවේ අවධානය එම මන්ත්‍රීවරයා වෙත යොමු කරවා, ඔහුගේ කථාව නතර කරන ලෙස නියම කිරීමට සභාපතිවරයාට හැකි ය.

*මන්ත්‍රීවරයෙකුගේ පීඩාකාරී කථාව නතර කරන ලෙස සභාපතිවරයාට නියම කළ හැකි අවස්ථා.*

74. යම් මන්ත්‍රීවරයකුගේ හෝ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම හෝ කථා විලාසය නුසුදුසු යැයි සභාපතිවරයාට හැඟී යන්නේ නම්, එම මන්ත්‍රීවරයාට හෝ මන්ත්‍රීවරුන්ට සභාවේ හෝ කාරක සභාවේ හෝ එම දිනයේ ඉතිරි රැස්වීම්වලින් වහා ම ඉවත් වන ලෙස සභාපතිවරයා විසින් නියෝග කළ යුතු ය.

*නුසුදුසු කථා හා හැසිරීම් ඇති මන්ත්‍රීවරයෙකු සභාවෙන් හෝ කාරක සභාවෙන් ඉවත් කිරීම.*

**මන්ත්‍රීවරයෙකුගේ සභා සහභාගීත්වය තහනම් කිරීම :**

75. (1) (ආ) මූලාසනයේ බලතල ගැන නොතකන්නා වූ හෝ සභාවේ හෝ කාරක සභාවේ හෝ වැඩ කටයුතුවලට හිතාමතා ම

*මන්ත්‍රීවරයෙකු නම් කිරීම.*

අවහිර කරමින් සභාවේ නියෝග උල්ලංඝණය කරන්නා වූ හෝ ඉහත 74 වන රීතිය යටතේ කරනු ලබන නියෝගයකට අනුව කටයුතු නොකරන්නා වූ යම් මන්ත්‍රීවරයකු සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(ආ) එම වරද සභාවෙහිදී සිදු කර ඇත්නම්, සංශෝධනයකින් හෝ රැස්වීම කල් තැබීමකින් හෝ විවාදයකින් හෝ විවාදයකින් තොරව හෝ සභාපතිවරයා එම මන්ත්‍රීවරයාගේ නම සඳහන් කරමින් "………. (නම) ………. සභාවට සහභාගී වීම තාවකාලිකව අත්හිටුවමි" යැයි ප්‍රකාශ කළ යුතු ය. *සභාව තාවකාලිකව අත්සිටුවීම.*

(ඇ) පූර්ණ කාරක සභාවක දී එම වරද සිදු කර ඇත්නම් වහාම සභාව බවට පරිවර්තනය වී, එම වරද සභාවේදීම කරන ලද්දක් සේ සලකා රීති අංක (ආ) හි සඳහන් යෝජනාව ඉදිරිපත් කොට ඒ ප්‍රශ්නය ම ඒ ආකාරයෙන් ම නැඟිය යුතු ය.

(2) (අ) මෙම නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ සභා සහභාගීත්වය තාවකාලිකව අත්සිටුවනු ලැබුවහොත්, ඔහුගේ එම අත්සිටුවනු ලැබීම ප්‍රථම අවස්ථාවේදී එක් සභා වාරයකට වලංගු වනු ඇත. දෙවන අවස්ථාවේදී හෝ එම සැසිවාරය තුළ දී එය සභා වාර දෙකක් වනු ඇත. තුන්වන හෝ ඊට පසු යම් අවස්ථාවකදී හෝ එම සැසිවාරය තුළදී ම එය සභා වාර හතරක් වනු ඇත. *සභා සහභාගීත්වය තහනම් කිරීම වලංගු කාල සීමාව.*

(ආ) යම් මන්ත්‍රීවරයෙකුගේ සභා සහභාගීත්වය හෝ සියලු වරප්‍රසාද හා දීමනා අහිමි වීම තාවකාලිකව හෝ මාස කිහිපයකට අත්සිටුවන අවස්ථාවකදී, එකී මන්ත්‍රීවරයාට හිමි සියලු වරප්‍රසාද හා දීමනා ඔහුට අහිමි වනු ඇත. *වරප්‍රසාද හා දීමනා අහිමි වීම.*

(3) මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු සාමූහික ව වරද සිදු කිරීමෙන් මෙම නියෝගය යටතේ තාවකාලිකව අත්සිටුවීමට නතුවන අවස්ථාවකදී, එකී මන්ත්‍රීවරුන් සියලු දෙනාගේ ම සභා සහභාගීත්වය එක විට තහනම් කළ යුතු ය. *සාමූහිකව වරද සිදු කළ විට සභා සහභාගීත්වය තහනම් කිරීම.*

76. 74 හෝ 75 රීතීන් යටතේ ඉවත් වන ලෙස නියම කරනු ලබන්නා වූ හෝ තාවකාලිකව අත්සිටුවනු ලබන්නා වූ හෝ මන්ත්‍රීවරුන් වහා ම සභා සීමාවෙන් ඉවත් විය යුතු ය. *සභා සහභාගීත්වය තහනම් කළ විට වහාම සභා සීමාවෙන් ඉවත් වීම.*

77. මන්ත්‍රීවරයකු සභාව තුළදී කරන ලද වරදක් සම්බන්ධයෙන් ඔහු සභාව තුළ නොමැති අවස්ථාවක දී ඔහු ව නම් කරනු *මන්ත්‍රීවරයෙකුගේ සභාව තුළ නොමැති විට ඔහුගේ සභා*

ලැබූ විට, ඔහුගේ සභා සහභාගීත්වය තාවකාලිකව අත්සිටුවීමට යෝජනා කිරීමට සභාපතිවරයාට පුළුවන. එවැනි අවස්ථාවල දී, ඒ බව ඒ මන්ත්‍රීවරයාට ලිඛිත ව දැනුම් දිය යුතු ය. *සහභාගීත්වය තහනම් කිරීම.*

78. ඉවත් වන ලෙස නියම කරනු ලබන්නා වූ හෝ තාවකාලිකව සභා සහභාගීත්වය අත්සිටුවනු ලබන්නා වූ හෝ යම් මන්ත්‍රීවරයකු සභා ගැබෙන් ඉවත් නොවේ නම්, එම මන්ත්‍රීවරයා ඉවත් කරවා එම නියෝගය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ලේකම්වරයාට නියම කිරීමට සභාපතිවරයාට හැකි ය. එවැනි අවස්ථාවලදී සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. *සභා සහභාගීත්වය තහනම් කළ මන්ත්‍රීවරයෙකු සභා ගැබෙන් ඉවත් කිරීම.*

## ප්‍රතිපත්තිමය සාකච්ඡාව :

79. පූර්ණ කාරක සභාවට යොමු වූ කරුණක් සම්බන්ධව වන සියලුම ප්‍රතිපත්ති ම ය සාකච්ඡාවන් පළාත් සභාව, පූර්ණ කාරක සභාවක් බවට පත් වීමට කලින් සිදු කළ යුතු ය. *ප්‍රතිපත්තිමය සාකච්ඡාව පූර්ණ කාරක සභාවට කලින් කළ යුතු බව.*

## පූර්ණ කාරක සභාව :

80. (1) අවශ්‍ය ඕනෑ ම වෙලාවක සභාවට පූර්ණ කාරක සභාවක් බවට පත් විය හැකි අතර, යළිත් සභාවේ කටයුතු ඇරඹීමේදී පූර්ණ කාරක සභාවේ කෙරුණු සාකච්ඡාවල ප්‍රගතිය සභාපතිවරයා විසින් සභාවට වාර්තා කළ යුතු ය. *අවශ්‍ය ඕනෑම වෙලාවක පූර්ණ කාරක සභාවක් බවට පත් විය හැක.*

(2) පූර්ණ කාරක සභාවේ වැඩ කටයුතු කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය.

(3) සභාපතිවරයා හෝ ඔහු නොමැති විට නියෝජ්‍ය සභාපතිවරයා හෝ ඔහුත් නොමැති විට මූලාසනය දැරීම, රීති අංක 8 යටතේ ක්‍රියා කළ යුතු ය.

(4) පූර්ණ කාරක සභාවක් විසින් සලකා බැලිය යුත්තේ, එම කාරක සභාව වෙත යොමු කර තිබෙන කරුණු පමණකි. *පූර්ණ කාරක සභාවකට අදාළ වන නියමයන්.*

81. (1) සභා රැස්වීමකට අදාළ කාර්යපටිපාටි රීති, පූර්ණ කාරක සභා රැස්වීමට ද අදාළ වන්නේ ය. එසේ වුවද, පූර්ණ කාරක සභා රැස්වීමකට අදාළ ව,

(අ) යෝජනාවක් සඳහා කල් දීමක් අවශ්‍ය නොවන්නේ ය.

(ආ) යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(ඇ) එක ම ප්‍රශ්නය ගැන එක් වරකට වඩා කථා කිරීමට මන්ත්‍රීවරයකුට හැකි ය.

(2) (අ) පූර්ණ කාරක සභාවකදී ඡන්දය පාවිච්චි කිරීම කළ යුතු වන්නේ ද 60 වන රීතිය යටතේ සභාවේ ඡන්දය පාවිච්චි කිරීමේ පිළිවෙළ අනුව ය. ප්‍රථම අවස්ථාවේදී සභාපතිවරයා ඡන්දය දිය යුතු නොවන නමුත් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී තිබෙන අවස්ථාවක ඔහු තීරක ඡන්දය දිය යුතු ය.

*පූර්ණ කාරක සභාවකදී ඡන්දය පාවිච්චි කිරීමද 60 වන රීතියේ ඇතුළත් වේ.*

(ආ) පූර්ණ කාරක සභාවකදී ඇති කර ගන්නා ලද එකඟතාවයක් සම්බන්ධයෙන් පූර්ණ කාරක සභාව, යළිත් පළාත් සභාව බවට පත් වූ පසු එකඟතාවයකට පැමිණීම අවශ්‍ය නොවන්නේ ය.

**උපදේශක කාරක සභා :**

82. (1) පළාත් සභාවේ විධායක කටයුතු කාර්යක්ෂම ව ගෙන යාම සඳහා සෑම අමාත්‍යවරයකු සඳහා ම උපදේශක කාරක සභාවක් බැගින් පත් වී තිබිය යුතුය.

*සෑම අමාත්‍යවරයෙකුටම උපදේශක කාරක සභාවක් තිබිය යුතු බව.*

(2) එවැනි සෑම උපදේශක කාරක සභාවක් ම පහත සඳහන් පරිදි සකස් විය යුතු ය.

*උපදේශක කාරක සභාවල සැකැස්ම.*

(අ) අදාළ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා එහි සභාපතිවරයා විය යුතු ය.

(ආ) i. අමාත්‍යවරුන් නොවන, සභාවේ වෙනත් මන්ත්‍රීවරුන් 20 දෙනෙකු පළාත් සභාවේ සභාපතිවරයා විසින් උපදේශක කාරක සභාවක් සඳහා නම් කරනු ලැබිය යුතු ය. එම නම් කිරීම හැකිතාක් දුරට සභාවේ පිළිගත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල සාමාජිකත්වය පිළිබිඹු කෙරෙන ආකාරයට විය යුතු අතර, පළාතට අයත් දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි විය යුතු ය.

*උපදේශක කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරු සංඛ්‍යාව 20*

ii. උපදේශක කාරක සභාවේ සාමාජිකත්වය වසර 2 ½ කට සීමා වන්නේ ය. *සාමාජිකත්වය වසර 02 ½ කි.*

(3) උපදේශක කාරක සභාවක කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතු ය. *උපදේශක කාරක සභාවක කාර්යයන්.*

(අ) උපදේශක කාරක සභාවල සභාපතිවරුන් වෙත පළාත් සභාව විසින් යොමු කරන ලද පළාත් සභාවේ පැවැත්මට අදාළ ඕනෑ ම කරුණක් පිළිබඳව සති හයක් ඇතුළත පළාත් සභාවට වාර්තා කළ යුතු ය. වාර්තාව සභාව වෙත ලැබීම හෝ සති හයක කාලයක් ඉකුත් වීම යන දෙකෙන් පළමුව එළඹෙන සිදුවීම තෙක්, එසේ යොමු කරන ලද කරුණ පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය. කෙසේ වෙතත්, උපදේශක කාරක සභාවේ සභාපතිවරයාගේ යෝජනාවක් අනුව, වාර්තාව ඉදිරිපත් කිරීමට මුළුමනින් ම තුන් මසක කාලයකට නොවැඩි කාලයක් ලබා දීමට සභාවට හැකි විය යුතු ය. *පළාත් සභාවේ පැවැත්මට අදාළ කරුණක් සති 06 ක් ඇතුළත වාර්තා කළ යුතු බව.*

(ආ) උපදේශක කාරක සභාවල සභාපතිවරු වන ප්‍රධාන අමාත්‍යවරයාට හෝ වෙනත් අමාත්‍යවරයකුට හෝ යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන් උපදෙස් දීම.

(4) උපදේශක කාරක සභාවක සභාපතිවරයා වෙත යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන්, *උපදේශක කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයෙකු සතු කාර්ය භාරය.*

(අ) අදාළ කාරක සභාවේ සභාපතිවරයාගෙන් කිසියම් තොරතුරක් ලබා ගැනීම,

(ආ) අවධානයට යොමු වන ඕනෑ ම කරුණක් අදාළ කාරක සභාවේ සභාපතිවරයාගේ දැන ගැනීමට සැලැස්වීම,

(ඇ) ගත යුතු ක්‍රියාමාර්ගයක් යෝජනා කිරීම,

(ඈ) සභාව වෙත ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීමට යෝජනා කිරීම,

උපදේශක කාරක සභා රැස්වීමකදී එහි ඕනෑ ම සාමාජිකයකු විසින් කරනු ලැබිය හැකි ය.

83. උපදේශක කාරක සභාවක සභාපතිවරයා විසින් කැඳවීමක් කළ විටකදී හෝ සාමාජිකයන් 04 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ලිඛිත ඉල්ලීමක් මගින් රැස්වීමක් පැවැත්වීමට ඉල්ලා සිටිනු ලබන විටකදී හෝ එම කැඳවීම *උපදේශක කාරක සභාව කැඳවීම.*

පිළිබඳ දැන්වීම ලැබීමෙන් දින 07 ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදේශක කාරක සභාව කැඳ විය යුතු ය. කෙසේ වෙතත් සෑම උපදේශක කාරක සභාවක් ම අඩු වශයෙන් දින 30 කට වරක් රැස්විය යුතු ම ය.

84. (1) උපදේශක කාරක සභා රැස්වීමේදී එහි සභාපතිවරයා මූලාසනය උසුලනු ලැබිය යුතු ය. එහි සභාපතිවරයා නොමැති අවස්ථාවකදී කාරක සභාවක සාමාජිකයන් විසින් ඔවුන්ගෙන් අයෙකු මූලාසනය දැරීමට තෝරා ගත යුතු ය. *උපදේශක කාරක සභාවක මූලසුන.*

(2) උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් 07 දෙනෙකු විය යුතු අතර, ගණපූරණය තීරණය කිරීමේදී කාරක සභාවේ සභාපතිවරයා හෝ මූලාසනය ගනු ලබන මන්ත්‍රීවරයා ද ඇතුළත් විය යුතු ය. *උපදේශක කාරක සභාවක ගණපූරණය.*

(3) (අ) කාරක සභාවේ පූර්ව නිවාඩු අනුමැතියකින් තොර ව, උපදේශක කාරක සභාවක සාමාජිකයකු එහි රැස්වීම් වාර තුනකට නොකඩවා නොපැමිණීමෙන් එහි සාමාජිකත්වය අත්හැර ගියා සේ සැලකිය යුතු ය. *උපදේශක කාරක සභාවක සාමාජිකත්වය අහෝසි වීම.*

(ආ) එසේ වුවද, සාමාජිකයකු ප්‍රථමයෙන් පළාත් සභාවෙන් අවසරය ලබා ගෙන සභා රැස්වීම්වලට නොපැමිණෙන කාල සීමාවල පවත්වන කාරක සභා රැස්වීම්වලට හෝ අදාළ උපදේශක කාරක සභාවෙන් අවසර ලබාගෙන ඇති විටක ඉහත විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) ඉහත 84(3)(අ) රීතිය ප්‍රකාර ව සාමාජිකත්වය අහෝසි වන මන්ත්‍රීවරයෙකු නැවත වසරක කාලයක් යනතුරු කිනම් හෝ උපදේශක කාරක සභාවකට පත් නොකළ යුතු ය. *වසරක් යනතුරු යළිත් උපදේශක කාරක සභාවකට පත් නොකළ යුතු බව.*

(5) 84(3)(අ) අනුරීතිය අනුව යම් මන්ත්‍රීවරයකුගේ උපදේශක කාරක සභා සාමාජිකත්වය අහිමි වූ වහා ම එකී මන්ත්‍රීවරුන් සම්බන්ධව ලේඛනයක් උපදේශක කාරක සභාවේ ලේකම් විසින් සභාවට වාර්තා කළ යුතු ය. *සාමාජිකත්වය අහිමි වූ විට.*

(6) උපදේශක කාරක සභාවක සාමාජිකත්වයේ කිසියම් පුරප්පාඩුවක්, පළාත් සභාවේ සභාපතිවරයා විසින් කරනු ලබන නම් කිරීමකින් පිරවිය යුතු ය. *පුරප්පාඩු පිරවීම.*

(7) සාමාජිකත්වයේ පුරප්පාඩුවක් නොසලකා හැර, රැස්වීමට හෝ සිය කාර්යයන් ඉටු කිරීමට හෝ උපදේශක

කාරක සභාවකට අයිතිය ඇත්තේ ය.

(8) ඡන්ද සමාන වූ විටෙක තීරක ඡන්දය උපදේශක කාරක සභාවක සභාපතිවරයාට හෝ මුලසුන ගන්නා මන්ත්‍රීවරයාට හිමි වන්නේ ය.

(09) (අ) සෑම උපදේශක කාරක සභාවක් ම මසක් ඇතුළත පැවති කාරක සභා රැස්වීම්වල දී ගනු ලැබූ තීරණයන් පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් එහි සභාපතිවරයා විසින් හෝ සාමාජික මන්ත්‍රීවරයකු විසින් මාසික රැස්වීමෙන් අනතුරුව පැවැත්වෙන පළමුවන පළාත් සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යුතු ය.

*උපදේශක කාරක සභා වාර්තාව සභාවට ඉදිරිපත් කළ යුතු බව.*

(ආ) උපදේශක කාරක සභා වාර්තාවෙන් පැන නගින කරුණක් පළාත් සභාවේ සභාපතිවරයා හරහා උපදේශක කාරක සභාවට යොමු කළ හැකිය.

(10) පළාත් සභාවේ සභාපතිවරයා විසින් වරින් වර මෙකී කාරක සභාවලින් නිර්දේශ ඉල්ලා සිටිය හැකි අතර, සුදුසු පරිදි අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට යොමු කළ හැකි ය.

*නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීම.*

**සභාවේ කාරක සභා :**

85. (1) පළාත් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යක්ෂමතාවය සහ සඵලදායකත්වය ඉහළ දැමීමටත් පළාත් සභාවේ ව්‍යාපෘති සහ වැඩ සටහන් මෙහෙයවීමටත්, අනිසි පරිපාලනය හඳුනා ගැනීම සහ එය වැළැක්වීමටත් නව ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා තොරතුරු එක්රැස් කිරීමටත්, මහජන අවශ්‍යතා විධායකය තුළින් ඉටු වන්නේදැයි සොයා බැලීමටත්, අගතියට පත් පළාතේ ජනතාවගේ ඉල්ලීම් පිළිබඳ සොයා බැලීමටත්, පළාතේ ආදායම් ප්‍රවර්ධනය කිරීමටත්, පරිපාලන ක්‍රියාවන් මානව හිමිකම්වලට අනුකූලද යන්න නිරීක්ෂණය කිරීමටත් සභාපතිවරයාට කාරක සභා පත් කිරීමට බලය ඇත්තේ ය.

*සභාපතිවරයා විසින් කාරක සභා පත් කිරීමට හේතු.*

(2) (1) ඒ අනුව සෑම සැසිවාරයක් ආරම්භයේ ම සභාපතිවරයා විසින් පහත සඳහන් කාරක සභාවන් පත් කළ යුතු වුවද, අඛණ්ඩව වසර 2 ½ කට වඩා වැඩි කාලයකට සාමාජිකත්වය දැරිය නොහැක්කේ ය.

*නිල බලයෙන් සහභාගී වීම.*

(අ) කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාව

(ආ) සභා කටයුතු පිළිබඳ කාරක සභාව

(ඇ) ගෘහ කාරක සභාව

(ඇ) ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව

(ඉ) පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාව

(ඊ) මහජන පෙත්සම් කාරක සභාව

(උ) අවදි කාරක සභාව

(ඌ) පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව

(එ) පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලු ම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව

(2) පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව හැර අනිකුත් සියලුම කාරක සභාවලට පළාත් සභාවේ සභාපතිවරයා නිල බලයෙන් සභාපති ලෙස පත් වන්නේ ය.

*විමසුම් කාරක සභාවන්.*

(3) ඉහත සඳහන් වූ කාරක සභා අතුරින් විමර්ශන කාරක සභා ලෙස මහජන පෙත්සම් කාරක සභාව, අවදි කාරක සභාව, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව, පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලු ම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව සැලකිය යුතු ය.

*දෛනික කටයුතුවලට අදාළ කාරක සභා*

(4) පළාත් සභාවේ දෛනික කටයුතුවලට අදාළ කාරක සභා පත් කිරීමේ බලතල රීති අංක 9(9) යටතේ සඳහන් වන අතර, සභාපතිවරයාට එකී සභාවන්හි කටයුතු කාර්යක්ෂම ව හා සඵලදායක ව සිදු කිරීම සඳහා මෙහෙය වීමට බලතල ඇත්තේ ය. එකී දෛනික කටයුතුවල අදාළ කාරක සභාව ලෙස ප්‍රඥප්ති හා නීති කාරක සභාව, කාර්ය පටිපාටි රීති කාරක සභාව සහ ගෘහ කාරක සභාව සැලකිය යුතු ය.

**උපදේශක කාරක සභාවකට හැර සෙසු කාරක සභාවල දෛනික කටයුතුවලට බලපාන පොදු කරුණු :**

86\. (1) සෑම කාරක සභාවක ම සභාපතිවරයා ඇතුළු මුළු සාමාජික සංඛ්‍යාව 15 දෙනෙකු විය යුතු අතර, ගණපූරණය 05 දෙනෙකු විය යුතු ය. ගණපූරණය ගණන් ගැනීමේදී මුලසුන දරන මන්ත්‍රීවරයා ද ඊට ඇතුළත් විය යුතු ය.

*සාමාජික සංඛ්‍යාව 15 යි ගණපූරණය 05 යි.*

(2) (අ) සෑම පළාත් සභාවක් ආරම්භයේදී ම පළාත් සභාවේ සභාපතිවරයා විසින් ඒ ඒ කාරක සභාවට සාමාජිකයන් නම් කළ යුතු ය. නිල බලයෙන් ම යම් කාරක සභාවක සභාපති වශයෙන් පත් වන කෙනෙකු නොමැති කාරක සභාවක සභාපතිවරයාව පළාත් සභාවේ සභාපතිවරයා විසින් නම් කළ යුතු ය.

*නිල බලයෙන් නොමැති කාරක සභාවල සභාපති ධූරය*

(ආ) අමාත්‍යාංශ උපදේශක කාරක සභා, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව, පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව හැර අනෙකුත් කාරක සභාවලට සභාපතිවරුන් පත් කිරීමේ බලය සභාපතිවරයා සතු වන්නේ ය.

*කාරක සභාවල සභාපති ධූරය*

(3) කාරක සභාවක සභාපතිවරයා එහි සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු වුවත්, සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා නොමැති අවස්ථාවක පැමිණි සිටි සාමාජිකයන් විසින් එහි මුලසුන දැරීම සඳහා තමන් විසින් කෙනෙකු තෝරාගත යුතු ය.

*කාරක සභාවේ මූලාසනය.*

(4) කලින් ලබා ගත් අවසරයක් නොමැතිව යම් සාමාජිකයෙකු නොකඩවා කාරක සභාවේ රැස්වීම් 03 කට සහභාගී නොවූ කල්හි එලෙස තනතුරින් ඉවත් කෙරුණු සාමාජිකයා නොවන වෙනත් සාමාජිකයෙකු නම් කිරීමක් මගින් සභාපතිවරයා විසින් එම පුරප්පාඩුව පිරවිය යුතු ය.

*කාරක සභාවේ පුරප්පාඩු පිරවීම.*

(5) කාරක සභා සමාජිකත්වය අහෝසි වීම සම්බන්ධයෙන් 84(4) රීතිය බල පැවැත් වන්නේ ය.

(6) නිල බලයෙන් සාමාජිකත්වය දරන යම් ධූරධාරියෙකු කලින් ලබා ගත් අවසරයක් නොමැතිව නොකඩවා කාරක සභා රැස්වීම් වාර 03 කට සහභාගී නොවුවහොත් ඒ බව අදාළ කාරක සභාවේ සභාපතිවරයා විසින් පළාත් සභාවට දැන්විය යුතු ය.

(7) කාරක සභාවක පුරප්පාඩුවක් ගැන නොසලකා රැස්වීමක වැඩ කටයුතු කරගෙන යෑමට කාරක සභාවකට අයිතිය ඇත්තේ ය.

(8) එක් එක් කාරක සභාවේ ලේකම්, සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන පළාත් සභා ලේකම් කාර්ය

මණ්ඩලයේ සේවය කරන වෙනත් නිලධාරියෙකු හෝ විය යුතු ය.

(9) කාරක සභාවේ සභාපතිවරයාට හෝ මුලසුන දරන සාමාජිකයකුට මුල් ඡන්දයක් සහ සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණු විට පාවිච්චි කිරීම සඳහා තීරක ඡන්දයක් ඇත්තේ ය.

(10) තමන් වෙත පැවරී ඇති කටයුතුවලට අදාළ ව තම සාමාජිකයන්ගෙන් ම යුතු අනුකාරක සභාවන් පත් කිරීමට කාරක සභාවකට හැකි විය යුතු ය.

(11) කාරක සභා රැස්වීම්වල වාර්තා ලබා ගැනීමට සෑම මන්ත්‍රීවරයකුට ම හැකි විය යුතු ය.

**මහජන පෙත්සම් කාරක සභාව :**

87. (1) මහජන පෙත්සම් කාරක සභාවක් අනුකාරක සභාවන් දෙකකින් සමන්විත විය යුත්තේ ය. සාමාජිකත්වය 15 ක් වූ මහජන පෙත්සම් කාරක සභාවේ එක් අනුකාරක සභාවකට සාමාජිකයන් 07 දෙනෙකු බැගින් පත් කළ යුත්තේ ය.

*මහජන පෙත්සම් කාරක සභාව අනු කාරක සභා දෙකකින් සමන්විත වීම.*

(2) සභාව විසින් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් විමර්ශනය කර සුදුසු පියවරක් ගැනීම එම කාරක සභාවේ කාර්යය විය යුතු ය.

(3) කාරක සභාවකට අවශ්‍ය යැයි හැඟී ගිය විටක, තමන් වෙත ඉදිරිපත් කර ඇති පළාතට අයත් කිනම් දිස්ත්‍රික්කයක කවර හෝ පෙත්සමක් හෝ වාර්තාවක් කාරක සභාව විසින් ම හෝ අනුකාරක සභාවක් යටතේ හෝ පරික්ෂා කළ හැකි ය.

(4) කාරක සභාව විසින් හෝ අනුකාරක සභාවක් විසින් තමන් වෙත ඉදිරිපත් වූ පෙත්සමක් හෝ වාර්තාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇති විටෙක, ඒ සඳහා වන සාක්ෂි විභාග කිරීම සඳහා වන සාක්ෂිකරුවන් වෙත කාරක සභාව හෝ අනුකාරක සභාව ඉදිරිපිට පෙනී සිටීම සඳහා වන දැන්වීම්, කාරක සභාවේ ලේකම් විසින් පරීක්ෂණ දිනයට අවම වශයෙන් දින තුනකට පූර්වයෙන් පාර්ශවයක් වෙත ලිඛිත ව භාර දීමට සැලසිය යුතු ය.

(5) කාරක සභාවක් ඉදිරියේ පෙත්සම්කරු හෝ සාක්ෂි දීම සඳහා වන කවර පාර්ශවයක් විසින් හෝ ලබා දෙන සාක්ෂිය දිවුරුම් පිට ලබා දෙන සාක්ෂියක් විය යුතු ය.

(6) සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන සභා ලේකම් කාර්යාලයේ වෙනත් යම් නිලධරයෙකු හෝ කාරක සභාවේ ලේකම් විය යුතුය.

(7) යම් පෙත්සමකින්, රජයේ නිලධාරියෙකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු විසින් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇති බව හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇති බව අනාවරණය වන බව කාරක සභාවේ අදහස වන අවස්ථාවක, පෙත්සම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(8) සභාපතිවරයාගේ අනුමැතියට යටත් ව, පහසුවෙන් ලබා ගැනීමට නොමැති තොරතුරු සපයා ගැනීම සඳහා හෝ කාරක සභාවට නියමිත කරුණුවලට අදාළ සංකීර්ණ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා හෝ ශිල්පීය දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහාය ලබා ගැනීමටත්, වෘත්තීමය පුද්ගලයින් හෝ නිලධාරීන් කැඳවීමටත් බලය කාරක සභාවට ඇත්තේ ය.

(9) (අ) මහජන පෙත්සම් කාරක සභාවට හෝ කාරක සභාව විසින් බලය දෙනු ලබන එකී අනුකාරක සභාවකට හෝ පළාත් රාජ්‍ය සේවයේ ඕනෑ ම පුද්ගලයකු කැඳවා ප්‍රශ්න කිරීමට හෝ කිසියම් පත්‍රිකා, පොත්පත්, වාර්තා, පළාත් සභාවේ ඕනෑ ම ආයතනයක ලිපි ලේඛන ගෙන්වා පරික්ෂා කිරීමටත්, ඕනෑම ආයතනයකට හෝ ස්ථානයකට ඇතුළු වීමටත්, ස්ථානීය පරීක්ෂණයක් කිරීමටත් බලය තිබිය යුතු ය.

(ආ) එවැනි අවස්ථාවකට සහභාගී වන නිලධාරීන්ගේ හෝ පුද්ගලයන්ගේ ආරක්ෂාව සලසා ගැනීම සුදුසු විධිවිධාන අනුව කළ යුතු ය.

(10) කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් පිළිබඳ මත, අදහස් මෙන් ම ඒ පෙත්සම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සුදුසු යැයි තමන් කල්පනා කරන අනිකුත් අදහස් ඇතුළත් කාරක සභාවේ වාර්තාව මසකට වරක් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

*කාරක සභා වාර්තා මසකට වරක් සභාවට වාර්තා කිරීම.*

(11) පෙත්සම් කාරක සභාව විසින් කැඳවන මහජන නියෝජිතයන් හා නිලධාරීන් අනිවාර්යයෙන් ම පෙත්සම් කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතු ය. එසේ පෙනී

නොසිටින්නේ නම් හෝ දෙනු ලබන නිර්දේශය දැනුම් දුන් දිනයේ සිට දින 30 ක් ඇතුළත පිළිගත හැකි හේතු නොදක්වා ක්‍රියාත්මක නොකරන්නේ නම්, අදාළ විෂයය භාර අමාත්‍යවරයා විසින් අදාළ පාර්ශවයන්ට විරුද්ධව විනයානුකූල ව කටයුතු කළ යුතු වන්නේ ය.

(12) මහජන පෙත්සම් කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එහි එක් අනුකාරක සභාවක ගණපූරණය 03 දෙනෙකු විය යුතු ය.

## ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව :

88. (1) ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ,

*ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වගකීම.*

(අ) එම කාරක සභාවට යොමු කෙරෙන ප්‍රඥප්ති කෙටුම්පතක, නීතියක, රෙගුලාසියක නීත්‍යානුකූල භාවය සලකා බැලීමත්, අඩුපාඩු හා සංශෝධනය විය යුතු තැන් පෙන්වා දීමත්,

(ආ) පළාත් සභාවට යම් අධිකරණමය කටයුත්තකට මැදිහත් වන්නට සිදු වන සැම අවස්ථාවකදීම ඒ සම්බන්ධයෙන් උපදෙස් දීමත් වේ.

(2) (අ) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් සංදේශයක් මගින් රීති 62 යටතේ යෝජිත යම් නීතියක් පිළිබඳව කාරක සභාව වෙත යොමු කළ විට, එවැනි නීතියක් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයට හෝ පාර්ලිමේන්තුවට හෝ ඉදිරිපත් කළ යුතු නිගමනයන් පිළිබඳව, කාරක සභාව එම දැන්වීම ලැබ දින තුනක් ඇතුළත රැස්විය යුතු ය.

*ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සහ පාර්ලිමේන්තුවෙන් එන සංදේශ සලකා බැලීමට දින තුනක් ඇතුළත රැස් විය යුතු බව.*

(ආ) එකී රැස්වීමෙන් පසු දින ම එකී නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයෙහි I වැනි ලැයිස්තුවට අදාළ වේ නම්, වාර්තාව යෝජිත නීතියට අදාළ පළාත් විෂය භාර අමාත්‍යවරයාට ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වෙනි උපලේඛනයෙහි III වන ලැයිස්තුවට අදාළ වේ නම්, වාර්තාව ඊළඟ පළාත් සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකි වන සේ ලේකම්වරයාට භාර දිය යුතු ය.

*I වන ලැයිස්තුවට අදාළ නම් පළාත් විෂය භාර අමාත්‍යවරයාටද, III වන ලැයිස්තුවට අදාළ නම් සභා ලේකම්වරයාටද භාර දීම.*

(3) ප්‍රඥප්ති කෙටුම්පත හෝ වෙනත් කරුණක් හෝ කාරක සභාවට ඉදිරිපත් කරනු ලැබූ විට, එම ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණට අනුකූල නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(4) ප්‍රඥප්ති කෙටුම්පතේ යම් නීතියක් හෝ වෙනත් කරුණක් කාරක සභාව වෙත ඉදිරිපත් කර සාකච්ඡා කරන අවස්ථාවේදී, අදාළ විෂය භාර අමාත්‍යවරයාට කාරක සභාවේ මතයන්ට බලපෑමක් නොවන පරිදි පැහැදිලි කිරීමක් සඳහා රැස්වීමට සහභාගී වීමට හැකි ය.

89. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවේ සඳහන් විෂයයකට අදාළ ව යම් ප්‍රඥප්තියක් පිළිබඳ පළාත් සභාව විසින් පාර්ලිමේන්තුවෙන් කරන විමසීම ද, එවැනි පනතක් පිළිබඳව පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවෙන් කරන විමසීම්ද ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය. එම යොමු කිරීම පිළිබඳව කාරක සභාවේ නිර්දේශ එහි සභාපතිවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

*III වන ලැයිස්තුවේ සඳහන් විෂයයන් සම්බන්ධ වන කාරණා සම්බන්ධව කාරක සභාව ක්‍රියා කළ යුතු ආකාරය.*

90. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවට අදාළ ප්‍රඥප්තියක් පිළිබඳව ප්‍රඥප්ති සහ නීති පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ඉක්මණින් අවශ්‍ය වූ විට, එම ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට අදහස් කරන අමාත්‍යවරයා ඒ බවට විශේෂ සටහනක් සහිත ව, එය ලේකම්වරයා වෙත යොමු කරන්නේ නම්, ලේකම්වරයා ඒ බව සභාපතිවරයාට දැනුම් දීමෙන් පසුව, හැකි ඉක්මණින් කාරක සභාව රැස් කිරීමටත්, ඉන් අනතුරුව සභාවට ඉදිරිපත් කිරීමට සහ අනිකුත් අවශ්‍ය කටයුතු කිරීමටත් ක්‍රියා කළ යුතු ය.

## කාර්ය පටිපාටි රීති කාරක සභාව :

91. පවතින රීති වරින් වර සමාලෝචනය කොට සුදුසු යැයි හැඟෙන නිර්දේශ යෝජනා කිරීමත්, සභාව විසින් හෝ අනිකුත් කාරක සභාවලින් ඉදිරිපත් කරනු ලබන රීති සම්බන්ධව සියලු කරුණු ගැන සලකා බලා සභාවට වාර්තා කිරීමත් කාර්ය පටිපාටි රීති කාරක සභාවේ කාර්යය විය යුතු ය.

*කාර්ය පටිපාටි රීති කාරක සභාව.*

## සභා කටයුතු පිළිබඳ කාරක සභාව :

92. (1) සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ :

*සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ වගකීම.*

(අ) න්‍යාය පත්‍රය සකස් කිරීමට සභාපතිවරයාට සහාය වීම.

(ආ) යම් පළාත් සභා රැස්වීමකදී, සාකච්ඡාවට නියමිත විෂයයන්ට අදාළ ව ආණ්ඩු පක්ෂයට, විපක්ෂයට හා මැතිවරණයට ඉදිරිපත් වූ විපක්ෂයේ සෙසු පක්ෂවලට වෙන් විය යුතු කාලය තීරණය කිරීම. *සභා විවාද කාලය*

(ඇ) සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සභා රීතිවලට අනුකූලදැයි සලකා බලා, සභා රීතිවලට අනුකූල නම්, හදිසියේ සලකා බැලිය යුතු යෝජනාවලට ප්‍රමුඛත්වය ලබා දී න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ලේකම්වරයාට උපදෙස් දීම සහ, *පෞද්ගලික මන්ත්‍රී යෝජනා*

(ඈ) මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීම් පිළිබඳව කාරක සභාව වෙත කෙරෙන යොමු කිරීම් ගැන පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම වේ.

(ඉ) අවශ්‍ය වූ විටක අදාළ අවස්ථාවලදී එකී වරප්‍රසාද කඩ කළ අයගෙන් කාරක සභාවට කැඳවා නිදහසට කරුණු විමසිය හැකි ය. ඒ සම්බන්ධයෙන් කරනු ලබන නිර්දේශයන් සභාවට ඉදිරිපත් කළ යුතු ය. *නිර්දේශයන් සභාවට ඉදිරිපත් කළ යුතු බව.*

(ඊ) වරප්‍රසාද ප්‍රශ්නයක් පැන නැගුණු විට එකී ප්‍රශ්නය කාරක සභාවට යොමු කිරීමේ අභිමතය සභාපතිවරයා සතු ය. එවැනි අවස්ථාවකදී සභා කටයුතු කාරක සභාව වරප්‍රසාද කමිටුවක් බවට පරිවර්තනය වන අතර, යොමු වූ ප්‍රශ්නයේ බරපතළ භාවය මත එය හදිසි ප්‍රශ්නයක් ලෙස සලකා අදාළ කමිටුව රැස් කිරීමේ බලය සභාපතිවරයා සතු වන්නේ ය.

(උ) 72 හා 73 රීති සම්බන්ධයෙන් පරිශිෂ්ටයේ (1) "අ" හා "ආ" යටතේ කරන ලද යොමු කිරීම් පිළිබඳව විමසා තීරණයක් ලබා දීම.

(2) සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ අදහස් විමසා බලා සභා රීතිවලට එකඟ නොවන යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයාට හැකි විය යුතු ය.

**ගෘහ කාරක සභාව :**

93. (1) ගෘහ කාරක සභාවේ වගකීම විය යුත්තේ, මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, අයිතිවාසිකම්, අවශ්‍යතා සලකා බලා කටයුතු කිරීම ය. *ගෘහ කාරක සභාව.*

(2) කාරක සභාව විසින් අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡා කර මන්ත්‍රීවරුන්ගේ අයිතීන් හා වරප්‍රසාද පිළිබඳව සහන සලසා දීමට කටයුතු කළ යුතු ය.

(3) ගෘහ කාරක සභාව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස් විය යුතු ය.

**පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාව :**

94. (1) පළාතේ වියදම් දැරීම සඳහා සභාව විසින් දෙනු ලැබ ඇති මුදල් විසර්ජනය කොට ඇති ආකාරය දක්වන ගිණුම් ද සභාවට ඉදිරිපත් කොට ඇති වෙනත් ගිණුම් ද ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව සමග පරික්ෂා කර බැලීම පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කාර්යය විය යුතු ය.

(2) පළාත් සභා අරමුදලින් ප්‍රතිපාදන ලබන පළාතේ යම් අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් ආයතනයක හෝ පරික්ෂා කරන ලද ගිණුම් මූල්‍ය තත්ත්වයන්, කාර්යය සාධනය, මූල්‍ය කටයුතු පිළිබඳ කාර්ය පටිපාටි හා සාමාන්‍ය කළමනාකාරීත්වය ගැනද, ඒ සම්බන්ධයෙන් පැන නගින කරුණුත් පිළිබඳව කාරක සභාව විසින් සභාවට වාර්තා කළ යුතු ය. *සභාවට වාර්තා කිරීම.*

(3) කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් ආයතනයක සියලුම ගිණුම්, මුදල් තත්ත්වය හා කළමනාකාරීත්වය පිළිබඳව පරික්ෂා කර පළාත් සභාවට වාර්තා කිරීම සඳහා කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය විටෙක කාරක සභාවේ ම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීමට කාරක සභාවට හැකි විය යුතු ය. *අනු කාරක සභා පත් කළ හැකි බව.*

(4) කාරක සභාවට හෝ කාරක සභාව විසින් බලය දෙනු ලබන එහි අනුකාරක සභාවකට හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ ඕනෑ ම පුද්ගලයකු කැඳවා ප්‍රශ්න කිරීමට හෝ කිසියම් පත්‍රිකා, පොත්පත් වාර්තා හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක ලිපි ලේඛන ආදිය ගෙන්වා පරික්ෂා කිරීමට හා එවැනි ඕනෑ ම අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් ආයතනයක ගබඩා දේපළ ආදියට ඇතුළු වීමට හෝ බලය තිබිය යුතු ය.

**පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම :**

95. (1) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවට යොමු කිරීම සඳහා *ආණ්ඩුකාරවරයා*

එවන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව සභාපතිවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබුවායින් පසුව, එය පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම සිදු විය යුතු ය. *එවන විගණකාධිපති වාර්තාව පළාත් සභාවට හරහා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට.*

(2) පළාත් සභාව යටතේ ඇති යම් අධිකාරියක යම් වර්ෂයක ගිණුම්ද සමග එම අධිකාරිය විසින් අදාළ අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව සභාපතිතුමාට පිටපතක් සහිත ව ඉදිරිපත් කළ යුතු ය. සභාපතිවරයා විසින් එකී ගිණුමේ සහ වාර්ෂික වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයෙකු වෙත ම ලබා දිය යුතුය. අදාළ අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව එය පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම සිදු විය යුතු ය. *අධිකාරියක වාර්ෂික වාර්තා අදාළ අමාත්‍යවරයා විසින් සභාවටත් පසුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව*

### අවදි කාරක සභාව :

96\. (1) අවදි කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ, *අවදි කාරක සභාවේ වගකීම.*

(අ) පළාත් සභාවේ ප්‍රතිපාදන යොදවා කරන්නා වූ ව්‍යාපෘතිවල ඵලදායීතාව සහ කාර්යක්ෂමතා ව වැඩි දියුණු කිරීම හා නාස්තිය වළක්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට නිර්දේශයන් ඉදිරිපත් කිරීම සහ,

(ආ) එකී ව්‍යාපෘති පිළිබඳව සභාපතිවරයාට මන්ත්‍රීවරුන්ගෙන් හා මහජනයාගෙන් ලැබෙන පැමිණිලි පරික්ෂා කර බලා, අවශ්‍ය යැයි තීරණය කරනු ලබන නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒ ගැන අදාළ අමාත්‍යවරයා දැනුවත් කිරීම වේ.

(2) අවදි කාරක සභාවට ඉහත 94(1) වගන්තියේ සඳහන් ව්‍යාපෘති සම්බන්ධව පළාත් සභාව යටතේ සේවය කරන ඕනෑ ම පුද්ගලයකු හෝ පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන ඕනෑ ම නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු හෝ කැඳවා ප්‍රශ්න කිරීමටත්, පත්‍රිකා පොත්පත් වාර්තා, ලිපි ලේඛන ආදිය ගෙන්වා පරික්ෂා කිරීමටත්, වැඩ බිම් හා දේපළ ආදිය පරික්ෂා කිරීමටත් බලය තිබිය යුතු ය. මේ කාර්යයන් කිරීම සඳහා පහසුකම් සහා ලේකම් කාර්යාලයෙන් සැපයිය යුතු ය. *අවදි කාරක සභාවේ බලතල.*

(3) අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවකදී ම අවදි කාරක සභාව රැස් විය යුතු අතර, අවදි කාරක සභාවට ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම්, චෝදනා හා යෝජනා සලකා බලා නිර්දේශයන් ද ලබා දීම කාරක සභාවේ වගකීම වන්නේ ය. *අවදි කාරක සභාව රැස්වීම සහ පෙත්සම් යෝජනා සලකා බැලීම.*

(4) (අ) අවදි කාරක සභාව සිය කාර්යයන් පිළිබඳව ඊළඟට පැවැත්වෙන ආසන්නත ම පළාත් සභාවට වාර්තා කළ යුතු අතර එම කාරක සභාව විසින් අමාත්‍යවරයෙකුට ඉදිරිපත් කරන ලද නිර්දේශ හෝ උපදෙස් හෝ එම වාර්තාවට ඇතුළත් විය යුතු ය. *සභාවට වාර්තා කිරීම.*

(ආ) එවැනි වාර්තාවක් පළාත් සභාවේදී සාකච්ඡාවට භාජනය කරන ලෙසට ඉල්ලා සිටීමට මන්ත්‍රීවරයකුට අයිතියක් තිබිය යුතු ය. එවැනි අවස්ථාවලදී ඒ සඳහා දිනයක් නියම කිරීම පළාත් සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය. *අවදි කාරක සභාවේ වාර්තාවට විවාදයක් ඉල්ලීම.*

**පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව :**

97. (1) පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ කාර්ය භාරය විය යුත්තේ,

(අ) පළාත් සභාවට රුස් කළ හැකි ආදායම් මාර්ග හඳුනා ගැනීම,

(ආ) එකී ආදායම් මාර්ග ඔස්සේ ආදායම් රුස් කිරීම සඳහා සම්පාදනය කළ යුතු ප්‍රඥප්ති සහ රීති සෑදීම සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දීම,

(ඇ) ආදායම් රුස් කිරීමේ ප්‍රගතිය විමසා බැලීම සහ ඒවා රුස් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම ය.

(2) පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවට ඉහත වගන්තිය පරිදි කටයුතු කිරීමේදී පළාත් සභාව යටතේ සේවය කරන ඕනෑ ම නිලධාරියෙකු හෝ සේවකයෙකු කැඳවා ප්‍රශ්න කිරීමටත්, පොත්පත්, වාර්තා, ලිපි ලේඛන, ගෙන්වා පරීක්ෂා කිරීමටත්, කාර්යාල වෙත ගොස් ඒවා පරීක්ෂා කිරීමටත් බලය තිබිය යුතු ය. *කාරක සභාව කැඳවීම සහ ලිපි ලේඛන ගෙන්වීම සහ ගොස් පරීක්ෂා කිරීම.*

(3) අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවකදී ම ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව රුස් විය යුතු අතර, මෙම කාරක සභාවට ගරු මන්ත්‍රීවරුන් යොමු කරනු ලබන කරුණු සහ යෝජනා සලකා බලා නිර්දේශයන් ලබා දීම කාරක සභාවේ වගකීම වන්නේ ය. *මන්ත්‍රීවරුන්ගේ යෝජනා සලකා බැලීම.*

(4) ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ වාර්තාව කාරක සභාව පවත්වා මාසයක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, එවැනි වාර්තාවක් පළාත් සභාවේදී *සභාවට වාර්තා කිරීම.*

සාකච්ඡාවට භාජනය කරන ලෙස ඉල්ලා සිටීමට මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබිය යුතු ය.

**පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව :**

98. පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලු ම අධිකාරී ආයතන විමසුම් කාරක සභාවේ කාර්යභාරය විය යුත්තේ;

(1) මෙම අධිකාරී, ප්‍රඥප්තියේ සඳහන් අරමුණු හා පරමාර්ථය අනුව කටයුතු කිරීම පිළිබඳව පරීක්ෂා කර බලා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත්,

(2) එම අධිකාරී විසින් ක්‍රියාත්මක කරන්නා වූ ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා නාස්තිය වළක්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමත් සහ

(3) එම අධිකාරී විසින් කරන්නා වූ කාර්යයන් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ මහජනයාගෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කර බලා අවශ්‍ය යැයි සලකනු ලබන නිර්දේශයන් සභාව වෙත ඉදිරිපත් කිරීමත් වේ.

99 මෙම කාරක සභාව සඳහා ද 97(2), 97(3) හා 97(4) රීතීන්ද බල පවත්වන බව සැලකිය යුත්තේ ය.

**විශේෂ කාරක සභා :**

100 පළාත් සභාවේ සම්මත වන යෝජනාවක් අනුව යම් නිශ්චිත කාර්යයක් හෝ කාර්යයන් ගැන ක්‍රියා කිරීම සඳහා විශේෂ කාරක සභා පත් කිරීමට සභාපතිවරයාට හැකි විය යුතු ය. එම කාරක සභා සඳහා ද අනෙකුත් කාරක සභා සම්බන්ධ පොදු රීතීන් අදාළ විය යුතු ය.

**නිල බලයෙන් කාරක සභාවලට පත් වීම් :**

101. (1) නිල බලයෙන් කාරක සභාවලට පත් වීම් සිදු විය යුතු ආකාරය පහත සඳහන් වේ.

(අ) **කාර්ය පටිපාටි රීති කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක - සාමාජික

(ආ) **සභා කටයුතු පිළිබඳ කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික

(ඇ) **ගෘහ කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික

(ඈ) **ප්‍රඥප්ති හා නීති කාරක සභාව:**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

(ඉ) **පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව :**

මුදල් විෂය භාර අමාත්‍යවරයා - සභාපති

(ඊ) **මහජන පෙත්සම් කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

(උ) **අවදි කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

(ඌ) **පළාත් ආදායම් ප්‍රවර්ධන කිරීමේ කාරක සභාව :**

මුදල් විෂය භාර අමාත්‍යවරයා - සභාපති

(එ) **පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව :**

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික

(2) පළාත් සභාවේ සභාපතිවරයා යම් කාරක සභාවක සභාපතිවරයා වශයෙන් සිටියදී නියෝජ්‍ය සභාපතිවරයා එහි සාමාජිකයෙකු වශයෙන් සිටින්නේ නම්, සභාපතිවරයා නොපැමිණ සිටින අවස්ථාවක නියෝජ්‍ය සභාපතිවරයා මූලාසනය ගත යුතුය. ඒ දෙදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් කෙනෙකු මූලාසනය සඳහා පත් කර ගත යුතු ය. *කාරක සභාවක මූලාසනය.*

(3) පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ සභාපතිවරයා මුදල් විෂය භාර අමාත්‍යවරයා විය යුතු නමුත්, ඔහු වෙනුවෙන් කටයුතු කර ගෙන යැමට වෙනත් මන්ත්‍රීවරයෙකු නම් කිරීමට ඔහුට හැකි විය යුතු ය. එවැනි නම් කිරීමක් වේ නම්, එය පළාත් සභාවේ සභාපතිවරයාට දැනුම් දී සභාවේ නිවේදනය කිරීමෙන් පසුව වලංගු භාවයට පත් වන්නේ ය.

**අධිවැය :**

102. (1) මෙම රීතියෙහි (5) වන අනු රීතියේ දැක්වෙන අන්දමට කරුණු යෙදුණු විටදී හැර, මුදල් වර්ෂයක අවසානයෙන් පසු එම වර්ෂයේ ප්‍රයෝජනය සඳහා මෙහි මින් මතු අධිවැය යනුවෙන් හඳුන්වනු ලබන මුදලක් දීම පිණිස යෝජනාවක් නොපිළිගත යුතු ය.

(2) වැඩ සටහනක කිසියම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් දරන ලද කිසියම් අධිවැයක් ඇතොත්, එය පරික්ෂා කර එම අධිවැය දරා ඇත්තේ වැඩ සටහන සම්බන්ධයෙන් ද නැතහොත් එම වැඩ සටහනෙහි ව්‍යාපෘති එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් දැයි ස්වකීය වාර්තාවෙහි ප්‍රකාශ කිරීමට පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට කරනු ලබන නියමයක් විය යුත්තේ ය.

(3) අධිවැය සිදු වී ඇත්තේ ව්‍යාපෘති එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් නම්, එම අධිවැය දරා ඇත්තේ නිසි බලය සහිත ව හා අරපරිස්සම ගැන පරික්ෂාකාරීවද යනු සොයා බලා කාරක සභාව සෑහීමකට පත් වෙයි නම්, ඒ අනුව වාර්තා කළ යුතු ය. ඊට වැඩිමනක් අනුමැතියක් එම අධිවැය සඳහා අවශ්‍ය නොවිය යුතු ය. එතෙකුදු වුවත්, අධිවැය සිදු වී තිබෙන්නේ කිසියම් පෞද්ගලික පඩි නඩි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නම් වියදම දරන ලද්දේ එවකට පැවති වැටුප් පරිමාණයන්ට අනුව යැයිද පෞද්ගලික පක්ෂ හජනයෙන් මුළුමනින් ම තොරව යැයිද, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව සෑහීමකට පත් විය යුතු ය. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව එලෙස සෑහීමකට පත් වෙයි නම්, ඒ අනුව වාර්තා කළ යුතු ය.

(4) පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව එලෙස සෑහීමකට පත් නොවේ නම්, එම අධිවැය තමන් අනුමත නොකරන බව හෝ තමන්ට සුදුසු යැයි හැඟෙන කවර ප්‍රමාණයක් තමන් අනුමත නොකරන බව හෝ වාර්තා කළ යුතු ය.

(5) වැඩ සටහනක් සම්බන්ධයෙන් අධිවැයක් දරා ඇති බව හෝ සමහර වැය විෂයයන් තමන් අනුමත නොකරන බව හෝ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව වාර්තා කරන සැමවිට ම එම අධිවැය හෝ අනුමත නොකරන ලද විෂයයක් සඳහා මුදලක් දීම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා නියම කරන දිනයකදී සලකා බැලීම සඳහා පළාත් සභාව කාරක සභාවකට පරිවර්තනය විය යුතු යැයි යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා එම අමාත්‍යවරයා විසින් එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරවා ගැනීමට ක්‍රියා කළ යුතු ය. එම අධිවැය අයත් වර්ෂයට පසු වර්ෂයෙහි දෙසැම්බර් 31 වැනි දිනට පසු එවැනි යෝජනාවක් භාර නොගත යුතු ය. එතකුදු වුවත්, මෙම රීති මාලාව ක්‍රියාත්මක වීමට නියමිත

කෙරෙන දිනයට පෙර වූ දෙසැම්බර් 31 වැනි දිනයට පෙර සිදු වූ අධිවැය පළාත් සභාවෙන් අනුමත කරවා ගැනීමේදී මෙම ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත එවැනි අධිවැය සම්මත කිරීමට පළාත් සභාවට හැකි විය යුතු ය.

(6) අධිවැයක් ඇතිව හෝ නැතිව නිසි බලය නොමැතිව කරන ලද කිසියම් වියදමක් අනුමත නොකිරීමට පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඇති බලය මෙම රීතියෙහි ඇති කිසිවකින් අඩු නොවිය යුතු ය. මෙම රීතියෙහි (5) වන අනුරීතියේ විස්තර කෙරෙන ක්‍රියා පිළිවෙළ එවැනි අනුමත නොකිරීමක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ය.

## අත්තිකාරම් ගිණුම් සීමා ඉක්මවීම :

103 (1) කවර හෝ අත්තිකාරම් ගිණුම් කටයුත්තක් සම්බන්ධයෙන් යම් මුදල් වර්ෂයක නීතියෙන් බලය දී ඇති උපරිම සීමාවන් ඉක්මවා යන්නා වූ හෝ අවම සීමාවලට අනුකූල නොවන්නා වූ කිසිම යෝජනාවක් මෙම රීතියෙහි (3) වන අනුරීතියේ දක්වා ඇති අවස්ථාවක් ඇති වූ විටෙක හැර නොපිළිගත යුතු ය.

(2) අත්තිකාරම් ගිණුම් උපරිම හෝ අවම හෝ සීමාවන්ට අනුකූල නොවීම නීතියට එකඟව සිදු කර නොමැති කල්හි, එම සීමාවන් එසේ අනුකූල නොවීම සම්බන්ධයෙන් අවසර දිය යුතුද, නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් තීරණය කළ යුතු ය.

(3) අත්තිකාරම් ගිණුම් කටයුතු සීමාවන්ට අනුකූල නොවීම් කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතුද, නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව නිර්දේශ කොට ඇති සෑම විටක ම හෝ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අවසර නොලත් පාඩු කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතු ද නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව නිර්දේශ කර ඇති කවර විටෙකදී හෝ එම නිර්දේශ සලකා බැලීම සඳහා පළාත් සභාව කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු බවට යෝජනාවක් මුදල් විෂය භාර අමාත්‍යවරා විසින් තීරණය කරනු ලබන දිනයක සලකා බැලීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකි ය.

## පළාත් සභාවට අයත් මුදල් සම්බන්ධයෙන් බලය

## පැවරෙන යෝජනා හෝ ප්‍රඥප්ති :

104 . පළාත් සභා අරමුදලින් හෝ වෙන යම් අරමුදල්වලින් හෝ ගෙවිය යුතු මුදල වියදම් කිරීමට, ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීම නැතහොත් කිසියම් බද්දක් පැනවීමට, එවකට තිබෙන බද්දක් අවලංගු කිරීමට, බද්දක් වැඩි කිරීමට, බද්දක් අඩු කිරීමට බලය පැවරෙන යෝජනාවක් හෝ ප්‍රඥප්තියක් හෝ ප්‍රඥප්තියකට ඉදිරිපත් කෙරෙන සංශෝධනයක් හෝ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, පළාත් සභාව විසින් සලකා බැලීම නොකළ යුතු ය. එවැනි යෝජනාවක් හෝ ප්‍රඥප්තියක් හෝ ප්‍රඥප්තියකට ඉදිරිපත් කෙරෙන සංශෝධනයක් හෝ එසේ ඉදිරිපත් කිරීමට පෙර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව එම අමාත්‍යවරයා පළාත් සභාවට දැන්විය යුතු ය.

*පළාත් සභාවට අයත් මුදල් සම්බන්ධ බලය පැවරෙන යෝජනා හෝ ප්‍රඥප්ති.*

## කාර්යය සටහන් :

105 . (1) සභාවේ සහ පූර්ණ කාරක සභාවල කාර්ය සටහන් ලේකම් විසින් තබා ගත යුතු අතර, එම කාර්ය සටහන්වල පිටපතක් ඊළඟ සභා රැස්වීම් දින ඔහු විසින් මන්ත්‍රීවරුන් අතර බෙදා දිය යුතුය. එම කාර්ය සටහන්වල පැමිණි/නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් සහ සභාවේදී ගනු ලැබූ තීරණයන් සටහන් විය යුතු ය.

*සභා රැස්වීමට පසු දිනම කාර්ය සටහන් බෙදා දිය යුතුය.*

(2) සභාවේ හෝ පූර්ණ කාරක සභාවක හෝ බෙදීමක් ඇති වූ විට 60(3) අනු රීතිය යටතේ ප්‍රශ්නයකට පක්ෂ ව සහ විරුද්ධව දී ඇති ඡන්දද, 60(6) රීතිය යටතේ බෙදීමක් හට ගෙන ඇති විට එසේ ඡන්දය දුන් මන්ත්‍රීවරුන්ගේ නම් ද, 60(8) අනු රීති යටතේ ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරුන්ගේ නම් ද කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය.

(3) කාර්ය සටහන් තහවුරු කිරීම අවශ්‍ය නොවන නමුත් එහි සංශෝධනය විය යුතු තැන් ඇතොත් සභාවේ අවසරය මත ඊළඟ රැස්වීමේදී ඉදිරිපත් කෙරෙන යෝජනාවක් මගින් හෝ ඊට පෙර සභාපතිවරයාට ලිඛිත ව දැන්වීමෙන් හෝ එසේ වූ විට ඊළඟ රැස්වීම් දින එම නිවැරදි කිරීම් සටහන් කළ යුතු ය.

## නිල [හැන්සාඩ්]වාර්තාව :

106 කාර්ය සටහන්වලට අමතර ව සභාවේ හෝ පූර්ණ කාරක සභාවක කෙරෙන කටයුතුවල සියලු විස්තර ඇතුළත් නිල

*නිල වාර්තාව.*

(හැන්සාඩ්) වාර්තාවක් සභාව සඳහා විය යුතු ය. නිල (හැන්සාඩ්) වාර්තාව සකස් කිරීමේදී සහාය කර ගනු පිණිස සභාවේ කෙරෙන සියලු කටයුතු පටිගත කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.

107 එම නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ලබා ගැනීමට මන්ත්‍රීවරුන්ට අයිතිය ඇත.

*නිල වාර්තා මන්ත්‍රීවරුන් අතට පත් කිරීම.*

(අ) නිල (හැන්සාඩ්) වාර්තාවේ නිවැරදි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, සංශෝධනය විය යුතු තැනක් වෙතොත් ඊළඟ සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලද යෝජනාවක් මගින් හෝ නිවැරදි කළ හැකි ය.

(ආ) නිල (හැන්සාඩ්) වාර්තාව සභාගත කිරීමට පෙර වෙනත් මන්ත්‍රීවරයෙකු හෝ මන්ත්‍රීවරුන් විසින් කර ඇති ප්‍රකාශයන්වල පිටපතක් ලබා ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

## පාර්ලිමේන්තුව සමඟ සන්නිවේදනය :

108 යෝජිත ඕනෑ ම ප්‍රඥප්තියක් හෝ නීතියක් සම්බන්ධයෙන් සභාව හා පාර්ලිමේන්තුව අතර ඇති වන සියලු ම කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සමඟ ලිඛිත ව හා වාචික ව ගනුදෙනු කිරීම සභාව වෙනුවෙන් සභාවේ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ කළ යුතු ය.

*පාර්ලිමේන්තුව සමග ගනුදෙනු සභා ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමග කළ යුතුය.*

## සභාවේ සීමාවන් :

109. (1) සභාවේ රැස්වීම පැවැත්වෙන සීමාව සභා ගර්භය ලෙස හැඳින් වේ.

*සභාවේ සීමාවන්ට ඇතුළත් වන දේ.*

සභා ගර්භය ඇතුළත් ගොඩනැගිල්ල පිහිටි භූමිය සභා පරිශ්‍රය ලෙස හැඳින් වේ.

(2) සභා ගර්භයේදී හැර, අන් තැනකදී රැස්වීමට සභාව නීත්‍යානුකූලව කැඳවනු ලැබූ විට, එම රැස්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ හා ගොඩනැඟිලි ඇතුළුව එම ස්ථානය එම රැස්වීම පැවැත්වීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුළදී සභාවෙහි සීමා ප්‍රදේශය වශයෙන් ගණන් ගනු ලැබේ.

## කාර්ය පටිපාටි රීති අත්සිටුවීම :

110. (1) හදිසියේ කළ යුතුව ඇති අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා කාර්ය පටිපාටි රීති එකක් හෝ කිහිපයක් හෝ බාධාවක් බව

*අමාත්‍යවරයෙකු විසින් රීති අත්හිටුවීමේ*

පෙනෙන කල්හි ඕනෑ ම අමාත්‍යවරයෙකුට එම රීතිවල අංක සඳහන් කරමින් ඒවා අත්සිටුවීමට යෝජනා කළ හැකි විය යුතුය. සභා රීති අත්සිටුවීමට හේතු වන කාරණය හෝ කාරණා හෝ එම යෝජනාවේ කෙටියෙන් සඳහන් විය යුතු ය. *යෝජනාවක් ඉදිරිපත් කිරීම.*

(2) මන්ත්‍රීවරයෙකුට එවැනි යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය. මන්ත්‍රීවරයෙකුගේ එබඳු යෝජනාවක් තවත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කළ යුතු ය. *මන්ත්‍රීවරයෙකු විසින් රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම.*

(3) යෝජනාවට පක්ෂ වන මන්ත්‍රීවරුන් ගණන ගණපූරණයට අවශ්‍ය ගණනට වඩා අඩු වන්නේ නම්, එම යෝජනාව සම්මත නොවූ ලෙස සැලකිය යුතු ය. *මන්ත්‍රීවරයෙකු විසින් කරන ලද රීති අත්හිටුවීමේ යෝජනාව සම්මත වීම.*

(4) (අ) කාර්ය පටිපාටි රීති අත්හිටුවා ගනු ලබන යෝජනාව හෝ යෝජනාවන් හදිසි යෝජනා ද යන්න සලකා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු කාරක සභාව රැස් විය යුතු ය.

(ආ) එසේ වුවද, යම් කරුණක් රටටම හෝ පළාතට බලපාන විශේෂ වැදගත්කමක් ඇති කාරණයක් නම්, එය සභා කටයුතු කාරක සභාවට යොමු නොකොට සභාපතිවරයා තීන්දු කරන්නේ නම්, 110(4)(අ) රීතියෙන් බාධාවක් නොවිය යුතු ය.

(5) 110 රීතිය යටතේ අත්සිටුවනු ලබන රීතීන් සම්බන්ධව සලකනු ලබන්නේ, සභාපතිවරයා තීරණය කරන පරිදි ය.

## කාර්ය පටිපාටි රීති සංශෝධනය කිරීම :

111. (1) යෝජිත සංශෝධනයට අදාළ වගන්තිය සඳහන් කරමින් යෝජනාවක් පිළිබඳ දැන්වීමක් ලේකම්වරයාට දීමෙන් කිසියම් මන්ත්‍රීවරයෙකුට මෙම කාර්ය පටිපාටි රීති සංශෝධනය සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය. *කාර්ය පටිපාටි රීති සංශෝධනය.*

(2) එවැනි යෝජනාවක් ඉදිරිපත් කොට ස්ථිර කරනු ලැබූ විට එය කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුතු ය. කාර්ය පටිපාටි රීති කාරක සභාව විසින් මාසයක් තුළදී පළාත් සභාවට වාර්තා කරන තුරු පළාත් සභාව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම නතර කළ යුතු ය.

(3) එකී වාර්තාව මාසයක් ඇතුළත ඉදිරිපත් නොවන්නේ නම් අදාළ මන්ත්‍රීතුමා සභාවට ඉදිරිපත් කර සභාවේ අනුමැතිය ලබා ගත යුත්තේ ය.

**සභාපතිවරයාගේ සාමාන්‍ය අධිකාරිය :**

112. (1) සභාවේ කටයුතු සම්බන්ධයෙන් මෙම රීතිවල විධිවිධාන සලස්වා නොමැති සියලු ම කරුණු සම්බන්ධයෙන් තීන්දු ගැනීමේ පූර්ණ බලය සභාපතිවරයාට තිබිය යුතු ය.

(2) ගොඩනැඟිලි පරිපාලනය, ආරක්ෂක විධිවිධාන සහ සභා ගර්භය පිළිබඳ සාමාන්‍ය පරිපාලන බලධාරියා වන්නේ සභාපතිවරයා ය.

(3) මෙම රීති අනුව සභාපතිවරයා සතු සියලු ම බලතල මූලාසනාරූඪ වී සිටින නියෝජ්‍ය සභාපතිවරයාට හෝ මූලාසනාරූඪ වී සිටින වෙනත් මන්ත්‍රීවරයෙකුට හිමි වන්නේ ය.

(4) 9 වන රීතිය මගින් කියවෙන සභාපතිවරයා සතු බලතල සභාපතිවරයාගේ සාමාන්‍ය අධිකාරිය යටතේද ගණන් ගත යුතු ය.

**අර්ථ නිරූපනය :**

113. වෙනත් විශේෂ ලෙසකින් සඳහන් නොවේ නම් මෙම රීතීන්හි

“පනත” යනුවෙන් අදහස් කෙරෙනුයේ, 1987 අංක 42 දරන පළාත් සභා පනත වේ.

“සභාපතිවරයා” යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා ය.

“නියෝජ්‍ය සභාපතිවරයා“ යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා ය.

“සභාව” යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාව ය.

"පොදු කටයුතු" යනුවෙන් අදහස් කෙරෙනුයේ, ඇමතිවරයෙකුගේ නමින් ඉදිරිපත් කෙරෙන පළාත් සභා විෂය පථයට අයත් විෂය කාර්යයක් වේ.

"රාජ්‍ය භාෂා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(1) (2) වගන්තිවලින් දී ඇති අර්ථ නිරූපනය අදාළ වේ.

"සම්බන්ධීකරණ භාෂා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) වගන්තිවලින් දී ඇති අර්ථ නිරූපනය අදාළ වේ.

"ලේකම්වරයා" යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා ය.

"සැසිවාරය" යනුවෙන් අදහස් කරනුයේ, සෑම වසරකම ආරම්භක රැස්වීම පැවැත්වෙන දිනෙන් පටන් ගෙන එම වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය යි.

114 . මෙම රීති සංග්‍රහයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. *සිංහල භාෂා පාඨ බල පවත්වනු ලබන බව.*

# පරිශිෂ්ටය

1. 9 රීතියේ 4 වන උප රීතිය යටතේ පහත සඳහන් ආකාරයට සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක විය යුතුය.

(අ) 72 වන රීතිය යටතේ සභාවේ කටයුතු විධිමත් කිරීම හෝ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් රීති ප්‍රශ්නයක් මතු කළ කල්හි සභාපතිවරයා විසින් එකී ප්‍රශ්නය සම්බන්ධයෙන් එකල්හිම හෝ සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කොට අදාළ ප්‍රශ්නයට විසඳුමක් ලබා දිය යුතුය. අදාළ ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවට යොමු කරන ලද අවස්ථාවක අදාළ කාරක සභාව ඒ පිළිබඳ තීරණය ඉදිරියේදී සභාව පැවැත්වෙන පළමු අවස්ථාවේදී සභාපතිවරයා මගින් සභාවට දැනුම් දිය යුතුය.

(ආ) 73 වන රීතිය යටතේ දැක්වෙන කරුණක් සම්බන්ධයෙන් අදාළ මන්ත්‍රීවරයාගේ කථාව හෝ අවිනීත හැසිරීම නතර කරන ලෙස සභාපතිවරයා විසින් දැනුම් දීමෙන් අනතුරුව තවදුරටත් සභාපතිවරයාගේ තීරණය උල්ලංඝනය කරනු ලබන අවස්ථාවකදී අදාළ මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් 75 රීතියට අනුව කටයුතු කිරීම සඳහා පක්ෂ නායකයින්ගේ රැස්වීමක් සභා කටයුතු තාවකාලිකව අවසන් කොට කැඳවිය යුතු අතර එකී රැස්වීමේදී අදාළ මන්ත්‍රීවරයාගේ හැසිරීම සාකච්ඡා කොට සමතයකට පත් කළ යුතුය.

යම් හෙයකින් පක්ෂ නායකයින්ගේ රැස්වීම තුළ අදාළ සමතයට එළැඹීමට නොහැකි වන්නේ නම් එකී මන්ත්‍රීවරයාට අදාළව පියවරක් ගැනීම සඳහා අදාළ කරුණ සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය. එකී සභා කටයුතු පිළිබඳ කමිටුවේ තීරණය මත අදාළ මන්ත්‍රීවරයා සභා කටයුතුවලින් එම දිනයේදී සහ/හෝ ඉදිරි සභා වාර තුනක උපරිමයකට යටත්ව සභා සහභාගීත්වය හෝ ඉවත් කිරීමට සභාපතිවරයාට නියෝග කළ හැකිය.

2. 9 වන රීතියේ 4 වන අනු රීතියට අනුව කාරක සභාවට කැඳවන නිලධාරීන් කැඳවීමේ නියෝග කඩ කරන අවස්ථාවක අදාළ නිලධාරියා අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හට ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කර නියමිත කාලයක් ඇතුළත තමා වෙත වාර්තා කරන ලෙස දන්වා සිටීමේ බලය සභාපතිවරයාට ඇත්තේය.

3. 9 වන රීතියේ 6 වන අනු රීතිය යටතේ පනවා ඇති රීතියක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් උද්ගත වන කල්හි සභාපතිවරයාට පවතින බලයට යටත්ව අදාළ කරුණ පිළිබඳව උපදේශයක් නීති හා ප්‍රඥප්ති කමිටුවෙන් ලබා ගැනීමට යොමු කළ හැකිය.

4. 4 වන රීතියේ 10 වන උපරීතිය අනුව වරප්‍රසාද ප්‍රශ්නයක් නැඟූ කළ ඒ පිළිබඳ කටයුතු කිරීමේ සභාපතිවරයා සතු පූර්ණ බලතලවලට යටත්ව ඇතැම් අවස්ථාවලදී අදාළ වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් එනයින්ම ක්‍රියා කිරීමේ බලතල සභාපතිවරයා සතු වේ. යම් හෙයකින් එලෙස කටයුතු නොකරන අවස්ථාවකදී අදාළ වරප්‍රසාද කඩ කිරීම සභාපතිවරයා විසින් වරප්‍රසාද කමිටුව වෙත යොමු කළ යුතු අතර, අදාළ වරප්‍රසාදය හදිසි තත්ත්වයක් මත පැන නඟින්නක් නම් සභා කටයුතු අත්හිටුවා අදාළ කරුණ පිළිබඳව තම තීරණය එම දිනයේදීම ලබා දීම හෝ වෙනත් තත්ත්වයකදී යොමු කෙරෙන වරප්‍රසාද ප්‍රශ්නයක් නම් සභාවේ ඉදිරියේදී රැස්වන පළමු අවස්ථාවේදීම සභාපතිවරයා හරහා සභාවට දැනුම් දීම වරප්‍රසාද කමිටුවේ වගකීම වේ.

0000 0000